විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

විදේශාධාර ව්‍යාපෘති

පටුන

			පිටු අංක.
	විධායක සාරාංශය		6
	විදේශාධාර ව්‍යාපෘති වල නිරීක්ෂණ		8
1	කෘෂිකාර්මික හා වැවිලි අංශය		
	1.1	කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය	8
	1.2	කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය - අදියර 01	11
	1.3	කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02	16
	1.4	දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය	21
	1.5	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය	30
	1.6	කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන	33
2	ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා අංශය		
	2.1	ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	39
	2.2	ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අතිරේක මූල්‍යනය	49
	2.3	කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය	53
	2.4	නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (අදියර - 01)	55
	2.5	මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	57
	2.6	යාපනය හා කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය	63
	2.7	රත්මලාන / මොරටුව අපජල අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතිය	68
	2.8	විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති	70
	2.9	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 2	72
	2.10	අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1	75
	2.11	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 3	80
	2.12	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය 2	86

	2.13	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 1	94
	2.14	අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතිය	99
	2.15	මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය	108
	2.16	මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 02	114
	2.17	මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 03	121
3	මහා මාර්ග අංශය		
	3.1	ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	126
	3.2	දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන	130
	3.3	ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය	133
	3.4	අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය	135
	3.5	සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	138
	3.6	බදුල්ල චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.	140
	3.7	කැලණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය	145
	3.8	පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය	147
	3.9	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය	149
	3.10	ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය	152
	3.11	කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය	155
	3.12	චීනයේ එක්සිම් බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	158
	3.13	නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය	161
	3.14	කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (OFID II)	163
	3.15	වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය	166
	3.16	ඔපෙක් අරමුදලින් A -017 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතිය (රක්වාන- සූරියකන්ද)	169
	3.17	ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය	173
	3.18	බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය(OFID III)	175
4	ප්‍රජා ප්‍රවාහන අංශය		
	4.1	කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමකාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	179

	4.2	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය	186
5	අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අංශය		
	5.1	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක I	191
	5.2	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක II	197
	5.3	උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් සංරචකය)	201
	5.4	උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය)	206
	5.5	විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	208
	5.6	ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය (නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රදාන)	212
	5.7	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ණය)	220
6	නිවාස හා නාගරික සංවර්ධන අංශය		
	6.1	අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය	231
	6.2	කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයදීමේ ව්‍යාපෘතිය	238
	6.3	නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය	243
7	වාරි මාර්ග අංශය		
	7.1	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1	246
	7.2	මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 2	252
	7.3	ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය	264
	7.4	දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය	270
	7.5	දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)	274
8	පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ අංශය		
	8.1	නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (RIDEP)	279
	8.2	ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - සංරචකය 02 (PRDP)	282
	8.3	ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP)	286
	8.4	පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (LGESP)	292
	8.5	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (සංරචකය 1 - පළාත් කොටස) (GEM)	295
9	භාණ්ඩාගාර හා රාජ්‍ය ණය අංශය		
	9.1	ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය	299

		යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.	
	9.2	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය	307
	9.3	මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය	316
	9.4	ලෝක බැංකුව අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය	320
	9.5	සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය	322
10	ආපදා කළමනාකරණ අංශය		
	10.1	ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය	326
11	වනාන්තර, වනජීවී සහ පරිසරය අංශය		
	11.1	පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය	328
12	බලශක්ති අංශය		
	12.1	විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය	333
	12.2	මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය	338
	12.3	හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර I)	340
	12.4	හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II)	346
13	සෞඛ්‍ය අංශය		
	13.1	කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය	349
	13.2	සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	352
	13.3	සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය	355
	13.4	සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය	363
	13.5	සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය (HSRP)	367
	13.6	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක I	370
	13.7	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II	374
	13.8	කොවිඩ් - 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය	376
	13.9	කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් -19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ දෙවන අතිරේක මූල්‍යකරණය ව්‍යාපෘතිය	378
	13.10	කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මූල්‍යයනය	382

විධායක සාරාංශය

1. ලංකාව තුළ ශක්තිමත් අපනයන ආදායමක් නොමැති අතර දේශීය වෙළඳපල තුළ හා දේශීය කර්මාන්ත වලින් නිපදවන භාණ්ඩ සඳහා අවශ්‍ය ඛනිජ සම්පත් හා ගුණාත්මක නිෂ්පාදන නොමැතිවීම හේතුවෙන් ලෝක වෙළඳපල තුළ ශ්‍රී ලාංකික අපනයන සඳහා අනම්‍ය ඉල්ලුමක් ද නොමැත . තවද, ශ්‍රී ලංකාව සුඛෝප‍භෝගී ජීවන රටාවකට හුරුවී ඇත. එනිසා, රට තුළ දෛනික අවශ්‍යතා ඉටු කරගැනීම සඳහා භාණ්ඩ හා සේවා රැසක් ආනයනය කිරීමට සිදුවේ.

2. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ආදායම වන්නේ, තේ, ඇගළුම්, කුළුබඩු වැනි නිෂ්පාදන හා විවිධ සේවා සැපයීම්ය. කෙසේවෙතත්, වර්ෂ ගණනාවක සිට මෙම ආදායම පාරිභෝගික භාණ්ඩ හා සේවා මෙරටට ආනයනය කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. එබැවින් වර්ෂ ගණනාවක සිට ශ්‍රී ලංකාවේ වෙළඳ ගිණුම්වල හිඟයක් පවතී. එනිසා, පාරිභෝගික භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට පවා රටේ අපනයන ආදායම ප්‍රමාණවත් නොවීය.

3. කෙසේ වෙතත්, ප්‍රාග්ධන වියදම රටක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන්නේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා රටේ යටිතල පහසුකම් වන විදුලිය, ජලය, මහාමාර්ග, සෞඛ්‍යය, අධ්‍යාපනය යන අංශවල සංවර්ධනය වැදගත් වන බැවිනි. එසේම, රට තුළ ආයෝජකයන්ගේ නිෂ්පාදිත සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කළයුතු අතර ඒ සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් ලබාදී රටේ දළ දේශීය නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබාගත යුතුය. එනිසා, රජයට අවශ්‍ය ප්‍රාග්ධනය විදේශ ණය ලෙස ලබාගෙන රටේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රදානය කළ යුතුය. මෙම විදේශ මූල්‍යයන ව්‍යාපෘති ආදළ අමාත්‍යාංශය හා ඊට ආසන්නතම ක්‍රියාත්මක කරන ආයතන නමින් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘති මඟින් රටේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය සහ ප්‍රදාන අදාළ ව්‍යාපෘති තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා නිසි ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

4. නමුත්, මෙම ව්‍යාපෘති තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර නොගෙන රටේ විදේශ ණය ශීඝ්‍රයෙන් ඉහළ යන බවට නිරන්තරයෙන් කතාබහට ලක්වන අතර මීට හේතුව වන්නේ අදාළ අමාත්‍යාංශවල හා එහි ක්‍රියාත්මක ආයතනවල මෙන්ම මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති අධීක්ෂණ ඒකකවල දුර්වලතාවයයි.

5. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ඉහත ආයතන විසින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන පහත සඳහන් හේතු බලපා ඇත.

i. ව්‍යාපෘතිය සඳහා නිසි සැලසුම් නොමැති වීම.
ii. ණය හෝ ප්‍රදාන ලබාගැනීමට පෙර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම.
iii. ව්‍යාපෘති කටයුතු සඳහා හෝ ව්‍යාපෘති ස්ථාපනය කිරීම සම්බන්ධ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැති වීම.
iv. ඉඩම් අත්පත්කරගැනීම් ආදිය ප්‍රමාදවීම නිසා කොන්ත්‍රාත්කරුවන්ට ඉදිකිරීම් ලබාදීම ප්‍රමාද වීම.
v. ව්‍යාපෘති සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් පත් නොකිරීම.
vi. දේශගුණය හා දේශගුණික තත්ත්වයන් පිළිබඳ වැරදි අනාවැකි හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදුකිරීම අපහසු වීම.

6. ඉහත හේතු නිසා විදේශ ආයෝජන ව්‍යාපෘති අපේක්ෂිත දිනවලදී නිම කිරීමට නොහැකි වන අතර එම හේතුව නිසා විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවල අරමුදල් යෙදවීම ඵල රහිත වේ. ඒ අනුව,

i. අපේක්ෂිත පරිදි විදේශ අරමුදල් ලබා නොදීම හේතුවෙන් අමතර පොළී සහ විය පැහැදම් ගාස්තු ගෙවීමට සිදුවීම.
ii. අපේක්ෂිත දිනවලදී නිම කිරීමට නෙහැකි වීම හේතුවෙන් ඉදිකිරීම් නිම කිරීමට භාවිතා කරන යෙදවුම්වල පිරිවැය ඉහළ යාම නිසා ව්‍යාපෘති පිරිවැය වැඩිවීම.
iii. ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු නියමිත වේලාවට සාක්ෂාත් කරගැනීමට නොහැකිවීම හා ව්‍යාපෘති තුළින් ප්‍රතිලාභ අපේක්ෂා කරන ජනතාවගේ අවශ්‍යතා ඉටු නොවීම.
iv. අදාළ ව්‍යාපෘති තුළින් රජය බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීමට නෙහැකිවීම.
v. අදාළ ව්‍යාපෘති නියමිත වේලාවට නිම නොකිරීම හේතුවෙන් නිෂ්පාදන හෝ සැපයුම් හෝ සේවා අඩාල වීම.
vi. ව්‍යාපෘති ප්‍රමාදය හේතුවෙන් පරිසරයට සිදුවන බලපෑම වැඩිවීම.
vii. ව්‍යාපෘති ප්‍රමාදය හේතුවෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකක පවත්වාගෙන යාමට අමතර මුදලක් ගෙවීමට සිදුවීම.
viii. කොන්ත්‍රාත්කරුවන් සඳහා අමතර මුදලක් ගෙවීමට සිදුවීම.
ix. විදේශ විනිමය අනුපාත වෙනස්වීම නිසා ව්‍යාපෘති පරිවැය විශාල ලෙස වැඩිවීම.
x. රට පිළිබඳ විශ්වාසය නෙමැතිවීම නිසා විදේශ ණය දෙනු ලබන ආයතන රට තුළ ආයෝජනයෙන් ඉවත්වීම.

7. මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවට අනුව විදේශ අරමුදල් සපයනු ලබන ආයතන විසින් 2021,2022 හා 2023 යන වර්ෂ වලදී පිළිවෙලින් රු. මිලියන 351,623 ක්, රු. මිලියන 783,326 ක් හා රු. මිලියන 831,952 ක් විදේශ ණය වශයෙන් ලබාදී ඇත.

8. මෙම විදේශ ආධාර මඟින් ව්‍යාපෘතීන් දිවයිනේ ප්‍රධාන අංශ 13ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම ව්‍යාපෘති වලට අදාල මූලික තොරතුරු ව්‍යාපෘතියේ අරමුදල් මෙහෙයවීම පිළිබඳ 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා මූල්‍ය කාර්යසාධන, එම වර්ෂ සඳහා විගණකාධිපති විසින් සිදුකරන ලද විගණන නිරීක්ෂණ, එම නිරීක්ෂණ ව්‍යාපෘතිය මඟින් ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

විදේශාධාර ව්‍යාපෘති වල නිරීක්ෂණ

01. කෘෂිකාර්මික හා වැවිලි අංශය

1.1. කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය

2016 අගෝස්තු 15 දී ආරම්භ කරන ලද කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල ණය ගිවිසුම් අංක 2000001447 යටතේ රු. මිලියන 3,349 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 5,153ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 02ක දී දීර්ඝ කර 2023 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	521.60	575.66	253.97
විදේශ අරමුදල්	620.33	670.53	1,587.66
මුළු වත්කම්	5,383	10,552	11,842
මුළු වගකීම්	5,383	10,552	11,842
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	816.66	943.27	1,617.33
දේශීය අරමුදල් මඟින්	807.82	969.50	594.19

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	2016 සිට 2023 සැප්තැම්බර් දක්වා තෝරාගත් දිස්ත්‍රික්ක හයක තේ ඉඩම් හෙක්ටයාර් 5500ක් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කළ පරිදි 2016 දී ව්‍යාපෘතියේ මෙහෙයුම් ආරම්භ කිරීමට නොහැකි වීම හේතුවෙන් තේ ඉඩම් ප්‍රතිසංස්කරණය කර නැවත වගා කිරීමේ ඉලක්කය හෙක්ටයාර් 4,500 දක්වා සංශෝධනය කර තිබුණි.	2023	සැලසුම් තළ පරිදි එහි ක්‍රියාකාරකම් සිදු කළ යුතුය.	2023.12.31 දිනට තේ නැවත වගා කිරීමේ ප්‍රගතිය හෙක්ටයාර් 4500ක සමස්ත ඉලක්කයෙන් හෙක්ටයාර් 4,131කි. ඒ අනුව තේ නැවත වගා කිරීමේ හෙක්ටයාර 369 ක ඉතිරිය තවමත් අවසන් කර නොමැත. ඒ අනුව ව්‍යාපෘතිය අවසන් වන විට තේ නැවත වගා කිරීමේ මුළු ප්‍රගතිය සියයට 92ක් ලෙස වාර්තා විය.	නැවත වගා කිරීමේ ඉලක්කයෙන් හෙක්ටයාර 4131 පමණක් නැවත වගාව සිදු කර ඇත.2023 සැප්තැම්බර් 30 දින ව්‍යාපෘතිය අවසන් වී ඇත.
(ආ)	සහනාධාර ක්‍රම යටතේ 2017 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුළ දිස්ත්‍රික්ක හයේ හෙක්ටයාර් 242 ක මුළු භූමි ප්‍රමාණයක තේ නැවත වගා කිරීමට බලපත්‍ර ලබාගත් ප්‍රතිලාභීන් 805 දෙනෙකු රු. මිලියන 36 ක මුල් ගෙවීම් ලබාගෙන විවිධ හේතූන් මත කිසිදු කටයුත්තක් ආරම්භ කර නොතිබුණි.	2023	ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අධීක්ෂණයෙන් අරමුදල් භාවිතා කිරීම සහ තීරණය කරන ලද ක්‍රියාකාරකම් සිදුකිරීම කළ යුතුය.	මෙම මුදල ගෙවීම නිරවුල් කර ගැනීම සඳහා සමථ මණ්ඩල වෙත යොමු කරන ලද ප්‍රමාණය රු.මිලියන 10.02 (ඇමරිකානු ඩොලර් 30,383) ක් වූ අතර නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇති ප්‍රමාණය රු. මිලියන 25.91 (ඇමරිකානු ඩොලර් 78,501)ක් විය.	කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල විසින් ලබා දෙන ලද අනුමැතියට අනුව, 2023 තුන්වන කාර්තුවෙහි සාධාරණීකරණය කරන ලද මුළු මුදලෙන් US$ 108,884 ක් එනම් රු. මිලියන 35.93 ක් අඩු කර ඇති අතර IFAD හි වාර්තා වලින් නුසුදුසු වියදම් ඉවත් කර තිබුණි.

(ඇ)	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව පිහිටි තවානෙන් වසරකට රබර් පැල 250,000ක් සැපයීමට හැකියාව ඇති කිරීම සහ ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 45ක් වෙන් කර ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය මගින් තවාන සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 7ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියට එහි තවානෙන් රබර් පැල 40,365ක් පමණක් ලබා ගැනීමට හැකිව තිබූ අතර ඉතිරි ප්‍රමාණය අනෙකුත් තවාන් වලින් මිලදී ගෙන තිබුණි. එබැවින් පැල ප්‍රවාහනය සඳහා අමතර වශයෙන් රු. මිලියන 22ක් වැය කර තිබුණි.	2021,2022	අනවශ්‍ය වියදම් අවම කර ගැනීම සඳහා අදාළ සියලු කටයුතු නියමිත කාලය තුළ සිදු කළ යුතුය.	2023.05.31 දිනට ව්‍යාපෘතිය මගින් සංවර්ධන කටයුතු සඳහා රු. මිලියන 53.69ක් මූල්‍යනය කර තිබුණි. 2022 වර්ෂය තුළ පදියතලාව තවාන මගින් සපයන ලද මුළු අංකුර රබර් පැල සංඛ්‍යාව 40,365 කි. ඉතිරි අවශ්‍යතාවය වන 325,039 න් RDD හි අනෙකුත් තවාන් මගින් සපයනු ලැබුවේ පැල 312,417 ක් පමණි. 2022 වසර තුළදී, ව්‍යාපෘතිය මගින් අම්පාර සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන්ගේ ඉඩම් වෙත ප්‍රසම්පාදනය කරන ලද අංකුර රබර් පැල බෙදා හැරීම සඳහා රු. 22,097,293 ක ප්‍රවාහන වියදම් දරා ඇත.	පදියතලාව පැල තවානේ පැල නිෂ්පාදනය2023 වර්ෂයේ 44,457ක් වූ අතර ව්‍යාපෘතිය අවසන් වන විට දළ වශයෙන් පැළ 83,451ක් නිෂ්පාදනය කර ඇත.

1.2. කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය - අදියර 01

2016 දී ආරම්භ කරන ලද කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය - අදියර 01 සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය ණය ගිවිසුම් අංක 5873-එල්කේ යටතේ රු. මිලියන 11,700.61 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 8,451 ක් විය. ව්‍යාපෘතිය එක් අවස්තාවක දී දිර්ඝ කර 2024 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ සඳහා සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය කල මතයක්ද 2023 වර්ෂය සඳහා තත්වාගණනය නොකල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	5,239	7,440	8,732
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	23,115	31,594	40,727
මුළු වගකීම්	7,262	6,881	5,751
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	5,620	7,634	13,949
දේශිය අරමුදල් මඟින්	3,283	4,760	14,809

එම තත්වාගණන කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණ	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණන ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘති අරමුණුවලට අදාළව ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් නිකුත් කරන ලද ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ	2021 2022 2023	අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය.	සඳහන් කර ඇති පීඩීඕ හතරෙහි ප්‍රගතිය 2023 අප්‍රේල් 30 දිනට නිම කරන ලද උප	අපේක්ෂිත ඉලක්කය සියයට 95.7ක් වන නමුත් 2024 අගෝස්තු මාසය අවසන් වන

දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. 2023 අප්‍රේල් 30 වන විට, සියයට 55 ට වඩා අඩු ප්‍රතිශතයක් සපුරාගෙන ඇති ඉලක්ක හතරක් වසර 5ක ව්‍යාපෘති කාලය තුළ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබූ අතර ඉදිරි වසර එකහමාර තුළ එම අරමුණු ඉටුකර ගැනීමට හැකිවේද යන්න පිළිබඳ අවිනිශ්චිතාවයක් පැවතුණි.		ව්‍යාපෘති සංඛ්‍යාව මත පමණක් පදනම්ව තීරණය කර ඇත. 2023 අප්‍රේල් 30 දින වන විට නිම කරන ලද උප ව්‍යාපෘති සංඛ්‍යාව 630 කි. නියමිත ඉලක්ක සම්පූර්ණ කිරීමට අදාළ ඉහත දර්ශක (පීඩීඕ) ගණනය කිරීමට සමස්ථ උප ව්‍යාපෘති සංඛ්‍යාවෙන් සියයට 55ක් සමාලෝචනය කිරීමට උප ව්‍යාපෘති 758 ක් ඉතිරිව පවතී. කොවිඩ්-19 වසංගතය සහ මෑතකාලීන ආර්ථික අර්බුදය හා සම්බන්ධ ආරම්භක ප්‍රමාදයන් සහ අභියෝග හේතුවෙන් එම පීඩීඕ දර්ශක 4 පසුගාමී තත්ත්වයක් පෙන්නුම් කරන නමුත් 2023 වර්ෂයේ 2 වන කාර්තුවේ සිට ක්‍රමානුකූල දියුණුවක් පෙන්වයි. ඒ අනුව, උප ව්‍යාපෘති 758 අවසන් වූ විට, ඉදිරි මාස 20 තුළ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය මත පීඩීඕ හි අවසාන ඉලක්ක කරා ළඟා විය හැකිය.	විට අත්පත් කරගත් ඉලක්කය සියයට 76.8ක් වන බව නිරීක්ෂණය වූ බැවින් ව්‍යාපෘති කාලය අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය හැක.

(ආ)	ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු දුර්වල වීම හේතුවෙන්, ව්‍යාපෘතිය මඟින් ආයෝජකයින් වෙත ලබාදෙන ගැළපුම් දීමනාව, පළමු වාරිකය ලබාදුන් ආයෝජකයින් 263 දෙනෙකු වෙත ලබාදීමට නියමිතව තිබූ රු.මිලියන 1,023 ක් වූ දෙවන වාරිකය ලබාදීම ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ප්‍රමාද විය. තවද, පළමු වාරිකය සහ දෙවන වාරිකය ලබා දුන් ආයෝජකයින් 249 දෙනෙකු සඳහා තෙවැනි වාරිකය ලෙස ගෙවීමට තිබූ රු.මිලියන 389 ගෙවීම ව්‍යාපෘතිය ආරම්භයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා ප්‍රමාද විය.	2021 2022	නියමිත කාලය තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය.	මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ආයෝජකයින් මුහුණ දෙන විවිධ ගැටලු ය. 2 වන වාරිකය නිකුත් කිරීම ව්‍යාපෘතියේ 1 වන වාරිකයේ ප්‍රගතිය මත පදනම්ව වෙනස් වන අතර අපේක්ෂිත ප්‍රතිශතය (ප්‍රදාන සහ ස්වකීය දායකත්වය) සපුරාලන තෙක් තවදුරටත් අරමුදල් නිකුත් කිරීමක් සිදු නොවේ.	අපේක්ෂිත ඉලක්කය 95.7%ක් වන නමුත් 2024 අගෝස්තු මාසය අවසන් වන විට අත්පත් කර ගත් ඉලක්කය 76.8%ක් බව නිරීක්ෂණය වූ බැවින් ව්‍යාපෘති කාලය අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය හැක.
(ඇ)	2017, 2018 සහ 2019 යන වර්ෂයන්හිදී එකතුව රු.මිලියන 85.72 ක් වූ ගැළපුම් දීමනා ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හැර දැමූ සමහර සමාගම් වෙත නිකුත් කර තිබුණි. එම ආධාර මුදල් ආපසු ගෙවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආපසු ගෙවා ඇත්තේ රු.මිලියන 49.48ක් පමණි. ඉතිරි මුදල වන රු. මිලියන 36.25ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයකරගත යුතුව තිබුණි.	2021 2022	අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.	ඉතිරි මුදල වන රු.මිලියන 36.997 ක වටිනාකම යෝජකයින් 4 දෙනෙකුගෙන් අයකර ගැනීමට පියවර ගෙන ඇත.	අයකළ යුතු ඉතිරි මුදල මේ දක්වා අය කරගෙන නොතිබුණි.

(ඇ)	කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීමට ඇ. ඩොලර් මිලියන 7.12 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 වන දින දක්වා එය භාවිතාකර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු නියෝජිතයන් සමඟ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වා ඇති අතර පරිපාලන විධිවිධානවල ඇති ගැටලු හේතුවෙන් අදාළ බැංකු විසින් එම ක්‍රියාමාර්ගය ආරම්භ කර නොතිබුණි.	2021 2022	අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් කටයුතු කළයුතුය.	ව්‍යාපෘතියේ කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යටතේ ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා වෙන් කර ඇති ඇ.ඩො. මිලියන 7.12 ක වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණයෙන්ම පාලනය කර අධීක්ෂණය කරනු ලැබේ. පරිපාලන ගැටලු හේතුවෙන් වාණිජ බැංකු මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අකමැත්තක් දක්වයි. එබැවින්, වෙන් කරන ලද මුදල සංශෝධනය කරන ලද අතර, මුළු ප්‍රතිපාදනවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1.00 ක මුදලක් ඉතිරි කර ඇමෙරිකානු ඩොලර් මිලියන 6.12 ක් ගැළපුම් දීමනා යෝජනා ක්‍රමයට මාරු කරන ලදී.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව දන්වා එම මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 6.12ක් ගැලපෙන ප්‍රදාන සඳහා කර ඇත.
(ඉ)	ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට අරමුදල් භාවිතයේ ප්‍රගතිය සලකා බැලීමේදී, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය මුදලින් වෙන් කර ඇති ඩොලර් මිලියන 61.05 න්	2021 2022 2023	ව්‍යාපෘතියේ හඳුනාගත් කාර්යයන් නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතුය.	2023 ජූලි මාසයේදී ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කරන ලද අතර මුළු ව්‍යාපෘති වටිනාකම ඩොලර් මිලියන 48.620 දක්වා අඩු විය. නව ව්‍යාපෘති වටිනාකමට අනුව	2024 අගෝස්තු මාසය අවසන් වන විට අරමුදල් භාවිතය ඇමෙරිකානු ඩොලර් මිලියන 46.9 කි. 2024 දෙසැම්බර් 31 අවසන් වන විට සම්පූර්ණ ණය මුදලම යොදවා

ව්‍යාපෘතිය සඳහා වැය කර ඇත්තේ ඩොලර් මිලියන 43.32 ක අරමුදල් පමණක් බව නිරීක්ෂණය විය. එය ප්‍රතිශතයක් ලෙස සියයට 70ක් විය. එබැවින්, ඉතිරි වසරක කාලසීමාව ඉතිරි අරමුදල් සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම බව නිරීක්ෂණය විය.

මූල්‍ය ප්‍රගතියෙන් ව්‍යාපෘතිය නිම කළ සියයට 80ක් පමණ නොහැකි බව ළඟා කර ගෙන නිරීක්ෂණය විය. ඇත.

1.3. කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02

2017 දී ආරම්භ කරන ලද කෘෂිකාර්මික අංශය නවීකරණය සඳහා වූ ව්‍යාපෘතිය - අදියර 02 සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය ණය ගිවිසුම් අංක 5873-එල්කේ යටතේ රු. මිලියන 9,175.88 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 191.75 ක් විය. ව්‍යාපෘතිය 01 අවස්ථාකදී දීර්ඝ කර 2024 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.ව්‍යාපෘතිය මඟින් 2023 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි.

2021සහ 2022 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා සඳහා ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 වර්ෂය සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම	1,317	2,164
රජයේ අරමුදල්		
විදේශ අරමුදල්		
මුළු වත්කම්	6,839	10,228
මුළු වගකීම්	712	728
මුළු අරමුදල්		
විදේශ ණය මඟින්	5,459	6,810
දේශිය අරමුදල් මඟින්	68	76

එම තත්වාගණන කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	2023 ජුනි 30 වන විට, නියමු ව්‍යාපෘතිය සඳහා සමාගම් 21 ක් ලියාපදිංචිකර තිබූ අතර ඉන් සමාගම් 18 ක් ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භකර	2022	ව්‍යාපෘතියේ මෙහෙයුම් කාලය තුළ අදාළ ඉලක්ක සපුරා ගැනීමට ප්‍රයත්න දැරිය යුතුය.	විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ. ඇතැම් සමාගම් මේ වනවිටත් ඔවුන්ගේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ආරම්භකර	2024 අගෝස්තු වන විට, එක් සමාගමක් මෙහෙයුම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

	නොතිබුණි. තවද, සමාගම් 4 කට කාර්යාල පරිශ්‍ර නොතිබුණි. ඉදිරි වසර එක හමාර තුළ එම අරමුණු ඉටුකර ගැනීමට හැකිවේද යන්න විගණනයට ගැටළුසහගතය.			ඇති අතර සෙසු සමාගම් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කරමින් සිටී.	
(ආ)	ගම්පොළ කුරුඳුවත්ත ප්‍රදේශයේ ස්ථාපිත වියළි මිරිස් වගා කරනු ලබන ප්‍රතිලාභීන් 300 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා රෝපණ ද්‍රව්‍ය සහ ගොවි උපකරණ ලබාදීම වෙනුවෙන් මධ්‍යම පළාත් ව්‍යාපෘති කාර්යාලය විසින් රු.මිලියන 168.2 ක මුදලක් වැයකර තිබුණි. ව්‍යාපෘතියට සහභාගී විය හැකි ගොවීන් සංඛ්‍යාව 177 ක් වීම හේතුවෙන් පුද්ගලයින් 123 දෙනෙකු සඳහා මිලදීගත් උපකරණ නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	2022	අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය.	විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.	ගොවීන් වගාවෙන් ඉවත්ව තිබූ අතර ව්‍යාපෘතිය මගින් බෙදා හරින ලද භාණ්ඩ නිෂ්ක්‍රීය වී තිබුණි .
(ඇ)	උතුරුමැද පළාත වැනි බහුලව මිරිස් වගා කරනු ලබන, මහනුවර දිස්ත්‍රික්කයේ කඳුකර ප්‍රදේශයන්හි තැනිතලා ඉඩමක් සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන්, හෙල්මළු ක්‍රමය නිසා වැසි ජලයෙන් හා ගංවතුරෙන් මිරිස් විනාශ වී ඇති අතර ස්ථාන කිහිපයකින් අක්කර භාගයක පමණ ඉඩමක් සොයා ගැනීමට සිදුවී තිබුණි. තවද,	2022	අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපෘතිය සැළසුම්කර ක්‍රියාත්මක කළ යුතුය.	මෙම ප්‍රදේශයේ මිරිස් වගාව සඳහා සුදුසු වේ. මෙම වගාවෙන් දැනටමත් දෙවරක් අස්වනු නෙලා අවසන්ව ඇත. මිරිස් වගා කරන අනෙකුත් ප්‍රදේශය සම්බන්ධයෙන් ගත්කළ මෙම ප්‍රදේශය මිරිස් වගාවට සුදුසු වේ.	වියළුම් යන්ත්‍රය මෙතෙක් භාවිත කර නොතිබූ අතර ජල බිංදු පද්ධතිය අක්‍රිය වී තිබුණි.

	පොම්ප භාවිතය සහ බිංදු ජල සම්පාදන පද්ධතිය අක්‍රීය වී තිබුණි.කුරුඳුවත්ත ප්‍රදේශයේ මිරිස් වියළීමේ යන්ත්‍රයක් සවිකර තිබුණද, වියළීමේ යන්ත්‍රයට ළඟා වීමට මිරිස් රැගෙන යන ගොවීන්ට ගොවිපළේ සිට කි.මීටර් 13- 40 ක් පමණ දුරක් ගමන් කිරීමට සිදුවීම නිසා වියළීමේ යන්ත්‍රය භාවිතයද අසාර්ථකවී තිබුණි.				
(ඇ)	කෘෂිකාර්මික නවීකරණ ව්‍යාපෘතිය 2017 ජනවාරි 17 වන දින ආරම්භකර ඇති අතර අධීක්ෂණ තොරතුරු පද්ධතිය (MIS) නිර්මාණය කිරීම සඳහා 2018 නොවැම්බර් 15 දක්වා මාස 22 ක පමණ කාලයක් ගතවී තිබුණි. 2018 නොවැම්බර් 15 වන දින, රු.මිලියන 8 ක වටිනාකමකට පෞද්ගලික සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව ලබා දී තිබු අතර කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලද දින සිට මාස 03 ක් ඇතුළත ව්‍යාපෘතිය සඳහා සම්පූර්ණ අධීක්ෂණ තොරතුරු පද්ධතියක් (MIS) ලබාදිය යුතු බව සඳහන් වී තිබුණි. මෙම තොරතුරු පද්ධතියට 2022 දෙසැම්බර් වන තෙක් සම්පූර්ණයෙන් නිමකර	2022	නියමිත කාල සීමාව තුළ අපේක්ෂිත අරමුණු සාක්ෂාත්කර ගැනීමට කටයුතු කළයුතුය.	විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම සමඟ එකඟවේ.	2024 අගෝස්තු මාසය අවසන් වන විට, ඉලක්කගත අරමුණු ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය.

	නොතිබුණු අතර ඒ සඳහා දරන ලද රු. මිලියන 5 ක වියදම නිෂ්කාර්යව පැවතුණි.				
(ඉ)	තොරතුරු වලට අනුව, ව්‍යාපෘතියේ ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 6.2 ක් හෙවත් රු.මිලියන 904.89 ක් වෙන්කර තිබුණි. මෙම මුදලින් රු.මිලියන 132 ක් 2022 සැප්තැම්බර් වන විට වියදම්කර තිබුණි. ගොවි ආශ්‍රිත නිෂ්පාදන සංගම් ඇති කිරීම මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණ වී තිබුණි. පුහුණුව අවසානයේ ව්‍යාපාති නිලධාරීන් පොකුරු ව්‍යාපෘති වල ගොවීන් සමඟ සම්බන්ධතා සහ නිරීක්ෂණ කටයුතු වලින් ඉවත්වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගොවීන් මෙම ව්‍යාපෘතියේ නියමු කණ්ඩායම් වලින් ඉවත්ව තිබූ අතර ගොවි පුහුණුව හා ධාරිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා දරන ලද රු. මිලියන 132 ක මුදල නිෂකාර්ය වියදමක් බවට පත්ව තිබුණි.	2021 2022	සැළසුම්කළ පරිදි ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළයුතුය.	ගොවීන් පුහුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ. ISP වැඩසටහන යටතේ ඇතැම් නියමු ව්‍යාපෘති පුළුල්කර ඇත. තවද, නියමු ව්‍යාපෘති සඳහා පොදු ලැයිස්තුගත නොකළ සමාගම් 21 ක් ස්ථාපිත කරන ලදී.	නියමු ව්‍යාපෘති සඳහා සමාගම් පිහිටුවා තිබූ නමුත් ගොවි පුහුණුව සහ ධාරිතා සංවර්ධන කටයුතු අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.
(ඊ)	නාවලපිටිය මිරිස් වගා ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමට පෙර	2022	ව්‍යාපෘති කාර්යයන් නිසි පරිදි සැළසුම්කර	කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි.	රු. මිලියන 32.224ක් වටිනා පොලිතින් ආවරණ

ගොවීන් 300කට බෙදා දීම සඳහා උපකරණ මිලදී ගෙන තිබුණි. 2022 සැප්තැම්බර් මාසය අවසන් වන විට ගොවි සංවිධාන තුනක සහ කෘෂිකාර්මික මධ්‍යස්ථානයේ උපකරණ නොලැබුණු ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 86 කි. නිශ්චිත ගොවීන් සංඛ්‍යාව තෝරා ගැනීමකින් තොරව පොලිතීන් ආවරණ රෝල් මිලදී ගැනීම හේතුවෙන් රුපියල් මිලියන 32.224ක් වටිනා පොලිතීන් ආවරණ රෝල් 380ක් මාතලේ නියෝජ්‍ය ව්‍යාපෘති කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතිණි.	ක්‍රියාත්මක කළ යුතුය.	රෝල් 380ක් මාතලේ දිස්ත්‍රික්කයේ පල්වෙහෙර ප්‍රදේශයේ ගබඩාවක 2024 අගෝස්තු මාසය දක්වා නිෂ්ක්‍රීයව තිබුණි.

1.4. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

2019 දී ආරම්භ කරන ලද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සඳහා අන්තර්ජාතික සංවර්ධන සමායතනය ණය ගිවිසුම් අංක 6346-LK යටතේ රු. මිලියන 22,804.65 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 4,024.35 ක් විය. ව්‍යාපෘතිය 2024 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	1,382	3,838	7,900
රජයේ අරමුදල්	60	100	420
විදේශ අරමුදල්	1,322	3,738	7,480
මුළු වත්කම්	3,733	7,426	20,020
මුළු වගකීම්	46	163	8
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	3,391	6,210	17,451
දේශිය අරමුදල් මඟින්	248	419	1,515

එම තත්වාගණන කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	මුලතිව් දිස්ත්‍රික්කයේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය සඳහා 2020 ඔක්තෝම්බර් 28 වැනි	2022	ව්‍යාපෘතියේ කර්තව්‍යයන් නිසි ලෙස සැලසුම් කර ඒවා සාක්ෂාත් කර ගත හැකි ආකාරයට	මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය විවිධ හේතු නිසා ප්‍රමාද වී ඇත. මොනරාගල	2024 අගෝස්තු මාසය අවසන් වන විට, ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණ කටයුතු අවසන් කර

	දින ව්‍යාපෘතිය මගින් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. නමුත් ගොවිජන සේවා මධ්‍යස්ථාන නවීකරණය සිදු කර නොතිබුණි.		කළමනාකරණය කළ යුතුය.	දිස්ත්‍රික්කයේ බුත්තල, වැල්ලවාය සහ තෙලුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථාන 03ක් සඳහා පැකේජයක් ලෙස කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇත. තෙලුල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ යෝජිත ඉදිකිරීමට මාර්ග ප්‍රවේශයක් නොමැතිකම සහ ඉදිකිරීම් භූමිය වැසි ජලයෙන් යටවීම නිසා සිදු කර නොමැත.	නොතිබුණි.
(ආ)	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සඳහා වර්ග අඩි 7020කින් යුත් ගොඩනැගිල්ලක් බද්දට ගෙන තිබුණු අතර විගණනය කරන ලද දිනය වන 2023 මැයි 15 දින වන විට රජයේ තක්සේරුකරුගේ වාර්තාව උල්ලංඝණය කරමින් සහ ගොඩනැගිල්ලේ වෙළඳපොල වටිනාකම ඉක්මවා යාම හේතුවෙන් ව්‍යාපෘතිය විසින් රු. 960,000ක අතිරේක ගෙවීමක් කර තිබුණි.මෙම ගොඩනැගිල්ල සේවකයින් 32 දෙනෙකු විසින් පමණක් භාවිතා කරනු ලබන අතර එක් පුද්ගලයෙකුගේ ගොඩනැගිලි බිම්	2022	වත්කම් අත්පත් කර ගැනීම සහ ගිවිසුම්වලට එළඹීම වඩාත් ඵලදායී, නිවැරදිව සහ අවම ප්‍රවාහන පිරිවැයකින් සිදු කළ යුතුය.	වාහන 10ක් පමණ නැවැත්වීමේ පහසුකම් සහිත ඉඩකඩක් තිබීම සහ වර්ග අඩි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අදාළ ගෙවීම් සිදු කර ඇත. රු.660,000 යනු ගොඩනැගිල්ලේ වර්ග අඩියට අදාළ වටිනාකම පමණි. ඉහත සඳහන් කළ මිල ගණන් සහ පහසුකම් සහිත එම ගොඩනැගිලි බොරැල්ල සහ බත්තරමුල්ල අවට සොයාගත නොහැකි බව කරුණාවෙන් සලකන්න.	මෙම ගොඩනැගිල්ල තවමත් භාවිතයේ පවතින අතර කාර්යාල අවකාශය වෙනත් ස්ථානයකට ගෙන යාමට කටයුතු කර නොතිබුණි.

	උපයෝජනය වර්ග අඩි 219 ක් පමණ වේ. එමෙන්ම බොරැල්ල - බත්තරමුල්ල ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර් 4ක් පමණ දුරින් පිහිටි මෙම ගොඩනැගිල්ල නිසා සේවකයන්ට වැඩි කාලයක් ගත කිරීමට සිදු වන අතර අමතර වියදම් දැරීමට සිදුවේ.				
(ඇ)	අනුරාධපුර රනෝරාව, මහානිකවැව කඩිනම් කෘෂිකර්ම වැඩසටහන යටතේ එක් ගොවියෙකුට අක්කර ¼ ක භූමි ප්‍රමාණයක් බැගින් මිරිස් වගාවක් කිරීම සඳහා ගොවීන් 19 දෙනෙකු තෝරාගෙන එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 2.7ක වියදමක් දරා තිබුණි. නමුත් ව්‍යාපෘතිය භෞතිකව පරීක්ෂා කරන විට, එක් ගොවියෙකු පමණක් මිරිස් වගාවේ නියැළෙමින් සිටි අතර අනෙක් ගොවීන් 18 දෙනා මිරිස් වගාවෙන් ඉවත්ව ගොස් තිබුණි. මේ අනුව දරන ලද වියදම නිෂ්කාර්ය වී තිබුණි.	2022	ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි සැලසුමක් කළ යුතුය. ප්‍රතිලාභීන්ට නිවැරදි උපදෙස් ලබා දිය යුතු අතර අධීක්ෂණය නිසි ලෙස සිදු කළ යුතුය.	නිරීක්ෂණය සමග එකඟයි. ප්‍රථමයෙන් ගොවීන් 19 දෙනෙකුට මිරිස් වගාව පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. ඉන් පසුව ඔවුන් මිරිස් වගාවට යොමු කරන ලදී. සුදු මැස්සන් මිරිස් වගාවට හානි කළ නිසා වගාව විනාශ විය. ඊට අමතරව පොහොර හිඟය නිසා ගොවීන් මිරිස් වගාව අතහැර වෙනත් වගාවන් වෙත යොමු විය.	2024 සැප්තැම්බර් වන විට ගොවීන් මිරිස් වගාව අත්හැර දමා ඇති බව නිරීක්ෂණය විය.
(ඈ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෙවතු වගා වැඩසටහන සඳහා කහ, ඉඟුරු සහ පලතුරු පැළ කට්ටල 15,762ක් මිලදී ගෙන බෙදා හැරීමේ ප්‍රසම්පාදනය ප්‍රදානය	2022	ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල උපදෙස් අනුව හා රජයට කාර්යක්ෂමතාවය උපරිම වන අයුරින්	ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු එකඟ නොවන්නේ නම්, එවැනි අවස්ථාවක, ප්‍රසම්පාදනය	2024 සැප්තැම්බර් වන විට එම අලාභ අය කරගෙන නොතිබූ අතර ගොවීන් මෙම වගාවෙන් ඉවත්ව ගොස් තිබුණි.

කිරීමට අදාළව තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිර්දේශ නොමැතිව රු. මිලියන 12.9 ක අවම ලංසුව ප්‍රතික්ෂේප කිරීම සහ ලංසුකරුවන් දෙදෙනෙකුට රු. මිලියන 20.5කට ප්‍රසම්පාදනය පිරිනැමීම හේතුවෙන් රු. මිලියන 7.6ක අලාභයක් සිදුවී තිබුණි. තවද, ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් තිදෙනාගෙන් එක් අයෙකු ප්‍රසම්පාදන ප්‍රදානයට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රසම්පාදන තීරණයට අත්සන් නොකළ සාමාජිකයාගේ අත්සන ව්‍යාජ ලෙස සකස් කර ඇති බවත් ඒ පිළිබඳව අමාත්‍යාංශ ලේකම්වරයා කිසිදු පරීක්ෂණයක් සිදු කර නොමැති බවත් සාමාජිකයා විසින් 2021 නොවැම්බර් 21 දින අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව පැමිණිලි කර තිබුණි. ප්‍රසම්පාදන තීරණය ව්‍යාජ එකක් බවට ලේකම්වරයාට දැනුම් දීමෙන් පසු අත්සන් දෙකක් පමණක් සහිතව ප්‍රසම්පාදන තීරණය ප්‍රකාශයට පත්කර තිබුණි. මූල්‍ය රෙගුලාසි 135(2) ට පටහැනිව ප්‍රසම්පාදන තීරණයට එක අත්සනකින් තොරව කුරුණෑගල ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් ගෙවීම් කර තිබුණි.	ක්‍රියා කළ යුතු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් හානි අයකර ගත යුතුය.	ඉදිරියට ගෙන යා හැකිය. එම කටයුතු සිදු නොකිරීමෙන් එම නිලධාරියා තම වගකීම් පැහැර හැර ඇත. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයෙකු විසින් නිකුත් කර ඇති වාර්තා මගින් මූලික විමර්ශන සිදු කරන ලෙස නිර්දේශ කර ඇත. ඒ නිර්දේශ මත අප මූලික විමර්ශන කමිටුවක් පත් කර තිබේ.

(ඉ)	ව්‍යාපෘතිය මඟින් ලබාදුන් ප්‍රතිපාදනවලින් උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය 620 මඟින් රු. මිලියන 6.5 ක් වටිනා අඹගස් වැව කමත ඉදිකිරීම සඳහා 2022 අගෝස්තු 02 වැනි දින පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගත ව තිබුණි. ගිවිසුම් ගත වීමට පෙර ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් කමත ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් තෝරා ගෙන අත්පත් කර ගෙන නොතිබුණි. අත්තිකාරම් සුරක්ෂණය මත කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු අතර 2023 ඔක්තෝබර් 30 දින අත්තිකාරම් සුරක්ෂණයේ කාලය ඉකුත්වී තිබුණි. අත්තිකාරම් සුරක්ෂණ පවරා නොගෙන 2023 දෙසැම්බර් 28 දක්වා දින දීර්ඝ කර තිබුණි.	2023	ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර නිසි සැලසුමක් සකස් කළ යුතුය. ව්‍යාපෘතියේ අරමුදල් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතුය.	නිරීක්ෂණය සමග එකඟයි.	2024 අගෝස්තු වන විට අත්තිකාරම් බැඳුම්කර පවරාගෙන නොතිබුණි.
(ඊ)	ව්‍යාපෘතිය මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ එල්ලංගා පද්ධති 05 ක් යටතේ වැව් 80 ක් රු. මිලියන 613 ක ඇස්තමේන්තුවක් යටතේ සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් වැව් 30ක් සංවර්ධනය කිරීම සඳහා රු.මිලියන 475ක ඇස්තමේන්තුවක් යටතේ කොන්ත්‍රාත්	2023	එල්ලංගා පද්ධති 05 යටතේ ඇති වැව් සැලසුම් කර ඇති පරිදි නියමිත වේලාවට නිම කළ යුතුය.	පුත්තලම දිස්ත්‍රික්කයේ සංවර්ධනය කිරීමට නියමිත වැව් සංඛ්‍යාව වැව් 30 දක්වා අඩු කිරීමටත්, ව්‍යාපෘතිය සඳහා වෙන් කළ ඩොලර් ප්‍රමාණය අඩුවීම හේතුවෙන් ඉතිරි වැව් සංවර්ධනය අවස්ථා 02කදී	අඩු කරන ලද ඩොලර් ප්‍රමාණය ආපසු ලබා දී තිබුණු අතර අතහැර දැමූ වැව් ප්‍රතිසංස්කරණය කිරීම නැවත ආරම්භ කර නොතිබුණි.

	ලබාදී තිබුණු අතර වැව් 50ක් සංවර්ධනය කිරීම අත්හැර දමා තිබුණි. පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන දිස්ත්‍රික් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ආරම්භ කර තිබුණු වලස්වැව, දේවාල කන්ද වැව, සාලිය වැව, පන්සල වැව, ජයන්ති වැව සහ තම්මැන්නාව වැව යන වැව්වල කොන්ත්‍රාත් කාලය අවසන්ව තිබුණ ද ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වී නොතිබුණි.			අත්හැර දැමීමටත් සිදු විය. පුත්තලම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සංවර්ධනය කරන ලද වැව් 06 වැඩ නිමවීමෙන් පසු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ඇත.	
(ඉ)	දිවයිනේ දිස්ත්‍රික්ක 10ක ගොවිජන සේවා මධ්‍යස්ථාන 47ක් සඳහා වී ගොවිතැනට වඩාත් උචිත තාක්ෂණය හඳුන්වාදීමේ අරමුණින් රු. මිලියන 215.43ක් වැය කර යාන්ත්‍රික පැල රෝපණ යන්ත්‍ර 189 ක්, යාන්ත්‍රික වල් නෙලීමේ යන්ත්‍ර 189 ක් සහ බීජ රෝපණ යන්ත්‍ර 95 ක් ලබා දී තිබුණි. එයින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 8ක් සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානවල අවශ්‍යතාවය හා ඉල්ලීමකින් තොරව රාජාංගනය වම් ඉවුර, තඹුත්ත, ගල්ගමුව, මහානාන්පේරිය, රඹෑ, ඇහැටුවැව, අඹස්පොල, මොරගොල්ලාගම යන ප්‍රදේශ සඳහා රු. මිලියන	2023	වගා කරන වී වර්ගයට ගැළපෙන ආකාරයට, ගොවීන්ගේ අවශ්‍යතාවලට, ගොවි බිමට සුදුසු ආකාරයට යන්ත්‍රෝපකරණ හඳුන්වා දිය යුතුයි. නිෂ්ක්‍රීය යන්ත්‍ර ලබා ගැනීමට කටයුතු කළ නිලධාරීන්ගෙන් අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ගොවිජන සේවා මධ්‍යස්ථාන 47 සඳහා ලබා දී ඇති මුළු රෝපණ යන්ත්‍ර සංඛ්‍යාව (යන්ත්‍ර 189) සලකා බලන විට, 2023/24 මහ කන්නය දක්වා වී වගා කිරීමේ ප්‍රගතිය ගොවීන් 258ක් විසින් යන්ත්‍ර 115ක් භාවිතා කරමින් අක්කර 495.6ක් වන අතර එය මුළු රෝපණ යන්ත්‍ර සංඛ්‍යාවට සාපේක්ෂව සියයට 61ක භාවිතයකි. එසේම, වයඹ පළාතෙහි යාවත්කාලීන යන්ත්‍ර භාවිත ප්‍රගතිය සලකා බැලීමේදී, ගොවීන් 162 දෙනෙකු විසින් රෝපණ යන්ත්‍ර 27ක්	2024 අගෝස්තු මාසය අවසන් වන විට මෙම යන්ත්‍ර භාවිතයට නොගෙන නිශ්ක්‍රියව තිබුණි.

	21ක් වැය කරමින් පැල රෝපණ යන්ත්‍ර 35ක්, වල් නෙලීමේ යන්ත්‍ර 32ක් සහ බීජ රෝපණ යන්ත්‍ර 15ක් ලෙස මුළු යන්ත්‍ර 82ක් ලබාදී තිබුණි. එම යන්ත්‍ර ලබා දීමෙන් පසු වගා කන්න 3 කට පසු, 2023 දෙසැම්බර් වන විට, වගා කන්න තුන සඳහාම අක්කර 182.73 ක් ගොවීන් 118 දෙනෙකු පමණක් වගා කර තිබුණි. කෘෂිකාර්මික යන්ත්‍ර වගා කටයුතු සඳහා නොගැලපීම හේතුවෙන් එම ලබාදුන් යන්ත්‍රවලින් පැල රෝපණ යන්ත්‍ර 35 න් 14 ක් එක් වරක්වත් භාවිතා කර නොතිබුණි. ලබා දි තිබුණු වල් නෙලීමේ යන්ත්‍ර 32 න් 13 ක් එක්වරක්වත් භාවිතාකර නොතිබුණු අතර ලබා දී තිබුණු බීජ රෝපණ යන්ත්‍ර 15 න් 14 ක් එක් වතාවක්වත් භාවිතා කර නොතිබුණි. භාවිතා කර තිබුණු යන්ත්‍ර අවස්ථා එකක් හෝ දෙකක් පමණක් භාවිතා කර තිබුණි. ඒ අනුව දරන ලද පිරිවැය නිශ්කාර්ය වී තිබුණි.			භාවිතා කරමින් අක්කර 283.8 වගා කර ඇත. එබැවින්, රෝපණ යන්ත්‍ර සහ වල් නෙලීමේ යන්ත්‍ර භාවිතය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින අතර, එමඟින් වී අස්වැන්න වැඩි වන අතර ශ්‍රම පිරිවැය සහ කෘෂි රසායන පිරිවැය ඉතිරි වේ.	
(ඉ)	ගොවීන් වෙත බෙදාදීම සඳහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘතිය මඟින් 2021 වර්ෂයේදී රු.මිලියන 50ක් වැය කර තිබුණි. එම	2023	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ වගා අවශ්‍යතා මත බෙදා හැරිය යුතුය. නිකුත් කරන ලද භාණ්ඩ හා බීජ පිළිබඳව පසු	මෙම ගොවීන් තෝරා ගැනීමේ පදනම වූයේ, 2021/22 මහ කන්නය වගා කිරීම සහ නිෂ්පාදක සංගම්වල සාමාජිකයන් වීම	2024 අගෝස්තු වන විට ගොවීන් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයෙන් ඈත් වී තිබුණි.

	කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන උපකරණ ලබාගත් පරංගියාවාඩිය, කෝන්වැව සහ ගලෙන්බිඳුණු වැව ප්‍රදේශවල ප්‍රතිලාභීන් 2847 කගෙන් එක් අයෙකු පමණක් 2023 දෙසැම්බර් වන විට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරමින් තිබුණි. ඒ අනුව, කොම්පෝස්ට් නිෂ්පාදන උපකරණ සඳහා දරන ලද රු. මිලියන 50ක වියදම නිශ්කාර්ය වී තිබුණි.	විපරම් කර අවශ්‍ය උපදෙස් සහ මග පෙන්වීම ලබා දිය යුතුය.	සහ ඒ වන විට ප්‍රධාන වශයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමයි. ගොවීන් විටින් විට කොම්පෝස්ට් නිෂ්පාදනය සීමා කරන බැවින් ගොවීන් වෙත නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කෙරේ. එසේම, ඔබේ උපදෙස් පරිදි, භාවිත නොකරන සියලුම ද්‍රව්‍ය නැවත අයකර ගැනීමටත්, ලේඛන සකස් කිරීමෙන් පසු අවශ්‍යතා ඇති වෙනත් ආයතනවලට ලබාදීමටත්, එම ගොවීන්ට ප්‍රතිලාභ ලබා නොදීමටත් තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ තොරතුරු රැස්කිරීම මේ වන විට ආරම්භ කර ඇත.	
(එ)	ව්‍යාපෘතිය ආරම්භයේදී 2023 කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කර ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා භාවිතා කළ යුතු වුවද, මෘදුකාංග පද්ධති මිලදී ගැනීම/නිර්මාණය කිරීම ව්‍යාපෘතිය ආරම්භ කර වසර 4කට පසු 2022	සෘජු කොන්ත්‍රාත් පදනම මත ප්‍රසම්පාදනය කිරීමට වගකිව යුතු සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ගිණුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීම ප්‍රමාද කිරීම විමර්ශනය කර ඊට සම්බන්ධ	කළමනාකරණ තොරතුරු පද්ධතිය විෂය පථයේ ස්වභාවය සහ සාධාරණීකරණය සැලකිල්ලට ගනිමින්, සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය STEP යොමු අංකය LK-MOA-315134-	2024 අගෝස්තු වන විට කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

සැප්තැම්බර් 22 සහ 2022 ඔක්තෝබර් 17 යන දිනවල සිදු කරන තිබුණි. කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා රු. මිලියන 13.65ක් සහ ගිණුම්කරණ පද්ධතිය සඳහා රු. මිලියන 3.92ක් වැය කර තිබුණි. කෙසේ වෙතත්, ගිණුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ අපේක්ෂිත අරමුණු වෙත ළඟා වී නොතිබුණි.	නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය.	CS-CDS හරහා කරගෙන යාමට ලෝක බැංකුව විසින් නිෂ්කාශනය ලබා දී ඇත. ඒ අනුව, GIS පදනම් කරගත් කළමනාකරණ තොරතුරු පද්ධතිය වෙනස් කිරීම, ස්ථාපනය කිරීම, අධීක්ෂණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ප්‍රසම්පාදනය සිදු කරන ලදී.

1.5. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

2021 දී ආරම්භ කරන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල ණය ගිවිසුම් අංක 2000003227 යටතේ රු. මිලියන 7,698 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,268 ක් විය. ව්‍යාපෘතිය 2027 ජූනි 10 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2023 වර්ෂය සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	8	140
රජයේ අරමුදල්		
විදේශ අරමුදල්		
මුළු වත්කම්	371	680
මුළු වගකීම්	0.01	0.087
මුළු අරමුදල්		
විදේශ ණය මඟින්	363	687
දේශිය අරමුදල් මඟින්	8	28

එම තත්වාගණන කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2019 නොවැම්බර් 04 දින නිකුත් කරන ලද ව්‍යාපෘති සැලසුම් වාර්තාවට අනුව, ව්‍යාපෘතිය 2020 දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණද, මූල්‍ය	2022 2023	නිශ්චිත කාල රාමුව තුළ කාර්යයන් සම්පූර්ණ කළ යුතුය.	2023.12.31 වන විට ව්‍යාපෘති සහභාගිත්ව ගැමි පිවිසුම සහ ව්‍යාපෘතිය මුලපිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කර ඇත.	වර්තමානය වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය වර්ධනය වෙමින් පවතී . 2024 සැප්තැම්බර් වන විට සියයට 10 ක

	ගිවිසුම 2021 ජුනි 10 වන දින අත්සන් කර තිබුණි.මෙම ව්‍යාපෘතියේ කාලසීමාව වසර 06 කි. ව්‍යාපෘතිය 2022 අගෝස්තු මාසයේ සිට මූල්‍ය හා මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය වාර්තා වී ඇත්තේ සියයට 05ක් පමණි.				භෞතික ප්‍රගතියක් ලබා තිබුණි.
(ආ)	2023 දෙසැම්බර් 31 දිනට අරමුදල් පරිහරණයේ ප්‍රගතිය සලකා බැලීමේදී, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් ණය මුදලින් මුළු ප්‍රතිපාදනය වූ ඇ.ඩො.මිලියන 41.70 ක මුදලින් ව්‍යාපෘතිය ඇ.ඩො.367,590 ක අරමුදල් පමණක් භාවිතා කර තිබුණි. ප්‍රතිශතයක් ලෙස එය සියයට 1 ක් විය. එබැවින් ඉතිරි වසර තුනහමාරක කාලසීමාව තුල ඉතිරි අරමුදල් සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය අකාර්යක්ෂම වී තිබුණි.	2023	අරමුදල් කාර්යක්ෂමව භාවිතා කළ යුතුය.	කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොමැත.	වර්තමානය වනවිට එම ව්‍යාපෘතියේ වැඩකටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා තිබුණි . 2024 සැප්තැම්බර් අවසන් වන විට ඇ .ඩො . මිලියන 9.45 භාවිතා කර තිබුණි.
(ඇ)	ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය විසින් එකඟ වූ රජයේ මුළු දායකත්වය ඇ.ඩො.මිලියන 12.70 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රජයේ අරමුදලේ සමුච්චිත භාවිතය ඇ.ඩො.මිලියන 0.08 ක්	2023	ක්‍රියාකාරකම් නිසි ලෙස සැලසුම් කර ඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කළ යුතුය.	කළමනාකාරීත්වය නිරීක්ෂණය පිළිගෙන ඇත. වැඩිදුර පැහැදිලි කිරීමක් ලබා දී නොමැත.	වර්තමානය වනවිට එම ව්‍යාපෘතියේ වැඩකටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා තිබුණි . 2024 සැප්තැම්බර් අවසන් වන විට ඇ .ඩො .

	පමණක් වී තිබුණි. එය එකඟ වූ මුදලින් සියයට 0.62 ට සමාන වේ. මෙම ව්‍යාපෘතිය 2027 ජූනි 10 වන විට අවසන් කිරීමට නියමිත අතර ඉදිරි වසර තුනහමාර තුළ එකඟ වූ රජයේ අරමුදලින් ඉතිරි සියයට 99 භාවිතා කිරීම අවිනිශ්චිත තත්වයක් පැවතුණි.				මිලියන 9.45 භාවිතා කර තිබුණි.
(ඇ)	ලෙජර කේත නොමැතිව සාමාන්‍ය ලෙජර පවත්වාගෙන යාම, කාණ්ඩ වශයෙන් ජර්නල් සටහන් ඇතුළත් කිරීම නිසාත් වැරදි ලෙජර සටහන් කිරීම්, වෙනත් කිසිදු නිලධාරියකු විසින් ජර්නල් සටහන්වල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය පරීක්ෂා නොකිරීම, මුදල් පොත නඩත්තු නොකිරීම යනාදිය සම්බන්ධ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා පැවතුණි.	2022 2023	විධිමත් අභ්‍යන්තර පාලනයන් පවත්වා ගත යුතු අතර නිවැරදි ගිණුම්කරණ මෘදුකාංග පද්ධතියක් භාවිතා කළ යුතුය.	අනාගතයේදී මෙවැනි ගැටළු නැවත ඇතිවීම වැලැක්වීම සඳහා නව අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් කටයුතු කර ඇත.	මේ වන විට සාමාන්‍ය ලෙජරය නිතිපතා යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා තිබුණි.

1.6 කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන

2017 දී ආරම්භ කරන ලද කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යාන්තර අරමුදල ණය ගිවිසුම් අංක 2000002639 හා අංක 2000001984 යටතේ රු. මිලියන 8,892 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 8,278 ක් විය. ව්‍යාපෘතිය එක් අවස්ථාකදී දීර්ඝ කර 2025 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 සඳහා තත්වාගණන නොකල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම	2,744	2,034	4,658
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	7,036	14,677	17,652
මුළු වගකීම්	5	8	11
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	4,396	10,444	11,294
දේශිය අරමුදල් මඟින්	734	1,244	2,654

එම තත්වාගණන කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	කහ වගා කිරිමේ ව්‍යාපෘතිය සඳහා අපේක්ෂිත වියදම රු. මිලියන 37 ක් වූ අතර සැබෑ වියදම රු. මිලියන 15.6 කි. කහ	2021 2022	විදේශ වෙළෙඳපොළ හඳුනාගත යුතුයි.	මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වූ නමුත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයන් ව්‍යාපෘතියට	වර්තමානය වන විට, ව්‍යාපෘතිය විසින් මෙම කහ ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

	නිෂ්පාදනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, කහ බීජ නිෂ්පාදනයේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කහ බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම, කහ වගාව තුළින් වාර්ෂික මුළු ආදායම ඉහළ නැංවීම සහ ගොවි සංවිධානයේ ධාරිතාව ඉහළ නංවා ගනිමින් ගොවි සංවිධානය වෙළඳපොළ ඉලක්ක කරගත් සමාජ ව්‍යවසායක් බවට පත් කිරීමේ ඉලක්කය ද මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. මෙම කහ වගා ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති අතර රු. මිලියන 15.6 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.			බරපතල ලෙස බලපායි.	
(ආ)	කැවෙන්ඩිෂ් කෙසෙල් වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 28 දෙනෙකුට බැංකු මගින් රු. මිලියන 15.6 ක ණය මුදලක් ලබා දී ඇති අතර කෙසෙල් වගාවන් අසාර්ථක වීම හේතුවෙන් එම ණය ගෙවීම පැහැර හැර තිබුණි.	2022 2023	හඳුනාගත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතිය සැලසුම් කළ යුතුය.	ප්‍රතිලාභීන් 28 දෙනෙකුට රු.මිලියන 15.6 ක ණය ප්‍රමාණයක් බැංකු මගින් ලබා දී ඇති අතර කෙසෙල් වගාව අසාර්ථක වීම හේතුවෙන් එම ණය ගෙවීම පැහැර හැර ඇත. ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් විය. දේශීය වර්ගයේ කැවෙන්ඩිෂ් කෙසෙල් වල වර්ධනය සඳහා සහ ඵල දැරීම සඳහා කෘත්‍රිම පොහොර අවශ්‍ය නොවේ නම්. රසායනික පොහොර තහනම් කිරීමට	වර්තමානය වන විට, ව්‍යාපෘතිය විසින් මෙම කැවෙන්ඩිෂ් කෙසෙල් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

				රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය නිසා ව්‍යාපෘතිය අසාර්ථක වූ අතර මෙම ගොවීන්ට අස්වැන්නක් ලබා ගැනීමට නොහැකි විය.	
(ඇ)	ව්‍යාපෘති නිෂ්පාදකයා ලෙස කටයුතු කරන ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් සමාගම විසින් ලබා දීමට නියමිත දායකත්වයේ වටිනාකම රු. මිලියන 34.6 කි. 2020 දෙසැම්බර් 31 වන දින වන විට මෙම සමාගම විසින් ලබා දී ඇති දායකත්වය රුපියල් මිලියන 9 කට ආසන්න වන අතර, ව්‍යාපෘතිය මගින් වාර්තා කරන ලද වියදම්වලට අදාළ ගෙවීම් වවුචර හෝ වෙනත් අදාළ ලියකියවිලි ආයතනය සතුව නොතිබූ බැවින් ලංකා ඉකෝ ප්‍රඩක්ට් ගරන්ටී ලිමිටඩ් විසින් පෙන්වා දී ඇති වියදම් පදනම් විරහිත අසත්‍ය අගයන් විය.	2021 2022 2023	සියලු කටයුතු ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් අධීක්ෂණය කළ යුතුය.	ප්‍රවර්ධකයන්ට පොත් තැබීම, ගිණුම්කරණය සහ සියලු උපකාරක ලියකියවිලි සමඟ ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණුව ලබා දුන් අතර ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.	අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ඈ)	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කළ මුරුංගා වගා ව්‍යාපෘතිය, නිලධාරීන්ගේ සහ ප්‍රවර්ධකයාගේ අකාර්යක්ෂමතාව හේතුවෙන් අසාර්ථක වී තිබුණි. ගොවීන්ගේ දායකත්ව වටිනාකම හැර ව්‍යාපෘතියේ දායකත්වය මත බිංදු ජල සම්පාදනය	2021 2022 2023	ප්‍රවර්ධකයන්ට ප්‍රදාන ලබාදීමට පෙර, ඔවුන්ගේ ව්‍යාපාර අධීක්ෂණය කළ යුතුය. අකාර්යක්ෂම ප්‍රවර්ධකයන්ගෙන් සහ අදාළ නිලධාරීන්ගෙන්	කොවිඩ් 19 කාලය දක්වා, සැලකිය යුතු මූලික ප්‍රගතියක් පෙන්නුම් කරමින්, ගොවීන් 116 දෙනෙකු සමඟ මුරුංගා ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. වෙළඳපල	වර්තමානය වන විට, ව්‍යාපෘතිය විසින් මුරුංගා වගා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

	සඳහා වතුර මෝටර් ලබා ගැනීම සඳහා රු.මිලියන 25.52ක මුදලක් වැය කර තිබුණි. මුරුංගා ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වූ ගොවි පවුල් ආර්ථික අර්බුදවලට මුහුණපා තිබුණි. මුරුංගා ව්‍යාපෘතියේ ප්‍රවර්ධකයන් සමඟ එළැඹුනු ගිවිසුම 2021 දෙසැම්බර් 05 දින අවසන් වී තිබුණු අතර ඒ බව ප්‍රවර්ධක වෙත දැන්වීමට වැඩසටහන් අධ්‍යක්ෂ විසින් මාස 18 කට අධික කාලයක් ගත කර තිබුණි.		ගෙවන ලද ප්‍රදානය අයකර ගත යුතුය.	කඩාවැටීම හේතුවෙන්, අපනයන වෙළඳපොලේ ඇති අභියෝග නිසා ප්‍රවර්ධකයා මිලදී ගැනීම අත්හිටුවා ඇත. ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමට බලපාන මූලිකම ගැටලුව වනුයේ අපනයන ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය සියයට 100ක් කාබනික වීමේ අවශ්‍යතාවයයි. පාංශු අපද්‍රව්‍ය අනාවරණය වීම හේතුවෙන්, දැනට ව්‍යාපෘතියට මෙම දැඩි කාබනික නිර්ණායක සපුරාලිය නොහැක.	
(ඉ)	පැරබෝවා පාරිසරික ගොවි සංවිධානයේ ප්‍රවර්ධක වන පැරබෝවා එක්ස්පෝට් සමාගමේ හිමිකරු විසින් එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය අදියර 01 න් රු. මිලියන 9 ක ප්‍රදාන හා එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පැවති කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන මඟින් වී ගබඩා ඉදිකිරීම සඳහා රු. මිලියන 2.7 ක ප්‍රදාන ලබාගෙන තිබුණි. කෘෂිකර්ම අංශ නවීකරණ	2023	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන හරහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් සම්බන්ධීකරණය කළ යුතුය.	පැරබෝවා ව්‍යාපෘතිය යනු ගොවි සංවිධානය සමඟ අත්සන් කරන ලද 4P සංකල්පය යටතේ ඇති අගය දාම වැඩසටහනකි. ගබඩා පහසුකම් පාරම්පරික වී වගා කිරීමේ යෝජනාවට සහ අත්සන් කරන ලද ගිවිසුමට ඇතුළත් වේ. එබැවින්, ගොවීන්ගෙන් එකතු කරන වී අපනයනය දක්වා ගබඩා කිරීම සඳහා අවශ්‍ය වන ගබඩා පහසුකම	ප්‍රදාන ලබාදීමේදී , වර්තමානය වනවිටත් ප්‍රාදේශීය මට්ටමින් පරීක්ෂණ සිදු නොවන බව නිරීක්ෂණය විය.

	ව්‍යාපෘතිය අදියර 01 න් ලබාගත් රු. මිලියන 9 ක ප්‍රදානවලින් අපේක්ෂිත කාර්යයන් ද ඉටු කර නොතිබුණි.			ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 2.7 ක ප්‍රදානයක් ලබා දෙමින් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන පියවර ගෙන ඇත. නූඩ්ල්ස් කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සඳහා අපනයන සමාගමට රු. මිලියන 9ක් ලබා දී ඇති බව ප්‍රවර්ධකයා (FO) විසින් අපට දන්වා ඇත.	
(ඊ)	ව්‍යාපෘතිය 2023 ජූනි 30 දිනට අවසන් කළ යුතු වුවද, ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 30 දක්වා ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් අනුමත කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල් භාවිතයේ ප්‍රගතිය සලකා බැලීමේදී, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් ණය මුදල ඩොලර් මිලියන 54.4 ක වෙන් කළ අරමුදල්වලින් ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 28.16 ක් පමණක් භාවිතා කර තිබුණි. ප්‍රතිශතයක් ලෙස එය සියයට 51.76 ක් වූ බැවින් ඉතිරි වසර දෙකක කාලය ඉතිරි අරමුදල් සමඟ සලකා බැලීමේදී අරමුදල් භාවිතය	2021 2022 2023	නියමිත කාල රාමුව තුළ ඉලක්කය සම්පූර්ණ කළ යුතුය.	2024 මැයි මස අවසානය වන විට, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල් භාවිතය සියයට 63 ක් වන අතර කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන මෙම වසර තුළ සියයට 80 ක ප්‍රගතියක් ලබා ගැනීමට සැලසුම් කර ඇත.	2024 අගෝස්තු මස අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය ඇමෙරිකානු ඩොලර් මිලියන 54.4ක් වන නමුත් සාක්ෂාත් කර ගත් ඉලක්කය ඇමෙරිකානු ඩොලර් මිලියන 36.31ක් (ප්‍රතිශතයක් ලෙස - 67) වන බව නිරීක්ෂණය වූ බැවින් ව්‍යාපෘතියේ කාල සීමාව අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය හැක.

	අකාර්යක්ෂම විය.				
(උ)	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රජය විසින් එකඟ වූ මුළු දායකත්වය ඇමරිකානු ඩො. මිලියන 19.30 ක් වන අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රාජ්‍ය අරමුදලේ සමුච්චිත භාවිතය ඇමරිකානු ඩොලර් මිලියන 10.25 ක් පමණක් වූ අතර එය එකඟ වූ මුදලින් සියයට 53 ට සමාන විය. මෙම ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් 31 වන දින අවසන් කිරීමට නියමිත අතර ඉදිරි වසර දෙක තුළ එකඟ වූ රජයේ අරමුදලින් ඉතිරි සියයට 47 භාවිතා කිරීම අවිනිශ්චිතය.	2021 2022 2023	නියමිත කාල රාමුව තුළ ඉලක්කය සම්පූර්ණ කළ යුතුය.	2024 මැයි මස අවසන් වන විට, රජයේ අරමුදල් භාවිතය සියයට 72 ක් වන අතර මෙම වසර තුළ කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සියයට 87 ක ප්‍රගතියක් කරා ළඟා වීමට සැලසුම් කර ඇත.	2024 අගෝස්තු මස අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය ඇමෙරිකානු ඩොලර් මිලියන 19.3ක් වන නමුත් සාක්ෂාත් කර ගත් ඉලක්කය ඇමෙරිකානු ඩොලර් මිලියන 14.17ක් (ප්‍රතිශතයක් ලෙස - 73) වන බව නිරීක්ෂණය වූ බැවින් ව්‍යාපෘතියේ කාල සීමාව අවසන් වන විට අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය හැක.

02. ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා අංශය

2.1 ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2015 දෙසැම්බර් 07 දින ආරම්භ කරන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 5685 යටතේ රු. මිලියන 24,750 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,840ක් විය. ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දී දීර්ඝ කර 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2022 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	200	150	173.88
විදේශ අරමුදල්	5,249	2,669.90	5,724.87
මුළු වත්කම්	31,773	63,877	60,357
මුළු වගකීම්	880	855	836
මුළු අරමුදල්			
විදේශ ණය මහින්	24,248	26,917.90	32,640.53
දේශිය අරමුදල් මහින්	854	1004.20	1,178.08

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(ආ)	නාගරික හා ග්‍රාමීය ජල සම්පාදන යෝජනා ක්‍රම තිස් අටක්, ප්‍රතිසංස්කරණය කිරිම, පොදු සනීපාරක්ෂක සේවා සැපයීම, ස්වදේශික සනීපාරක්ෂක හා පාසල් සනීපාරක්ෂක ව්‍යාපෘති සඳහා අවස්ථා 01 සිට අවස්ථා 07 දක්වා	2023	අපේක්ෂිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කළ යුතුය.	සිදු වූ ප්‍රමාදයන් සම්පූර්ණයෙන්ම වළක්වා ගත නොහැකි විය. එවැනි තත්ත්වයන් යටතේ, දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට සහාය වීම සඳහා	2024.12.31 දින වන විට නිම කිරීමට කටයුතු කරමින් පවතී.

	කාලය දීර්ඝ කිරීම් ලබා දීමෙන් පසුව පවා ව්‍යාපෘති තිස් අටක දින 330 සිට දින 2,158 දක්වා සැලකිය යුතු කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. මෙම කාල ප්‍රමාදය නිසා ප්‍රතිලාභීන්ටඅපේක්ෂිත ප්‍රතිලාභ නොලැබීම, ව්‍යාපෘති පිරිවැය ඉහළ යාම, ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සඳහා අමතර පිරිවැයක් දැරීම වැනි අහිතකර බලපෑම් සිදු වී තිබුණි.			ව්‍යාපෘතියට සුදුසු පරිදි කාලය දීර්ඝ කිරීමට සිදු විය.	
(ආ)	කොටියාකුඹුර ව්‍යාපෘතියේ වැලි පෙරන ටැංකිය මෙහෙයුම් සඳහා භාවිත නොකිරීම නිසා දරන ලද රු. මිලියන 1.7 ක පිරිවැය අනාර්ථික වී තිබුණි.	2023	පිරිසිදු ජලය බෙදා හැරීම සඳහා වැලි පෙරහන භාවිතා කළ යුතුය.	පෙරහන් ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් ප්‍රජා මූල සංවිධාන (ප්‍ර.මූ.ස) සමඟ සාකච්ඡා කරන අතර වැලි පෙරහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමතර කාර්යයන් සඳහා ප්‍රජා දායකත්වය භාවිතා කළ යුතුය.	ව්‍යාපෘතිය පෙරහන් ක්‍රියාත්මක කිරීම සඳහා CBO සමඟ සාකච්ඡා කරමින් සිටී.
(ඇ)	රටේ ආර්ථික තත්ත්වය මත ද්‍රව්‍යවල මිල ඉහළ යාමත් සමඟ එක් කොන්ත්‍රාත්කරුවෙකු කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ඩී.එස්.ඩී සහ දැරණියගල ඩී.එස්.ඩී හි ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති දෙක ප්‍රතිසංස්කරණය කිරීම අත්හැර දමා තිබුණි.	2023	වැය කරන ලද පිරිවැය ප්‍රයෝජනයට ගැනීමට කොන්ත්‍රාත්තු ක්‍රියාත්මක කළ යුතුයි.	කොවිඩ් 19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල ගණන් නිසා විෂය පථය අඩු විය.	විෂය පථය අඩුකර නව කොන්ත්‍රාත්තු පිරිනමා අඩුවූ විෂය පථයට අනුව පමණක් 2024 සැප්තැම්බර් 30 දින වන විට වැඩ නිමකර තිබුණි.

(ඇ)	උපරිම ජල සනත්වය පී.පී.එම් 250 ක් විය යුතු වුවත් ජල සනත්වය පී.පී.එම් 1,805 ක් වීම නිසා 2019 දී නිම කරන ලද රු. මිලියන 26 ක් වටිනා ජල සම්බන්ධතා 250 කට ජලය බෙදාහරින රිදීමාලියද්ද ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය වසර දෙකකට වැඩි කාලයක් තිස්සේ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පද්ධතිය භාරදීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම.	ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ (මණ්ඩලය) නළ මාර්ග දැන් ක්‍රියාත්මක වේ. එබැවින්, ප්‍ර.මූ.ස නල පද්ධතිය මණ්ඩලයේ නල පද්ධතියට සම්බන්ධ කරන ලෙස සහ ප්‍ර.මූ.ස පවරා ගන්නා ලෙස ප්‍රජාව විසින් මණ්ඩලයෙන් ඉල්ලා ඇත.	ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පද්ධතිය භාරදීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත .
(ඉ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 ඡේදයට පටහැනිව රු. මිලියන 599 ක් වූ කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රසම්පාදනය කුඩා සංරචකවලට බෙදා ක්‍රියාත්මක කර තිබූ බැවින්, ව්‍යාපෘතියේ තීරණාත්මක මාර්ග සැලකිල්ලට නොගැනීම නිසා ව්‍යාපෘතියේ සමහර සංරචක ප්‍රධාන සංරචක සම්පූර්ණ කිරීමට පෙර නිම කර තිබූ බැවින් සමහර වත්කම් භාවිතයට පෙර හානි වීමට ඉඩ තිබුණි.	2023	ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් අනුකොටස් කිරීම සහ කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් සොයා ගැනීමට විමර්ශනය කළ යුතුය.	සැලකිය යුතු විශාලත්වයකින් යුත් යම් කොටසක සැලසුම් අවසන් වූ පසුව, අදාළ පැකේජය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ විය.	නිවැරදිවීමක් සිදු වී නොමැති අතර අනාගත ප්‍රසම්පාදනයන්හිදී මේ පිළිබඳ සැලකිල්ලට ගත යුතුය.
(ඊ)	ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 වැනි දින අවසන් කිරීමට අපේක්ෂිත වූ අතර එදින සිට ණය ආපසු ගෙවීම ආරම්භ කළද, නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වූ අතර	2023	ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාව ඉටු කිරීම සඳහා ව්‍යාපෘති කටයුතු කඩිනම් කළ යුතුය.	මුල් ව්‍යාපෘතියේ අවසන් අදියරේදී අනපේක්ෂිත කොවිඩ්19 වසංගතය, ආර්ථික අර්බුදය සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් ව්‍යාපෘති	ව්‍යාපෘතිය නියමිත කාලපරිච්ඡේදය තුල අවසන් නොකර 2025.05.30 දක්වා එනම් වසර 05 මාස 06 ක කාලයක් අතිරේක මූල්‍යනයක් යටතේ දීර්ඝ කර

	ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබියදී එ.ජ.ඩො.මිලියන 18 ට සමාන රු. මිලියන 5,080 ක ණය ආපසු ගෙවීම් 2020 වසරේ සිට මහා භාණ්ඩාගාරය විසින් සිදු කර තිබුණි.			කාලය දීර්ස කර ඇත.	ගෙන ඇත.
(උ)	ව්‍යාපෘති ඇගයීම් ලේඛනවල 38 වැනි වගන්තියේ අවශ්‍යතාවයට අනුව, ග්‍රාමීය ජල සම්පාදන නව ව්‍යාපෘති සහ ග්‍රාමීය ජල සම්පාදන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිවලට අදාළව රු. මිලියන 551 ක ප්‍රජා දායකත්වය ලබාගෙන හෝ වාර්තා කර නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී මලයාලපුරම් ප්‍රදේශයේ නළ එලීම සඳහා රු. මිලියන 52 ක ප්‍රජා දායකත්වය ලබාගෙන නොතිබුණි.	2023	විශේෂ හේතූන් නොමැති විට ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ කොන්දේසිවලට අනුකූල විය යුතුය.	උතුරු පළාතේ නැවත පදිංචි කිරීමේ ජනතාවගේ ගැටළු සලකා බලමින් කිලිනොච්චි සහ මුලතිව් දිස්ත්‍රික්කවල ප්‍රජා දායකත්වය ඉවත් කර ඇත.	මෙම දායකත්වයන් ලබා ගෙන නොමැත.
(ඌ)	කොන්ත්‍රාත් ලේඛනවල කොන්දේසි අංක 43 ට පටහැනිව, ව්‍යාපෘතිය විසින් කිලිනොච්චි දිස්ත්‍රික් ව්‍යාපෘති සඳහා සෘජුවම උප කොන්ත්‍රාත්කරුවන් දාහතර දෙනෙකුට රු. මිලියන 19 ක් ගෙවා තිබුණි.	2023	කොන්ත්‍රාත්කරුව න්ට ගෙවීම් කරන විට, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුගමනය කළ යුතුය.	කොන්ත්‍රාත් කොන්දේසිවල 8.1 උප වගන්තිය අනුව, සේවා යෝජකයාට උප කොන්ත්‍රාත්කරුවන් ට සෘජුවම ගෙවීමේ හැකියාව වළක්වා නොමැත.	නිවැරදි කර නොමැත.

(එ)	කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසිවලට අනුව, කොන්ත්‍රාත් අවසන් කිරීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රතීක (Septage) පවිත්‍රාගාරයට අදාළව රු. මිලියන 84 ක සහ පරන්තන් හින්දු විද්‍යාලයේ පාසල් සනීපාරක්ෂක ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 2.3 ක ඇවර කරන ලද අලාභ ව්‍යාපෘතිය විසින් අයකර ගෙන නොතිබුණි.	2023	කොන්ත්‍රාත් ගිවිසුමට අනුකූල විය යුතු අතර කොන්ත්‍රාත් කොන්දේසි කඩ කළ අය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉහළ භූගත ජල මට්ටම පරන්තන් හින්දු විද්‍යාලයේ පූතික (Septic) ටැංකිය ඉදිකිරීමේ ප්‍රමාදයට බලපා ඇත. එබැවින්, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට කාල දීගුවක් ලබා දී ඇත.	පිළිතුරට අනුව නිවැරදි නොවී පවතින අතර ව්‍යාපෘති සැලසුම් කිරීමේ දෝෂ ඇත.
(ඒ)	මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතියේ රු. මිලියන 695 ක් වූ සමස්ත වැඩවලින් රු. මිලියන 236 ක් හෙවත් සමස්ත ව්‍යාපෘති වටිනාකමෙන් සියයට 33.91 ක් ව්‍යාපෘතිය විසින් මග හැර තිබුණි. ව්‍යාපෘති විෂය පථය විශාල ලෙස වෙනස් වී ඇතත් නව ප්‍රසම්පාදනයකට නොගොස් අමතර වැඩ ඇණවුම් සඳහා රු. මිලියන 29 ක් සහ විශේෂ අනුපාත ලේඛණගත වැඩ සඳහා රු. මිලියන 238 ක් ව්‍යාපෘති පිරිවැයට එකතු කර තිබුණි.	2023	අනවශ්‍ය විචලනයන් සහ පිරිවැය වළක්වා ගැනීම සඳහා සැලැස්ම සහ ඇස්තමේන්තුව සැකසීමට පෙර ශක්‍යතා අධ්‍යයනය කළ යුතුය.	මුලන්කාවිල් ව්‍යාපෘතියේ සංකීර්ණ ස්වභාවය සහ වැඩ බිම් තත්ත්වය සහ වෙනත් හේතූන් සැලකිල්ලට ගනිමින් ව්‍යාපෘතිය සතුටුදායක ලෙස නිම කිරීම සඳහා අවශ්‍ය පරිදි සැලකිය යුතු වෙනස්කම් හඳුන්වා දීමට සිදු විය.	නිවැරදි වී නොමැත.
(ඔ)	ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති කාර්ය සාධන වාර්තාවට අනුව, අතුරු ගෙවීම් සහතික අනුමත කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරු විසින් අතුරු ගෙවීම් සහතික	2023	ප්‍රමාද ගාස්තු සහ බැඳීම් ගාස්තු වළක්වා ගැනීම සඳහා පියවීම් පටිපාටිය කඩිනම් කිරීම.	කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘතිය වෙත ගෙවීම් අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී සහ පාලනය කළ නොහැකි හේතූන්	මේ දක්වා ගෙවා නොමැත.

	ඉදිරිපත් කිරීම හා විචලන විධාන ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 2,340 ක් වටිනා භෞතික වශයෙන් නිම කරන ලද ව්‍යාපෘති පහළොවක මූල්‍ය ප්‍රගතිය සියයට 0 සිට 66 දක්වා පරාසයක පවතී.			මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය විසින් අතුරු ගෙවීම් සහතික නිකුත් කිරීමේදී ප්‍රමාදයන් සිදු වූ බවට අප එකඟ වේ.	
(ඕ)	ජල හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජල හා සනීපාරක්ෂක අංශයේ අත්පොතෙහි ඇතුළත් විස්තීර්ණ උපායමාර්ගික සැලැස්ම සහ මාර්ග සිතියමට අනුව, ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් ව්‍යුත්පන්න වූ මූලාශ්‍රය ප්‍රකාරව 2020-2030 කාලසීමාව තුළ මොණරාගල, කිලිනොච්චි සහ මුලතිව් සඳහා ප්‍රතීක පවිත්‍රාගාර අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, එම දිස්ත්‍රික්කවල ප්‍රතීක පවිත්‍රාගාර සඳහා ව්‍යාපෘතිය රු. මිලියන 345.53 ක් ආයෝජනය කර තිබූ අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නිම කරන ලද ප්‍රතීක පවිත්‍රාගාරයට ප්‍රවේශ මාර්ගය නිම නොකිරීම හේතුවෙන් 2023 පෙබරවාරි මාසයේ සිට එය ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	ව්‍යාපෘතිය විසින් 2020-2030 ජාතික සැලැස්ම සඳහා අවශ්‍යතා හදුනාගෙන තිබුණි. එම නිසා, ජාතික සැලැස්මට පටහැනිව මෙම ප්‍රතීක පවිත්‍රාගාර සංවර්ධනය වූයේ කෙසේද යන්න සොයා බැලිය යුතුය.	පළාත් පාලන ආයතනවල ඉල්ලීම් මත සහ මෙම නාගරික ප්‍රදේශවල මළ අපද්‍රව්‍ය ආරක්ෂිතව බැහැර කිරීමේ ඉල්ලීම් තක්සේරු කිරීමෙන් පසු එම ප්‍රතීක පවිත්‍රාගාර ව්‍යාපෘති තුන ආරම්භ කර ඇත.	කිලිනොච්චි ප්‍රතීක පවිත්‍රාගාර සඳහා ප්‍රවේශ මාර්ගය සම්පාදනය කිරීමේ අදියරේ පවතී.

(ක)	ව්‍යාපෘතියේ කාලසීමාව තුළ දිස්ත්‍රික්ක 07 තුළ ඉදිකිරීමට නියමිත වැසිකිළි 24,000, වැසිකිළි 22,000 ක් ලෙස වෙනස් කරන ලද අතර එයින් වැසිකිළි 21,944 ක් හෙවත් සියයට 91 ක් පමණක් නිම කර තිබුණි. ව්‍යාපෘති කාලසීමාව අවසානයේදී සැලසුම් කරන ලද ගෘහස්ථ වතු සනීපාරක්ෂක ඒකක 3,000 අතරින් ඒකක 2,390 ක් හෙවත් සියයට 79 ක් පමණක් නිම කර තිබුණු අතර සැලසුම් කරන ලද ආයතනික සනීපාරක්ෂක ඒකක 14 අතරින් ඒකක 07 ක් හෙවත් සියයට 50 ක් පමණක් නිම කර තිබුණි.	2023	අනවශ්‍ය පිරිවැය මඟහරවා ගැනීම සඳහා මූලික අදියරේදී සැබෑ අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් පසු ළඟා කරගත හැකි ඉලක්කයක් ස්ථාපිත කළ යුතුය.	පදිංචිය අතහැර දැමීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ඉහළ මිල උච්චාවචනයන් හේතුවෙන් සැලසුම් කළ ඉලක්කයෙන් තනි වැසිකිලි ප්‍රතිලාභීන් 607 දෙනෙකු පමණක් ඉවත් වී ඇත.	අනාගතයේදී අනුගමනය කරන බව දන්වා ඇත.
(ග)	ව්‍යාපෘතියේ මූලික ක්‍රියාකාරී සැලැස්මට අනුව, කෑගල්ල, මොණරාගල සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල රු. 250,000 බැගින් වූ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රතිලාභීන්ගේ සනීපාරක්ෂක ඒකක 84 ක් ඉදිකිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය අවසන් වන විට කෑගල්ල සහ මොනරාගල දිස්ත්‍රික්කවල ඒකක 48 ක් හෙවත් සියයට 57 ක් පමණක් ඉදිකර තිබුණු අතර කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු අත්හිටුවා තිබුණි.	2023	අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීමේදී අවශ්‍යතා තක්සේරු කිරීම සිදු කළ යුතුය.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අදියරේදී, සනීපාරක්ෂක පහසුකම් සැපයීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශය ද එම ප්‍රතිලාභීන් හඳුනාගෙන ඇති බව ව්‍යාපෘතියට දැන ගැනීමට ලැබී ඇත. එබැවින්, එලෙස හඳුනාගත් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇත.	අනාගතයේදී අනුගමනය කරන බව දන්වා ඇත.

(ච)	කොන්ත්‍රාත්කරුවන්ට කාලය දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දීමෙන් පසුවත් සහ ව්‍යාපෘති කාලයෙන් මාස 03 ඉක්මවා ඇතත් මෙම ව්‍යාපෘතියමඟින් නාගරික කාණ්ඩය - 02 සහ ග්‍රාමීය හා වතු කාණ්ඩයේ සැලසුම් කළ ජල සම්බන්ධතා 61,925 අතරින් සම්බන්ධතා 49,423 ක් හෙවත් සියයට 80 ක් පමණක් ලබා දී තිබුණු අතර නාගරික කාණ්ඩය - 01 හි සැලසුම් කළ ජල සම්බන්ධතා 21,702 අතරින් සම්බන්ධතා 15,051 ක් හෙවත් සියයට 69 ක් ලබා දී තිබුණි.	2023	අනවශ්‍ය වියදම් මගහරවා ගැනීම සඳහා ළඟා කරගත හැකි ඉලක්ක මූලික අදියරේදීම ස්ථාපිත කළ යුතුය.	2024 මැයි 31 වන දින දක්වා ප්‍රගතිය 15,358 ක් හෙවත් සියයට 71 ක් විය. ග්‍රාමීය හා වතු ජල සම්පාදන යෝජනා ක්‍රමවල නිවාස සම්බන්ධතා ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ප්‍ර.මූ.ස/ඊ.ඩබ්ලිව්.එච් .සී.එස් සමඟ එක්ව කටයුතු කරයි.	2024 ජූලි වන විට ලඟා කරගෙන ඇති බව වාර්තා කර ඇත.
(ජ)	උඩුගොඩ සහ කොටියාකුඹුර ප්‍රදේශයේ ප්‍ර.මූ.ස 195 ක ජල සාම්පල පරීක්ෂා කිරීම සඳහා ඉදිකරන ලද රු. මිලියන 8 ක වටිනාකමකින් යුත් රසායනාගාර දෙකක් භෞතික පරීක්‍ෂණයට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක නොවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් ප්‍ර.මූ.ස වරින් වර ගුණාත්මකභාවය පරීක්ෂා නොකර ජලය බෙදාහරියි.	2023	2024 ජුනි 30 දින දක්වා සම්පූර්ණයෙන්ම භාර දී නැත. එම නිෂ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කළ යුතුය.	සියලුම රසායනාගාර උපකරණ මණ්ඩලය වෙත භාර දී ඇත.	සියලුම රසායනාගාර උපකරණජල සම්පාදන මණ්ඩලය වෙත භාර දී ඇත. නිෂ්ක්‍රීය ගොඩනැගිලි සම්බන්ධව තීරණයක් ගෙන නොමැත.
(ට)	විගණන පරීක්‍ෂණයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘති 13 ක් අතරින්	2023	හේතු සොයා බලා පිරිසිදු ජලය බෙදා හැරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	ජල සාම්පල පරීක්ෂණ වාර්තා මත පදනම්ව, එස්.එල්.එස් ප්‍රමිතිය	ප්‍ර.මූ.ස අඛණ්ඩව දැනුවත් කරන බව දන්වා ඇත.

	04 කම පිරිපහදු කළ ජල සහ පිරිපහදු නොකළ ජල සාම්පල යන දෙකෙහිම ජල පරීක්ෂණවල ප්‍රතිඵල අසමත් විය.			තුළ පානීය ජලය වැඩිදියුණු කිරීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය විසින් ප්‍ර.මූ.ස වෙත අඛණ්ඩව දැනුවත් කරයි.	
(ත)	2019 මාර්තු 15 දිනැති චක්‍රලේඛ අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අවශ්‍යතාවයට අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය සේවකයින් 17 දෙනෙකු යොදවා තිබුණි.	2023 2021	චක්‍රලේඛවල විධිවිධාන දැඩි ලෙස පිළිපැදීම.	ව්‍යාපෘති ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කෙටි කාලීන සේවා කොන්ත්‍රාත්තු මඟින් අවශ්‍ය කාර්ය මණ්ඩලය කුලියට ගෙන ඇත.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් ලබාගෙන නොමැත.
(ද)	දුර්වල ප්‍රගතියක් සහිත කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ව්‍යාපෘති හතක් ප්‍රදානය කර ලබා දී තිබූ රු. මිලියන 52.57 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලක් ඵලදායී ලෙස යොදා නොගෙන ඔවුන් ළඟ තබාගෙන තිබුණි.	2022	නව කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර දැනට සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතුය.	මෙම අවස්ථාවේදී, ඔරුබැදිවැව II අදියර සහ III අදියර කොන්ත්‍රාත්තුවේ ප්‍රධාන නල එළීමේ කටයුතු සහ විද්‍යුත් යාන්ත්‍රික කටයුතු අවසන් කර ඇත. උල්හිටිය තුළමුවෙන් ජල පවිත්‍රාගාරයට වතුර පොම්ප කරමින් ඇත. සෝදා හැරීමේ සහ විෂබීජ නාශක කටයුතු සිදු කරමින් පවතී. නිවාසවලට සම්බන්ධතාවය ලබා දීම සිදු කළ යුතුව ඇත.	නිවැරදි වී නොමැති අතර කාල ප්‍රමාද සහිතව එදිනට කොන්ත්‍රාත් අවසන් නොකල කොන්ත්‍රාත් කරුවන්ට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

(න)	විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී උපදේශන සේවා සඳහා රු. මිලියන 961.14 කට සමාන මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සිදු කරන ලද නියදි භෞතික විගණනවලට අනුව, කොන්ත්‍රාත් දුර්වල ලෙස නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම හේතුවෙන් ව්‍යාපෘති අවසන් කිරීම, ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීම, විචලනයන් අනුමත කිරීම, අමතර වැඩ අනුමත කිරීම, නිල නිවාස ඉදිකිරීම් නැවත සැලසුම් කිරීම යනාදිය අඛණ්ඩව සිදු කර තිබුණි.	2022 2021	දුර්වලතා මඟහරවා ගැනීම සඳහා උපදේශකයා සමඟ කළමනාකාරිත්වය ශක්තිමත් එකඟතාවකට පැමිණිය යුතු අතර උපදේශකයින්ගේ දුර්වල කාර්ය සාධනයට එරෙහිව පියවර ගත යුතුය.	අයි.එස්.සී උපදේශක තෝරා ගැනීම සඳහා ගුණාත්මකභාවය සහ පිරිවැය පදනම් කරගත් තේරීම් ක්‍රමයක් යොදා ගන්නා ලදී.	තත්වය එසේම පවතී.
(ප)	නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලයේ පරිගණක සහ කාර්යාල උපකරණ ඇතුළු ස්ථාවර වත්කම් අයිතම 125ක් ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට නිදහස් කර තිබුණි.	2021	ව්‍යාපෘතියේ 3 වන සංරචකයේ කොන්දේසි අනුව හඳුනාගත් පාර්ශවකරුවන් වෙත ව්‍යාපෘතියේ වත්කම් මුදා හැරීමේදී ජල සම්පාදන අමාත්‍යාංශ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වීම	ව්‍යාපෘතියේ 3 වන සංරචකයේ කොන්දේසි අනුව මණ්ඩලයේ වතු නිවාස සංවර්ධන භාරයේ සහ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා හඳුනාගෙන සපයා ඇත.	අමාත්‍යාංශ විගණන කමිටුවෙහි නිර්දේශ මත වත්කම් නිදහස් කිරීම කමිටුවක් හරහා සිදු කරයි.

2.2. ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය -අතිරේක මූල්‍යනය

2021 සැප්තැම්බර් 04 දී ආරම්භ කරන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවේ ණය ගිවිසුම් අංක 9255 LK යටතේ රු. මිලියන 12,000 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 235 ක් සහ ප්‍රජා දායකත්වය රු.මිලියන 588ක් විය. ව්‍යාපෘතිය එක් අවස්ථාවකදී දීර්ඝ කර 2025 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ද 2023 වර්ෂය සඳහා තත්ත්වාගණනය නොකළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	-	-
විදේශ අරමුදල්	380.10	5,449
මුළු වත්කම්	2,196	7,218
මුළු වගකීම්	65	591
මුළු අරමුදල්		
විදේශ ණය මගින්	2,131	6,627
දේශිය අරමුදල් මගින්	-	-

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් දැක්වේ.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රෙය් 2 වන පරිච්ඡේදයේ 2.3 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රතීක (Septage) පවිත්‍රාගාරයේ	2023	ප්‍රසම්පාදනය ආරම්භ කිරීමට පෙර මාර්ගෝපදේශයට අනුව සියලුම නිෂ්කාශන තහවුරු කර ගත යුතු අතර ව්‍යාපෘති අරමුදල්	කෙටුම්පත් පරිසර ඇගයීම් වාර්තා සකස් කර ඇති අතර අවසාන වාර්තාව වැඩිදියුණු කිරීම සඳහා ලෝක බැංකුව සිය අදහස් දක්වා ඇත. මධ්‍යම	අන්‍යෝන්‍ය එකඟතාවයකින් කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි.

	ඉදිකිරීම් කටයුතු සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයෙන් ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලෙස කළ ඉල්ලීමට පෙර ප්‍රසම්පාදන ආයතනය සමාජ බලපෑම් තක්සේරුව, පාරිසරික බලපෑම් තක්සේරුව වැනි ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර නොතිබුණි. කෙසේ වෙතත්, මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය නොලැබීම සහ මහජනතාවගෙන් ලද විරෝධතා නිසා පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණි. අත්හැර දැමූ දිනය දක්වා කළ වැඩ සඳහා කොන්ත්‍රාත්කරු රු. මිලියන 40.2 ක් ඉල්ලා තිබුණි. එබැවින්, ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වියදමක් විය.	අනාර්ථික ලෙස භාවිත වන පරිදි නොසැලකිලිමත් ලෙස කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.	පරිසර අධිකාරිය විසින් ඉල්ලා ඇති පරිදි අනුමැතිය ලබා ගැනීම සඳහා වන සියලුම ලියකියවිලි සහ පැහැදිලි කිරීම් ඉදිරිපත් කර ඇත. තවද, ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් යෝජිත ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් රන්පොකුණගම නිවාස යෝජනා ක්‍රමයේ අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රදේශය තුළ අක්කර 02 ක ඉඩමක් වෙන් කර දී ඇත.	
(ආ)	කොන්ත්‍රාත්කරු විසින් 2023 අතුරු ගෙවීම් සහතික සහ විචලන නියෝග ඉදිරිපත් කිරීම සහ ඒවා අනුමත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 2,830 ක් වටිනා ව්‍යාපෘති 12 ක මූල්‍ය ප්‍රගතිය භෞතික ප්‍රගතියට වඩා අඩු විය.	ගෙවීම සඳහා අනුමැතිය ලබා දී අත්තිකාරම්වල අදාළ කොටස අඩු කරන තුරු අත්තිකාරම් වියදම් ලෙස ගත නොහැක. එබැවින්, සහතික කළ වැඩ සඳහා ගෙවීමේ ක්‍රියාවලිය සිදුකර යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වේ. කෙසේ වෙතත්, සියයට 20 ක අත්තිකාරම් ගෙවීම මූල්‍ය ප්‍රගතියට ඇතුළත් කර නොමැත. එබැවින්, සියයට 20 ක අත්තිකාරම් ගෙවීම මූල්‍ය ප්‍රගතියට ඇතුළත් කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.

(ඈ)	ඉදිකිරීම් ව්‍යාපෘති 23 ක් සම්බන්ධයෙන්, ව්‍යාපෘති කාලසීමාව නිසි ලෙස සැලසුම් නොකිරීම හේතුවෙන් දින 17 සිට දින 244 දක්වා සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වී තිබුණි.	2023	පරිසරය සහ අනෙකුත් බලපෑම් තක්සේරු කිරීමෙන් පසු ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ යුතුය. එබැවින්, මෙම ව්‍යාපෘතියේ අසාමාන්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා වැඩ කටයුතු අධීක්ෂණය නොකිරීමේ වගකීම කළමනාකරණයට පැවරේ.	අයහපත් කාලගුණික තත්ත්වය, අධික වර්ෂාපතනයෙන් වැඩ බිම් ජලයෙන් යට වීම ප්‍රමාදයට හේතු විය. අස්වනු නෙළීම අවසන් වන තුරු කුඹුරු ප්‍රදේශයේ නල එළීමේ කටයුතු නතර කිරීමට සිදු වේ. වසරේ මාස 2-3 ක් හැර සාමාන්‍යයෙන් සමහර ප්‍රදේශ ජලයෙන් යටවේ.	ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඈ)	මූලික අපේක්ෂිත නිම කිරීමේ දිනය 2023 දෙසැම්බර් 31 දින වුවත් කොනාවිල් ජල සම්පාදන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය 2024 මාර්තු 31 වන විට පිළිවෙළින් සියයට 47 ක් සහ සියයට 25.94 ක් විය. භෞතික සත්‍යාපනය සිදු කරන ලද 2023 ඔක්තෝබර් 05 වැනි දිනට මිලිමීටර් 110 පීවීසී පයිප්ප නොමැති වීම හේතුවෙන් සැලසුම් කර තිබූ කි.මීටර් 69 න් කි.මීටර් 12.23 ක් පමණක් නිම කර තිබුණි. එබැවින්, රු. මිලියන 164.4 ක් වැය කර ඇතත් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය සැලසුම් කළ පරිදි ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	2023	අනවශ්‍ය ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය සඳහා නියමිත වේලාවට ද්‍රව්‍ය ලබා ගත හැකි බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය.	අයහපත් කාලගුණික තත්ත්වය සහ අස්වනු නෙළීම අවසන් වනතුරු කුඹුරු ප්‍රදේශයේ නළ එළීමේ කටයුතු නතර කිරීමට සිදුවීම නිසා ප්‍රමාද වීම. භෞතික ප්‍රගතිය 70% කි.	ප්‍රමාදයන් සහිතව ක්‍රියාත්මක වේ.

(ඉ)	පරිසර අධිකාරිය විසින් ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දී තිබියදිත් රු. මිලියන 180 ක ඇස්තමේන්තුගත වියදමින් ඉදිකිරීමට සැලසුම් කර තිබූ මාතර දිස්ත්‍රික්කයේ කොටවිල පිහිටි ප්‍රතීක පවිත්‍රාගාරය සඳහා ප්‍රසම්පාදන කටයුතු 2024 මැයි 31 දින දක්වා සිදු කර නොතිබුණි. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2022 සැප්තැම්බර් 01 වන දින පවිත්‍රාගාරය සඳහා මාතර නගර සභාව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි.	2023	වැඩවල අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලබා ගැනීමේ හැකියාව ආරම්භයේදීම සහතික කළ යුතුය.	අතිරේක මූල්‍යකරණයේ සීමා කිරීම් හේතුවෙන්, කොටවිල ප්‍රතීක පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යා නොහැක.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොමැත.
(ඊ)	නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ව්‍යාපෘතියේ සියලුම කාර්ය මණ්ඩලවල වැටුප් වත්මන් මූල්‍ය ගිවිසුමෙන් වියදම් කර තිබුණද, 2022 ඔක්තෝම්බර් මාසයේ වැටුප් සඳහා අතිරේක මූල්‍ය වැඩපිළිවෙළින් රු. මිලියන 13.9 ක මුදලක් වැය කර ඇත. කෙසේ වෙතත්, අතිරේක මූල්‍ය භාවිතයට සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මිනිස් බල අවශ්‍යතාවය සැලසුම් කර නොතිබුණි.	2022	අතිරේක මූල්‍යකරණය යටතේ ව්‍යාපෘතිය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතාවය ස්ථාපිත කළ යුතුය.	වැටුප ව්‍යාපෘති කළමනාකරණ පිරිවැයක් වන බැවින් සහ එය අරමුදල් දෙකෙහිම "ව්‍යාපෘති කළමනාකරණ සහාය" යන 4 වැනි සංරචකය යටතේ වැටෙන බැවින්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය අරමුදල් දෙකම සඳහා නියැලී සිටින නිසා අපි මාස 1 ක වැටුප් ගෙවීම සඳහා අතිරේක මූල්‍යනය භාවිතා කර ඇත.	අදාල නිවැරදි කිරීම සිදුකර නොමැති අතර වර්ථමාන ගෙවීම් ව්‍යාපෘති සඳහා වෙන වෙනම සිදුකරයි.

2.3. කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය

2017 වර්ෂයේදී ආරම්භ කරන ලද කළු ගඟ ජල සම්පාදන පුළුල් කිරීමේ ව්‍යාපෘතිය ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය ණය ගිවිසුම් අංක එස්.එල්-පී 117 යටතේ රු. මිලියන 45,056 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 10,282 ක් විය. 2025 අප්‍රේල් දින වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 **වර්ෂ** වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදී 2021 සහ 2023 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 වර්ෂ සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	25	18	6.9
විදේශ අරමුදල්	365	184	-
මුළු වත්කම්	514	972	967
මුළු වගකීම්	40	294	282
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	452	635	635
දේශිය අරමුදල් මඟින්	25	43	50

එම තත්වාගණනය කළ විගණන මතයන් ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	විස්තරාත්මක සැලසුම, චිත්‍ර (drawings) සකස් කිරීම සහ කොන්ත්‍රාත් ලේඛන 2019 ජුනි මාසය වන විට පිළියෙල කර අවසන් කර ඇතත් 2023 වර්ෂය	2023	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමටත්, ඉතිරිව ඇති වැඩ නිම කිරීමටත්, ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමටත් ක්‍රියා කළ	2022 අප්‍රේල් මාසයේ සිට මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ	ණය ලබාදිම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

	අවසන් වන විටත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.	යුතුය.	ඒකක කාර්යාලයද තාවකාලිකව අත්හිටුවන ලදී. මෙය ව්‍යාපෘතියේ ප්‍රගතියට දැඩි ලෙස බලපා ඇත.	
(ආ)	ඉදිකිරීම් කටයුතු 2020 2023 ජූනි මස ආරම්භ කර 2023 සැප්තැම්බර් වන විට අවසන් කළ යුතු වුවත් 2023 දෙසැම්බර් 31 වන විටත් සියලු ඉදිකිරීම් පූර්ව ඉදිකිරීම් මට්ටමේ පැවතිණි.	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමටත්, ඉතිරිව ඇති වැඩ නිම කිරීමටත්, ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමටත් ක්‍රියා කළ යුතුය.	2022 අප්‍රේල් මාසයේ සිට මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකක කාර්යාලයද තාවකාලිකව අත්හිටුවන ලදී. මෙය ව්‍යාපෘතියේ ප්‍රගතියට දැඩි ලෙස බලපා ඇත.	ණය ලබාදීම ආරම්භ කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.4. නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය (අදියර - 01)

2016 වර්ෂයේදී ආරම්භ කරන ලද නගරාශ්‍රිත සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ සංවර්ධන ආයතනය ණය ගිවිසුම් අංක සීඑල්කේ 1013-01k යටතේ රු. මිලියන 13,224 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 4,524 ක් විය. ව්‍යාපෘතිය 2022 ජූනි 30 අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	29	44	17
විදේශ අරමුදල්	300	538	-
මුළු වත්කම්	1,125	1,775	1,842
මුළු වගකීම්	-	-	-
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	714	1220	1220
දේශිය අරමුදල් මඟින්	152	196	213

එම විගණන මතයන් ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	කළමනාකරණ සහය උපදේශනයේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට විට පිළිවෙලින් සියයට 61ක් සහ 63ක් විය.	2023	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ හැකියාව සොයා බැලිය යුතුය.	ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලෙස RAMP කමිටුව උපදෙස් දී තිබුණි	ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.
(ආ)	මලාපවහන කළමනාකරණ කුසලතා සංවර්ධන උපදේශන ප්‍රසම්පාදන ක්‍රියාවලිය	2023	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ හැකියාව සොයා බැලිය යුතුය.	ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලෙස RAMP කමිටුව	ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.

	2018 නොවැම්බර් මාසයේදී ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර, 2022 නොවැම්බර් මාසයේදී උපකරණ කොන්ත්‍රාත්තුව (පැකේජය 2) පමණක් ප්‍රදානය කර තිබුණි. අනෙකුත් කොන්ත්‍රාත්තු 2023 දෙසැම්බර් 31 වන විට ප්‍රදානය කර නොතිබූ අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 60 සහ 18 ක් විය.			උපදෙස් දී තිබුණි	
(ඇ)	මීගමුව අපජල බැහැර කිරීමේ පද්ධතිය සඳහා පොම්පාගාරයක් සහිත එකතු කිරීමේ පද්ධතියක් ඉදිකිරීමේ ලංසු ලේඛනය අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර 2022 ජනවාරි 25 දින අනුමැතිය ලබා ගත් අතර, ණය දෙන ආයතනය විසින් 2022 මැයි 12 දින විරෝධතා දක්වා නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ හැකියාව සොයා බැලිය යුතුය.	ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවන ලෙස RAMP කමිටුව උපදෙස් දී තිබුණි	ව්‍යාපෘතිය තාවකාලිකව නවතා ඇත.

2.5. මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

2010 දී ආරම්භ කරන ලද මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය ගිවිසුම් අංක SL-P99 යටතේ රු. මිලියන 17,922 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 4,060 ක් විය. ව්‍යාපෘතිය 2022 ජූනි 30 වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘති කාලය තුල අවස්ථා දෙකකදී දිර්ඝ කර 2024 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021 සහ 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කළ මතයක් ද 2023 වර්ෂ සඳහා තත්වාගණනය නොකළ මතයක් ද ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	95	37	35
විදේශ අරමුදල්	3,126	1,083	_
මුළු වත්කම්	20,480	21,624	20,232
මුළු වගකීම්	1,054	1,059	1,054
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	17,003	18,086	18,086
දේශිය අරමුදල් මඟින්	2,585	2,622	2,657

එම තත්වාගණනය කළ විගණන මතයන් ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	දිනකට ධාරිතාවය 14,000m^3 අප ජල පවිත්‍රාගාරයක් ඉදිකර	2023	ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුයි.	රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ණය	ණය ලබා දීම නැවත ආරම්භ කිරීමට කටයුතු කරමින්

	2020 මාර්තු මස සිට ක්‍රියාත්මක කරනු ලැබූ නමුත් ව්‍යාපෘතියේ පැකේජ 3 යටතේ දේපල සබඳතා ලබාදීම සම්පූර්ණ කර නොමැති නිසා 2024 ජුනි 30 දින වන විට දිනකට 5,500m^3 ධාරිතාවයේ ක්‍රියාත්මක වේ. අප ජල පවිත්‍රාගාරය අඩු ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉටුකර ගැනීමට නොහැකි වී ඇති අතර විවිධ ආර්ථික, සමාජීය ගැටළු රාශියක් පැන නැගී තිබුණි.			නොගෙවීමට රජය ගත් තීරණය හේතුවෙන් ණය දෙන ආයතනය 2022 මාර්තු මාසයේ සිට කොන්ත්‍රාත්කරුවන් ට බිල්පත් ගෙවීම අත්හිටුවා ඇති අතර, කොන්ත්‍රාත්තුව තාවකාලිකව අත්හිටුවා ඇත.	පවතී.
(ආ)	මුල් ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව**,** ව්‍යාපෘතියේ පැකේජය 3- දේපල සම්බන්ධතා කොටස **2017** වන විට අවසන් කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්**,** වසර හයකට වඩා වැඩි ප්‍රමාදයකින් පසුව සියයට **64** ක භෞතික ප්‍රගතියක් සහිතව කොන්ත්‍රාත්තුව අත්හිටුවන ලදී. මෙම කොන්ත්‍රාත්තුව දේපල සම්බන්ධතා 9,276 ක් ලබා දීමට සැලසුම් කර තිබූ නමුත් **2023** දෙසැම්බර් **31** වන විට අපවහන ජාලයට දේපල **4,088**ක් පමණක් සම්බන්ධ කර තිබුණි. මෙම සැලකිය යුතු	2023	සැලසුම් කළ කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතුය.	රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ණය නොගෙවීමට රජය ගත් තීරණය හේතුවෙන් ජයිකා ආයතනය 2022 මාර්තු මාසයේ සිට කොන්ත්‍රාත්කරුවන් ට බිල්පත් ගෙවීම අත්හිටුවා ඇත.	3 පැකේජය සඳහා සවිස්තරාත්මක සැලසුම් සහ දේපල සම්බන්ධතා කොන්ත්‍රාත්තු 2023 දෙසැම්බර් 31 වන විට සම්පූර්ණ කර නොමැත. කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කරමින් පවතී.

	ප්‍රමාදය **සමස්ථ** ව්‍යාපෘතිය කෙරෙහි බලපාන අතර ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම සම්බන්දව අවදානමක් පවතී.				
(ඇ)	කොන්ත්‍රාත්කරුගේ හිමිකම් පෑම් 1 සහ 2 යටතේ ආශ්‍රිත පිරිවැය සහ කාලය දිගු කිරීම සඳහා ඉල්ලීම් කර තිබූ නමුත් මේ සඳහා ව්‍යාපෘති ඉංජිනේරුවරයා එකඟ වී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, හිමිකම් අංක 1 සහ අංක 2 ආරවුල් විනිශ්චය මණ්ඩලය (DAB) වෙත යොමු කරන ලදී. සේවායෝජකයා ආරවුල් විනිශ්චය මණ්ඩලය ලබා දුන් තීරණය පිළි නොගත් අතර ඒ සඳහා එකඟ නොවීමේ නිවේදන නිකුත් කර තිබුණි. කොන්ත්‍රාත්කරු 2020 ජුනි මාසයේදී සාමූහික එකඟතා විසඳුමක් සඳහා යෝජනාවක් ඉදිරිපත් කර තිබූ අතර කොන්ත්‍රාත්කරුගේ හිමිකම් වටිනාකම ලෙස කොන්ත්‍රාත්කරු රු. මිලියන 1,745.20 ක් සහ රු. මිලියන 1,304.69 ක්ද, ඉංජිනේරු නියෝජිත රු. මිලියන 89.36 ක්ද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය රු. මිලියන 791.12 ක් සහ රු. මිලියන	2023	කොන්ත්‍රාත්කරුට කිසියම් ගෙවීමක් කිරීමට පෙර මණ්ඩල විචල්‍යතා කමිටුවක් සහ අමාත්‍යාංශ විචල්‍යතා කමිටුවක් මඟින් වටිනාකමේ නිරවද්‍යතාවය තහවුරු කිරීමට ක්‍රියා කළ යුතුය.	මෙම කොන්ත්‍රාත්තුව කැබිනට් ටෙන්ඩර් මණ්ඩලය හරහා ප්‍රදානය කර ඇති බැවින්, විචලනයන් සඳහා අනුමැතිය ලබාගැනීමට 2021 දෙසැම්බර් 29 වන දින ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.	කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.

	1,138.31 ක්ද යෝජනා කර තිබිණි. මෙම විවිධ වටිනාකම් යෝජනා කර තිබුණද එහි නිරවද්‍යතාවය, සම්පූර්ණත්වය හෝ වලංගුභාවය විධිමත් ලෙස තහවුරු නොකර, 2021 දෙසැම්බර් 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 4299(g) මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රු. මිලියන 1,304.69ක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට නිර්දේශ කර තිබුණි.				
(ඇ)	මලාපවහන ජාලයේ ස්ථාන 48 ක දිග මීටර් 1,855 ප්‍රදේශයක නල පද්ධතියේ නල ගිලා බැසීම් සිදුව තිබුණි. මෙහි ස්ථාන 38ක් ඇතුළුව මීටර් 1,520ක් වසර 2ක් පුරාවට වරින් වර සේදීම අවශ්‍ය බවට හඳුනාගෙන ඇති අතර, ස්ථාන 8ක් ඇතුළුව මීටර් 299ක් සෑම මාස 6කට වරක් අඛණ්ඩව වසර 100ක කාලයක් සේදීම අවශ්‍ය වන අතර ස්ථාන 2ක් ඇතුළුව මීටර් 36ක නල පද්ධතිය නැවත වරක් ඉදිකිරීම සඳහාත් කමිටු නිර්දේශ ලබාදී තිබුණි. කමිටු වාර්තාවට අනුව ප්‍රමාණවත් නොවන බිම් සැකසුම, ප්‍රමාණවත් නොවන සංයුක්ත කිරීම, තත්වයෙන් බාල අමුද්‍රව්‍ය භාවිතය, නැවන	2023	ව්‍යාපෘතිය වසා දැමීමට පෙර සියලු දෝෂ නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය.	අවසන් බිල්පත තවමත් ගෙවා නොමැති බැවින්, නල ගිලා බැසීම හේතුවෙන් කාලීනව නළ සේදීම සහ නල නැවත එළීම් කිරීම සඳහා වූ පිරිවැය වෙනුවෙන් පැකේජ 2 කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමට අවශ්‍ය නොවන බව දන්වා සිටී.	2023 දෙසැම්බර් 31 වන විට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර නොතිබුණි.

	පිරවුම් සඳහා සුදුසු නොවන ක්‍රමවේද යොදගැනීම, නල විධිමත්ව සම්බන්ධ නොකිරීම හා දිගුකාලීන අයහපත් කාලගුණික තත්වයන් නල ගිලා බැසීමට හේතු වී තිබුණි. ඒ අනුව නල ගිලාබැසීම් සඳහා කොන්ත්‍රාත්කරුගේ දෝෂයන් හා ව්‍යාපෘති කළමණාකරණ අංශයේ නිසි අධීක්ෂණයක් නොවීම ප්‍රධාන වශයෙන් හේතු වී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් නල ගිලා බැසීමේ දෝෂ තත්වය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අයකරගැනීමට තීරණය කර තිබූ රු.මි. 59.6 ක මුදල සම්බන්දයෙන් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය සහ පැකේජ 2 කොන්ත්‍රාත්කරු අතර ලිඛිත එකඟතාවයකට හෝ අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.				
(ඉ)	2024 මාර්තු 31 දින වන විටත් පැකේජ 3 කොන්ත්‍රාත්තුව අවසන් වී නොතිබීම හේතුවෙන් පරිශ්‍රයෙන් අපවිත්‍ර වූ ජලය මහවැලි ගඟට, මැද ඇලට සහ නුවර වැවට සෘජුවම මුදා හරිමින් දැඩි පරිසර දූෂණයක් ඇති කරන බව නිරීක්ෂණය විය.	2023	ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත්තුව තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් දේපල සම්බන්ධතා ලබා දිය නොහැක.	පරිශ්‍රයෙන් අපවිත්‍ර වූ ජලය මහවැලි ගඟට, මැද ඇලට සහ නුවර වැවට කෙළින්ම මුදා හරිමින් තිබිණි.

(ඊ)	2024 ජූනි 22 වැනි දින වන විට ව්‍යාපෘතිය මගින් ඉඩම් අත්පත් කර ගැනීම/මිලදී ගැනීම ආරම්භ කර වසර 20ක් ගතවී ඇතත් ව්‍යාපෘති කටයුතු සඳහා යොදාගෙන තිබූ ඉඩම් 09න්, ඉඩම් 02ක් පමණක් නිරවුල් කර තිබුණි.	2023	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි	මේ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ඉඩම් අංශය මගින් ඉදිරිපත් කරනු ලැබේ	ඉඩම් නිරවුල් කරගෙන නොතිබුණි.
(උ)	2023 ජූනි 22 දිනැති අංක LAND/CE/KAN/GEN /3833 ලිපිය මගින් ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි වශයෙන් රුපියල් 3,277,825ක් තක්සේරු කර තිබුණද ඊට ඉඩම් හිමියන් එකඟ නොවීම හේතුවෙන් ඉඩම් හිමියන් විසින් වන්දි සමාලෝචන මණ්ඩලයට අභියාචනය ක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ නමුත් මෙ සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් තීරණයක් ලැබී නොතිබුණි.	2023	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි	මේ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර ඉඩම් අංශය මගින් ඉදිරිපත් කරනු ලැබේ	අවසන් තීරණයක් ලැබී නොතිබුණි.

2.6. යාපනය හා කිලිනනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය

2011 දී ආරම්භ කරන ලද යාපනය හා කිලිනනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 2710 - එස්ආර්අයි (සාමාන්‍ය මෙහෙයුම්), අංක 2711 - එස්ආර්අයි (එස්එෆ්) (විශේෂ මෙහෙයුම්), අංක 3603-එස්ආර්අයි හා අංක 3604-එස්ආර්අයි (අතිරේක මූල්‍යනය) යටතේ රු. මිලියන 26,781.86 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 7,585.79 ක් විය. ව්‍යාපෘතිය 2022 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘති කාලය තුල ණය අංක 2710 අවස්ථා 3 දී සහ ණය අංක 2711 අවස්ථා 3 කදී දීර්ඝ කර ඇති අතර 2026 ජූනි වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021 සහ 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කළ මතයක් ද 2023 වර්ෂ සඳහා තත්වාගණනය නොකළ මතයක් ද ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	360	143	347
විදේශ අරමුදල්	3,519	6,062	8,966
මුළු වත්කම්	15,442	23,530	31,760
මුළු වගකීම්	676	791	1,120
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	11,306	17,369	26,335
දේශීය අරමුදල් මඟින්	1,344	2,487	2,699

එම තත්වාගණන කළ විගණන මතයන් ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ඇමරිකානු ඩොලර් මිලියන 11.5 ක් වටිනා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ සහ SCADA පද්ධතිය ස්ථාපිත කිරීමට	2023	නියමිත කාල සීමාව තුළ වැඩ නිම කළ යුතුය	යාන්ත්‍රික, විදුලි සහ **SCADA** කොන්ත්‍රාත්තුව **2025** ජූලි වන විට සම්පූර්ණ කිරීමට	දුර්වල කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලබයි.

	අදාල කොන්ත්‍රාත්තුව 2023 සැප්තැම්බර් 4 වන දින ප්‍රදානය කරන ලද අතර 2024 නොවැම්බර් 06 ට පෙර අවසන් කිරීමට නියමිතව ඇතත් 2023 දෙසැම්බර් 31 දිනට සියයට 5 ක දුර්වල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබුණි.			සැලසුම් කර ඇත.	
(ආ)	DN 01, TWTM 01, TWTM 02 නල එලීමේ කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ රුපියල් මිලියන 73 ක නැවත ලබාගැනීමේ තැන්පතු මුදල එම කටයුතු අවසන් වී වසර පහක් ගතවී ඇතත් ආපසු ලබා ගැනීම සිදුකර නොතිබුණි.	2023	මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් තැන්පත් මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතුය.	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් තැන්පතු ප්‍රතිපූරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටී.	තැන්පත් මුදල් ලබාගෙන නොමැත.
(ඇ)	මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකයේ ප්‍රසම්පාදන කටයුතු 2016 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර වසර 5 ක කාලයක් මේ සඳහා වැය කර 2021 ජනවාරි කොන්ත්‍රාත්තුව ප්‍රධාන කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම කොන්ත්‍රාත්තුවේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 100 ක් වුවත් සත්‍ය වශයෙන් සියයට 83 කාර්යසාදනයක් අත්කරගෙන තිබුනි. මෙම කොන්ත්‍රාත්තුවේ මෙහෙයුම් හා නඩත්තු කාලය වසර 7 වන අතර	2023	බලාගාරය නඩත්තු කිරීමට සහ තිරසාර ලෙස භාවිතා කිරීමට අරමුදල් මූලාශ්‍රයක් සොයා ගැනීමට ක්‍රියා කළ යුතුය	ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩ නිම කිරීමට ඇති ප්‍රමාදය ආවරණය කර ගැනීම සඳහා දැඩි අධීක්ෂණයකින් සිටින අතර මෙහෙයුම් සේවා කාලය ආවරණය කිරීම සඳහා ණය අවසන් දිනය දීර්ඝ කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කරනු ඇත.	2024 මාර්තු වන විටත් කොන්ත්‍රාත් කටයුතු අවසන් කර නොතිබුණි.

	ඒ සඳහා රු.මි. 3,693 ඇස්තමේන්තු කර තිබූ නමුත් ණය ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව ණය කාල සීමාව 2026 ජූනි 30 දිනෙන් අවසන් වන බැවින් 2026 සිට 2030 දක්වාවූ කාල සීමාව තුල මෙහෙයුම් හා නඩත්තු පිරිවැය ශ්‍රී ලංකා රජයට හෝ ජල සම්පාදන මණ්ඩලයට දරාගැනීමට සිදුවීමේ අවදානමක් පවතී.				
(ඇ)	මුහුදු ජලය ප්‍රති ආශ්‍රිත පිරියත ඒකකයෙහි කොන්ත්‍රාත්කරු 2023 මැයි 22 වැනි දින විවිධ හේතූන් නිසා ඇතිවූ මිල උද්ධමනය පදනම් කර ගනිමින් ඩොලර් මිලියන 12.7 ක හිමිකම් පෑමක් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, පහත සඳහන් හේතූන් මත මිල උද්ධමන ගැලපීම් සඳහා හිමිකම් පෑමට කොන්ත්‍රාත්කරුට අයිතියක් නොතිබූ බව නිරීක්ෂණය විය.	2023	ගෙවීම් කිරීමට තීරණ ගැනීමේදී ගිවිසුමේ කොන්දේසි සහ අනෙකුත් නීති රීති, තීරණ සහ මාර්ගෝපදේශවල ට අනුකූල විය යුතුය.	එකඟ වේ	කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී.
(i)	FIDIC කොන්දේසි වල අංක 08 විශේෂ කොන්ත්‍රාත් කොන්දේසි 13.8 මිල ගැලපීම් යටතේ මිල උද්ධමන ගැලපීම් සඳහා හිමිකම් පෑමට කොන්ත්‍රාත්කරුට හිමිකමක් නොමැති බවට ගිවිසුම් ගත වී තිබීම.				

(ii) අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් මිල විචලනය සඳහා ඉඩ ලබාදී ඇත්තේ කොන්ත්‍රාත් ගිවිසුම් වල මිල විචලනය සඳහා කොන්දේසි ඇතුලත් කර නොමැති අවස්ථාවලදී වුවත් මෙහිදී කොන්ත්‍රාත් ගිවිසුමේ උපග්‍රන්ථ 2 මිල ගැලපීම් කොන්දේසි ඇතුලත් කර ඇති නිසා අමාත්‍ය මණ්ඩල තීරණ පදනම් කරගනිමින් මිල විචලනය සඳහා හිමිකම් පෑමක් සිදුකල නොහැකි වීම.

(iii) කොන්ත්‍රාත් කොන්දේසි 13.8 අනුව ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ඇතිකරගෙන ඇති ද්වි පාර්ශවික ගිවිසුම ප්‍රකාරව නිර්මාණය කර ගොඩනැගීමේ කොන්ත්‍රාත්තු සඳහා උද්ධමනයේ බලපෑම ඉල්ලුම් නොකිරීම කොන්ත්‍රාත්කරු එකඟ වී ඇති බැවින් කොන්ත්‍රාත්කරු ඉල්ලා ඇති මිල විචලනය ගෙවීම් කිරීම ද්වි පාර්ශවික ගිවිසුමේ පාර්ශව දෙක විසින්ම අනුමත කල යුතු අතර එක් පාර්ශවයක් විසින් ගෙවීම් කලහොත් එය ගිවිසුම කඩ කිරීමක්

	බවට පත්වීම.				
(ඉ)	2020 දෙසැම්බර් 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ 38.33 (ආ) ඡේදයේ දක්වා ඇති පරිදි මුහුදු ජලය භාවිතයෙන් ලවණ ඉවත් කිරීමේ බලාගාරය බල ගැන්වීම සඳහා සුදුසු පුනර්ජනනීය බලශක්ති විකල්පයක් ක්‍රියාවට නැංවීම සඳහා අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 4 ක මුදලක් වෙන් කර ඇත. පුනර්ජනනීය බලශක්ති විකල්පයක් ලෙස සූර්ය බලාගාරයක් ස්ථාපිත කිරීම තීරණය කර තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	අවශ්‍ය අරමුදල් ලබා ගැනීම සඳහා අරමුදල් සපයන ආයතන සමඟ සම්බන්ධීකරණය කරන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලා ඇත.	අදාළ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර නැත.
(ඊ)	මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා උපයෝජනය නොකල ණය ශේෂය සඳහා බැඳීම් ගාස්තු ලෙස මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියන 464.8 ක් ගෙවා තිබුණි.	2023	මෙවැනි පාඩු අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	කොන්ත්‍රාත් ප්‍රමාදය මේ තත්ත්වයට හේතු විය.	අනාගත ව්‍යාපෘති සම්බන්දයෙන් මෙම තත්වය වලක්වා ගැනීමට ක්‍රියා කල යුතුය.

2.7 රත්මලාන / මොරටුව අපජල අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතිය

2019 දී ආරම්භ කරන ලද රත්මලාන / මොරටුව අපජල අපහරණ පියවර 01 අදියර 02 ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ සංවර්ධන ආයතනය සහ ශ්‍රී ලංකා රජය අතර ණය ගිවිසුම් අංක සීඑල්කේ 1023 – 01 එල් යටතේ රු. මිලියන 15,414 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 6,268 ක් විය. ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් මාසයේදි අවසන් කිරිමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	63	60.35	175.12
විදේශ අරමුදල්	1,427	148.50	
මුළු වත්කම්	1,610	1,819	2,028
මුළු වගකිම්	-	-	34
මුළු අරමුදල			
විදේශ ණය මගින්	1,427	1,575	1575
දේශිය අරමුදල් මගින්	183	243	419

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
ප්‍රමුඛතා විෂය පථය යටතේ, 2023 දෙසැම්බර් 31 දින වන විට Gravity main, Rider main සහ Force main නල පද්ධතිය සඳහා මීටර් 12,634 ක් නල එලීමට නියමිතව තිබුණද, එයින් අවසන්	2023	ප්‍රතිලාභීන්ගේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුයි.	විවිධ හේතූන් නිසා ප්‍රගතිය ප්‍රමාද වූ අතර ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය.	ණය නිකුත් කිරීම අත්හිටුවීම හේතුවෙන්, තෝරාගත් ප්‍රමුඛතා විෂය පථය ක්‍රියාත්මක කර ඇති අතර, 2023 දෙසැම්බර් 31 වන විට මන්දගාමී

කර තිබුණේ මීටර් 8,519 ක් පමණක් වන අතර, ඒ අනුව ව්‍යාපෘතිය සියයට 67 ක ප්‍රගතියක් පමණක් ලබා ඇත.	ප්‍රගතියක් දක්නට ලැබේ.

2.8. විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති

2016 දී ආරම්භ කරන ලද විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 9186 - එස් ආර් I යටතේ රු. මිලියන 181 ක ප්‍රධානයක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 50 ක් විය. 2024 මාර්තු ව්‍යාපෘතිය අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කළ මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය නොකළ මතයක් ද ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	2	2	2
විදේශ අරමුදල්	29	-	145
මුළු වත්කම්	227	243	385
මුළු වගකිම්	14	28	23
මුළු අරමුදල			
විදේශ ප්‍රවාහ මඟින්	197	197	342
දේශිය අරමුදල් මඟින්	16	18	21

එම විගණන මතයන් ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	දිනකට 150m³ නිපදවිය හැකි Seawater Reverse Osmosis (SWRO) බලාගාරය නිම කර ඇතත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් එහි	2023	ප්‍රතිලාභීන්ගේ අරමුණු නොපමාව ඉටු කිරීමට කටයුතු කළ යුතුයි	පවතින අඩු ධාරිතාවයක ජල නිෂ්පාදනය නිසා නව සබඳතා ලබාදීම දුෂ්කර වී ඇත. ජල ඉල්ලුම සපුරාලීම	ප්‍රතිලාබීන්ට අපේක්ෂිත පරිදි ජල සබඳතා ලබා දී නොමැත.

	දෛනික ජල නිෂ්පාදනය 100m³ ට වඩා අඩු මට්ටමක පවතී. මෙම තත්ත්වය හේතුවෙන් දූපත් තුන සඳහා ප්‍රමාණවත් ජල සම්බන්ධතා ලබාදීමට නොහැකි වී ඇති අතර ජල සම්බන්දතා 1,600 න් 400 ක් පමණ ස්ථාපිත කර ඇත. ඒ අනුව ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි තත්වයක් නිරීක්ෂණය වේ.			සඳහා නයිනතිව්හි ජල නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා විවිධ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කරයි.	
(ආ)	විදුලි සැපයුමක් නොමැතිකම හේතුවෙන් අයිස් නිෂ්පාදන කර්මාන්ත ශාලාව සහ ශීතකරණ පද්ධතිය ඉදිකිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අත්හිටුවා ඇත. මේ නිසා දූපත් තුනේ ධීවර ප්‍රජාවට අපේක්ෂා කළ ප්‍රතිලාභ අහිමි වී ඇත.	2023	ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ලංවිමේ හයිබ්‍රිඩ් බල පද්ධතියක් නොමැතිකම හේතුවෙන් අයිස් කැට සාදන බලාගාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වන අතර එය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට පවතී.	කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට පියවර ගෙන නොමැත.

2.9 අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 2

2016 වර්ෂයේදී ආරම්භ කරන ලද අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 2 සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය ණය ගිවිසුම් අංක එස්.එල්-පී 115යටතේ රු. මිලියන 26,778 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 4,820ක් විය. ව්‍යාපෘතිය 2024 ජූනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණන නොකළ මතයක් ද ලබා දී තිබුණි.

මූල්‍ය වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	11	17	18
විදේශ අරමුදල්	3	30	-
මුළු වත්කම්	401.3	428.4	455.9
මුළු වගකීම්	3.4	6.8	17.1
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	186	216	216
දේශීය අරමුදල් මඟින්	36	54	71

එම තත්වාගණ කල විගණන මතයන් ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්ථා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	ව්‍යාපෘතියේ සවිස්තරාත්මක සැලසුම බොහෝ දුරට අවසන් කර ඇති අතර දැන් එය ලංසු සැකසීමේ අදියරේ පවතී. 2022 අප්‍රේල් මාසයේ සිට ණය දෙන ආයතනය විසින් මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ලංසු සැකසීමේ කටයුතු ප්‍රමාද වී ඇත.	2023	ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය.	ජපන් සහයෝගිතා ආයතනය විසින් අරමුදල් සහ එකඟතාවයන් ලබා දෙන තෙක් ලංසු ඉදිරිපත් කිරීම අවසන් කරන දිනය දින නියමයක් නොමැතිව දීර්ඝ කිරීම සිදුකර ඇත.	2024 ඔක්තෝබර් සිට අරමුදල් ලබාදීම ආරම්භ කර ඇත. ණය කාලසීමාව 2031 ජූනි 14 දක්වා දීර්ඝ කර ඇත.

(ආ)	ප්‍රධාන ඉදිකිරීම් සංරචක හතර සඳහා ලංසු තැබීමේ ක්‍රියා පටිපාටි අවසන් වුවද, ණය දෙන ආයතනය මුදල් ලබා දීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු තවමත් ප්‍රදානය කිරීමේ අදියරේ පවතී.	2023	ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය.	ජපන් සහයෝගිතා ආයතනය විසින් අරමුදල් සහ එකඟතාවයන් ලබා දෙන තෙක් ලංසු ඉදිරිපත් කිරීම අවසන් කරන දිනය දින නියමයක් නොමැතිව දීර්ඝ කිරීම සිදුකර ඇත.	ණය ලබාදීම ආරම්භ කිරීම සඳහා සාකච්ඡා වෙමින් පවතී. රටේ පැවති ගැටළුකාරී තත්වය නිසා සහ ජයිකා ආයතනය ණය මුදල් ලබාදීම ආරම්භ කරන තෙක් ලංසු කැඳවීමේ දිනය දීර්ඝ කර ඇත.
(ඇ)	මෙම ව්‍යාපෘතිය මගින් දන්ත හා අස්ථි ෆ්ලෝරෝසිස් ඇති කරන එමෙන්ම නිදන්ගත වකුගඩු රෝගය පැතිරීම සඳහා ප්‍රධාන අන්තරායකාරී සාධකයක්ද වන අනාරක්ෂිත දූෂිත භූගත ජලයෙන් යැපෙන කැබිතිගොල්ලෑව, පදවිය, හොරොව්පොතාන සහ කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශ සහ රඹෑව හා මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොටසක් ආවරණය කරයි. එබැවින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සඳහා මෙම ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රජය ප්‍රමුඛත්වය දී ඇති අතර ව්‍යාපෘතිය 2017 ජුනි මස සිට ආරම්භ කර 2024 ජුනි මස අවසන් කිරීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් පුද්ගලයින් 170,951 දෙනෙකුට ප්‍රතිලාභ	2023	ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කිරීමට පියවර ගත යුතුය.	ජපන් සහයෝගිතා ආයතනය විසින් අරමුදල් සහ එකඟතාවයන් ලබා දෙන තෙක් ලංසු ඉදිරිපත් කිරීම අවසන් කරන දිනය දින නියමයක් නොමැතිව දීර්ඝ කිරීම සිදුකර ඇත.	ණය ලබාදීම ආරම්භ කිරීම සඳහා සාකච්ඡා වෙමින් පවතී. රටේ පැවති ගැටළුකාරී තත්වය නිසා සහ ජයිකා ආයතනය ණය මුදල් ලබාදීම ආරම්භ කරන තෙක් ලංසු කැඳවීමේ දිනය දීර්ඝ කර ඇත.

හිමිවන අතර නව සම්බන්ධතා 67,000 ක් ලබාදීමට ඉලක්ක කර තිබුණද 2023.12.31 දින වන විටත් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ලබාදී නැත.
2017 ජූනි 14 සිට 2024 ජූනි 14 දක්වා වසර හතක කාලය තුල රු.මි.27,197 ක් මෙම ව්‍යාපෘතියේ කටයුතු සඳහා වෙන්කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම මුදලින් සියයට එකකටත් වඩා අඩු ප්‍රතිශතයක් වන රු.මි.439 ක් ව්‍යාපෘතියේ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. මෙම උපයෝජනය අපේක්ෂිත මට්ටමට වඩා සැලකිය යුතු පහල මට්ටමකි. සියළු කටයුතු තවමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පැවතීම හේතුවෙන් ප්‍රතිලාභීන්ගේ අපේක්ෂාවන් ඉටුකර ගැනීමට නොහැකි වූ අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ඉලක්කගත ප්‍රතිලාභීන් වෙත ළඟා කර ගැනීමේ අවදානමක් ඇතිවී ඇති අතර මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට බරක්වීමට ඉඩ ඇත.

2.10. අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1

2013 දී ආරම්භ කරන ලද අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතියේ අදියර 1 සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතන අරමුදලේ ණය ගිවිසුම් අංක SL-P110 යටතේ රු. මිලියන 8,726 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,789 ක් විය. ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය අවස්ථා 4 ක දී දීර්ඝ කර අවසන් වශයෙන් 2025 ජූලි 5 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය කල මතයක්ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය නොකළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ මුදල්	129	99	319
විදේශ මුදල්	1,607	627	-
මුළු වත්කම්	8,081	8,946	9,410
මුළු වගකීම්	517	658	822
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	6,968	7,595	7,595
දේශීය අරමුදල් මඟින්	592	690	1,010

එම තත්වාගණය කල විගණන මතය ඉදිරිපත් කිරීම සඳහා හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි වේ.

	විගණන නිරීක්ෂණ	මූල්‍ය වර්ෂය	විගණකාධිපතිවරයාගේ නිර්දේශය	ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
(අ)	1 සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 8,698.6 ක් වටිනා කෙරීගෙන යන වැඩ මණ්ඩලය වෙත විධිමත් ලෙස භාර දී තිබුණද, එම වත්කම් ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන වල ඒ බව දක්වා නොතිබුණි. ඒ අනුව, කෙරීගෙන යන වැඩ වටිනාකම	2023	LKAS 16 ට අනුකූලව ව්‍යාපෘති ගිණුම්වල, භාර දුන් වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙතෙක් ලැබී ඇති සියලුම වත්කම් ආකෘති පත්‍ර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයට (උතුරු මැද) භාර දී ඇත. තවද, අත්කර ගන්නා ලද වත්කම් ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් වත්කම් කළමනාකරණ පද්ධතියට (ඒඑම්එස්)	දැනට, ප්‍රාග්ධනීකරණ කටයුතු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුරු මැද) විසින් සිදු කරනු ලැබේ. ප්‍රාග්ධනීකරණ කටයුතු අවසන් වූ පසු, අදාළ සටහන් ව්‍යාපෘති

	රුපියල් මිලියන 8,698.6 කින් අධි ප්‍රමාණය වී තිබූ අතර ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට බාරදුන් අගය එම ප්‍රමාණයෙන් අව ප්‍රමාණය වී තිබුණි.			ඇතුළත් කර ඇත. දැනට, අනුමැතිය ලබාගැනීමේ සහ ප්‍රාග්ධනීකරණ කටයුතු ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානය (උතුරු මැද) විසින් සිදු කරනු ලැබේ.	ගිණුම් වෙත යොමු කරනු ඇත.
(ආ)	තුළුමුව ඉදිකිරීම, ජල පිරිපහදුව, භූගත ජලාශ, ජල කුළුණු, කාර්යාල ගොඩනැගිලි, යාන්ත්‍රික හා විදුලි වැඩ (ලොට් ඒ) සඳහා වන ප්‍රධාන නල සිවිල් කොන්ත්‍රාත්තුව 2018 මාර්තු 23 දින ප්‍රදානය කරන ලද අතර 2020 අප්‍රේල් 20 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. පසුව නියමිත දිනට කොන්ත්‍රාත්තුව අවසන් නොකිරීම හේතුවෙන් 2024 මාර්තු 31 දින දක්වා 07 වතාවක් කාලය දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව කොන්ත්‍රාත්තුවේ සමස්ථ භෞතික ප්‍රගතිය 2024 ජූලි 31 විගණිත දිනට සියයට 99.7 ක් විය. කෙසේ වෙතත් දීර්ඝ කරන ලද කාල සීමාව තුළ කොන්ත්‍රාත් පැකේජය සම්පූර්ණයෙන් නිම කිරීමට	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ රටට අලාභයක් සිදු නොකර සැලසුම් කර ඇති පරිදි ලොට් ඒ කොන්ත්‍රාත් පැකේජය සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතුය.	කොවිඩ්-19 හි බලපෑම්, අන්තර් ගෙවීම් අයදුම්පත් (අයිපීඒ) ගෙවීමේ ප්‍රමාදයන්, මූල්‍ය අර්බුදය හේතුවෙන් ඇති වූ ද්‍රව්‍ය හිඟය සහ මහකනදරාව වැවෙන් ජලය ලබා ගැනීම සම්බන්ධ ගැටළු හේතුවෙන් ලොට් ඒ හි ප්‍රගතිය සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇත. මෙම අභියෝග මධ්‍යයේ වුවද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමග සමගාමීව සාකච්ඡා කරමින් තාවකාලිකව අත්හිටුවීම මගහරවා ගනිමින්, කොටසින් කොටස වැඩ කරගෙන යන ලෙස ව්‍යාපෘති කළමණාකරණ ඒකකය කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලා සිටින ලදී. මෙම තීරණාත්මක කාල පරිච්ඡේදය තුළ ලබා ඇති ප්‍රගතිය ධනාත්මක ප්‍රතිඵලයක්	ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය මුදල් ලබාදීම නැවත ආරම්භ කිරීමෙන් පසු, ලොට් ඒ කොන්ත්‍රාත්තුවේ ඉතිරි සියලුම වැඩ 2024 වර්ෂය අවසන් වීමට පෙර නිම කිරීමට බලාපොරොත්තු වේ.

	කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි. ස්කාඩර් දුරස්ථ සම්බන්ධතාවය ජල පවිත්‍රාගාරයේ ඇලම් ටැංකිය ඇලවීම, ඇතාකඩ හා ඉසින්බැස්සගල ජල කුළුණු පරිශ්‍රයන්හි භූමි අලංකරණය, උද්‍යාන ආලෝකකරණය, නානකාමර උපාංග, සංචාරක නිවාස වල නිම කිරීමේ කටයුතු 2024 ජූලි 31 දින වන විටත් සම්පූර්ණ කිරීමට ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.		නියෝජනය කරන බව අපි විශ්වාස කරමු.	
(ඇ)	2013 වර්ෂයේදී 2023 ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය පාරිභෝගිකයින් 115,000ක් පමණ වන ජනගහණය සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීමේ අරමුණින් සිදු කරන ලද ප්‍රයත්නයකි. අනාරක්ෂිත භූගත ජලය පානය හේතුවෙන් දන්ත සහ අස්ථි ෆ්ලෝරෝසිස් මෙන්ම නිදන්ගත වකුගඩු රෝග ඇතිවීමට වැඩිනැඹුරුවක් ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමනිලධාරි වසම්	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභීන්ට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීම සඳහා නිවාස සම්බන්ධතා මාරු කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ජල පවිත්‍රාගාරය මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත පවරා ඇති බැවින්, නිවාස සම්බන්ධතා ලබාදීමේ වැඩසටහන ඕඇන්එම් විසින් හසුරුවනු ලැබේ. නව නිවාස සම්බන්ධතා ප්‍රගතිය ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ මැදවච්චිය සහ රඹෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහිම ප්‍රජා මූල සංවිධාන අත්පත් කර ගැනීම මත ය. මේ වන විට සීබීඕ 16 ක් ලබාගෙන ඇති අතර අත්පත් කරගත් සීබීඕ යටතේ නව සම්බන්ධතා 3,002 ක් ලබා දී ඇති අතර අලුතින් දැමූ නල ජාලයෙන් නව	ජල පවිත්‍රාගාරය මෙහෙයුම් හා නඩත්තු ඒකකය වෙත භාරදීම හේතුවෙන් නිවාස සම්බන්ධතා ලබාදීමේ වැඩසටහන සම්පූර්ණයෙන් හසුරවනු ලබන්නේ ඕ ඇන්ඩ් එම් විසින් නව නිවාස සම්බන්ධතා ලබාදීමේ ප්‍රගතිය ප්‍රධාන වශයෙන් ප්‍රජා මූල සංවිධාන අත්පත් කරගැනීම මත රඳා පවතී. මේ වන විට වර්ෂයේ ඉලක්කය සපුරාගැනීම

	75ක් ආවරණය වන පරිදි නව නිවාස සම්බන්ධතා 25,000ක් එක් කිරීම මෙයට ඇතුළත් වේ. ජල පවිත්‍රාගාරය 2022 ඔක්තෝම්බර් මස සිට ක්‍රියාත්මක කර මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දී තිබුණද, සහ ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 99 ක් දක්වා ළඟාවී තිබුණද 2024 ජූලි 31 වන විගණිත දින වන විටත් ලබාදී තිබූ සම්බන්ධතා ගණන 3,721 කි. 2024 වසරේ ඉලක්කගත නව සම්බන්ධතා 6000 න්, 2024 ජූලි 31 දින වන විටත් ලබා දී තිබුණේ නව සම්බන්ධතා 1,881 ක් පමණි.		සම්බන්ධතා 720 ක් ලබා දී ඇත.	සඳහා අළුතින් එලන ලද නල ජාලය හරහා නව නිවාස සම්බන්ධතා ලබාදෙනු ලැබේ.
(ඇ)	2013 වසරේ සිට 2023 ව්‍යාපෘති කටයුතු ආරම්භ කර තිබුණද, 2023 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘතිය යටතේ කිසිදු ප්‍රධාන කොන්ත්‍රාත්තුවක් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, පරිපාලනය, උපදේශනය, නඩත්තුව ආදී වශයෙන් විශාල මුදලක් වැය කරමින් ව්‍යාපෘති කළමණාකරණ	අනපේක්ෂිත තත්වයන් කළමනාකරණය කර ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩ කඩිනම් කිරීමට සහ අනවශ්‍ය පිරිවැය අවම කිරීමට කටයුතු කළ යුතුය.	විවිධ හේතුන් මත ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලකිය යුතු ලෙස ප්‍රමාද වී ඇත, කෙසේ වෙතත්, මේ වන විට ජල පවිත්‍රාගාරය සහ රඹෑව භූමිය නිල වශයෙන් මෙහෙයුම් හා නඩත්තු අංශයට 2022 ඔක්තෝම්බර් 1 වන දින භාර දෙන ලදී. අනතුරුව, මෙහෙයුම් හා නඩත්තු අංශය රඹෑව (ඩබ්ලිව්.ටී.පී) තුළ දැනට පවතින සියලුම	ව්‍යාපෘති කළමනාකරණය (පීඑම්යූ) නියමිත කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සක්‍රීයව අධීක්ෂණය කරයි.

ඒකකය විසින් ව්‍යාපෘතිය ඇදගෙන යමින් පවතී. ආර්ථිකයට ප්‍රතිලාභයක් නොදීමට අමතරව ව්‍යාපෘති ප්‍රදේශයේ පවතින නිදන්ගත වකුගඩු රෝගයට (සීකේඩීයූ) විසඳුමක් ලබාදීමකින් තොරව ණය වාරික රු. මිලියන 1,309 ක්, බැඳීම් ගාස්තු රු. මිලියන 45, ණය පොලී රු.මිලියන. 178 ක් වැය කර තිබුණි.

සම්බන්ධතා (1642) මාරුකොට නව සම්බන්ධතා ක්‍රමානුකූලව යෝජනා ක්‍රමයට ඒකාබද්ධ කර ඇත. මේ වන විට මුළු සම්බන්ධතා 7,248 ක් ලබා දී ඇත. ලොට් බී කොන්ත්‍රාත් පැකේජය අවසන් කර ඇති අතර ලොට් සී 1 සහ ලොට් සී3 කොන්ත්‍රාත්කරුවන් සේදීම් හා විෂබීජහරණය හැර ඔවුන්ගේ විෂය පථය සම්පූර්ණ කර ඇති අතර, එය ඉදිරි මාසය තුළ අවසන් කර මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දීමට අපේක්ෂා කෙරේ.

2.11 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය 3

2016 දී ආරම්භ කරන ලද මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය 3 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3348 - SRI යටතේ රු. මිලියන 4,940 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,292 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 3 ක දී දීර්ඝ කර 2024 පෙබරවාරි 29 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිලිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ද 2022 සහ 2023 වර්ෂ සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ මුදල්	14	-	186
විදේශ මුදල්	3,471	2,492	1,737
මුළු වත්කම්	3,614	6,245	9,544
මුළු වගකීම්	1	140	1,016
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	3,596	6,089	7,825
දේශීය අරමුදල් මඟින්	16	16	202

එම තත්වාගණනය කල විගණන මතයන් ඉදිරිපත් කිරීමට හේතුවූ කරුණුවලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැණනැගුනු වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණ	මූල්‍ය වර්ෂය	විගණකාධිපතිවර යාගේ නිර්දේශය	ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
(අ)	ව්‍යාපෘතියේ උපදේශකගේ නිර්දේශය ලබා ගැනීමකින් තොරව විචල්‍යතා නියෝගයක් හරහා ව්‍යාපෘති කාල දීර්ඝ කිරීම් හිමිකම් වෙනුවෙන් අයි.සී.බී 01 සහ අයි.සී.බී 02	2023	ව්‍යාපෘති විචලතා කමිටුවට ලබා දී ඇති අධිකාරී සීමාව තුළ එවැනි ගෙවීම් අනුමත කළ යුතුය. විශේෂ අවශ්‍යතාවයක් තිබේ නම්,	අයි.සී.බී - 03 හි කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ හිමිකම් ඇගැයීමේදී, ව්‍යාපෘති උපදේශන කොන්ත්‍රාත්තුව අවසන් වී තිබූ අතර 2022 ඔක්තෝබර් වලින් පසුව	සියලුම හිමිකම් එන්ඩබ්එස්ඩීබී හි ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් ඇගයීමට ලක්කරන

	ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ට පිළිවෙලින් ඇ.ඩොලර් 385,759.65 + රු. මිලියන 345 ක් සහ ඇ.ඩොලර් 1,637,367.61 + රු. මිලියන 89.7 ක් ද, අයි.සී.බී 03 කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 436.48 ක් කාල දිගුවන් පාදක කර ගනිමින් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද අරමුදල් භාවිතා කර ගෙවා තිබුණි.		අරමුදල් මුදා හැරීමට පෙර අදාළ බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.	කොන්ත්‍රාත්තුව දීර්ඝ නොකෙරුණි. එම නිසා අයිසීබී 3 හිමිකම් පෑම මණ්ඩලයේ ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් ඇගයීමට ලක්කරන ලදී.	ලදී. මේ වන විට ව්‍යාපෘතිය බොහෝ දුරට අවසන් වී ඇත.
(ආ)	අයි.සී.බී 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් විචලතා නියෝග හරහා කාලය දීර්ඝ කිරීමේ හිමිකම් ලෙස ඇ.ඩොලර් 372,488 ක් සහ රු. මිලියන 505.99 ක් ඉල්ලුම් කර තිබූ අතර කෙසේවෙතත් ව්‍යාපෘතිය මගින් ඇ. ඩොලර් 1,023,338 ක් සහ රු. මිලියන 98.21 ට සමාන රු. මිලියන 436.48 ක් ගෙවා තිබුණි. ඒ අනුව නිසි අනුමැතියකින් තොරව සහ රට තුළ පවතින විදේශ විනිමය අර්බුදය සැලකිල්ලට නොගෙන, ඉල්ලුම් කළ මුදල පියවීම සඳහා ව්‍යාපෘතිය, කොන්ත්‍රාත්කරු ඉල්ලා සිටි ඇ.ඩොලර් ප්‍රමාණයට වඩා ඇ.ඩොලර් 650,850 ක් වැඩිපුර ගෙවා තිබුණි.	2023	අභ්‍යන්තර ක්‍රියා පරිපාටි අනුගමනය කළ යුතුය.	අයි.සී.බී -3 කොන්ත්‍රාත්තුව සඳහා ව්‍යාපෘතිය දිගු කිරීමේ හිමිකම් ඇගැයීමේදී, එය කාල දිගු වාර – 7 දක්වා පමණක් සලකා බලන ලදී. ඒ අතර කොන්ත්‍රාත්කරු චීන යුආන් 50,822,695.83 සහ ඇ.ඩොලර් 131,635.49 සහ රුපියල් 621,468,876.68 ක් ඉල්ලීම් කරන ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුවට අනුව ගෙවීම් සහතික කළ හැක්කේ ඇ.ඩොලර් සහ රුපියල් වලින් පමණි. එබැවින් ඇ.ඩොලර් 1,023,338 සහ රුපියල් 98,211,794.09 ක් නිර්දේශ කරන ලදී. තවද, අනුමැතිය ලබා	ඉදිරියේදී මේ හා සමාන ඕනෑම විචලතාවයක් සඳහා විචලතා කමිටුවක් තුල සැලකිල්ලට භාජනය කරනු ඇත.

	මීට අමතරව, අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි උල්ලංඝනය කරමින් ජල සම්පාදන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයා විසින් ඉහත ගෙවීමට ඉදිරිපත්කල රු. මිලියන 436 ක් වටිනා විචල්‍ය නියෝගය ගෙවීමට නිර්දේශ කරමින් සහ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා ගේ අනුමැතිය වෙනුවටද අත්සන් යොදා තිබුණි.			දෙන කාල පරිච්ඡේදය තුලදී අතිරේක සාමාන්‍යාධිකාරී (ඩබ්ලිව්.එස්.පී), මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා වෙනුවෙන් රාජකාරී ආවරණය කිරීමේ කටයුතු වල නියුතුව සිටියේය.	
(ඇ)	කාල දීර්ඝ කිරීමේ එකඟතාවයන්ට අනුව, කොන්ත්‍රාත් වටිනාකම හැර වෙනත් කිසිදු අමතර පිරිවැයක් ඉල්ලා සිටීමට අයිතියක් නොමැති බවට කොන්ත්‍රාත්කරුවන් එකඟ වී ඇතත්, කොන්ත්‍රාත්කරුගේ විචල්‍ය හිමිකම් සඳහා රු. මිලියන 532.91 සහ ඇ.ඩොලර් 3,046,465.26 ක් ඉහත කොන්දේසිය උල්ලංඝනය කරමින් ගෙවීම් කර තිබුණි.	2023	කොන්ත්‍රාත්කරු වන්ගේ දුර්වල ක්‍රියාකාරීත්වය/අ කාර්යක්ෂමතාව සහ අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීම සඳහා කළමනාකාරිත්ව ය අවශ්‍ය පියවර ගත යුතුය.	ෆිඩික් හි පොදු කොන්දේසි 8.4 ට අනුව කොන්ත්‍රාත්කරුට 20.1 උප වගන්තියට යටත්ව [කොන්ත්‍රාත්කරුගේ හිමිකම්] 10.1 උප වගන්තියේ (වැඩ සහ අංශ භාර ගැනීම්) අරමුණු සම්පූර්ණ කර ගැනීම සඳහා කාලය දීර්ඝ කිරීමට හිමිකම් ඇත. මේ සඳහා පහත සඳහන් ඕනෑම හේතුවක් නිසා ප්‍රමාද විය හැක : විචලතාවයක්, වසංගත හෝ රජයේ ක්‍රියා හේතුවෙන් ඇති වූ පිරිස් හෝ භාණ්ඩ ලබා ගැනීමේ අනපේක්ෂිත හිඟය ආදිය. කාල දිගු වාර	සේවා යෝජකයා ඇතැම්, කාලය දීර්ඝ කිරීම් සඳහා කාලය හා පිරිවැය යන දෙකටම එකඟ වූ අතර ඇතැම් විට කොන්ත්‍රාත්කරුගේ ගිවිසුම සමඟ කාලය පමණක් ලබාදී තිබුණි.

				ලබාදෙන විට, ඉහත නිර්ණායක මත පදනම්ව ඇගයීම සිදු කරන ලදී. ඒ අනුව, සේවායෝජකයා සමහර කාල දිගුවන් සඳහා කාලය සහ පිරිවැය යන දෙකටම එකඟ වූ අතර ඇතැම් අවස්ථාවලදී පමණක් කාලය ලබාදීමට එකඟවන ලදී.	
(ඈ)	අයි.සී.බී 01 සහ අයි.සී.බී 02 කොන්ත්‍රාත්තුවල භෞතික වැඩ පිළිවෙලින් 2022 මාර්තු 15 සහ 2022 මැයි 21 දින අවසන් කර තිබුණද, ව්‍යාපෘතිය මගින් 2024 මැයි මස විගණනය කරන ලද දින වන විටත් අවසන් බිල් පත් ගෙවීම් සිදු කර නොතිබුණි. තවද ඉහත කොන්ත්‍රාත් දෙක අවසන් කර වසර 2ක් ගතවී ඇතත් අවසාන බිල්පත් පියවීමට පෙර ෆිඩික් කොන්දේසි 7.6 වගන්තිය අනුව අවසාන අමුද්‍රව්‍ය සැසඳුම් වාර්තාව පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය	2023	ප්‍රතිපාදන ඉක්මවූ ගෙවීම් සඳහා මෙන්ම අයි.සී.බී 03 සහ අයි.සී.බී 04 කොන්ත්‍රාත්තුවල අමතර ගෙවීම් සඳහාද අදාළ අනුමැතිය ලබා ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගත යුතුය.	අයි.සී.බී -01 සහ අයිසීබී-02 හි කොන්ත්‍රාත් සඳහා ප්‍රතිපාදන මුදල වැඩි කිරීමට අවශ්‍ය වූ අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය අවශ්‍ය විය. ඒ අනුව ව්‍යාපෘතිය 2024 පෙබරවාරි මාසයේදී කොන්ත්‍රාත්තු සඳහා ප්‍රතිපාදන මුදල වැඩි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලියට මාස 12 කට අධික කාලයක් ගත විය. තවද ඉදිරිපත් කරන ලද කොන්ත්‍රාත්කරුවන් ගේ අවසන් බිල්පත්වල අඩුපාඩු පැවතීම ප්‍රමාදයට හේතු වූ අතර අයි.සී.බී -01 සහ අයි.සී.බී -02 අවසන් බිල්පත් දෙකම අවසන් අදියරේ ඇත.	**2024** පෙබරවාරි මාසයේදී කොන්ත්‍රාත්තු ප්‍රතිපාදන මුදල වැඩිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබගෙන ඇත. මේ වන විට අමුද්‍රව්‍ය සැසඳුම් සම්පූර්ණ කොට ඇති අතර අයිසීබී 1 සහ අයිසීබී 2 කොන්ත්‍රාත්තුවල අවසන් බිල්පත්ද පියවා ඇත.

				ද්‍රව්‍ය සැසඳුම් වාර්තාව බිල්පත් ගෙවීම් අවසන් කිරීම සමග සෘජුව සම්බන්ධ වන අතර අයි.සී.බී -01 සහ අයි.සී.බී - 02 දෙකෙහිම සැසඳුම් වාර්තා මේ වන විට අවසන් කර ඇත.	
(ඉ)	මෙම වාර්තාවේ 3.1 ඡේදය සඳහන් ව්‍යාපෘතියේ මන්දගාමී කාර්ය සාධනයේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිපාදන වියපැහැදම් කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයන් පෙන්නුම් කළ අතර, ඒ හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම්ගාස්තු ලෙස රුපියල් මිලියන 183ක් රජයට ගෙවීමට සිදුව තිබුණි.	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු අතර අනාර්ථික වියදම් පාලනය කල යුතුය.	2016 අගෝස්තු සිට බලපැවැත්වෙන අංක 3348-SRI දරන ණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙහි සමුච්චිත බැඳීම් ගාස්තුව 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 183 කි. අංක 3348-SRI දරන මෙම ණය, ලබාගෙන ඇත්තේ අංක 2947-SRI සහ අංක 3029-SRI යන ණය ප්‍රතිපාදන වලට අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ය. අංක 3348-SRI ණය භාවිතා කිරීමට එම ණය සංරචක වල ප්‍රතිපාදන අවසන් කළ යුතු විය. කෙසේ වෙතත්, විවිධ හේතූන් නිසා අංක 2947-SRI සහ අංක 3029-SRI දරන ණය උපයෝජනය අපේක්ෂා කළ පරිදි සිදු නොවූ අතර එබැවින් අංක 3348-SRI දරන ණය ප්‍රතිපාදන භාවිතා	3,348 – SRI ණය ප්‍රතිපාදනය, 2947 – SRI සහ 3029 – SRI යන ණය ප්‍රතිපාදනයන්හි අතිරේක අරමුදල් අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ලබාදී තිබුණි. පාලනය කල නොහැකි විවිධ තත්වයන් මත 3,348 – SRI දරණ ණය ප්‍රතිපාදන භාවිතා කිරීම ප්‍රමාද වීම සිදුවිය.

කිරීම ප්‍රමාදවීම මත ADB වෙත බැඳීම් ගාස්තු ගෙවීමට සිදු විය.

2.12. මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය 2

2014 දී ආරම්භ කරන ලද මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය 2 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3029 SRI සහ 3030 SRI (SF) යටතේ රු. මිලියන 10,394 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,523 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 2 දී දීර්ඝ කර 2024 පෙබරවාරි 29 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිලිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ද 2022 සහ 2023 වර්ෂ සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ මුදල්	148	58	478
විදේශ මුදල්	3,235	4,292	1,493
මුළු වත්කම්	13,370	17,891	18,479
මුළු වගකීම්	534	705	202
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	10,648	14,939	16,433
දේශිය අරමුදල් මඟින්	2,188	2,246	2,724

එම තත්වාගණනය කල විගණන මතය ඉදිරිපත් කිරීම සඳහා හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණ	**මූල්‍ය වර්ෂය**	**විගණකාධිපතිවර යාගේ නිර්දේශය**	**ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වර්තමාන තත්ත්වය**
(අ)	ප්‍රතිපාදන හා ව්‍යපැහැදම් කාලසීමාව අවසන් වූ වෙනත් ව්‍යාපෘතියකට (ණය අංක 2948-**SRI**-ඒඩීබී ව්‍යාපෘති 1 ට) අදාලව කරන ලද වියදම් පියවීම සඳහා	2023	ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘති අරමුදල් විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ	ආසියානු සංවර්ධන බැංකුව විසින් ණය අංක 2948-**SRI** හි උපයෝජනය නොකළ අත්තිකාරම් ඇ.ඩොලර් 28,543.22 ආපසු ගෙවීම ඉල්ලා සිටි	GOSL සහ මණ්ඩල අරමුදල් දෙකෙහිම අරමුදල් නොතිබුණු බැවින් සාමාන්‍යාධිකාරීවර යාගේ අනුමැතිය ඇතිව අයිසීබී 03 කොන්ත්‍රාත්කරු හරහා අරමුදල්

	රු. මිලියන 12.3 ක ව්‍යාපෘති අරමුදල් භාවිතා කර තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2023 ජනවාරි 3 වැනි දින ලබා දුන් ලිඛිත උපදෙස් පරිදි **ICB** 03 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරු (චයිනා හාබර් ඉංජිනියරින් - චයිනා ජියෝ කෝපරේෂන් ජොයින්ට් වෙන්චර්) විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ බැංකු ගිණුමට රු. මිලියන 10.7 ක මුදලක් තැන්පත් කර තිබුණි. මණ්ඩලය විසින් එම තැන්පත් මුදල භාවිතා කර ඉහත සඳහන් කළ අනෙක් ව්‍යාපෘතියේ උපයෝජනය නොකළ අත්තිකාරම් ශේෂය වූ ඇ.ඩොලර් 28,543 ක් ව්‍යාපෘතියේ අරමුණු උල්ලංඝනය කරමින් නැවත පියවීමට යොදා ගෙන තිබුණි.		අරමුණු හැර වෙනත් කටයුතු සඳහා භාවිතා නොකළ යුතු අතර ගිණුම් දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	අවස්ථාවේ ව්‍යාපෘති කළමනාකරණය විසින් මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (මූල්‍ය) වෙතින් මේ සඳහා අරමුදල් ව්‍යාපෘතියේ රාජ්‍ය ප්‍රතිපාදන මගින් හෝ මණ්ඩලයේ අරමුදල් මගින් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. කෙසේ නමුත් ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය ප්‍රතිපාදන හෝ මණ්ඩල අරමුදල් යන දෙකෙහිම ප්‍රතිපාදන නොතිබුණු බැවින්, මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ඇතිව, **ICB**-03 කොන්ත්‍රාත්කරු හරහා එම මුදල ආපසු ගෙවීමට සංවිධානය කරන ලදී. කොන්ත්‍රාත්තුවට අනුව, වෙන්කරන ලද අයිතම යටතේ ක්‍රියාත්මක කරන සියලුම වැඩ සඳහා කොන්ත්‍රාත්කරුගේ පොදු කාර්ය සහ ලාභය සඳහා සියයට 15 ගෙවීමට අවශ්‍ය වේ.	ලබාගැනීමට සිදුවිය.
(ආ)	ආදායම් නොවන ජල කළමනාකරණය සඳහා ජල ප්‍රවාහ දත්ත ලබා ගැනීමට	2023	පවතින ගැටලු නිවැරදි කර අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට	ප්‍රධාන වශයෙන් බැටරි ආයු කාලය ඉක්මවා යාම හේතුවෙන් ප්‍රවාහ	දැනට, දේශීය නියෝජිතයෙක් සියලුම DMA මීටර විමර්ශනය කර

	ICB 04 කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23 ක (DMAs) ඇ.ඩොලර් 246,337.80 (වත්මන් වටිනාකම දළ වශයෙන් රු.මිලියන.73.9) වටිනා DMA මීටර 23 ක් ස්ථාපිත කර ඇත. කෙසේ වෙතත්, 2024 මැයි 02 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේදී එම සියලු මීටර දෝෂ සහිත බවත්, 2021 වසරේ සිට සමහර මීටර් අක්‍රියව පවතින බවත් නිරීක්ෂණය විය. මෙම ගැටළුව සියළුම දිස්ත්‍රික් මිණුම් ප්‍රදේශ තුල ආදායම් නොවන ජල කළමණාකරණ කටයුතු සපලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අහිතකර ලෙස බලපා තිබුණි.		කටයුතු කළ යුතුයි.	දත්ත මීටර හරහා ආදායම් නොවන ජල පාලන මැදිරිය දක්වා යැවිය නොහැකි වේ. එබැවින්, ABB නිර්දේශිත දේශීය නියෝජිතයා හරහා බැටරි ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.	දෝෂ හඳුනාගනිමින් සිටී. එය අවසන් වූ පසු එම දෝෂ සහිත මීටර නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. අවශ්‍ය බැටරි ආනයනය කර ඇති අතර ප්‍රතිස්ථාපන සඳහා භාවිතා කර ඇත. තවද එන්ඩබ්එස්ඩීබී, දේශීය නියෝජිතයා සමඟ නඩත්තු ගිවිසුමක් අත්සන් කිරීමට නියමිතය.
(ඇ)	අයිසීබී 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් ව්‍යාපෘති කටයුතු සඳහා ආනයනය කර තිබූ රුපියල් මිලියන 51.36 (ආසන්න වශයෙන්) වටිනාකමින් යුත් “NWS&DB” ලෙස සංකේතවත් කරන	2023	අනාගතයේදී සිදුවන වංචනික ක්‍රියාකාරකම් වලක්වා ගැනීම සඳහා තොග සම්බන්ධයෙන් දැඩි අභ්‍යන්තර පාලනයක් පවත්වා ගත යුතු අතර මෙම වංචාව හේතුවෙන් සිදු වූ පාඩු වගකිවයුතු	කොන්ත්‍රාත්තුවට අනුව ගබඩා පහසුකම නඩත්තු කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි. ගැටළුව හඳුනා ගත් විට ද්‍රව්‍යමය අලාභයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ව්‍යාපෘති කළමනාකරු	අලාභ අයකර ගැනීම සඳහා අදාළ පාර්ශවයට එරෙහිව NWSDB විසින් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර, එය මේ වන විට සිදු වෙමින් පවතී.

	ලද Ningbo වර්ගයේ ගෘහස්ත ජල මීටර් 6548 ක තොගයක් කොන්ත්‍රාත්කරු භාරයේ තිබියදී 2023 වර්ෂයේදී අස්ථාන ගත වී තිබුණි. මේ අතරතුර, ඉහත මීටර් තොගයෙන් මීටර් 913 ක් පෞද්ගලික වෙළෙඳ ආයතනයක විකිණීමට තබා තිබියදී සොයා ගන්නා ලදී.	පුද්ගලයින්ගෙන් අයකර ගත යුතුය.	මෙන්ම NWSDB අභ්‍යන්තර විගණන අංශය විසින් ආරම්භ කරන ලදී. සාකච්ඡා ගණනාවකට පසු අහිමි වූ ජල මීටර සැපයීමට කොන්ත්‍රාත්කරු එකඟ වූ අතර කොන්ත්‍රාත්කරු විසින් යම් ද්‍රව්‍යමය අලාභයක් සිදු වුවහොත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව ඔවුන්ගේ අවසාන බිල්පතෙන් අඩු කරන බව දැනටමත් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත.	
(ඇ)	ව්‍යාපෘතියේ අරමුණු 2023 උල්ලංඝනය කරමින් ජල සම්පාදන මණ්ඩලයට අවශ්‍ය ගෘහස්ත ජල මීටර 122,500ක් සහ Gunmetal ferrules 100,000 ක් මිලදී ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම වෙනුවෙන් ICB 3 කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 870 ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබූ අතර එහි කොන්ත්‍රාත්කරුගේ ලාභය සහ පොදු කාර්ය වියදම් වශයෙන් සියයට 15	ව්‍යාපෘති කළමනාකරණය සැමවිටම ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘතියේ අරමුදල් යෙදවීමට පිළිපැදිය යුතු අතර දැනටමත් වෙනත් අරමුණු සඳහා භාවිත කර ඇති මුදල් ආපසු ගෙවිය යුතුය.	2022 වර්ෂයේදී පැවති විදේශ විනිමය අර්බුදය අතරතුර, ජල මීටර, රසායනික ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම සඳහා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්තුවට ණයවර ලිපි විවෘත කිරීමට මණ්ඩලයට අපහසු විය. (විදේශීය සැපයුම්කරුට අදාල බැංකුව මඟින් දේශීය බැංකු මඟින් නිකුත්කරන ණයවර ලිපි පිළි නොගැනීම) මෙම අර්බුදය කළමනාකරණය	විදේශ විනිමය අර්බුදය තුළ NWSDB අත්‍යවශ්‍ය සම්බන්ධතා ද්‍රව්‍ය - ජල මීටර, රසායනික ද්‍රව්‍ය ආදිය මිලදී ගැනීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමට අපහසු විය. මෙම අර්බුදය කළමනාකරණය කිරීම සඳහා එන්ඩබ්එස්ඩීබී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව, අයිසීබී-03 සහ අයිසීබී-04 හරහා ප්‍රසම්පාදනය සිදු කරන ලෙස

	කට සමාන රු.මි. 113.56 ක් ද ඇතුලත්ව තිබුණි. මීට අමතරව ව්‍යාපෘතිය මඟින් රු.මි. 1,657.87 ක් වටිනා සම්බන්ධතා ද්‍රව්‍ය හා රු.මි. 293.85 ක රසායන ද්‍රව්‍ය පිළිවෙලින් අයිසීබී 4 සහ අයිසීබී 3 ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් හරහා ජල සම්පාදන මණ්ඩලයේ භාවිතයට මිලදීගෙන ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ අරමුණු උල්ලංඝණය කරමින් ඉහත සැපයුම් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් ගේ ලාභය පොදු කාර්යය (සියයට 15) ලෙස ව්‍යාපෘතිය රු.මිලියන 254 ක් ගෙවා ඇත.			කිරීම සඳහා ජල සම්පාදන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ICB - 03 සහ ICB-04 කොන්ත්‍රාත්කරුවන් හරහා ප්‍රසම්පාදනය සිදු කිරීමට මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී උපදෙස් දෙන ලදී. මෙම ප්‍රවේශය දැනටමත් SCAPC විසින් කොන්ත්‍රාත් මිල ඉහළ නැංවීමේ අනුමත අදියරේදී සමාලෝචනය කර ඇති අතර කොන්ත්‍රාත් විෂය පථයෙන් පිටත ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය සහිතව GoSL මඟින් ලද ප්‍රතිමුදල් හරහා ගෙවීමට නිර්දේශ කර ඇත. දැන් අපි අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීමේ කටයුතු කරගෙන යන්නෙමු.	සාමාන්‍යාධිකාරී (NWSDB) උපදෙස් දෙන ලදී.
(ඉ)	ව්‍යාපෘතියේ පුහුණු හා සංවර්ධන ධාරිතා වැඩිදියුණු කිරීමේ යෝජනාව යටතේ රු. මිලියන 1,571 ක වියදමකින් මණ්ඩලයේ	2023	මෙම ඉදිකිරීම් සඳහා වැය වූ මුදලට සරිලන වටිනාකමක් ලබා ගැනීම සඳහා මුළු වත්කම් ප්‍රයෝජනයට	මහකොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය මගින්	සිවාස් හි කළමනාකාරිත්වය විවිධ ප්‍රචාරණ මාදිලි හරහා පුහුණු මධ්‍යස්ථානය ප්‍රවර්ධනය කිරීමට සහ ප්‍රචාරණය

අභ්‍යන්තර අවශ්‍යතා සඳහා පමණක් නොව වාණිජ පදනම මත බාහිර ක්‍රියාකාරකම් සඳහාද යොදාගත හැකි වන පරිදි තෙලවල පුහුණු මධ්‍යස්ථානය (CEWAS) ඉදිකොට තිබුණු අතර 2022 දෙසැම්බර් 16 දින සිට මණ්ඩලයේ නිළධාරීන් යොදාගනිමින් එහි ක්‍රියාකාරකම් ආරම්භ කර තිබුණි. 2023 වර්ෂය තුළ එහි නඩත්තුව සඳහා රුපියල් මිලියන 41.63 ක් පමණ වැය කර තිබූ අතර මුළු ආදායම රුපියල් මිලියන 27.28 ක් විය. ඒ අනුව එම කාලය තුළ පාඩුව රුපියල් මිලියන 14.35 කි. තවද, රුපියල් මිලියන 7.22ක කාර්යාල උපකරණ වලින් යුත් වර්ග මීටර් 337.5ක අංගසම්පූර්ණ කාර්යාල පරිශ්‍රය, පරිගණක විද්‍යාගාර 2 ක්, ගෘහභාණ්ඩ සහිත පුස්තකාල පරිශ්‍රයක් හා රුපියල් මිලියන 4.1 ක ව්‍යායාම උපකරණ සමඟ ව්‍යායාම් ශාලාවක් විවෘත කළ දින සිට කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව අක්‍රියව පවතී.	ගැනීමට කටයුතු කළ යුතුය.	තෙලවල පුහුණු මධ්‍යස්ථානය සංවර්ධනය කර මණ්ඩලය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා 2022 දෙසැම්බර් මස භාර දී තිබුණි . පුහුණු මධ්‍යස්ථානයේ (CEWAS) මෙහෙයුම් ක්‍රියාකාරිත්වය සඳහා මණ්ඩලය විසින් විවිධ ඒකක පිහිටුවා ඇත. මෙම විමසුමේ දක්වා ඇති ආදායම් සහ වියදම් ප්‍රමාණයන් පුහුණු මධ්‍යස්ථාන ක්‍රියාකාරිත්වය සඳහා පිහිටුවා ඇති ඉහත සඳහන් කරන ලද ඒකකය සමඟ පරීක්ෂා කළ යුතුය.	කිරීමට සක්‍රීයව උත්සාහ කරයි. මෙම ප්‍රචාරණ ප්‍රයත්නයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන්, CEWAS හට තවත් අවස්ථා ආකර්ෂණය කර ගැනීමට සහ එහි සේවා පරාසය පුළුල් කිරීමට හැකි වේ.

(ඊ)	ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 ට වඩා අඩුකර වඩා හොඳ ජල සම්පාදන සේවාවන් ඵලදායී ලෙස ලබාදීමේ අරමුණින් ව්‍යාපෘතිය - 02 ආරම්භ කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කර මාස 111ක් ගතවී ඇතත්, ඩීඑම්ඡ් 42 න් ඩීඑම්ඡ් 25 ක් පමණක් සම්පූර්ණයෙන් නිම කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී ඇත. කෙසේ වෙතත්, රුපියල් මිලියන 4,293.25 ක් ණය ආපසු ගෙවීම් කර ඇති අතර, 2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් සහ පොලී ගාස්තු පිළිවෙලින් රුපියල් මිලියන 95.11ක් සහ රුපියල් මිලියන 1,852.47ක් රජය විසින් ගෙවා තිබුණි.	2023	රටට තවදුරටත් මූල්‍ය බර පැටවීම වළක්වා ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කල යුතුය.	ව්‍යාපෘති දිගුව සඳහා හේතු කිහිපයක් බලපා තිබේ. පවතින ජල සම්පාදන යෝජනා ක්‍රමයන්හි නිවැරදි නළ සිතියම් විස්තර නොමැතිවීම. නල එලීමේ කටයුතු වලදී හමු වූ අනපේක්ෂිත වැඩබිම් තත්වයන් වැඩ කරන කාලය බොහෝ දුරට රාත්‍රී කාලයට සීමා වීම මාර්ග කැණීම් කිරීමේ බලපත්‍ර සඳහා බලධාරීන්ගේ (එනම් කොළඹ මහනගර සභාව, පොලීසිය) අනුමැතිය ප්‍රමාද විම. 2019 අප්‍රේල් මාසයේදී බෝම්බ පිපිරීම Covid-19 බාධා කිරීම ඉහත සඳහන් කළ හේතු කොන්ත්‍රාත්කරුගේ සහ සේවායෝජකයාගේ පාලනයෙන් ඔබ්බට සිදුවී ඇති බැවින් කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීමට සහ ව්‍යාපෘති	දැන් ව්‍යාපෘතිය - 02 සියයට 99.8ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. 2024 අවසන් වීමට පෙර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීමට PMU සැලසුම් කරයි.

				උපදේශකයින්ගේ ඇගයීම් මත පදනම්ව සාමාන්‍යාධිකාරීවරයා විසින් ව්‍යාපෘති කාලය දීර්ඝ කරනු ලැබේ.	
(උ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කර අවුරුදු 2 ගතවී ඇතත් රු.මිලියන 14,599 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා නොතිබුණි.	2023	වත්කම් විධිමත් ලෙස මණ්ඩලය වෙත පැවරීමට වහාම පියවර ගත යුතුය.	එකඟ වෙමි. 2024 අවසන් වන විට ඉලක්ක කර ඇති කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් සම්පූර්ණ කළ පසු එය සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ඇත.	වත්කම් ප්‍රාග්ධනීකරණ කටයුතු ආරම්භ කරන ලදී. කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් ගෙවීම අවසන් වූ පසු සියළුම වත්කම් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනීකරණය කළ හැක.

2.13 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන ව්‍යාපෘතිය 1

2013 දී ආරම්භ කරන ලද මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන් ව්‍යාපෘතිය 1 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 2947-SRI සහ 2948-SRI(SF) යටතේ රු. මිලියන 11,088 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,696 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 3 ක දී දීර්ඝ කර 2021 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ද 2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ මුදල්	310	5	241
විදේශ මුදල්	784	34	(9.24)
මුළු වත්කම්	17,780	17,202	17,433
මුළු වගකීම්	690	74	79
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	13,437	13,470	13,461
දේශීය අරමුදල් මගින්	3,656	3,661	3,902

එම තත්වාගණනය කල විගණන මතය ඉදිරිපත් කිරීම සඳහා හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැනනැගුණු වැදගත් නිරීක්ෂණ කිහිපයක් පරිදි විය.

	විගණන නිරීක්ෂණ	මූල්‍ය වර්ෂය	විගණකාධිපතිවරයාගේ නිර්දේශය	ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වර්තමාන තත්ත්වය
(අ)	ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් කෘ කැබ් රථ **14**ක් සහ ඩබල් කැබ් රථ **07**ක් මණ්ඩලය වෙත පවරා තිබුණි. නමුත් මණ්ඩලයේ වත්කම් ලේඛනවලට අනුව ලැබී තිබුණේ වාහන **16**ක් පමණි. එබැවින් රුපියල් මිලියන **28**ක් වටිනා	2023	වාර්තා නොකළ වාහන පහකට අදාළ ප්‍රමාණවත් තොරතුරු ලබාදීමට වහා පියවර ගත යුතුය.	ඉතිරි වාහන වල **(5)** විස්තර වහාම සපයනු ලැබේ.	දැනට වාහන 5 හි විස්තර සකස් කරමින් පවතින අතර ඉක්මනින් ලබාදෙනු ලැබේ.

	වාහන **5**ක් පිළිබඳව විගණනයට සාක්ෂි සැපයීමට ව්‍යාපෘති කළමනාකාරීත්වය අසමත්ව තිබුණි.				
(ආ)	කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 49 සිට 18 දක්වා අඩුකිරීමේ ඉලක්කය සපුරා ගැනීමේ අරමුණින් ආදායම් නොවන ජලය කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීමට සහ ඉලක්කගත අරමුණු වල ප්‍රගතිය මැනීමට ප්‍රවාහ මිනුම් දත්ත ලබා ගැනීම සඳහා ඇමරිකානු ඩොලර් 383,710.2 ක වටිනාකමකින් යුත් (ආසන්න වශයෙන් රු.මි.115 ක් පමණ) ඩීඑම්ඒ මීටර 36 ක් සවි කර තිබුණි. කෙසේ වෙතත්, නිෂ්ක්‍රීය වූ බැටරි සහ දෝෂ සහිත ඩේටා ලොගර් හේතුවෙන් ඉහත ඩීඑම්ඒ මීටර 36 න් මීටර 31 ක් අක්‍රියව පැවතුනි. තවද ඇතැම් මීටර 2022 වසරේ සිට අක්‍රියව පවතින බවද නිරීක්ෂණය විය.	2023	කළමනාකරණය මෙම සංරචකයේ අසාර්ථකත්වයට වගකිව යුතු අතර පවතින ගැටළු නිවැරදි කිරීමට සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	ව්‍යාපෘතිය ප්‍රවාහ මීටර නිෂ්පාදකයාගෙන් අලෙවියෙන් පසු සේවාව ලබා ගැනීමේ ක්‍රියාවලියේ නිරතව සිටී. අවශ්‍ය බැටරි ආනයනය කර ප්‍රතිස්ථාපනය සඳහා කටයුතු කරමින් පවතී. තවද එන්ඩබ්එස්ඩීබී කොළඹ නගරය සඳහා ස්ථාපනය කර ඇති ප්‍රවාහ මිනුම් පද්ධතිය වරින් වර නඩත්තු කිරීම සඳහා දේශීය නියෝජිතයෙකු සමඟ නඩත්තු ගිවිසුමක් අත්සන් කරයි.	දැනට, දේශීය නියෝජිතයන් සියලුම ඩීඑම්ඒ මීටර විමර්ශනය කරමින් හා දෝෂ හඳුනාගනිමින් සිටී. එය අවසන් වූ වහාම එම දෝෂ සහිත මීටර නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. තවද එන්ඩබ්එස්ඩීබී විසින් දේශීය නියෝජිතයෙකු සමඟ නඩත්තු ගිවිසුමකට එළඹීමට කටයුතු කරමින් සිටී.

(ඇ)	එම ඩීඑම්ජ් මීටර වසර 3ක නිෂ්පාදන වගකීමක් සහිතව 2016 සහ 2017 වසර වලදී මිලදී ගෙන තිබුණු අතර මිලදී ගත් දින සිට වසර දෙකකට පසු ඒවා සවි කර තිබුණි. තවද ස්ථාපනය කරන විටත් මීටර 36න් 31ක වගකීම් කාලය අවසන් වී තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකාරීත්වය තවමත් එම දෝෂ සහිත මීටර නිවැරදි කිරීමටත්, එම මීටර් නඩත්තු කිරීමට නිෂ්පාදක බලයලත් දේශීය නියෝජිතයෙකු සමඟ ගිවිසුමකට එළැඹීමටත්, ප්‍රවාහ මීටර සවිකිරීමේ ක්‍රියාවලිය බරපතල ලෙස ප්‍රමාද වීම නිසා සැපයුම්කරුගේ වගකීම් කාලය දීර්ඝ කිරීමටත් තවමත් කටයුතු කර නොතිබුණි.	2023	නියමිත කාල රාමුව තුළ දී ඇති කාර්යය සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති කළමනාකාරිත්වය වගකිව යුතුය.	ප්‍රවාහ මීටර වල ගැලපීම සහතික කිරීම සඳහා එම මීටර තනි වෙළඳ නාමයකින් මිලදී ගන්නා ලදී. මුල් ව්‍යාපෘති සැලැස්මට අනුව එය 2018 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.. කෙසේ වෙතත්, නල එලීමේදී ප්‍රධාන කොන්ත්‍රාත්කරු මුහුණ දුන් වැඩබිමේ විවිධ දුෂ්කරතා හේතුවෙන්, ඩීඑම්ජ් සැකසීමට අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත විය. එබැවින් ස්ථාපන කටයුතු ප්‍රමාද විය.	දැනට, දේශීය නියෝජිතයන් සියලුම ඩීඑම්ජ් මීටර විමර්ශනය කරමින් හා දෝෂ හඳුනාගනිමින් සිටී. තවද එන්ඩබ්එස්ඩීබී විසින් දේශීය නියෝජිතයෙකු සමඟ නඩත්තු ගිවිසුමකට එළඹීමට කටයුතු කරමින් සිටී.
(ඈ)	රත්මලාන ප්‍රධාන ගබඩා පරිශ්‍රයේ ජල මීටර පරීක්ෂා කිරීමේ වැඩපොලක් ඉදිකිරීම සඳහා **2014** වර්ෂයේදී රුපියල් මිලියන **2** ක අත්තිකාරම් ගෙවීමක් සහිතව පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු	2023	මූල්‍ය පාඩු කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	එන්ඩබ්එස්ඩීබී විසින් අදාළ පාර්ශවයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.	කොන්ත්‍රාත්කරු ව්‍යාජ ලියකියවිලි ලබා දී ඇති අතර, පාඩුව අයකර ගැනීම සඳහා එන්ඩබ්එස්ඩීබී විසින් අදාළ පාර්ශවයට එරෙහිව නීතිමය

	ට රුපියල් මිලියන **11** ක කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. **2024** අප්‍රේල් මාසය වන විට කොන්ත්‍රාත්තුව ලබා දී වසර **10** ක් ගතවී තිබුණද කොන්ත්‍රාත්කරු ඊට අදාළ කිසිදු කාර්යයක් කර නොතිබුණු අතර කළමනාකාරීත්වය විසින් අත්තිකාරම් ගෙවීමේ ඇපකරයේ කාලය දීර්ඝ කිරීමට හෝ එම ඇපකර, මුදල් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.				ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.
(ඉ)	ව්‍යාපෘතිය භෞතික වශයෙන් වසර දෙකකට පෙර අවසන් කර සහ කොන්ත්‍රාත්තුවේ අවසන් බිල්පත් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණද රුපියල් මිලියන **16,452**ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම්වලට අදාළ, වත්කම් ප්‍රාග්ධනීකරණ කටයුතු අවසන් කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත විධිමත් ලෙස භාරදී නොතිබුණි.	2023	වත්කම් ප්‍රාග්ධනීකරණ ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ තවදුරටත් ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘතිය අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය.	පැකේජ් **1** සහ **2** අවසාන බිල්පත් සම්පූර්ණ කර ඇති බැවින්, මෙම මුළු මුදල වත්කම් පෝරම හරහා ප්‍රාග්ධනීකරණයට එකතු වේ.	වර්තමානය වන විට ඉතිරිවී ඇති වත්කම් වල ප්‍රාග්ධනීකරණ කටයුතු, එන්ඩබ්එස්ඩීබී විසින් සිදුකරනු ලබන අතර ඒවා 2024 වර්ෂය අවසානයට පෙර නිම කිරීමට සැලසුම් කර ඇත.

(ඊ)	නළ එළන ලද සියලුම මාර්ග කොළඹ මහ නගර සභාවට පවරා දෙවසරක් ගතවී ඇතත් ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ඉදිකිරීම් සම්බන්ධයෙන් වූ රුපියල් මිලියන **109**ක ආරක්ෂක තැන්පතු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි**.**	2023	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඇප මුදල් අයකර ගැනීමට වහා පියවර ගත යුතුය	පවරා දී ඇති මාර්ගවල ආරක්ෂක තැන්පතු නිදහස් කරන ලෙස දැනටමත් කොළඹ මහ නගර සභාවෙන් ඉල්ලා තිබුණි.	ආරක්ෂණ තැන්පතු ආපසු ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

2.14. අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතිය

2014 දී ආරම්භ කරන ලද අඹතලේ ජල සම්පාදන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඒජන්සි ෆ්‍රැන්චයිස් ද ඩිවලොප්මන්ට් (AFD) අරමුදලේ ණය ගිවිසුම් අංක CLK 1008 – 01P යටතේ රු. මිලියන 9,100 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,900 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 03 ක දී දීර්ඝ කර 2024 ජූනි 30 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	116	155	1,492
විදේශ අරමුදල්	2,218	4,933	-
මුළු වත්කම්	6,222	11,380	12,677
මුළු වගකීම්	263	333	139
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	5,018	9,943	9,943
දේශීය අරමුදල් මගින්	949	1,104	2,595

එම තත්වාගණනය කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණ	**මූල්‍ය වර්ෂය**	**විගණකාධිපතිවරයාගේ නිර්දේශය**	**ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වර්තමාන තත්ත්වය**
(අ)	ව්‍යාපෘතියේ සැලසුම් සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවාව සඳහා වන කොන්ත්‍රාත්තුව රු.මිලියන 461 කට 2015 දෙසැම්බර් 01 දින මාස 36ක් ඇතුළත අවසන් කිරීමට පෞද්ගලික උපදේශන සේවා සමාගමකට	2023	ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නියමිත කාල සීමාව තුළ අවසන් කිරීමට සහ තවදුරටත් පාඩු අවම කර ගැනීමට උපදේශකවරයා සමීපව අධීක්ෂණය කළ යුතුය.	අයි.සී.බී. 03 සහ අයි.සී.බී. 05 කොන්ත්‍රාතු තවමත් ක්‍රියාත්මක වන බැවින්, උපදේශන සේවාවේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය වේ. 2024 ජූලි 25	ICB 03 සහ ICB 05 කොන්ත්‍රාත්තු තවමත් ක්‍රියාත්මක වෙමින් පවතින අතරම මේ වන විට තීරණාත්මක මට්ටමේ පවතින බැවින්, උපදේශන සේවා කාලය දීර්ඝ කිරීම අවශ්‍ය වේ. මේ සඳහා 2024

ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, අයි.සී.බී. 05 සහ අයි.සී.බී. 03 හි උපදේශන කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබූ අතර ව්‍යාපෘති කාල සීමාව පුරාවට කොන්ත්‍රාත්කරුවන්ගේ දිගු ප්‍රමාදයන්, අකාර්යක්ෂමතාව සහ දුර්වල කාර්යසාධනය පෙන්නුම් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, උපදේශන කාලය 2024 ජූනි 30 දක්වා 6 වතාවක් දීර්ඝ කිරීමට සිදු වී තිබුණු අතර, තවදුරටත් 6 වැනි දිගුවේදී උපදේශන කොන්ත්‍රාත්තුවේ යෙදවුම් සඳහා රුපියල් මිලියන 21 ක් වැය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ සමස්ත උපදේශන සේවා පිරිවැය ඇස්තමේන්තුගත උපදේශන පිරිවැයට වඩා රුපියල් මිලියන 159 කින් වැඩි වී තිබුණු අතර උපදේශන කොන්ත්‍රාත්තුව විධිමත් අනුමැතියකින් තොරව 2024 ජූලි 10 දින වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී.	වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු බැවින් විධිමත් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය.	ජූලි 25 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහ මණ්ඩල අනුමැතිය ලැබිණි. ඒ අනුව, උපදේශන සේවා කොන්ත්‍රාත්තුව 2024 දෙසැම්බර් 31 දක්වා තවදුරටත් දීර්ඝ කිරීමට නියමිතය.

(ආ)	ගොතටුව සන මීටර් 15,000 ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සමඟ කිලෝමීටර 05 ක් සඳහා ඩීඅයි නල (අයිසීබී 03) සැපයීම සහ එළීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2023 ජුනි 06 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණි. පසුව එය 2024 මැයි 07 දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට සමස්ත භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය සියයට 86 ක් හා සියයට 83 ක් වූ අතර එය 2024 ජුනි 30 දිනට පිළිවෙලින් සියයට 93 ක් හා සියයට 85 ක් විය. තවද අයි.සී.බී. 03 කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය ව්‍යාපෘතියේ දීර්ඝ ප්‍රමාදයට සෘජුවම බලපා ඇති බව ව්‍යාපෘතියේ උපදේශකවරයා සිය ප්‍රගති වාර්තාවල සඳහන් කර තිබුණි.	2023	සැලසුම් කර ඇති පරිදි අයි.සී.බී. 03 කොන්ත්‍රාත් පැකේජය තවදුරටත් ප්‍රමාදයකින් තොරව සහ රටට පාඩු නොලබන ආකාරයට සැලසුම් කර සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය.	ප්‍රමාදයන් සඳහා දායක වන මූලික සාධක අයිතම 4.1.1 හි දක්වා ඇති අතර දුර්වල පාංශු තත්ත්වයන්, භූගත උපයෝගිතා විශාල ප්‍රමාණයක් පැවතීම සහ සැලසුම් වෙනස්වීම් හේතුවෙන් ඇති වන අතිරේක කාර්යයන් නවතම කාලය දීර්ඝ කිරීමේ ඉල්ලීමට බලපාන තරමේ සැලකිය යුතු ගැටළු වී ඇත.	ICB 03 කොන්ත්‍රාත්තුව 2024 නොවැම්බර් 30 වන විට අවසන් කිරීමට නියමිතයි. දැනට, 2024 සැප්තැම්බර් 30 වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 88.50 සහ සියයට 95.62 ලෙස පවතී.
(ඇ)	ව්‍යාපෘති ක්‍රියාකාරකම් 2016 සිට ආරම්භ කර තිබූ අතර මූලික ව්‍යාපෘති නිමකිරීමේ දිනය 2019 දෙසැම්බර් 31 වන දින වුවද තෙවරක් කාල දීර්ඝ කිරීම් ලබා දී තිබුණත්, ව්‍යාපෘතිය යටතේ ඇති කිසිදු ප්‍රධාන කොන්ත්‍රාත්තුවක් 2024 ජුලි 31 දින වන විටත් සම්පූර්ණයෙන් නිම කර	2023	අනපේක්ෂිත තත්ත්වයන් කළමනාකරණය කර රටට තවදුරටත් මූල්‍ය බර පැටවීම වැළැක්වීම සඳහා කාර්යයන් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	ව්‍යාපෘති ප්‍රමාදයට දායක වී ඇති 4.1.1 සහ 4.1.2 වගන්තිවල දක්වා ඇති අභියෝග හැර, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (පී.එම්.යූ.) හිතාමතාම	ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කැපී පෙනෙන ධනාත්මක ප්‍රතිඵල ළඟාකරගෙන ඇත. දැනට අඹතලේ ජල පවිත්‍රාගාරයේ මුළු විදුලි පිරිවැයෙන් දළ වශයෙන් සියයට 11 ක් නියෝජනය කරමින් මසකට

නොතිබුණි. නමුත් ආර්ථිකයට කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව ණය වාරික (රු.මි. 234) සහ බැඳීම් ගාස්තු (රු. මිලියන 390) හා ණය පොලී (රු. මිලියන 621) නිෂ්කාර්යව දරා තිබුණි. අනෙක් අතට ඉහළ බලශක්ති පරිභෝජනය අඩුකිරීමේ අපේක්ෂිත අරමුණ සාක්ෂාත් කර ගැනීමකින් තොරව එන්.ඩබ්.එස්.ඩී.බී හි ජල සැපයුම් සඳහා වන පිරිවැය ද වැඩි වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල සැලසුම්කරණය, දුර්වල කාර්ය සාධනය සහ ව්‍යාපෘති කළමනාකරණයේ දුර්වල කොන්ත්‍රාත්තු අධීක්ෂණය ද ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි.

ප්‍රමාදයක් සිදු කර නැත. මීට අමතරව, කොන්ත්‍රාත්කරුගේ දුර්වල සැලසුම්, කාර්ය සාධනය හෝ අධීක්ෂණය හේතුවෙන් ප්‍රමාදය ආරෝපණය කළ නොහැක. එසේ වුවද, ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කැපී පෙනෙන ධනාත්මක ප්‍රතිඵලවලට හේතු වී ඇත. අඹතලේ ජල පවිත්‍රාගාරයේ මාසිකව රු.මි. 18.5 ක පමණ බලශක්ති ඉතිරියක් නිරීක්ෂණය වන අතර එය මුළු විදුලි පිරිවැයෙන් දළ වශයෙන් සියයට 11 ක් පමණ නියෝජනය වේ. මෙම ඉතුරුම් අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කරන අතර ව්‍යාපෘතිය අවසන් වූ පසු තවදුරටත් වැඩි විය හැක.

රුපියල් මිලියන 18.5 ක පමණ බලශක්ති ඉතිරියක් ලැබෙමින් පවතී.

(ඇ)	යෝග්‍ය ධාරිතාවයෙන් යුත් කාර්යක්ෂම පොම්ප සවිකිරීමෙන් බලශක්ති ඉතිරිකිරීම සඳහා අඹතලේ නිෂ්පාදන පහසුකම්වල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සහ බලශක්ති ඉතිරිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව (අයි.සී.බී. 05) 2020 දෙසැම්බර් වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් අනතුරුව කොන්ත්‍රාත් කාලය 2024 අප්‍රේල් 30 දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව සමස්ත ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලින් සියයට 45.60ක බරක් නියෝජනය කළද, සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙළින් සියයට 65 ක් සහ සියයට 47 ක් ලෙස පෙන්නුම් කර තිබූ අතර 2024 ජූනි 30 වන විට එය පිළිවෙලින් සියයට 75 ක් සහ සියයට 48 ක් විය.	2023	කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කරමින් ව්‍යාපෘති කළමනාකාරිත්වය විසින් ව්‍යාපෘති අකාර්යක්ෂමතා සහ අනවශ්‍ය ප්‍රමාදයන් මඟහරවා ගැනීමට ක්‍රියා කළ යුතුය.	4.1.2 වගන්තියේ දක්වා ඇති ගැටළු හේතුවෙන් ප්‍රමාදයන් සිදුවී ඇත. මෙම ප්‍රමාදයන් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතියට අඛණ්ඩව බලපා ඇත. රොන්මඩ පිරිපහදු පද්ධතිය සහ පසු සේදුම් ප්‍රතිසාධන පද්ධතිය සඳහා ඉදිකිරීම්, යාන්ත්‍රික සහ විදුලි (M&E) කටයුතු සාධාරණ ප්‍රගතියක් සහිතව සිදුවෙමින් පවතින අතර අනෙකුත් සිවිල් කටයුතු සම්පූර්ණ කළ හැක. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් මාසයට පෙර ව්‍යාපෘතිය නිම කිරීමට හැකියාවක් නොපවතී.මෙම ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරු අමතර කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා ඇත. ව්‍යාපෘති	රොන්මඩ පිරිපහදු පද්ධතිය සහ පසුසේදුම් ප්‍රතිසාධන පද්ධතියන්හි යාන්ත්‍රික සහ විදුලි (එම් ඇන්ඩ් ඊ) කටයුතු තවමත් සිදු වෙමින් පවතී. 2024 සැප්තැම්බර් 30 වන විට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 79.83 සහ සියයට 52.29 ලෙස පැවතුණි.. කොන්ත්‍රාත්කරු විසින් 2024 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කිරීමක් ඉල්ලා ඇත. මෙම පැකේජය සම්පූර්ණ ව්‍යාපෘතියේ තීරණාත්මක අංගය වන බැවින් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සක්‍රීයව අධීක්ෂණය කරමින් සිටී.

			දීර්ඝ කිරීම සඳහා කැබිනට් අනුමැතිය 2024 දෙසැම්බර් 31 දක්වා ලබා දී ඇත. සංශෝධිත කාලසටහනට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සඳහා ව්‍යාපෘති කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සක්‍රියව අධීක්ෂණය සහ අධීක්ෂණය කරමින් සිටී.	
(ඉ)	අයිසීබී 3 කොන්ත්‍රාත්තුව 2023 යටතේ මොරගස්මුල්ල ජල ටැංකියට ජලය පොම්ප කිරීම සඳහා මොරගස්මුල්ල ප්‍රදේශයේ බූස්ටර් පොම්පාගාරයක් ඉදිකිරීමට රු. මිලියන 86 ක් වෙන් කර තිබූ අතර එහි ඉදිකිරීම් කටයුතු සියයට 93.88 ක් දක්වා නිම කිරීමෙන් පසු, ICB 3 කොන්ත්‍රාත්තුව යටතේ මාලිගාකන්ද ප්‍රදේශය දක්වා එළන ලද මිලිමීටර් 1,200 සම්ප්‍රේෂණ නළයට සෘජුවම නල මාර්ගයක් සම්බන්ධ කර මොරගස්මුල්ල ජල ටැංකියට අධි පීඩනයකින්	ව්‍යාපෘති කළමනාකරණය සෑම විටම ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති අරමුදල් භාවිතා කිරීමට අනුගත විය යුතුය.	මුලදී, අයිඩීඑච් රෝහල් පරිශ්‍රයේ 15,000 m³ භූගත ජලාශයක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව මොරගස්මුල්ල කුළුණට ජලය සැපයීමට සම්ප්‍රේෂණ පද්ධතියේ පීඩනය ප්‍රමාණවත් නොවීය. කෙසේ වෙතත්, 15,000 m³ ජලාශය අඹතලේ ජල පවිත්‍රාගාරයට ගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස, පද්ධතිය	මොරගස්මුල්ල ප්‍රදේශයේ ප්‍රක්ෂේපිත ජල අවශ්‍යතා සපුරාලීම සඳහා 2030 දශකයේ මැද භාගයේ සිට අවශ්‍ය වන අතර බූස්ටර් පොම්පාගාරයක් මෙම අදියරේදී අවශ්‍ය නොවන තත්වයක් පැවතුණි.

	ජලය සැපයීමට මණ්ඩලය විසින් තීරණය කිරීමත් සමඟ මොරගස්මුල්ල පොම්පාගාර ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. කෙසේ වෙතත්, මෙම තීරණය ගන්නා විට අතහැර දැමූ ව්‍යාපෘතිය සඳහා අමතර හිමිකම් පෑමක් ලෙස රු. මිලියන 28.86 ක මිල විචලතා ඇතුලත්ව රු.මිලියන. 66.5 ක් වැය කර තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද සියලු වියදම් ආර්ථික නොවන වියදම් බව නිරීක්ෂණය විය.		සෘජු බෙදා හැරීමේ පද්ධතියක් බවට පත් වූ අතර එමඟින් සම්ප්‍රේෂණ පීඩනය වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2030 දශකයේ මුල් භාගය වනතුරු මොරගස්මුල්ල ප්‍රදේශයට සේවා සැපයීම සඳහා බූස්ටර් පොම්පාගාරයක් අවශ්‍ය නොවේ. ජලාශයේ පිහිටීම වෙනස් කිරීම NWSDB පාලනයෙන් ඔබ්බට වූ අතර එබැවින් දුර්වල සැලසුම් කිරීමක් ලෙස සැලකිය නොහැකිය. මොරගස්මුල්ල ප්‍රදේශයේ ප්‍රක්ෂේපිත ජල අවශ්‍යතා සපුරාලීම සඳහා 2030 දශකයේ මැද භාගයේ සිට බූස්ටර් පොම්ප අවශ්‍ය වේ.	
(ඊ)	අයිසීබී 05 හි ප්‍රධාන 2023 කොන්ත්‍රාත්කරු 2023 මැයි 24 දිනැති අංක ZHSZJH/2857/05/23 ලිපිය මගින් එ.ජ.ඩොලර් 5,691,179.76 ක මුදලක්	ලංසු ලේඛනයේ වෙන් කර ඇති අයිතම සඳහා පමණක් ව්‍යාපෘති අරමුදල් භාවිතා කිරීමට සැමවිටම	මිල වැඩි කිරීම සඳහා අයිසීබී 05 කොන්ත්‍රාත්කරු ගෙන් අපට හිමිකම් පෑමක් ලැබී ඇත.	හිමිකම් පෑම දැනට ඇගයීමට ලක්ව ඇත. ගනු ලබන ඕනෑම තීරණයක් සාධාරණ සහ ගිවිසුමේ

	මිල විචලතා සඳහා හිමිකම්පෑමක් ලෙස ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් එය නිර්මාණ සහ ඉදිකිරීම් ස්වභාවයේ කොන්ත්‍රාත්තුවක් වන බැවින් කළමණාකාරීත්වයට ගිවිසුම ප්‍රකාරව මිල විචලතා ගෙවීමට වෙනත් ප්‍රතිපාදන කිසිවක් නොතිබුණි.		වගබලා ගත යුතුය. (මෙය නිර්මාණ කොට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවක් බැවින් මිල විචලතා සඳහා ප්‍රතිපාදන නොමැති නිසා) තවද, මෙවැනි මතභේදාත්මක ගෙවීම් සඳහා අරමුදල් නිකුත් කිරීමට පෙර NWSDB හි අභ්‍යන්තර විගණනයේ (තාක්ෂණ අංශය) නිර්දේශ ලබා ගත යුතු බව යෝජනා කෙරේ.	කොන්ත්‍රාත්කරු ඔවුන්ගේ වැඩ සඳහා අවශ්‍ය යෙදවුම්වල පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් ගැලපීමක් ඉල්ලා ඇත.	නියමයන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අප ව්‍යාපෘති විචලතා කමිටුව මගින් අදාළ සියලු තොරතුරු ප්‍රවේශමෙන් සමාලෝචනය කරමින් සිටිමු. ඇගයීම් ක්‍රියාවලිය අවසන් වූ වහාම අප වැඩිදුර යාවත්කාලීන ලබාදීමට කටයුතු කරමි.
(උ)	වසරක් ඇතුලත කාර්ය මණ්ඩල නිල නිවාස ඒකක 06 ක් ඉදිකිරීම සඳහා වටිනාකම රු. මිලියන 129 ක කොන්ත්‍රාත්තුවක් 2021 අගෝස්තු 10 වැනි දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. ඒ සඳහා 2023 සැප්තැම්බර් දක්වා දීර්ඝ කිරීම් හතරක් ලබා දී තිබුණි. නිම කිරීමට තවත් ඉතිරි වැඩ කිහිපයක් තිබියදී මණ්ඩලය විසින් අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණු අතර මිල ඉහලයාමේ පිරිවැය රු. මිලියන 44.12 ක්	2023	ඉතිරි වැඩ අවසන් කර වත්කම් එන්.ඩබ්.එස්.ඩී.බී වෙත පැවරීමට කඩිනම් පියවර ගත යුතුය.	ආරම්භක කොන්ත්‍රාත්තු වේ මිල විචලතා ගණන් බලා නැත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් සංශෝධන -1 අත්සන් කිරීමෙන් පසුව, මිල විචලතා හඳුන්වා දෙන ලදී. එබැවින් කොන්ත්‍රාත් ප්‍රමාණ බිල්පතෙහි (BOQ) වෙන්කල මුදලක් (Provisional amount)	කාර්ය මණ්ඩල නිල නිවාස ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමේ තීරණාත්මක වැදගත්කම සලකා බලන විට, අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට සහ ඉතිරි වැඩ නිම කිරීම සඳහා අමතර අරමුදල් සොයා ගැනීමට සියලු උත්සාහයන් කරමින් පවතී.

ඇතුළුව රු. මිලියන 131.51 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවද 2024 ජුලි 10 වැනි දින විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී සම්පූර්ණ ටයිල් වැඩ සහ බොහෝ නිම කිරීමේ කටයුතු තවමත් අවසන් කිරීමට ඉතිරිව තිබුණි.

ඇතුළත් නොවීය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කොන්ත්‍රාත්තුවේ භෞතික අවිනිශ්චිතතා (Physical contingencies) යටතේ මිල ඉහළ යාම සලකා බැලූ අතර එහෙත් එතැන් සිට සියයට 10 ක අවිනිශ්චිත සීමාව ඉක්මවා ගොස් තිබුණි.

2.15. මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

2010 අප්‍රේල් 09 දින ආරම්භ කරන ලද මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 2557 එස්. ආර්.අයි. (එස්.එෆ්) සහ අංක 2558 එස්.ආර්.අයි (එස්.එෆ්) යටතේ රු. මිලියන 10,783.65 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,813.46 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 6 ක දී දීර්ඝ කර 2023 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	145	99	21
විදේශ අරමුදල්	690	753	725
මුළු වත්කම්	14,567	15,412	16,038
මුළු වගකීම්	289	365	49
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	12,184	12,853	13,647
දේශිය අරමුදල් මඟින්	2,094	2,194	2,342

ඊට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	උපදේශක දීමනා ගෙවීම සඳහා උපරිම දින 22 ක් වැඩකළ යුතු බව දක්වා තිබුණි. කෙසේවෙතත්, ගෙවීම් වවුචර්පත් පරීක්ෂාවේදී උපරිම දින 22 ක් නොපැමිණ උපදේශන දීමනාව ගෙවා තිබුණි. 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා ගෙවීම් වවුචර්පත්	2021	උපදේශන දීමනාව නීති හා රෙගුලාසිවලට අනුකූලව ගෙවිය යුතුයි.	වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය. නිමකළ යුතු වැඩ ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත.

	පරීක්ෂාවේදී වැඩ නොකරන දින සඳහා එකතුව රු.මිලියන 3.9 ක් ගෙවා තිබුණි.				
(ආ)	නිළධාරීන් තිදෙනෙකු බේරුම්කරණ කටයුතු සඳහා පත්කර තිබුණු අතර නිළධාරීන් තෝරාගත් ආකාරය සහ පත් කිරීම සඳහා ලබාගත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය පිළිබඳ ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. නිළධාරීන් තිදෙනා වෙත 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1.7 ක් ගෙවා තිබුණි.	2021	ගෙවීම් සිදුකිරීමට පෙර නිසි අනුමැතිය ලබා ගත යුතුය.	නැත.	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය.
(ඇ)	මහා භාණ්ඩාගාරය 2010 පෙබරවාරි 15 දින සිට 2021 අගෝස්තු 15 දක්වා OCR ණය මුදලේ ලබා නොගත් ණය ශේෂය මත රු.මිලියන 122 ක් බැඳීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි.	2021	නිසි ව්‍යාපෘති සැලසුම්කරණයක් මඟින් මෙම පිරිවැය අවම කරගත යුතුය.	නැත	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය.
(ඉ)	2021 වර්ෂයේ ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ නිළධාරීන් 7 දෙනෙකු සඳහා රු.මිලියන 2.5 ක් ගෙවා තිබුණු අතර රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය නිමකර ආසන්නව මාස 70 ක් ගත වී තිබුණද ප්‍රතිපත්ති සහයක කණ්ඩායම සඳහා රු.මිලියන 41.2 ක මුදලක් ව්‍යාපෘතිය	2021	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සහායක කණ්ඩායම් ක්‍රියාකාරීව දායක වියයුතු අතර ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීම සිදුකළ යුතුය	නැත	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය.

	ආරම්භයේ සිට 2021 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබුණි. ප්‍රතිපත්ති සහයක කණ්ඩායමේ කාර්යසාධන වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති සඳහා ප්‍රතිපත්ති සහායක කණ්ඩායමේ දායකත්වය ඇගයීමට නොහැකි විය.				
(ඊ)	**අපජල පොම්පාගාරය සහ පොම්ප කිරීමේ ජාලය සැලසුම් කිරීම, ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.** ව්‍යාපෘතිය 2010 අප්‍රේල් 9 වන දින ආරම්භ කර 2015 ජුනි 30 දින නිම කිරීමට නියමිතව තිබුණද, නිමකිරීමේ දිනය 2023 ජුනි 30 දක්වා 6 වතාවක් දීර්ඝ කර තිබුණි	2022	අවශ්‍ය ගුණාත්මක මට්ටම සහතික කරමින් වැඩ කඩිනමින් නිම කිරීමට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරු පෙළඹවිය යුතුය.	නැත	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය.
(උ)	කොළඹ මහ නගර සභාවේ අපජල පොම්පාගාර සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කොන්ත්‍රාත්තු අංක ජීසීඩබ්ලිව්එම්පී/ඒඩීබී/පීඑස්/01/අයිසීබී/වැඩ/03/2013 යටතේ යූරෝ 887,104 ක්, එජඩො 937,976 ක් සහ රු මිලියන 52.4ක් වටිනා අත්‍යවශ්‍ය අමතර කොටස් සැපයීමට එකඟ වී තිබුණි.	2022	දැනට සපයා ඇති අමතර කොටස් තොග සහ තවදුරටත් සැපයීමට නියමිත අමතර කොටස් සැපයීම සම්බන්ධයෙන් ව්‍යාපෘති කාර්යාලය සහ කොළඹ මහා නගර සභාව වහා පියවර ගත යුතුය.	නැත	ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය.

	කෙසේවෙතත්, 2022 දෙසැම්බර් 31 වන විට යුරෝ 739,906 ක් එජඩො 777,736 ක් සහ රු මිලියන 52.4 ක් වටිනා අත්‍යාවශ්‍ය අමතර කොටස් සැපයිව යුතුව තිබුණි.				
(ඌ)	විට්ස්වයික් , බොරැල්ල, තිඹිරිගස්යාය, මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් එම පොම්පාගාර 04 සඳහා 2016 වර්ෂයේදී රැගෙන එන ලද යන්ත්‍ර සහ උපකරණ 2022 දෙසැම්බර් 31 දින තෙක් එම පොම්පාගාරවල සවිකිරීමට නොහැකි වී ඇත.	2022	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ඉතිරි වැඩ නිම කිරීමට රජයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි.
(එ)	ණය ගිවිසුම් අංක 2557 එස්ආර්අයි සහ 2558 එස්ආර්අයි දරන මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය, 2010 අප්‍රේල් 04 දින ආරම්භ කර 2015 ජුනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ අවසන් දිනය 2023 ජුනි 30 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘතිය නිම කිරීම මාස 96 කින් ප්‍රමාද වී ඇත.	2023	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය අවසන් විය. ඉතිරි වැඩ නිම කිරීමට රජයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි

(ඒ)	විටස්වයික්, බොරැල්ල, තිඹිරිගස්යාය සහ මාලිගාවත්ත යන පොම්පාගාර 04ක ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වීම හේතුවෙන් තාවකාලික විසඳුමක් ලෙස බයිපාස් ක්‍රමයක් යටතේ අපජලය පොම්ප කිරීමට සිදුවන බවත්, ඒ අනුව ව්‍යාපෘතියට අපේක්ෂිත ප්‍රතිලාභ ජනනය කිරීමට නොහැකි වී තිබුණි.	2023	ව්‍යාපෘති කාල සීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනිමට අවශ්‍ය වේ.	නැත	ඉදිකිරීම් ආරම්භ කර ඇත.
(ඔ)	ජලාපවහන අංශයට හඳුන්වා දෙනලද වටිනාකම රු. මිලියන 3.2ක් වන මූල්‍ය කළමණාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි.	2023	විදේශ ආයෝජන ඵලදායී ලෙස භාවිත කිරීමට පියවර ගත යුතුයි.	නැත	භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ඕ)	පොම්පාගාර තුනක ඉදිකිරීම් අවසන් කිරීමෙන් පසු ඒවා කොළඹ මහා නගර සභාවට භාර දී තිබු අතර 2021 නොවැම්බර් 24 වන දින කොම්පඤ්ඤවීදිය පොම්පාගාරයේ සිදු කරන ලද පූර්ව ආරම්භ කිරීම් පරීක්ෂණයේදී ප්‍රධාන නලයට හානි වී තිබූ බව නිරීක්ෂණය වී ඇති අතර පොම්පාගාරයේ යන්ත්‍රෝපකරණ අක්‍රීයව පැවතුනි. තවද, විවෘත ඇළ මාර්ගයක් ඔස්සේ බේරේ වැවට අපජලය මුදා හැරීම නිසා පරිසර	2023	ගුණාත්මක ඉදිකිරීම් සිදුකිරීමෙන් පරිසර හානිය වළක්වා ගැනීමට පියවර ගත යුතුය.	නැත	නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

හානියක් සිදුවන බව
වැඩිදුරටත් නිරීක්ෂණය
විය.

2.16 මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 02

2014 සැප්තැම්බර් 23 දින ආරම්භ කරන ලද මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 02 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3030 එස්. ආර්.අයි. (එස්.එෆ්) යටතේ රු. මිලියන 1,042.88 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 187.72 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 02 ක දී දීර්ඝ කර 2023 ඔක්තෝම්බර් 22 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	25	108	20
විදේශ අරමුදල්	50	1,018	95
මුළු වත්කම්	539	1,703	1,758
මුළු වගකීම්	47	77	17
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	380	1,406	1,501
දේශිය අරමුදල් මඟින්	112	220	240

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ) **මාදම්පිටිය අපජල පවිත්‍රාගාරය** 2021 දෙසැම්බර් 31 වන විට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අපජල පවිත්‍රාගාරය (ආ) ඉදිකිරීම සඳහා වන ඉඩම අත්පත් කරගෙන නොතිබුණු අතර පාරිසරික බලපෑම් (ඇ) ඇගයීමේ වාර්තාව පිළියෙල කිරීමේ කටයුතු තාවකාලිකව නවතා තිබුණි. (ඈ) **උතුර ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන 7ක් සඳහා පහසුකම් සැපයීම** (ඉ) හු තාක්ෂණික විමර්ශන සඳහා වන කොන්ත්‍රාත්තුවේ ලංසු කැඳවීම නිම කර නොතිබුණි. **උතුර ජල පෝෂක ප්‍රදේශයේ පවතින කුඩා පොම්පාගාර 5ක් පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම** 2021 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබඳ තක්සේරුව ආරම්භ කර නොතිබුණි. **මාලිගාවත්තේ සිට මාදම්පිටිය පොම්පාගාරය දක්වා මූලික බදක් සහිත මලාපවහන ඉදිකිරීම** ලංසු කෙටුම්පත් නිමකර	2021	වැඩසටහනේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගැනීමට අවශ්‍ය වේ.	කාර්යය කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.

	ඇත. අරමුදල් සීමාවීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොමැත. **උතුරු ජල පෝෂක ප්‍රදේශයේ මලාපවහන වැඩිදියුණු කිරීම, පුනරුත්ථාපන කිරීම සහ අලුත්වැඩියාව** කෙටුම්පත් ලංසු ලියවිලි 2019 සැප්තැම්බර් 28 දින සමාලෝචනය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙත ඉදිරිපත් කර ඇත. නමුත් අනුමත කර නොමැත				
(ඊ)	**සීසීටීවී සහ විශේෂ උපකරණ භාවිතයෙන් පවතින මලාපවහන පද්ධතියේ කිලෝමීටර් 97.2ක තත්ත්වය තක්සේරු කිරීම** 2016 වර්ෂයේදී ලංසු ක්‍රියාවලිය ආරම්භ කර තිබුණද දීර්ඝ ප්‍රමාදයකින් පසුව කොන්ත්‍රාත්තුව 2021 ඔක්තෝබර් 12 දින ප්‍රදානය කර තිබුණි.	2021	කාලය අපතේයාම අවම කර ගැනීමට සහ වැඩසටහනේ කාලපරිච්ඡේදය අවසන් වීමට පෙර වැඩසටහනේ කටයුතු නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.	එම කාර්යයන් කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.
(උ)	උපදේශන සමාගම සමඟ ඇති කර ගත් කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, කාල පදනම අනුව ගෙවීම් සිදු කරනු ලැබේ. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ප්‍රමාද වීම, ඉඩම් නිදහස් නොකිරීම වැනි හේතු නිසා ඇති වූ කොන්ත්‍රාත්	2022	ක්‍රියාත්මක කරවීමේ ආයතනය විසින් අධ්‍යයනය කළ යුතුය.	එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.

	ප්‍රමාදය හා ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් අධීක්‍ෂණය සඳහා උපදේශන ආයතනයට ඵල රහිත ගෙවීමක් කර තිබුණි.		
(i)	දැනට පවතින මලාපවහන පද්ධතියේ කිලෝමීටර් 59ක තත්ත්ව පරීක්ෂාවට අදාළ නිර්දේශ ලබා ගැනීම.		
(ii)	කිලෝමීටර් 22කින් සහ කිලෝමීටර 7 අර්ධ වශයෙන් නිම කර සම්පූර්ණයෙන් නල එළීමට ඇති භූගත හා පීඩන මලාපවහන ජාල පද්ධතිය ඇතුළුව අර්ධ වශයෙන් නිම කරන ලද තලකොටුව සහ කාලිංග මාවත පොම්පාගාර ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුවේ අධීක්ෂණය		
(iii)	වැල්ලවත්තේ අලුතින් ඉදිකිරීමට නියමිත අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අධීක්ෂණය		
(iv)	කිරුළ - නාරාහේන්පිට මලාපවහන ජාල පද්ධතිය කිලෝමීටර් 12.4 එළීම සහ පොම්පාගාර දෙකක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීම.		

(v)	දකුණු ජල පෝෂක ප්‍රදේශයේ දැනට පවතින අපජල අපවහන ජාල පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම අධීක්ෂණය කිරීම.				
(උ)	**සැලසුම්කරණය, අධීක්ෂණය, ආයතනික සංවර්ධන උපදේශකයින්** වැඩසටහන 2014 ජුනි 3 දින ආරම්භ කර 2019 ජුනි 30 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, අවසාන දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දෙවරක් දීර්ඝ කර ඇත. 2022 ඔක්තෝබර් 24 වන විට ව්‍යාපෘතියේ සමස්ථ ප්‍රගතිය සියයට 57.27 විය. කෙසේවෙතත්, වැඩසටහනේ සම්පූර්ණ නොකළ ව්‍යාපෘති ප්‍රතිදානයන් පැවතියදී අවසන් කරන ලදි.	2023	ප්‍රතිපාදන වෙන්කර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.	එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.
(එ)	**මාදම්පිටියේ අපජල පවිත්‍රාගාරය** මාදම්පිටිය අපජල පවිත්‍රාගාරයේ ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් දිනකට පොම්පාගාරයට ලැබෙන අපජලය ඝන මීටර් 95,000ක් පමණ කිසිදු පවිත්‍රකරණයකින් තොරව මුහුදට මුදා හැරීමට සිදුව ඇති බව නිරීක්ෂණය විය.				
(ඒ)	**උතුරු ජල පෝෂක ප්‍රදේශයේ පහසුකම් නොමැති ප්‍රදේශ 7ක් සඳහා මලාපවහන පහසුකම් සැපයීම**				

	පොම්පාගාර ස්ථානයේ භූ විෂමතා සමීක්ෂණ සහ මාර්ග ජාලය සඳහා කොන්ත්‍රාත්තුව අවසන් කර ඇත. කෙසේවෙතත්, භූ තාක්ෂණික විමර්ශනය සඳහා වන කොන්ත්‍රාත්තුව සඳහා ලංසු තැබීම අවසන් වී නොතිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට උපදේශන කොන්ත්‍රාත්තු පිරිවැය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකළ අතර 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද කාලය මාස 51ක් පමණ විය.				
(ඔ)	කිසිදු අරමුදල් සම්පාදනයකින් තොරව ව්‍යාපෘතිය අවසන් වන දින සිට මාස 8 කට ඔබ්බට සංවෘත පරිපථ රූපවාහිනී (Closed-Circuit Television) කොන්ත්‍රාත්තුවක් සඳහා සමාගමක් සමඟ ගිවිසුමක් අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය වසා දැමීම හේතුවෙන් රු. මිලියන 3.12ක අමතර ගෙවීමක් සමඟ සීසීටීවී කොන්ත්‍රාත්තුව 2022 ඔක්තෝබර් 24 වන දින අවසන් කරන ලදී. කෙසේවෙතත්, කිලෝමීටර් 89 ක ගුරුත්වාකර්ෂණ කාණුවලින් කිලෝමීටර් 58 ක් සහ මැන්හෝල් 1974න් මැන්හෝල්	2023	කොළඹ මහනගර සභාව විසින් තක්සේරු වාර්තාව භාවිත කිරීමට කටයුතු කළ යුතුය.	එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.

	1242ක් නිම කර නොතිබුණි.				
(ඕ)	අමාත්‍යාංශ ලේකම්වරයා විසින් උපදේශන සමාගම සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, සවිස්තරාත්මක සැලසුම්කරණය, ඉදිකිරීම් අලංකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීම උපදේශක සමාගම සිදුකිරීම අවශ්‍ය වේ. එසේ වුවද, 2017 මැයි 04 වන දින M/S Larsen and Toubro සමඟ අත්සන් කරන ලද කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, දෙවන කොටස සඳහා පොම්පාගාර ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය, අධි පීඩන නල එළීම සහ ගුරුත්වාකර්ෂණ පයිප්ප සඳහා සැලසුම් සකස් කිරීම කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇත. ඒ අනුව, සැලසුම් කටයුතු සඳහා උපදේශන ආයතනයට ගෙවීම් කරන අතරම එම කාර්යය සඳහා කොන්ත්‍රාත් සමාගමට ද ගෙවීම් සිදු කර ඇති බැවින් එකම කාර්යය සඳහා දෙවතාවක් ගෙවීම් සිදු කරන බව නිරීක්ෂණය විය.	2023	ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය විසින් අධ්‍යයනයක් සිදුකළ යුතුය.	එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කර නොතිබුණි.	ව්‍යාපෘති කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.

2.17 මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 03

2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද මහ කොළඹ ජලය හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන අදියර - 03 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3348 එස්.ආර්.අයි (එස්.එෆ්) හා 3349 එස්.ආර්.අයි (එස්.එෆ්) යටතේ රු. මිලියන 13,471.16 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,930.60 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 02 ක දී දීර්ඝ කර 2022 ඔක්තෝම්බර් 24 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	212	43	04
විදේශ අරමුදල්	1218	513	619
මුළු වත්කම්	5,929	6,710	6,838
මුළු වගකීම්	781	809	471
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	4,063	4,773	5,157
දේශිය අරමුදල් මඟින්	1,085	1,128	1,210

එම විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	**කිරුළපන පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ මලාපවහන ජාලයක්, අධි පීඩන නල සහ පොම්පාගාර ඉදිකිරීම** කොන්ත්‍රාත්තුව 2017 මැයි 18 දින ආරම්භ කර	2021	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමන ලදී.

	2020 මැයි 14 දින අවසන් කිරීමට නියමිතව තිබුණද, කොන්ත්‍රාත්තුව 2022 ජූලි 30 දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව කොන්ත්‍රාත්තුව වර්ෂ දෙකක් පමණ කාලයක් ප්‍රමාද වී තිබුණි.				
(ආ)	**මූල්‍ය කළමනාකරණය සහ ගිණුම්කරණ පද්ධතිය (FMAS)** ජලාපවහන අංශයට හඳුන්වා දුන් රු. මිලියන 3 ක් වටිනා මූල්‍ය කළමනාකරණ සහ ගිණුම්කරණ පද්ධතිය 2017 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.	2022	පද්ධතිය භාවිතා කිරීමට පියවර ගත යුතුය.	නැත	පද්ධතිය අක්‍රිය වී ඇත.
(ඇ)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටලුවලට කඩිනම් විසඳුම් ලබාදීම සඳහා 2010 වර්ෂයේ සිට කොළඹ මහ නගර සභාවේ, පළාත් පාලන අමාත්‍යාංශයේ සහ බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති සහායක කණ්ඩායමක් පත්කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට එම නිලධාරීන්ට රු මිලියන 6.5 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි. කෙසේවෙතත්, ගිවිසුම්ගත කාල සීමාව තුළ ණය මුදල භාවිත කර නොතිබූ අතර, ඒ	2022	ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සක්‍රීයව දායක විය යුතු අතර ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කළ යුතු අතර නිසි ව්‍යාපෘති සැලසුම් කිරීම තුළින් මෙම පිරිවැය අවම කළ යුතුය.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දැමිණි.

	අනුව භාවිතයට නොගත් ණය ශේෂය සඳහා බැඳීම් ගාස්තු ලෙස 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 118.7 ක් ආසියානු සංවර්ධන බැංකුවට ගෙවිය යුතු විය. ඒ අනුව ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත ප්‍රතිපත්ති සහයක කණ්ඩායමෙන් සහයක් නොලැබුණු බව නිරීක්ෂණය විය.				
(ඇ)	ණය ගිවිසුමට අනුව, වැඩසටහන 2016 නොවැම්බර් 3 වන දින ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, වැඩසටහනේ අවසාන දිනය 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කරන ලදී.	2022	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දැමිණි.
(ඉ)	**කිරුළ - නාරාහේන්පිට ප්‍රදේශයට මලාපවහන පහසුකම් ලබාදීම.** කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් 23 වන දින ආරම්භ කර 2020 අප්‍රේල් 10 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 දිනවන විටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.	2023	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දැමිණි.

(ඊ) **දකුණු ජල පෝෂක ප්‍රදේශවල දෝෂ සහිත මලාපවහන අලුත්වැඩියා කිරීම සහ අඩු ධාරිතාවයෙන් යුත් මලාපවහන ඉහළ නැංවීම සහ ක්‍රියාත්මක කිරීම** කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 01 වන දින ආරම්භ කර 2021 දෙසැම්බර් 05 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.	2023	ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමට පෙර ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දමා තිබුණි.
(උ) අපජල පවිත්‍රාගාරය මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන යටතේ පවතින ප්‍රධාන උප ව්‍යාපෘතිය වන අතර එයට එ.ජ.ඩො මිලියන 44.37 ක් වෙන් කරන ලදී, මූලිකවම අපජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ජුනි 21 දින ආරම්භ කර 2019 දෙසැම්බර් 14 වැනි දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, මාස 30ක ප්‍රමාදයකින් පසුව 2020 දෙසැම්බර් 18 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද අතර, 2021 ඔක්තෝබර් 21 දින කොන්ත්‍රාත්කරු සමඟ	2023	වටිනාකම අලාභයක් ලෙස කපා හැරීමට කටයුතු කළ යුතුය.	නැත	ණය කාලය අවසන් වීම හේතුවෙන් ව්‍යාපෘතිය වසා දැමිණි.

ගිවිසුම අත්සන් කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, ඉදිකිරීම් කටයුතු සඳහා මාස තුනක් ඇතුළත කොන්ත්‍රාත්කරුට ඉඩම භාර දිය යුතුවේ. 2022 දෙසැම්බර් 30 දින දක්වා ව්‍යාපෘති කළමනාකරණය විසින් ඉඩම ලබා දීමට අපොහොසත් වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවසන් කර කොන්ත්‍රාත්කරුට අවසන් කිරීමේ ගාස්තුවක් ලෙස රු. මිලියන 619ක් ගෙවා තිබුණි.

03. මහා මාර්ග අංශය

3.1. ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන

2014 දී ආරම්භ කරන ලද ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3171, 3221, 3222, 3325 හා 3610 යටතේ රු. මිලියන 104,000 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 13,780 ක් විය. ව්‍යාපෘති කාලය වසර 10 ක් වන අතර 2024 ජුනි 01 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	42	9	9
විදේශ අරමුදල්	10,129	14,492	5,760
මුළු වත්කම්	85,187	209,173	198,986
මුළු වගකීම්	7,329	17,691	8,085
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	76,926	187,063	187,002
දේශීය අරමුදල් මඟින්	656	665	674

එම තත්වාගණ විගණන මතයට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	කොන්ත්‍රාත්ත පොදු කොන්දේසි අනුව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකයේ සහතික කළ අගය දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, සිවිල් වැඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට	2023	ප්‍රමාද පොලී අවම කිරීමට පියවර ගත යුතු අතර ගෙවීම්වල නිරවද්‍යතාවය සහතික කළ යුතුය.	අරමුදල් ලැබීම සීමාවීම හේතුවෙන් ගෙවීම් හිඟහිටව ඇත	ඉදිරිපත් කර දින 56 ඉක්ම වූ නොගෙවූ බිල්පත් තවදුරටත් පවතී.

	ගෙවිය යුතු මුදල රු. මිලියන 2,671.28 ක් ගෙවීම ප්‍රමාද කිරීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද පොලී රු. මිලියන 284.77 ක් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාද වීම නිසා රජයට අමතර වැයබරක් දැරීමට සිදුව තිබුණි.				
(ආ)	ව්‍යාපෘතිය විසින්ම මිලදී ගත් වාහන 335 න් වාහන 318 ක් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කිරීමට පෙර මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබීම නිසා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සහ පළාත් කාර්යාලවල භාවිතය සඳහා වාහන 14 ක් කුලී පදනම මත ලබා ගෙන එම වාහන සඳහා 2023 දෙසැම්බර් 15 දිනට රු. මිලියන 16.36 ක් කුලී ලෙස ගෙවා තිබුණි.	2022 2023	අවිධිමත් කළමනාකරණය සහ වත්කම් අවභාවිතය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීම සඳහා විමර්ශනයක් පැවැත්විය යුතුය.	2024 වර්ෂය තුළදී කුලී පදනම මත වාහන ලබාගැනීම නවතා තිබුණි.	අදාල විමර්ශනයන් පවත්වා නොතිබුණි.
(ඇ)	අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශයට පටහැනිව පැල්මඩුල්ල - ඇඹිලිපිටිය - නෝනාගම ප්‍රධාන මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු දැනටමත් ලබාදී තිබූ කොන්ත්‍රාත්කරුවන් සිව් දෙනාටම බලංගොඩ - බෝවත්ත - කල්තොට මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතුද ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ කොන්දේසි පිළිපැදිය යුතු අතර මාර්ගෝපදේශයට අනුකූල නොවීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.	අමාත්‍යාංශය විසින් මූලික විමර්ෂණයක් පවත්වා තිබුණි.	ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම සම්බන්ධයේ ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	ප්‍රදානය කර තිබුණි.				
(ඈ)	2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහන ආරම්භ කර වසර 09 ක් ගතවීමෙන් පසුවද තෝරාගත් සමස්ථ ජාතික මාර්ග කි.මී. 370 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,905 ක් අතරින් ජාතික මාර්ග කි.මී. 165 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,825 ක පුනරුත්ථාපන කටයුතු පමණක් නිම කර තිබුණි.	2021 2022 2023	කාල රාමුව තුළ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.	තෝරාගත් මාර්ගවල අත්‍යාවශ්‍ය කාර්යයන් පමණක් සිදුකෙරේ.	ණය නියෝජිතායතනය විසින් අරමුදල් කපාහැරීම නිසා තෝරාගත් කොන්ත්‍රාත්වල අත්‍යාවශ්‍ය කාර්යයන් පමණක් සිදුකෙරේ.
(ඉ)	අදාල මූල්‍ය ආයතන වලින් ලබාගත් අත්තිකාරම් ඇපකර මගින් හිඟ හිටි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට විරුද්ධව කොන්ත්‍රාත්කරුවන් විසින් වාරණ නියෝග ලබාගැනීම හේතුවෙන් පළාත් 05 ක අත්හිටුවා තිබුණු (Terminated) කොන්ත්රාත් පැකේජ 12 ක එකතු වටිනාකම රු. මිලියන 2,793.41 ක අත්තිකාරම් මුදල් 2023 දෙසැම්බර් 31 වන විට එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිව තිබුණි. තවද කාර්ය සාධන ඇපකරවලින් අයකරගැනීම් ප්‍රමාදවීම හේතුවෙන් රු. මිලියන 2,668.47 ක මුදලක් ව්‍යාපෘතියට අයවීම හිඟහිට තිබුණි.	2022 2023	ඇපකර මුදල් කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට හෝ පාඩුව වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගැනීමටත් වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය.	අයනොවීම එළෙසම පවතින බව නිරීක්ෂණය විය.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඊ)	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාදය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ණය ආධාර සීමා කිරීම හේතුවෙන් මාර්ගවල අත්‍යාවශ්‍ය වැඩ (Critical Works) පමණක් ඉටු කිරීමට තීරණය කිරීම නිසා මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් යටතේ 2023 දෙසැම්බර් 31 දින වනවිට ලබාදී තිබුණු රු. මිලියන 6,250.03 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advances) ආපසු අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතව පැවතුණි.	2023	නැවත සැලසුම් කිරීමේ බලපෑම තහවුරු කර ගත යුතු අතර කොන්ත්‍රාත් කොන්දේසි සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	තවදුරටත් අත්තිකාරම් අයකර ගැනීම හිඟ හිටව තිබුණි.	කොන්ත්‍රාත් කොන්දේසි සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2. දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන

2017 දී ආරම්භ කරන ලද දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන සඳහා ආසියානු සංවර්ධන බැංකු වේ ණය ගිවිසුම් අංක 3579, 3580, 3851, 4067 හා 4384 යටතේ රු. මිලියන 137,070 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 28,115 ක් විය. ව්‍යාපෘති කාලය 2027 මාර්තු 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	5	6	3
විදේශ අරමුදල්	38,232	27,017	390
මුළු වත්කම්	91,426	200,336	201,874
මුළු වගකීම්	12,652	5,122	10,605
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	78,974	187,626	183,114
දේශීය අරමුදල් මඟින්	83	89	757

එම තත්වාගණ විගණන මතයට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	පළාත් 04 ක පැකේජ 53 ක් යටතේ ග්‍රාමීය මාර්ග කි.මී. 3,654.95 ක් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය යටතේ සැලසුම් කර තිබුණු අතර පහසුකම් පරිපාලන අත්පොතට අනුව මාර්ග පුණරුත්ථාපන කටයුතු	2021 2022 2023	වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක කාල රාමුව තුළ සපුරා ගැනීම සඳහා උපරිමව කටයුතු කල යුතුය.	තෝරාගත් මාර්ගවල අත්‍යාවශ්‍ය කාර්යයන් පමණක් සිදුකෙරේ.	ණය නියෝජිතායතනය විසින් අරමුදල් කපාහැරීම නිසා තෝරාගත් කොන්ත්‍රාත්වල අත්‍යාවශ්‍ය කාර්යයන් පමණක් සිදුකෙරේ.

	2023 ජුනි මස වනවිට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 වර්ෂය අවසානය වනවිට කි.මී. 2,115 හෙවත් සියයට 57.87 ක ප්‍රගතියක් පමණක් අත්කරගෙන තිබුණු අතර ව්‍යාපෘති කාලය 2027 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණි.				
(ආ)	කොන්ත්‍රාත්ත පොදු කොන්දේසි 14.7 උප වගන්තිය අනුව සේවා යෝජකයා විසින් එක් එක් අතුරු ගෙවීම් සහතිකයේ සහතික කළ අගය දින 56 ක් ඇතුළත ගෙවිය යුතු වුවද, සිවිල් වැඩ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල රු. මිලියන 5,558.94 ක් බව නිරීක්ෂණය විය. එයින් රු.මිලියන 1,188.03 ක අතුරු ගෙවීම් සහතික 2022 වර්ෂයට අයත් වුවද 2023 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවීම් කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසියේ 14.8 උප වගන්තියට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රමාද පොලී සඳහා රු. මිලියන 284.77 ක ප්‍රතිපාදන සිදුකර තිබුණි.	2022 2023	ප්‍රමාද පොලී අවම කිරීමට පියවර ගත යුතු අතර හිමිකම්වල නිරවද්‍යතාවය සහතික කළ යුතුය.	අරමුදල් ලැබීම සීමාවීම හේතුවෙන් ගෙවීම් හිඟහිටව ඇත	දින 56 ඉක්ම වූ නොගෙවූ බිල්පත් තවදුරටත් පවතිනු ඇත.
(ඇ)	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් ප්‍රමාදය සහ ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන	2022 2023	ප්‍රතිපත්ති සම්පාදකයින් ප්‍රතිසංස්කරණ කටයුතුවල	තවදුරටත් අත්තිකාරම් අයකර ගැනීම හිඟ හිටව තිබුණි.	අත්තිකාරම් ආපසු අයකර ගැනීමට ක්‍රමවේදයන් හඳුන්වාදී

	ණය ආධාර සීමා කිරීම හේතුවෙන් මාර්ගවල අත්‍යාවශ්‍ය වැඩ (Critical Works) පමණක් ඉටු කිරීමට තීරණය කිරීම නිසා මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් යටතේ 2023 දෙසැම්බර් 31 දින වනවිට ලබාදී තිබුණු රු. මිලියන 8,197.88 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advances) ආපසු අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිත තත්වයක පැවතුණි.		විෂයපථය අඩුකිරීමෙන් පසු අත්තිකාරම් ආපසු අයකර ගැනීමට ක්‍රමවේදයන් ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුන්වා දීමට පියවර ගතයුතුය.		නොතිබුණි.
(ඇ)	අදාල මූල්‍ය ආයතන වලින් ලබාගත් අත්තිකාරම් ඇපකර මගින් හිඟ හිටි අත්තිකාරම් මුදල් අයකර ගැනීමට විරුද්ධව කොන්ත්‍රාත්කරුවන් විසින් වාරණ නියෝග ලබාගැනීම හේතුවෙන් ඌව, උතුරු හා බස්නාහිර පළාත්වල අත්හිටුවා තිබුණු (Terminated) කොන්ත්‍රාත් පැකේජ 10 ක එකතු වටිනාකම2023 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 2,014.10 ක අත්තිකාරම් මුදල් අදාල කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකිව තිබුණි.	2023	අත්තිකාරම් බැඳුම්කර මුදල් කර අයකර ගැනීම් සිදුකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම හෝ පාඩුව සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.	අයනොවීම එළෙසම පවතින බව නිරීක්ෂණය විය.	නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

3.3. ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය

2013 දී ආරම්භ කරන ලද ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදලේ ණය ගිවිසුම් අංක 1452 පී යටතේ රු. මිලියන 4,560 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,561.32 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා 05 ක දී දීර්ඝ කර 2025 පෙබරවාරි 02 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	56	15	36
විදේශ අරමුදල්	75	85	419
මුළු වත්කම්	5,334	5,499	12,481
මුළු වගකීම්	65	53	109
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	4,760	4,945	11,836
දේශිය අරමුදල් මඟින්	399	414	449

එම තත්වාගණ විගණන මතයට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 2,772 ක් අත්කර ගැනීමට අපේක්ෂා කර තිබූ අතර ඉඩම් කට්ටි 730 ක් සඳහා රු. මිලියන 245.13 ක වන්දි මුදලක් සහ 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 155 ක් සඳහා රු. මිලියන	2021 2022-2023	කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හි	ප්‍රගතිය අඛණ්ඩව අධීක්ෂණය කිරීමට පියවර ගැනීම	අයිතිය පවරාගැනීම් කඩිනමින් සිදුකර ගැනීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර ඇත.

	58.24 ක ප්‍රමාද පොලී ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 147ක අයිතිය පමණක් පවරාගෙන තිබූ අතර එය සමස්ත පෞද්ගලික ඉඩම්වලින් සියයට 7.8 ක ප්‍රගතියක් පමණි.	38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලද සමාලෝචනයේදී ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.		
(ආ)	කොන්ත්‍රාත් ගිවිසුමේ 2023 විශේෂ කොන්දේසි අංක 128 ප්‍රකාරව රසායනාගාර උපකරණ සහ ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත් කටයුතු අවසානයේදී කොන්ත්‍රාත්කරු සතුවේ. කෙසේ වෙතත්, ඔරුගොඩවත්ත - අබතලේ මාර්ගයේ පාලම් අංක 4/2 ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සඳහා එකවර ගෙවීමක් ලෙස රු. මිලියන 6 ක් ගෙවා තිබුණි. එබැවින් එම අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යාමට හේතු වී තිබුණි.	කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට පෙර විධිමත්ව සමාලෝචනය කළ යුතුය. සේවා යෝජකයාගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම වැළැක්වීම සඳහා ලංසු ලේඛන සමාලෝචනය කිරීමේදී තාක්ෂණික සහ ප්‍රසම්පාදන කමිටු විසින් ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.4. අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය

2021 දී ආරම්භ කරන ලද අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර බැංකුව සමඟ ණය ගිවිසුම් අංක IBRD 9290 – LK යටතේ රු. මිලියන 101,499.6 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 300 ක් විය. ව්‍යාපෘති කාලය 2026 ඔක්තෝම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	48	43
විදේශ අරමුදල්	4,654	9,046
මුළු වත්කම්	7,473	16,878
මුළු වගකීම්	467	1,091
මුළු අරමුදල		
විදේශ ණය මඟින්	5,974	16,093
දේශීය අරමුදල් මඟින්	48	91

එම තත්වාගණ විගණන මතයට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	මූලික ව්‍යාපෘති කාලය වසර 05 ක් වූ අතර පළමු වසර දෙකේ වැඩසටහනේ ඉලක්කගත මාර්ග දිග කි.මී. 1096.8 න් 2023 දෙසැම්බර් 31 දින වනවිට මාර්ග කි.මී. 251.18 ක දිගක් පමණක් නිම කර	2022 2023	කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.	මාර්ග හඳුනාගැනීමේ ප්‍රමාදයන් හා ප්‍රසම්පාදන සිදුකිරීමේ ප්‍රමාදයන් තවදුරටත් නිරීක්ෂණය විය.	නිර්දේශයන් ක්‍රියාත්මකව නොතිබුණි.

	තිබුණි.				
(ආ)	ව්‍යාපෘති ඇගයුම් ලේඛනයට අනුව, උප සංරචක 1.2 යටතේ මාර්ග අංශයේ ආයතනික සහ ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 5 ක මුදලක් වෙන් කර තිබුණි. මෙම උප සංරචකය මගින් මාර්ග අංශයේ සමස්ත කළමනාකරණය වැඩිදියුණු කිරීම මගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් සමුච්චිත අවශ්‍යතාවයේ විකාශනය වීම සහ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම අරමුණු කර තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර 02 ක් ගතවී ඇතත් මෙම සංරචකය ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.	සැලසුම් සකස්කරමින් පවතී.	නිර්දේශයන් ක්‍රියාත්මකව නොතිබුණි.
(ඇ)	අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සකස් කර ස්ථාපිත කිරීමට නිර්දේශ කරන ලදී. මුලදී, මෙම සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 50	2022 2023	කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.	සැලසුම් සකස්කරමින් පවතී.	නිර්දේශයන් ක්‍රියාත්මකව නොතිබුණි.

ක මුදලක් වෙන් කර ඇති අතර එය 2023 මැයි 09 දින ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවෙන් එ.ජ.ඩො. මිලියන 15 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ඉහත අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ නිර්දේශවලට පටහැනිව 2023 වර්ෂය අවසන් වන විටත් මෙම සංරචකය ආරම්භ කර නොතිබුණි.

3.5. සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2013 දී ආරම්භ කරන ලද සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සවුදි අරමුදලේ ණය ගිවිසුම් අංක 9/574 යටතේ රු. මිලියන 7,800 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,828 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා 01 ක දී දීර්ඝ කර 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	43	4	82
විදේශ අරමුදල්	480	113	211
මුළු වත්කම්	8,703	8,862	19,667
මුළු වගකීම්	131	192	74
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	7,698	8,145	18,985
දේශීය අරමුදල් මඟින්	465	470	552

එම තත්වාගණ විගණන හේතු වු කරුණු වලට අමතර අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘතිය මගින් අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩම් කැබලි ගණන 1,370 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 1,308 ක් සඳහා වන්දි වශයෙන් රු. මිලියන 195.98 ක් ද ප්‍රමාද පොලී වශයෙන් රු.	2022-2021	කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතු අතර ජාතික	අත්පත්කරගැනීම් කඩිනම් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීම	ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

	මිලියන 56.22 ක්ද ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අයිතිය පවරාගත් ඉඩම් කැබලි සංඛ්‍යාව 78 පමණක් විය.		විගණන පනතේ අංක 18 හි 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරන ලද සමාලෝචනයේදී ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.		
(ආ)	කොන්ත්‍රාත් පොදු කොන්දේසියේ 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව, කාර්ය සාධන බැඳුම්කර සැපයීමේ පිරිවැය සඳහන් කිරීමට කොන්ත්‍රාත්කරුවන්ට අවසර දීමෙන් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් දක්වා තිබුණි. කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාගත් කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකුට රු. මිලියන 0.79 ක් ගෙවා තිබුණි.	2021	ලංසු ලේඛණ නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණපත්‍ර සමාලෝචනය කල යුතුය.	ඉදිරියේදී මෙම ගෙවීම් අයිතම ඉවත් කිරීමට තීරණය කර ඇති බව.	නිර්දේශ ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව.

3.6. බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය.

2017 දී ආරම්භ කරන ලද බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදලේ ණය ගිවිසුම් අංක 1661 P යටතේ රු. මිලියන 7,800 ක සහ සවුදි අරමුදලේ ණය ගිවිසුම් අංක 10/639 යටතේ රු. මිලියන 7,800 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,600 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා 1 ක දී දීර්ඝ කර 2025 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එම වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	429	78	392
විදේශ අරමුදල්	3,859	1,085	1,791
මුළු වත්කම්	16,260	17,764	19,520
මුළු වගකීම්	1,192	1,533	831
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	12,178	13,253	15,322
දේශිය අරමුදල් මඟින්	2,881	2,959	3,350

එම තත්වාගණ විගණන මතයට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් කර තිබූ විගණන පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘතිය මගින් ඉඩම් කට්ටි 5,458 ක් අත්පත් කරගෙන තිබුණි. එයින් ඉඩම් කැබලි 2972 ක් සඳහා වන්දි ගෙවියයුතු අතර ඉන් ඉඩම් කට්ටි 2,177 ක් සඳහා වන්දි මුදල් ලෙස රු. මිලියන 540.67 ක් සහ ඉඩම්	2022	අමතර වියදම් වළක්වා ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත්කර ඇති බව දන්වා තිබුණි.	ඉඩම් අත්කරගැනීම් අවසන් කර නොතිබුණි.

කට්ටි 326 ක් සඳහා ප්‍රමාද පොලී ලෙස රු. මිලියන 10.9 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව 2023 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දී තිබුණේ ඉඩම් කට්ටි 749ක් පමණි.

(ආ) ගිවිසුම් කාලය මාස 30 ක් වූ ලුණුගල සිට බිබිල දක්වා මහා මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව රු.මිලියන 2,006.43 ක වටිනාකමකට 2017 ජුනි 12 දින ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය සහ එකඟ වූ කාල රාමුව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2021 ජුනි 29 දින අවසන් කරන ලද අතර (Terminated) ඒ වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 60.32 ක් විය.මේ සම්බන්ධයෙන් පහත

	නිරීක්ෂණ සිදු කරනු ලැබේ.				
(i)	කොන්ත්‍රාත්කරු සහ සේවායෝජකයා යන දෙපාර්ශවයේම එකඟතාවයෙන් යුතුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය විමසා තිබුණද, කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසි යටතේ 15 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්ශවයේ එකඟතාවයෙන් අවසන් කිරීමට අදාලව ප්‍රතිපාදන දක්වා නොතිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව සහ නීතිපතිවරයාගේ මතය අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර නොතිබුණි.	2022	කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුගත විය යුතුය.	කොන්දේසිවලට අනුගත වීමට කටයුතු කර නොතිබුණි.	කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි.
(ii)	2022 නොවැම්බර් 17 දිනැති නීතිපතිවරයාගේ ලිපියට අනුව වැඩ නිම නොකිරීම කොන්ත්‍රාත්කරුගේ වරදින් සිදුවූවක් බව පැහැදිලිව සඳහන් කර තිබුණි. 2021 ජූනි 12 දින අර්ධ	2022	කොන්ත්‍රාත් කොන්දේසි වලට අනුගත විය යුතුය.	කොන්දේසිවලට අනුගත වීමට කටයුතු කර නොතිබුණි.	කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි.

	වශයෙන් නිම කරන ලද වැඩ ඉංජිනේරුවරයා විසින් භාරගෙන ඇතත්, කාර්ය සාධන බැඳුම්කරයේ වලංගු කාලය වන 2022 ජූලි 31 දිනට පෙර කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 15 අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි. එබැවින්, මෙම ප්‍රමාදය නිසා කොන්ත්‍රාත් කොන්දේසි මත ක්‍රියා කිරීමෙන් මාර්ග සංවර්ධන අධිකාරියට සිදුවන පාඩු අවම කර ගැනීමට තිබූ අවස්ථාව අහිමිව තිබුණි.				
(iii)	ඉහත පැකේජය, පැකේජ දෙකක් ලෙස නැවත ලංසු කැඳවා රු. මිලියන 2,919.56 ක අගයකට කොන්ත්‍රාත් දෙකක් ලෙස පිරිනමා තිබුණු අතර එහිදී අදාල ප්‍රසම්පාදනය සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන අත්පොතෙහි 4.4.2 වගන්තියට පටහැනිව මූලික කොන්ත්‍රාත්තුව සඳහා	2023	ප්‍රසම්පාදන කොන්දේසි වලට අනුගත වියයුතුය	ප්‍රසම්පාදන කොන්දේසිවලට අනුගත නොවීම	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

අනුමැතිය ලබාදුන් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව නැවත කොන්ත්‍රාත් පිරිනැමීමේදී එම ප්‍රසම්පාදනයන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමුකර තිබුණි.

3.7 කැලණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2014 ජූලි 01 දී ආරම්භ කරන ලද **කැලණි ගඟ ඉහළින් නව පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතිය** සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා අරමුදලේ ණය ගිවිසුම් අංක එස්එල් - පී 111 යටතේ රු. මිලියන 46,755ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 8,558 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා දෙකක දී දීර්ඝ කර 2021 ඔක්තෝබර් 25 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021 සහ 2022 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදී 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	129	84
විදේශ අරමුදල්	10,066	1392
මුළු වත්කම්	57,777	93,361
මුළු වගකීම්	1,203	3,675
මුළු අරමුදල		
විදේශ ණය මඟින්	54,003	87,036
දේශීය අරමුදල් මඟින්	2,124	2,209

එම තත්වාගණනය කළ විගණන මතයන්ට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර, ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,135 ක් වැය කරමින් විවිධ පාර්ශ්වවලට අයත් ඉඩම් කට්ටි 968 කින් සමන්විත හෙක්ටයාර් 12.9 ක භූමි ප්‍රදේශයක් අත්පත් කර ගෙන තිබුණි.	2022	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතු බව.	ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කරන ලද බිම් කොටස් 968 න් වැඩි ප්‍රමාණයක් අනවසර පුද්ගලයින් විසින් අල්ලාගත්/පදිංචි රජයට අයත් ඉඩම් විය. එබැවින් එම රජයේ ඉඩම් සම්බන්ධයෙන්	පනතේ අංක 44 වගන්තිය අනුව ඉඩම් කැබලි 968න් කැබලි 55 කට අදාලව පමණක් අදාල සහතිකය ලබාගෙන තිබුණි.

	එහෙත් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය අනුව අදාල ඉඩම් මාර්ග සංවර්ධන අධිකාරියට පැවරීමට 2023 ජුනි 06 දින වන විටත් කටයුතු කර නොතිබුණි.		ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ කටයුතු කිරීම අවශ්‍ය නොවේ. අනෙකුත් ඉඩම් සම්බන්ධයෙන් 44 වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.	
(ආ)	2022/2023 වර්ෂවල 2022 හඳුනාගන්නා ලද දෝෂ 16 ක් නිවැරදි කිරීමට කොන්ත්‍රාත්කරුවන් කටයුතු කර නොමැති අතර, ව්‍යාපෘතිය මේ සම්බන්ධයෙන් 2023 ජුනි 30 දින දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	2023 නොවැම්බර් මස අඩුපාඩු දැනුම්දීමේ කාල සීමාව ඉකුත්වීමට පෙර සියලු දෝෂ නිවැරදි කරනු ලැබේ.	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

3.8. පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2015 සැප්තැම්බර් 07 දී ආරම්භ කරන ලද **පාලම් 25 ක් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය** සඳහා අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල ණය ගිවිසුම් අංක 886 යටතේ රු. මිලියන 4,632 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 460 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා දෙකක දී දීර්ඝ කර 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 සහ 2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	71	30	
විදේශ අරමුදල්	1386	633	
මුළු වත්කම්	4,191	4,795	4,800
මුළු වගකීම්	453	393	389
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	3,494	4,128	4,128
දේශිය අරමුදල් මඟින්	242	272	281

එම තත්වාගණනය කළ විගණන මතයන්ට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු බවට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක්	2022, 2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඇ) වගන්තියට අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපෘතිය තුළ	එකඟ වී ඇත.	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත

මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණු අතර 2019 සිට 2023 දක්වා මෙහෙයුම් කමිටු රැස්වීම් අටක් පමණක් පවත්වා තිබුණි.	පවත්වා ගතයුතු අතර එවැනි පද්ධතියක ඵලදායීතාවය අධීක්ෂණය කිරීම සඳහා වරින් වර සමාලෝචන සිදු කර ඒ අනුව ලිඛිත උපදෙස් ලබාදිය යුතුය.

3.9. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය

2021 මැයි 06 දී ආරම්භ කරන ලද මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 6623-එල්කේ (සහනදායී ණය) සහ අංක 6624-එල්කේ (සහනදායී නොවන ණය) යටතේ රු. මිලියන 13,762 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,642 ක් විය. ව්‍යාපෘතිය 2025 මැයි 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	17.49	128.57
විදේශ අරමුදල්	168	-
මුළු වත්කම්	187	301
මුළු වගකීම්	0.7	3.1
මුළු අරමුදල		
විදේශ ණය මඟින්	17.10	145.67
දේශිය අරමුදල් මඟින්	169.47	153.05

එම තත්වාගණනය කළ විගණන මතයන්ට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ මූලික කටයුතු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වසර 3 ක් ගතකර තිබුණු අතර 2024 මාර්තු 18 දින සිට වසර 3 ක් ඇතුළත මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තයේ	2023	එකඟ වූ කාල සීමාව තුළ ව්‍යාපෘතිය නිම කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය වෙත උපදෙස් දිය යුතුය.	මෙම කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත පිරිනමනු ලැබූ අතර එය අවසන් කරන දිනය 2027 මාර්තු 18 දින වේ. මහල් නවයකින් සමන්විත මෙම ගොඩනැගිල්ල	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී

	ඉදිකිරීම අවසන් කිරීම සඳහා මාගා ඉංජිනේරු පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. 2026 වර්ෂයට පෙර ව්‍යාපෘති කටයුතු සහ මහල් නවයක ගොඩනැගිල්ල නිම කිරීමට අපහසු බව නිරීක්ෂණය විය.			සඳහා මුදල් සොයා ගැනීමේ අපහසුතා හේතුවෙන් විෂය පථය සත් මහල් ගොඩනැගිල්ලක් ලෙස වෙනස් කර දැනට දේශීය රාජ්‍ය අංශයේ අරමුදල් වෙන් කරමින් පවතින අතර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී	
(ආ)	2018 ජුලි 16 දිනැති අංක 3/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 වගන්තියට අනුව, මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතනය මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතු වුවත්, මහා භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබාගැනීමෙන් තොරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ (භාවිතා කර නැවත ලබා දීම) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් වාහන 03 ක් ලබාගෙන තිබුණි.	2023	ජාතික අයවැය චක්‍රලේඛයේ උපදෙස් කඩ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය	මෙය ලෝක බැංකු අරමුදල් සපයන ව්‍යාපෘතියක් බැවින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන මෙහෙයුම් කල්බදු ක්‍රමයට වාහන ලබාගෙන ඇත. ඉහත වාහනවල කල්බදු ගිවිසුම් කාලය දැනටමත් අවසන් වී ඇත	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත
(ඇ)	බහුවිධ පර්යන්තය ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් සඳහා වන්දි වශයෙන් පුද්ගලයන් 825 දෙනෙකුට	2022 2023	එකඟ වූ කොන්ත්‍රාත් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට ව්‍යාපෘති අධ්‍යක්ෂ කටයුතු	එකඟ වෙමි.	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවෙමින් පවතින බැවින් මෙම ගෙවීම් අඛණ්ඩව සිදුවේ

	රු.මිලියන 712 ක් ගෙවා තිබුණි. එයින් ව්‍යාපාර පාඩු ලෙස රු. මිලියන 35.06 ක් 2019 වසරේ සිට වසර තුනක් සඳහා පුද්ගලයන් 17 දෙනෙකුට ගෙවා තිබුණි. ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් එම පුද්ගලයන්ට ම 2022 සහ 2023 වසරවල දී රු.මිලියන 22.2 ක මුදලක් ගෙවීමට ව්‍යාපෘතියට සිදු විය. එපමණක් නොව, මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් වන තුරු මෙම ගෙවීම් නැවත නැවත කිරීමට සිදු වේ	කළ යුතුය.		
(ඇ)	ණය ගිවිසුම ක්‍රියාත්මක 2023 වන දින සිට මාස හයක් ඇතුළත ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතක් සකස් කළ යුතු වුවද එසේ සකස් කර නොතිබුණි.	ණය ගිවිසුමට අනුව ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සකස් කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත උපදෙස් දිය යුතුය.	අදාළ කොන්ත්‍රාත්තුව මෑතක දී ප්‍රදානය කරන ලද අතර ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත සකස් කරමින් පවතී.	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

3.10 ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය

2017 ජනවාරි 28 දී ආරම්භ කරන ලද **ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම් ව්‍යාපෘතිය** සඳහා ආසියානු සංවර්ධන බැංකු වේ ණය ගිවිසුම් අංක 3425 එස්ආර්අයි (එස්එෆ්) යටතේ රු. මිලියන 3,655.43 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 490.98 ක් විය. ව්‍යාපෘතිය 2023 ජුනි 30 දින අවසන් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහි දි 2021 සහ 2023 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	0.006	-	0.09
විදේශ අරමුදල්	-	573	10.3
මුළු වත්කම්	471	1,095	916
මුළු වගකීම්	-	-	-
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	422.65	995.84	824.88
දේශීය අරමුදල් මඟින්	47.53	47.53	47,62

එම තත්වාගණනය කළ විගණන මතයන්ට හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	2022 පෙබරවාරි මාසයේ දී ආසියානු සංවර්ධන බැංකු විසින් සිදු කරන ලද මධ්‍ය කාලීන සමාලෝචනයට (Mid - term Review Mission) අනුව, ඉතිරි සහනදායී ණය ශේෂය භාවිතා කිරීම සඳහා අදාළ නව කාර්යය	2023	මාර්ග අංශයේ සැබෑ අවශ්‍යතාවයන් සඳහා විදේශ ණය ලබාගත යුතු අතර හඳුනාගත් වැඩ අදාළ කාලය තුල නියමිත මුදලින් ඉටු කළ යුතුය.	ව්‍යාපෘති යෝජනාවක් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර එය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි	විගණන නිර්දේශය ක්‍රියාත්මකකර නොමැත.

	පැවරුම් පිළිබඳ විස්තර සැපයීමට රජය සූදානම් වන තෙක් ණය මුදල පවත්වාගෙන යාමට සමාලෝචනයේ දී අපේක්ෂා කෙරිණි. කෙසේ වෙතත් මහා මාර්ග අමාත්‍යාංශය හා මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ වී තිබුණද, ව්‍යාපෘතිය අවසන් වන තුරු නව පැවරුම් සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. එබැවින්, එ.ජ.ඩො. මිලියන 7.45 ක සහනදායී ණය ශේෂය ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වසා දැමීමේදී එම මුදල ආපසු ගෙවා තිබුණි.			20 දින අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, ජාතික අයවැය චක්‍රලේඛ අංක. 03/2022 අනුව නව පැවරුම් සහ යෝජනා ක්‍රියාත්මක කර නොතිබුණි.	
(ආ)	ආසියානු සංවර්ධන බැංකුව විසින් මාර්ග සංරචකය සඳහා එ.ජ.ඩො. මිලියන 10 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් වන තෙක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් එ.ජ.ඩො. මිලියන 2.55 ක් පමණක් භාවිතා කර තිබුණි.	2021, 2022 2023	ණය මුදල් කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය	**ප්‍රවාහන ව්‍යාපෘති සැකසීමේ පහසුකම්** ව්‍යාපෘතියේ මාර්ග සංරචකය මූලිකව සමන්විත වූයේ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සහ SASEC Port Elevated Highway ව්‍යාපෘතිය සඳහා නිර්මිත සැකසීම විය. කෙසේ වෙතත්, අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ මූලික හා සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සැකසීම ඉහළ ප්‍රමුඛතාවයක් ලෙස	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

හඳුනාගෙන නොතිබුණි. එබැවින්, එ.ජ.ඩො. මිලියන 10 යෙන් එ.ජ.ඩො. මිලියන 6.9 ක වටිනාකමක් සහිත ප්‍රධාන සංරචකය ක්‍රියාත්මක කර නොතිබුණි

3.11 කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය

2021 අගෝස්තු 16 දී ආරම්භ කරන ලද කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් නිර්මාණය කිරීමේ හා ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා හංගේරියානු අරමුදලේ ණය ගිවිසුම් අංක එච්එස්001121000 යටතේ රු. මිලියන 10,192 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු මිලියන. 975 ක් විය. ව්‍යාපෘතිය 2024 පෙබරවාරි 15 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය කළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	359	85	406
විදේශ අරමුදල්	2,636	774	-
මුළු වත්කම්	3,493	6,518	7,177
මුළු වගකීම්	498	1,033	403
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	2,636	5,040	5,922
දේශිය අරමුදල් මඟින්	359	444	850

එම විගණන මතයන්ට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	2018 වසරේ රේඛීය අමාත්‍යාංශය විසින් සිදු කරන ලද මූලික ඇගයීම්වලට අනුව කොහුවල සහ ගැටඹේ ගුවන් පාලම් ඉදිකිරීමෙන් දිනකට රු. මිලියන 4.26 ක මුදලක් ජාතික ආර්ථිකයට ඉතිරි කර දෙන බව හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්,	2022	ව්‍යාපෘති ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘති ක්‍රියාකාරකම් කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	අන්තර් බිල්පත් සඳහා ගෙවීම් නොකිරීම හේතුවෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත

	ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම සහ එම ලබා ගැනීමට ප්‍රතිඵල ප්‍රමාද වී තිබුණි.				
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1,628.94 ක අන්තර් ගෙවීම් සහතික (IPC) 07 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා විදේශ ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම මුදල් ණය නියෝජිතායතනය මඟින් ගෙවා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි අනුව ප්‍රමාද ගාස්තු ගෙවීමේ අවදානමක් පැවතුණි.	2022	අමතර පිරිවැයක් දැරීමෙන් තොරව ණය නිදහස් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් හංගේරියානු එක්සිම් බැංකුව අරමුදල් නිදහස් කිරීම නතර කර ඇත. 2022 අප්‍රේල් දක්වා සියලුම හිඟ ගෙවීම් තවමත් ගෙවා නැත.	විදේශ ණය අත්හිටුවීම තවදුරටත් පවතී.
(ඇ)	වෙනත් ව්‍යාපෘති දෙකකින් රු. මිලියන 14.65 ක මුදලක් මෙම ව්‍යාපෘතිය සඳහා ලබාගෙන සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි සහ පොලී ලෙස ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එම මුදල් ලබාගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් සහ භාණ්ඩාගාරයෙන් ලබාගත් ලිඛිත අනුමැතියක් 2022 දෙසැම්බර් 31 දින වනවිටත් විගණනයට	2022	ගෙවිය යුතු මුදල් පියවීමට කඩිනම් පියවර ගත යුතුය	අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී බැංකු ගිණුම විවෘත කර නොතිබුණු අතර මූලික වියදම් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති වලින් දරන ලදී. එබැවින් රජයේ අරමුදල් සංරචකය යටතේ ප්‍රමාණවත් මුදල් ලැබුණු පසු ගෙවිය යුතු මුදල් පියවනු ලැබේ.	ගෙවිය යුතු රු.මිලියන 14.09 පියවීමට මේ දක්වා කටයුතුකර නොමැත.

ඉදිරිපත් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාල මුදල් පියවීමට කටයුතු කර නොතිබුණි.

3.12 චීනයේ එක්සිම් බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය.

2018 නොවැම්බර් 29 දී ආරම්භ කරන ලද චීනයේ එක්සිම් බැංකුව (හුනාන් ශාඛාව) අරමුදල් සපයන මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා චීන එක්සිම් බැංකුවේ ණය ගිවිසුම් අංක EXIM BANK – HUNAN - 015 යටතේ රු. මිලියන 20,300 ක් ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2370 ක් විය. ව්‍යාපෘතිය කාලය තුල අවස්ථා එකක දී දීර්ඝ කර 2022 නොවැම්බර් 28 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	97	76	30
විදේශ අරමුදල්	6,789	-	-
මුළු වත්කම්	17,624	18,040	32,559
මුළු වගකීම්	2,478	1,648	1,647
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	12,900	14,070	28,559
දේශීය අරමුදල් මඟින්	2,246	2,322	2,352

එම විගණන මතයන්ට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	විදේශ ණය ගිවිසුමේ අංක. 12.1(10) වගන්තිය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය අවසන් කළ දින සිට මාස හයක් ඇතුළත ව්‍යාපෘති අවසන් කිරීමේ සාරාංශ	2023	ණය ගිවිසුමට අනුව අවසන් කිරීමේ සාරාංශ වාර්තාව ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.	ණය ගිවිසුමට අනුව, ණය නියෝජිතායතනය විසින් කරන ලද ඉල්ලීම මත ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘති අවසන්	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත

	වාර්තාවක් ණය නියෝජිතායතනය වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා එම වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.			වාර්තාව ණය ලබාදෙන අය (නියෝජිතායතනය) වෙත ඉදිරිපත් කළ යුතු නමුත් තවමත් එවැනි ඉල්ලීමක් ලැබී නොමැත	
(ආ)	ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘති කාලය 2021 සැප්තැම්බර් 28 දින අවසන් වීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාලය 2022 සැප්තැම්බර් 28 දක්වා දීර්ඝ කර තිබුණි. දීර්ඝ කළ කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයට නොහැකි වූ අතර ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘති කාලය 2023 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරන ලෙස විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා අනුමැතිය ලැබී නොතිබුණි.	2022 2023	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ණය නියෝජිතායතන යෙන් ණය කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වෙමි	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත
(ඇ)	ව්‍යාපෘති කාර්යාල සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක සමාලෝචනය කිරීමට පත් කරන ලද කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව ව්‍යාපෘතිය 2023 ජනවාරි 31 දින වන විට වසා දැමිය යුතු වූ අතර 2023	2023	ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් ව්‍යාපෘතිය ඇවර කර ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය වසා දැමීමට කටයුතු කළ යුතුය.	ප්‍රායෝගික ගැටළු සලකා බලා ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය 2023.09.30 දක්වා ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව, ව්‍යාපෘති කළමනාකරණ	විගණන නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත

මාර්තු 31 වන විට කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කළ යුතු විය. කෙසේ වෙතත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය නියමිත දිනට වසා නොතිබුණු අතර නිසි අනුමැතියකින් තොරව 2023 සැප්තැම්බර් 30 දින දක්වා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වැටුප් සහ නඩත්තු සඳහා රු. මිලියන 9.06 ක මුදලක් ගෙවා තිබුණි.		ඒකකය 2023.09.30 දින වන විට වසා දමා මා.සං.අ. හි අධ්‍යක්ෂ ජනරාල් යටතේ ක්‍රියාත්මක කර ඇත.

3.13 නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය

2013 ජූලි 05 දී ආරම්භ කරන ලද නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනයේ ණය ගිවිසුම් අංක එස්එල් - පී 109 යටතේ රු. මිලියන 12,870.45 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,331 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා දෙකක දී ව්‍යාපෘති කාලය දීර්ඝ කර ව්‍යාපෘතිය 2020 ජූලි 05 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි..

2021 සහ 2022 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි එම වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කළ විගණන මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල් මඟින්	130	34
විදේශ අරමුදල් මඟින්	-	-
මුළු වත්කම්	11,224	11,333
මුළු වගකීම්	1.7	75.8
මුළු අරමුදල		
විදේශ ණය මඟින්	9,677	9,677
දේශීය අරමුදල් මඟින්	1,545	1,580

එම විගණන මතයන්ට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ පළපුරුද්ද නොමැතිකම, ආරක්ෂක පියවර පිළිබඳ අවබෝධයක් නොමැතිකම සහ නායයෑම් ඇතිවීම වැලැක්වීමේ ක්‍රියාමාර්ග වැඩි කිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය මඟින්	2022	ණය මුදල ඵලදායී ලෙස භාවිතා කළ යුතුය.	මෙම ව්‍යාපෘතියේ විෂය පථය වූයේ “A ” සහ “B” යන ඉඩම් කැබලි යටතේ නාය ගිය ස්ථාන 16 වේ. නාය ගිය ස්ථාන 16 නිම කිරීමට අමතරව, යෙන් මි. 1000 කට වඩා ඉතිරි	නිර්දේශ ක්‍රියාත්මක කිරිමට ක්‍රියාමාර්ග ගෙන නොමැති අතර, 2022 වර්ෂයේ අවසන්කර ඇත.

	හඳුනාගෙන තිබූ “ඒ” සහ “බී” අක්ෂර යටතේ වූ ඉදිකිරීම් අවසන් කිරීම වසර දෙකකට වැඩි කාලයකින් ප්‍රමාද වී තිබුණි. එබැවින්, ණය කාලය තුළ ව්‍යාපෘතිය සඳහා ජපාන් යෙන් මි. 7,619 ක මුළු ණය මුදලින් ජපන් යෙන් මි. 6,283 ක් පමණක් භාවිතා කර තිබුණි. එබැවින්, ණය කාලය අවසන් වන විට භාවිතයට නොගත් ණය ශේෂය සඳහා ගෙවන ලද කැපකිරීමේ ගාස්තුව ආර්ථික නොවන වියදම් බවට පත් වී තිබුණි.		කර ගනිමින් ණය මුදල මගින් අමතර නාය ගිය ස්ථාන 07 ක් කාල රාමුව තුළ නිම කරන ලදී.	
(ආ)	මෙම ව්‍යාපෘතිය යටතේ 2022 රු. මිලියන 30 ක් වැයකර නායයෑම් අවධානම කල්තියා දැනුම්දීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් (EWS) ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එම පද්ධතිය භාවිතා කර නොතිබුණි. ඒ අනුව, මෙම පද්ධතිය සඳහා දරන ලද වියදම අනාර්ථික තත්ත්වයට පත්ව තිබුණි.	ව්‍යාපෘතියේ අරමුණ සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය (EWS) භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	ණය ගිවිසුමට අනුව, මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ජාතික ගොඩනැගිලි පර්යේෂන සංවිධානය(NBRO) සහ මා.සං.අ. සමඟ එක්ව ස්ථාපිත කළ යුතුව තිබුණි. එබැවින්, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන අතර ණය ගිවිසුමට අනුව NBRO විසින් භාවිතා කර උපරිම ප්‍රතිලාභ ලබා ගනී.	පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය අධිකාරිය භාවිතා කර නොතිබුණි.

3.14 කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (OFID II)

2013 දී ආරම්භ කරන ලද කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (OFID II)සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේණය ගිවිසුම් අංක 1511 PB යටතේ රු. මිලියන 50 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 36.25ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා 03 කදී දීර්ඝ කර 2026 මැයි 31 දිනඅවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතරඑම වර්ෂ 3 සඳහාව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපතිවිසින් තත්වාගණන කල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	2330.87	119.67	721
විදේශ අරමුදල්	904.74	585.67	2012.59
මුළු වත්කම්	17,852.53	19,585	26,934
මුළු වගකීම්	1,260.69	2,266	1,238
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	6,086.48	6,694.32	13,057.96
දේශිය අරමුදල් මඟින්	9,027.07	9,146.74	11,159.34

එම තත්වාගණ විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	අවසන් වරට ඉදිරිපත් කල අන්තර් ගෙවීම් සහතිකය අනුව 2023 දෙසැම්බර් 31 අවසානයේ ව්‍යාපෘතිය නිසි අනුමැතියකින් තොරව ප්‍රාථමික සහ සාමාන්‍ය අයිතමවල පිරිවැය BOQ අගයට	2023	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් අවශ්‍ය අනුමැතිය ලබා ගනිමින් කාර්ය වැඩසටහන කලින් කලට සංශෝධනය විය යුතු අතර එසේම	වැලැක්වීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	වඩා රු.මිලියන 144.4 ක් වැඩි වී තිබූ අතර එය කොන්ත්‍රාත්තුව අමතර පිරිවැයකින් වැඩි කිරීමට හේතු වී තිබුණි.		අනවශ්‍ය වියදම් වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.		
(ආ)	මාර්ග සැලැස්මට අනුව ඉංජිනේරුවරයා විසින් නිසි මිනුම් සහිතව ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කර තිබුණද ඔරුගොඩවත්ත අඹතලේ මාර්ගය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු. මිලියන 208 ක විචලායයන් සඳහා ගෙවා තිබුණි. මෙම විචලනයන් 2024 මාර්තු 31 දින දක්වා අනුමත කර නොතිබූ අතර එය විගණනයේ දී ගැටළු සහගත විය.	2023	කාර්යය වැඩසටහන කලින් කලට සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය.	වැලැක්වීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා කොන්ත්‍රාත්තුව II අදියර වන 2019 ඔක්තෝබර් 21දින රු.මිලියන 1,943 ක වියදමින් ආරම්භ කර 2021 ඔක්තෝබර් 20 දින නිම කිරීමට නියමිතව තිබුණද අවස්ථා 4 කදී කොන්ත්‍රාත් කාලය දිර්ඝ කර තිබූ අතර රු. මිලියන 55.25ක අතුරු හිමිකම් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණි. ගිවිසුමේ කොන්දේසි	2023	වැඩ වැඩසටහන කලින් කලට සංශෝධනය විය යුතු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය.	වැලැක්වීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	අංක 8.7 අනුව, කොන්ත්‍රාත් ප්‍රමාදයන් සඳහා කොන්ත්‍රාත්කරුගෙන් අය කළ යුතු අදියර I සහ II සඳහා පිළිවෙලින් දින 125ක සහ දින 113ක ප්‍රමාදය සඳහා වූ රු. මිලියන 347ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.				
(ඇ)	ලැබී ඇති තොරතුරුවලට අනුව ව්‍යාපෘති කටයුතු සඳහා රජයේ ඉඩම් කට්ටි 992ක් ඇතුළුව ඉඩම් කට්ටි 5,710ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර,2023දෙසැම්බර් 31 දිනට ඒ සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද පොලීරු.මිලියන 2,658ක් ව්‍යාපෘතිය මඟින් ගෙවා තිබුණි.	2023 2022 2021	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය.	වැලැක්වීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.15 වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය

2019 දී ආරම්භ කරන ලද වරාය පිවිසුම් ගුවන් මාර්ග ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3716 යටතේ රු. මිලියන 46,381.72 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 9500.76 ක් විය. ව්‍යාපෘතිය 2025 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතරඑහිදි 2021 වර්ෂය සඳහාව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ද 2022 සහ 2023 තත්වාගණන නොකළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	495.11	20.67	7.64
විදේශ අරමුදල්	10,439.94	18,006.79	20,023.29
මුළු වත්කම්	12,467.30	47,815.11	63,194.27
මුළු වගකීම්	1,468.51	4,013.11	3,860.29
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	10,498.6	40,264.26	55,662.36
දේශීය අරමුදල් මඟින්	495.05	515.73	523.37

එම විගණන මතයඉදිරිපත් කිරිමටහේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	සමුද්‍රීය පහසුකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නිම කර ශ්‍රී ලංකා වරාය අධිකාරියට පැවරීම ප්‍රමාද වීම හේතුවෙන්, ව්‍යාපෘතියවිසින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයන් ස්ථානගත කිරීම සඳහා විවලතා	2022 2023	අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතු අතර අමතර වියදම් අවම කර ගැනීම සඳහා ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	ආයතනය විසින් වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මුල් පිරිවැය 34% කින් වැඩි වී තිබූ අතර ඉදිකිරීම් ප්‍රගතිය 44.5% ක් වී තිබුණි.

	නියෝග 03ක් යටතේ රු. මිලියන 221.53 ක පිරිවැයක් දරාතිබුණි.තවද, ඉහත ගෙවීම් අනුමත විචලන සීමාව රු. මිලියන 11.07 කින් ඉක්මවා ගොස් තිබුණි.				
(ආ)	අනුක්‍රමික උෂ්ණත්වය ඉක්මවීම, ABC ඉහළ මට්ටමේ වෙනස්වීම්, ඉහළ සහ පැති මතුපිට ඉරිතැලීම්, දරණ කුළුණුවල අඩු ශක්තිය, නුසුදුසු බැවුම් ආරක්ෂාව යනාදි දෝෂ දක්වමින් සඳහා 2021, 2022 සහ 2023වර්ෂ තුළ අනුකූල නොවීමේ වාර්තා 21ක් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය වූ අතර2023 දෙසැම්බර් 31 වන විට එම දෝෂ නිවැරදි කර නොතිබුණි.	2023	අනුකූල නොවීමේ වාර්තාවල සඳහන් දෝෂ නිවැරදි කිරීමට කඩිනම් පියවර ගත යුතුය.	ආයතනය විසින් වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	මිල ඉහළ යාම් හේතුවෙන්පවතින ණය අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා ඇමරිකානු ඩොලර් මිලියන 28.4ක ඇස්තමේන්තුගත වටිනාකමක් ඇති විද්‍යුත් ගාස්තු එකතු කිරීමේ පද්ධතිය (ETC) ක්‍රියාත්මක කිරීම අවලංගු කිරීමට ව්‍යාපෘතිය විසින් 2023 පෙබරවාරි 02 දින ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ඉල්ලා තිබුණු අතර අවලංගු කිරීම සඳහා	2022 2023	ව්‍යාපෘති ක්‍රියාකාරකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	ආයතනය විසින් වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

අනුමැතිය ලබා දී තිබුණි.කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ETC පද්ධතිය සඳහා උපදේශන සේවා වෙනුවෙන් රු. මිලියන 14.79 ක මුදලක් වැය කර තිබු අතර, ඒ සඳහා 2023 දෙසැම්බර් 31 දිනට මුළු වියදම රු. මිලියන 176.48 කි. එසේ වුවද, පෙර වර්ෂය තුළ කළමනාකාරිත්වය විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි විකල්ප ක්‍රියා පටිපාටියක් මත පදනම්ව ETC පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

3.16 ඔපෙක් අරමුදලින් A -017 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණුකිරීමේ ව්‍යාපෘතිය (රක්වාන- සූරියකන්ද)

2019 දී ආරම්භ කරන ලද A -017 මාර්ග පුනරුත්ථාපනය කිරීමේ හා වැඩිදියුණුකිරීමේව්‍යාපෘතිය සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ ණය ගිවිසුම් අංක 136552P යටතේ රු. මිලියන 5497.9 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,449.3ක් විය. ව්‍යාපෘති කාලය තුල එක් අවස්ථාවකදී දීර්ඝ කර 2025 දෙසැම්බර් 25 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතරඑහිදි 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 සහ 2023 වර්ෂ සඳහාතත්වාගණනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	59	13.21	52.27
විදේශ අරමුදල්	-	320.47	2529.19
මුළු වත්කම්	37.99	466.10	3,058.28
මුළු වගකීම්	32.02	132.42	444.34
මුළු අරමුදල			
විදේශ ණය මගින්	-	320.47	2,561.66
දේශිය අරමුදල් මගින්	5.9	13.21	52.27

එම විගණන මතයන්ඉදිරිපත් කිරිමටහේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	පාංශු ඛාදනය අවම කිරීම සහ බෑවුම් කැපීම් ස්ථාවර කිරීම සඳහා ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද 2021පෙබරවාරි 18 දින ලිපියේ මාර්ගෝපදේශ හා යෝජනා අනුව කැණීම් කරන ලද පස් සුදුසු කසල ස්ථාන වෙත ප්‍රවාහනය කිරිමට සහ ඛාදනයට නිරාවරණය නොවී තැබීමට කටයුතු කර නොතිබුණි.	2023	සියලුම හානි නිවැරදි කිරීමට පියවර ගත යුතු අතර හානිය අවම කිරීමේක්‍රියා පටිපාටි හඳුන්වා දිය යුතුය.	වැලැක්වීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශිත පරිදි නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	ICTAD - 2009 විසින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සහ පාලම් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වන සම්මත පිරිවිතරයන්ට අනුව, අත්තිවාරම සහ ජලය බැසයාමේ පදනම සකස් කිරීමේ ගෙවීම් ඒකකය ලෙසprovision sumයොදාගත යුතු වුවත්, ඊට පටහැනිව, සියලුම පැකේජවල ඉංජිනේරු ඇස්තමේන්තු එකවර සකස් කර තිබූ අතර, නිසි මිනුම් නොමැතිව ව්‍යාපෘතියෙන් රුපියල් මිලියන 12.51 ක මුදලක් ගෙවා තිබුණි.	2023	පිරිවැය ඇස්තමේන්තුව අනුමත කිරීමට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂ ICTAD කොන්දේසි වලට අනුකූල වන බවට සහතික විය යුතුය.	වැලැක්වීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ)	මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2021 අප්‍රේල් 20 වැනි දින පැවැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු රැස්වීමේ වාර්තාවට අනුව, සූරියකන්ද - රක්වාන ව්‍යාපෘතිය (කි.මී. 18) ප්‍රතිසංස්කරණය කිරීම සේවායෝජකයාගේ අවශ්‍යතාවය මතඑක් කොන්ත්‍රාත් පැකේජයක් සඳහා කිලෝමීටර 06 බැගින් වූ පැකේජ 03 කට බෙදා තිබුණි.ඒ අනුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව යටතේ A සහ B පැකේජ ප්‍රදානය කර ඇති අතර C පැකේජය කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව යටතේ ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත්, එවැනි ව්‍යාපෘතිය පැකේජ 03කට බෙදීමට ගත් තීරණය නිසා ව්‍යාපෘතියේ මූලික වියදම්, අධීක්ෂණ ගාස්තු, ව්‍යාපෘති පොදු කාර්ය පිරිවැය ඉහළ ගොස් තිබුණි.	2023	කොන්ත්‍රාත්තුව අනුමත කිරීමට පෙර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා අදාළ ප්‍රසම්පාදන කමිටුවෙන් නිසි අනුමැතිය ලබා ගත යුතුය.	වැලැක්වීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඈ)	ප්‍රසම්පාදන කාලසටහනට අනුව, ප්‍රසම්පාදන ආයතනය 2022 ජනවාරි 02 වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම්	2023	ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පිළිතුරට අනුව භාරදීමේ දිනය දීර්ඝ නොකෙරේ. එබැවින් දිනය දීර්ඝ	වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	කර තිබුණද, එම ප්‍රසම්පාදන කාල සැලසුම තුල කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබූ අතර එය ඉදිකිරීම් වල ප්‍රගතිය අඩු වීමට හේතු වී තිබුණි.		කිරීමට ඉඩ නොදිය යුතුය.		
(ඉ)	ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම් කට්ටි 1515ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර ඉන් ඉඩම් කට්ටි 789ක් සඳහා පමණක් 38(අ) වගන්තිය නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දක්වා 17 වැනි වගන්තිය යටතේ කිසිදු ඉඩම් කට්ටියක් සඳහා වන්දි තක්සේරු කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වල අධීක්ෂණය එම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් බලපෑ අතර අනාගතයේ දී ව්‍යාපෘති පිරිවැය ඇස්තමේන්තු ඉක්මවා යාමට එය අහිතකර ලෙස බලපෑ හැකිය.	2023 2022	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය	වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඊ)	ප්‍රසම්පාදන සැලැස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කර නොතිබූ අතර විය විදේශ අරමුදල් නියෝජිතායතනය විසින් හෝ අනුමත කර නොතිබුණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව ප්‍රසම්පාදන සැලැස්මක්ද සකස් කර නොතිබුණි.	2023	ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කටයුතු කළ යුතුය.	වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3.17 ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය

2017 දී ආරම්භ කරන ලද ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 5788-LK යටතේ රු. මිලියන 2086 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 240 ක් විය. ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 දින අවසන් කර තිබුණි.

වත්කම් කළමනාකරණය සඳහා ආයතනික ශක්තිමත් කිරීම සහ ධාරිතා වර්ධනය යන කොටස් 2ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 125ක් හෙවත් රු. මිලියන 18,125කට සමාන වි.ගැ.හිමිලියන 90.5ක් විය. කෙසේ වෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස් කර තිබුණි.ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනවලින් එ.ජ.ඩො. මිලියන 100කට සමාන රු. මිලියන 14,500ක් ව්‍යාපෘතියෙන් ඉවත් කර ඇති අතර එම මුදල සියලුම පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන් කර තිබුණි.ඉතිරි ශේෂයෙන් ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාමට වෙන් කර තිබුණේ රුපියල් මිලියන 16කට සමාන රු. මිලියන 2,320ක මුදලක් පමණක් වන අතර ඉතිරි මුදල වන රු. මිලියන 1,232.5ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 8.5ක් මාර්ග නඩත්තු භාරඅරමුදල වෙත පවරා තිබුණි.අවසානෙය් අැ.ෙඩා.මිලියන 7කට සමාන රු.මිලියන 2086 ක මුදලක් ෙවන් කර තිබූ අතර ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 දින අවසන් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර එහිදි 2021 හා 2022 වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2023 වර්ෂ සඳහා තත්වාගණන කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	19.03	13.5	8.79
විදේශ අරමුදල්	128.78	577.63	1,171.54
මුළු වත්කම්	597.22	1,654.93	2,469.97
මුළු වගකිම්	3.92	52.57	221.84
මුළු අරමුදල			
විදේශ ණය මඟින්	457.04	1,240.85	2,089.56
දේශිය අරමුදල් මඟින්	136.27	149.77	158.56

එම තත්වාගණන කළ විගණන මතය ඉදිරිපත් කිරිමටහේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2020 මැයි 6 වන දින ශ්‍රී ලංකා රජය විසින් කරන ලද ඉල්ලීම පරිදි COVID 19 සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 7 ක් පැවරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා වන මුළු ණය ප්‍රතිපාදන නැවත ඇමරිකානු ඩොලර් මිලියන 9 ට සමාන රුපියල් මිලියන 1,305 දක්වා අඩු කර ඇත. අවසානයේ ඇමරිකානු ඩොලර් මිලියන 7කට සමාන රුපියල් මිලියන 2,086 ක මුදලක් වෙන්කර තිබු අතර, රටේ පවතින ආර්ථික අර්බුදයට සහායවීම සඳහා ඉතිරි මුදල ඇමරිකානු ඩොලර් මිලියන 2 ක් මාරු කර ඇත.ව්‍යාපෘතිය 2016 ජූනි 30 දින එහි කටයුතු ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර 2023 සැප්තැම්බර් 30 වන විට අවසන් කර තිබුණි. තවද, ණය අරමුදල සීමා කිරීම හේතුවෙන් ආයතනික හා පාලන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවද නිරීක්ෂණය විය.	2023 2022	වැඩ සැලැස්මට අනුව වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය.	වැලැක්වීමට පියවර ගෙන නොමැත.	2023 සැප්තැම්බර් 30 දින ව්‍යාපෘතියේ විෂය පථය සීමා කර මෙහෙයුම් නිමකර ඇති අතර 2024 මාර්තු 31 දින ගිණුම් පියවා ඇවර කර ඇත.

3.18 බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය(OFID III)

2015 දී ආරම්භ කරන ලද බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලේ ණය ගිවිසුම් අංක 1662 P යටතේ රු. මිලියන 2,209.84 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,022.66 ක් විය. ව්‍යාපෘති කාලය තුල අවස්ථා 03 කදී දිර්ඝ කර 2026 මැයි 10 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි..

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතරපසුගිය වර්ෂ 3සඳහාව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය කළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	242.83	12.15	313.91
විදේශ අරමුදල්	379.48	508.21	492.96
මුළු වත්කම්	4,666.78	5,121.24	7,749.59
මුළු වගකිම්	696.19	530.79	655.19
මුළු අරමුදල			
විදේශ ණය මගින්	2,058.42	2,576.53	4,766.55
දේශිය අරමුදල් මගින්	1,819.87	1,889.72	2,203.64

එම විගණන තත්වාගණනය කළ විගණන මතයට හේතු වු කරුණු වලට ඉදිරිපත් කිරිමටහේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණනවාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	කිලෝමීටර් 25.8 ක් වූ ජාතික මාර්ග 04 න් ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ සිදුකිරීමට බලාපොරොත්තු විය. 2015 ජුනි 26 වැනි දින ණය ගිවිසුම අත්සන් කළද ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන්	2021 2022 2023	ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ව්‍යාපෘතියේ මූලික විෂය පථය සම්පූර්ණ කිරීම පිළිබඳව සහතික විය යුතුය.	වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	කොන්ත්‍රාත් පැකේජ 02හි පුනරුත්ථාපන කටයුතු වසර 2 ½ කට පසුව ආරම්භ කර තිබූ අතර ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 645 කින් ඉක්මවා තිබුණි. කඩුවෙල සිට අතුරුගිරිය මාර්ගයේ ඉතිරි වැඩ නිම නොකර ඉතිරි ණය මුදලින් මුල් වැඩ විෂය පථයට අයත් නොවන ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 9/1 පාලම ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය දැනටමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. තවද, කොන්ත්‍රාත් පැකේජය යටතේ වල්ගම-අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 1.25 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ විෂය පථයෙන් පසුව ඉවත් කර ඇත.				
(ආ)	ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනට පසුගිය වසර හතර තුළ වෙළඳ දැන්වීම්, මැනුම් කටයුතු, නායයෑම් අධ්‍යයනය, පදික වේදිකාව සැලසුම් කිරීම සහ පාරිසරික උපදේශන වියදම් සඳහා රු. මිලියන 16.96ක් වූ ලැබිය යුතු ශේෂ දෙකක් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන	2022 2023	ලැබිය යුතු මුදල පියවා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය.	වැලැක්වීම සඳහා පියවර ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	නොතිබුණි.				
(ඇ)	කඩුවෙල - අතුරුගිරිය මාර්ගයේ කිලෝමීටර් 9.5 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරු 2018 ජනවාරි 29 වන දින රු. මිලියන 1,065 ක වියදමින් ආරම්භ කර 2019 ජූලි 28 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුට දින 841ක කාලය දීර්ඝ කිරීම මගින් 2023 අගෝස්තු 29 දක්වා ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් දින 841ක කාලය දීර්ඝ කිරීමේ පිරිවැයට අදාළව රු. මිලියන 311ක් ඉල්ලා තිබුණු අතර කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරීත්වය සැලකිල්ලට නොගෙන ව්‍යාපෘතිය විසින් එම හිමිකම් පෑම අනුමත කර තිබුණි.	2022 2023	කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව මිල වැඩිකිරීමේ කාලය දීර්ඝ කිරීම, හේතුවල නිරවද්‍යතාවය සහ අදාළත්වය නිර්දේශ කිරීමට පෙර ඉංජිනේරුවරයා තහවුරු කළ යුතුය.	වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	කොන්ත්‍රාතුවට අදාල මුළු වැඩ ප්‍රමාණයන් හඳුනා ගැනීමට ව්‍යාපෘතියට නොහැකි වීම හේතුවෙන් කඩුවෙල - අතුරුගිරිය මාර්ගය සඳහා විචලන නියෝග නිකුත් කර තිබුණු අතර ඒ අනුව මුළු ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ පිරිවැයෙන් සියයට 43 ක් නියෝජනය වන රු. මිලියන 453 වූ වැඩ	2022 2023	විචලන ඇණවුම් නිර්දේශ කිරීමට පෙර ව්‍යාපෘති කළමණාකරණ ඒකකය (PMU) ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.	වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

	සඳහා විචල්න පිරිවැය වැඩි වී තිබුණි.			
(ඪ)	ව්‍යාපෘතියේ උපදේශන ගිවිසුම 2018 මාර්තු 08 දින රු. මිලියන 147.79 කර තිබුණද, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් රු. මිලියන 299.36 දක්වා සංශෝධනය වැඩි වී තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ පිරිවැය ඉහල යාමට කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය බලපා තිබුණි.	2022 2023	ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතියේ විෂය පථය සමඟ අනුකූලවන බවට වගබලා ගත යුතුය.	වැලැක්වීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක ක්‍රියාමාර්ග ගෙන කර නොතිබුණි. නොතිබුණි.
(ඬ)	ලද තොරතුරුවලට අනුව රජයට අයත් ඉඩම් කට්ටි 504ක් ඇතුළුව ඉඩම් කට්ටි 2,747ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය යටතේ වන්දි මුදල රුපියල් මිලියන 1,564ක් ගෙවා තිබුණි. මීට අමතරව, 2023 දෙසැම්බර් 31 දින දක්වා වන්දි ගෙවීමේ ප්‍රමාදයන් සඳහා ප්‍රමාද පොලී වශයෙන් රු. මිලියන 417 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබුණේ ඉඩම් කට්ටි 411ක් පමණි.	2021 2022 2023	ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහිතව සිදු කළ යුතුය.	වැලැක්වීම සඳහා නිර්දේශ ක්‍රියාත්මක ක්‍රියාමාර්ග ගෙන කර ොනාතිබුණි. නොතිබුණි.

04. ප්‍රජා ප්‍රවාහන අංශය

4.1 කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමකාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2019 දී ආරම්භ කරන ලද කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමකාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3806 SRI යටතේ රු. මිලියන 125 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 7,246 ක් විය. ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	3,363	6,954	15,803
මුළු වගකීම්	751	1,164	1,240
මුළු අරමුදල්	2,612	5,790	14,563
විදේශ ණය මඟින්			
දේශීය අරමුදල් මඟින්			

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	ආසියානු සංවර්ධන බැංකුව මගින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය සඳහා ලබා දෙන ලද අයවැයගත ප්‍රයාපන ගාස්තු එ.ජ.ඩො. 350,000 ක් වූ අතර ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට තවත් වසරක් ඉතිරිව තිබුණ ද,	2023	අතිරික්ත ප්‍රයාපන ගාස්තු ඇති වීම වළක්වා ගැනීම සඳහා අයවැයට අනුව සැලසුම් කර ඇති මුදල් ගෙවීම් නියමිත වේලාවට සිදු කළ යුතුය	සිදුවීම් පහක ප්‍රතිඵලයක් ලෙස නියමිත වේලාවට සැලසුම් කරන ලද මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි දක්වා ඇති ඇස්තමේන්තුගත	ප්‍රමාදයන් හේතුවෙන් තවදුරටත් ප්‍රයාපන ගාස්තු අය කෙරෙමින් පවතී.

	සත්‍ය ප්‍රයාපන ගාස්තුව එ.ජ.ඩො. 788,399 ක් වූ අතර ඉන් අනතුරුව, අතිරික්ත බැඳීම් ගාස්තු රු. මිලියන 126කට සමාන වූඑ.ජ.ඩො. 438,399 ක් විය.			බැඳීම් ගාස්තු ඉක්මවා ඇත.	
(ආ)	2023 අප්‍රේල් 28 දිනැති සංශෝධිත ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, මිල විචලනය සහ අනෙකුත් ගාස්තු වැඩිවීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා එ.ජ.ඩො. මිලියන 15 ක අමතර පිරිවැයක් අවශ්‍ය බව පෙනීයාම හේතුවෙන්ඒ සඳහා ව්‍යාපෘතියේ මූලික විෂය පථයට ඇතුළත් වූ එ.ජ.ඩො. මිලියන 10 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත උප ව්‍යාපෘති හතරක් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි.	2021, 2022 , 2023	නිසි තක්සේරුවකට අනුව විෂය පථයේ වෙනස්කම් සිදු කළ යුතු අතර එයව්‍යාපෘතියේ සමස්ත අරමුණුවලට අයහපත් බලපෑම් සිදු නොකළ යුතුය.	දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීම් අනුව, ව්‍යාපෘති මෙහෙයුම් කමිටු සාකච්ඡාවෙන් පසුව ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කර ඇත. එමඟින් ව්‍යාපෘතියේ අරමුණු සමඟ පිළිගැටුමක් ඇති නොවේ.	පාසල් මංතීරු පාලම ඉදිකිරීමේ කටයුතු දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කිරීරට යෝජනා වී ඇතත් මෙතෙක් ආරම්භ කර නොමැත.
(ඇ)	ව්‍යාපෘතිය ආරම්භයේ දී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව, දුම්රිය ප්‍රමාදයට ප්‍රධාන හේතුව ලෙස හඳුනාගත් දෙමටගොඩ සහ මරදාන දුම්රිය ස්ථාන අතර මාර්ග තදබදය මඟහරවා ගැනීමට පාසල් මංතීරු පාලම පුළුල් කිරීම සඳහා විශේෂ ප්‍රමුඛතාවක් ලබාදිය යුතු වුවද, මෙම උප ව්‍යාපෘතිය එකී වාර්තාවේ නිර්දේශයන්ට පටහැනිව				

	නතර කිරීමට තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ඒවනවිටත් ආරම්භ කර නොමැති නිසා ව්‍යාපෘතියේ අතිරේඛ පිරිවැය ආවරණය කරගැනීම සඳහා එය ක්‍රියාත්මක නොකිරීමට තීරණය කරන ලද බව විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව, ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සඳහා ව්‍යාපෘති අනුකමිටුව විසින් ගනු ලැබූ තීරණය ව්‍යාපෘතියේ සමස්ත ඉලක්ක කෙරෙහි වන බලපෑම පිළිබඳ නිසි තක්සේරුවක් සහිතව ගන්නා ලද තීරණයක් නොවීය.				
(ඇ)	ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ මහනුවර නගරාශ්‍රිත දුම්රිය සේවාව වැඩිදියුණු කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් සකස් කිරීම හා උපදේශන සේවාව ලබා ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව කැබිනට් අනුමැතිය මත පෞද්ගලික සමාගමක් වෙත ඇ.ඩො.2,642,014 ක් සහ යූරෝ 1,385,208ක් සහ රු.මිලියන 194 ක වටිනාකමට 2019 වර්ෂයේදී මාස 18 ක	2021 2022 2023	ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	ව්‍යාපෘතියේ විෂයපථය වන්නේ ශක්‍යතා අධ්‍යයනය සහ සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම පමණි.එබැවින් එය ඉටු කිරීමට අවශ්‍ය සියලු පියවර ගනු ලබන අතර ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය අරමුදල් සැපයීම ව්‍යාපෘති විෂයපථයෙන් පිටත සිදු විය යුතු කාර්යයකි.	අත්හිටුවා තිබුණු උපදේශන සේවා කටයුතු නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

	කාලයකින් නිම කිරීම සඳහා පවරා තිබුණි.ව්‍යාපෘතිය මගින් රු.මිලියන 719 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට අදාල සමාගමට ගෙවා තිබුණු අතර උපදේශන සමාගම විසින් කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම අත්හිටුවා තිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා දරන වියදම නිශ්කාර්ය වී තිබුණු අතර ශක්‍යතා අධ්‍යයනයෙන් පසු සංවර්ධන කටයුතු වෙනුවෙන් අරමුදල් ප්‍රභවයක් හදුනා ගැනීමට කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.				
(ඉ)	ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ දිප ව්‍යාප්ත දුම්රිය සන්නිවේදන පද්ධතිය ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා USD 7,490,874 දේශීය පුද්ගලික සමාගමක් සමග ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතිය යටතේ නව සන්නිවේදන පද්ධතිය භාවිත කරමින් ජනතාවට වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත දුම්රිය සේවාවක් ලබාදීමට අපේක්ෂා කර තිබූ අතර	2021, 2022, 2023	සන්නිවේදන පද්ධතිය උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව ක්‍රියාත්මක වියයුතු අතර නිලධාරීන් අදාල රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.	එම උපකරණ භාවිතා නොකිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන් සමග සාකච්ඡා කර ඉදිරි පියවර ගැනීමට කමිටුවක් පත්කර තිබේ. එකී කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	පද්ධතිය භාවිතා කිරීම ඉතා අවම මට්ටමක පැවතුණි.

	පද්ධතිය සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 1,901 ක මුදලක් වැය කර 2022 සැප්තැම්බර් මස අවසන්කර තිබුණි. දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එම පද්ධතිය ප්‍රායෝගික භාවිතා නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු අතර ඒ සඳහා දරන ලද වියදම නිශ්කාර්ය වී තිබුණි.				
(ඊ)	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදල යොදා ගනිමින් කැලණිවැලි දුම්රිය මාර්ගයේ ප්‍රවේශ අයිතිය තුළ (RoW) පදිංචි පවුල් 120ක් නැවත පදිංචි කිරීම සඳහා මාලපල්ල ප්‍රදේශයේ සහාධිපත්‍ය ඉදිකිරීම සඳහා වූ				
(උ)	කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී මාස 05කට පසු කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබූ අතර ඒ අනුව, ප්‍රවාහන අමාත්‍යාංශය විසින් පෞද්ගලික සමාගමක් සමඟ බදු රහිතරු.මි.1,317ක වටිනාකමකට කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.කොන්ත්‍රාත්තුව 2021 ජුනි 04 වන දින	2023	ගිවිසුමට අනුව ගෙවීම් කළ යුතු අතර නියමිත දිනට කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කළ යුතුය.	රුපියල් මිලියන 858.5 ක ඇස්තමේන්තුගත මිල වැඩිවීම තථ්‍ය විචලනය සහ ගෙවීම ඇගයීමට ලක් කරන බැවින් වැඩි වීමට හෝ අඩුවීමට යටත් වේ. මේ සඳහා ප්‍රතිපාදන ගිවිසුමේ කොන්දේසිවල ඇතුළත් වන අතර වර්තමාන වෙළෙඳපොළ මිල උච්චාවචනයන්	සියයට 95 ත නිමවුම් ප්‍රගතියක් වාර්තා කර ඇතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් නිමවුම් පිරිවැය සියයට 65 කින් ඉහළ ගොස් ඇත.

	ආරම්භ කිරීමට නියමිතව තිබුණු අතර කොන්ත්‍රාත් කාලය කොන්ත්‍රාත්තුව පිළිගත් දිනයේ සිට මාස 36 ක් විය. කොන්ත්‍රාත් කාලය පළමුවරට දීර්ඝ කිරීමෙන් පසුව, 2021 ජුනි 21 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර 2024 ජුනි 4 වන දින අවසන් කිරීමට නියමිතව තිබුණද, ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ ලිපියට අනුව ව්‍යාපෘතියේ ආරම්භක දිනය තවත් මාස06 කින් 2022 ජනවාරි 05 දක්වා ප්‍රමාද වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ලංසුකරු තෝරා ගැනීම සඳහා 2018 සිට 2021 දක්වා වසර දෙකක් ගත වී තිබීම සහ ප්‍රමාදයන් සඳහා වරින් වර ලබාදුන් දින දීර්ඝ කිරීම හේතුවෙන් සියයට 65ක මිල විචලනයක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.			මෙයට බලපා ඇත. එබැවින්, කොන්ත්‍රාත්කරුට මෙම ගෙවීම ලබා ගැනීමට ගිවිසුම්ගත අයිතිය ඇත.	
(ඍ)	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සුහුරු ටිකට්පත් පද්ධතියක්ප ස්ථාපනය කිරීම සඳහා 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද දීර්ඝ ටෙන්ඩර් ඇගයීම් ක්‍රියාවලියකින් පසුව, 2021 මැයි 31 දින ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා 2019 වර්ෂයේ දී පුද්ගලික සමාගමක්	**2022,** **2023**	ව්‍යාපෘතිය ප්‍රමාදයකින් තොරව අවසන් කළ යුතු අතර ගෙවීම් කොන්ත්‍රාත් ගිවිසුමට අනුව සිදු කළ යුතුය.	මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර වසර දෙකක් ගතවී ඇතත් එහි නිමැවුම් ලබාදීමේ පසුගාමී බවක් දක්නට ලැබේ. දුම්රිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය කොන්ත්‍රාත්කරු	ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.

සමඟ එ.ජ.ඩො. මිලියන 19 ක පිරිවැයකට ගිවිසුමක් අත්සන් කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2024 දෙසැම්බර් 31 දක්වා වසර 3 ½ කින් දීර්ඝ කර තිබුණු අතර අත්තිකාරම් වශයෙන් රු. මිලියන 321ක් ගෙවා තිබුණි.ව්‍යාපෘතියට අදාළ කටයුතු සඳහා 2020 වසරේ සිට උපදේශන සමාගමක සේවය ලබා ගෙන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් නොලබාම උපදේශන ගාස්තු වශයෙන් රු. මිලියන 21ක මුදලක් ගෙවා ඇති බවද නිරීක්ෂණය විය.

තවද, 2024 ජූනි 30දිනට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 34ක් වීම හේතුවෙන් ව්‍යාපෘතිය නියමිත දිනට නිම කිරීමේ අවිනිශ්චිතතාවයක් පවතින බවද,සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව හේතුවෙන් අපේක්ෂිත කාර්යසාධනය ලබා ගැනීමට නොහැකි වී ඇති බව ද නිරීක්ෂණය විය.

විසින් හඳුනා ගැනීම ප්‍රමාද වීමත් ඒ වන විට රට තුළ පැවැති අස්ථාවරභාවයත් මේ සඳහා සෘජුව බලපා ඇත.

4.2 කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

2016 දී ආරම්භ කරන ලද කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3425 SRI (SF) යටතේ රු. මිලියන 1456.50 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 198.04 ක් විය. ව්‍යාපෘතිය 2023 ජූනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපත්ති අනුව කැළණිවැලි දුම්රිය මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා සුදානම් කිරීමට (නැවත පදිංචි කිරීමේ කටයුතු)දේශිය අරමුදල් යොදා ගනිමින් ව්‍යාපෘති කළමනාකරන ඒකකය හරහා කටයුතු කෙරෙමින් පවතී.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ 02 සඳහා ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2023 සඳහා තත්ත්වාගනනය කළ මතයක් ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	4,733	4,836	6,955
මුළු වගකීම්	0	0	0
මුළු අරමුදල්	4,733	4,836	6,955
විදේශ ණය මඟින්			
දේශිය අරමුදල් මඟින්			

එම විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	සමස්ත ව්‍යාපෘතිය සඳහා තථ්‍ය පොළී පිරිවැය රු. මිලියන 232.90 කට සමාන ඇමෙරිකානු ඩොලර් 609,455ක් වූ අතර2023 දෙසැම්බර් 31 දිනට මුළු පොළී ගෙවීම රුපියල් මිලියන 190.68 කට සමාන ඇමෙරිකානු ඩොලර් 498,970 ක් වීම	2023	ණය කාලසීමාව තුල ගෙවන පොලී ගිණුම්ගත කළ යුතුය.	2023 වර්ෂයේදී ණය පොළී ගිණුම්කරණය සඳහා ව්‍යාපෘති කළමනාකරණ අත්පොතේ (PAM) කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබීම හේතුවෙන්, 2023 වර්ෂය සඳහා වූ	ගෙවිය යුතු පොලිය මෙවන තෙක් ගිණුම්ගත කර නොතිබුණි.

	හේතුවෙන්, රුපියල් මිලියන 42.22 කට සමාන ඇමෙරිකානු ඩොලර් 110,485 ක් වූ ගෙවිය යුතු පොළී වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි.			වාර්ෂික ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොමැත. තවද, 2023.06.30දිනට ව්‍යාපෘතියේ ණය කාලසීමාව අවසන් වී ඇති බැවින්, අනාගතයේදී ද ව්‍යාපෘතිය මගින් ගිණුම්ගත නොකළ ණය පොළිය ගිණුම්ගත කිරීමට කිසිදු නීතිමය පසුබිමක් නොමැත.	
(ආ)	ඉදිරි වර්ෂ විස්සක කාලයක් සඳහා මෙරට දුම්රිය සේවයෙන් ජාතික ප්‍රවාහන පද්ධතියට ලබා දිය යුතු දායකත්වය හඳුනාගෙන ඒ සඳහා කොළඹ තදාසන්න ප්‍රදේශය තුළ තිබෙන දුම්රිය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ආසියානු සංවර්ධන බැංකුව විසින් රු.මිලියන 1,551කට සමාන එ.ජ.ඩො.8,523,930ක් ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු අතර එම මුදලින් සියයට 95ක් වූ රු.මිලියන 1,469ක් ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් සඳහා වන උපදේශන සේවා වෙනුවෙන් වැය කර එහි වාර්තා 2021	2021, 2022, 2023.	හැකි ඉක්මනින් අදාළ දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීම කළ යුතුය.	ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයන සහ සවිස්තරාත්මක සැලසුම් වාර්තා පිළියෙළ කර 2021 අප්‍රේල් 30 දින වන විට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇත. මෙයින් මෙම ව්‍යාපෘතියට අයත් කාර්යය අවසන් වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘති කාර්යයන් ලෙස හඳුනාගෙන නොමැත.	දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු මෙතෙක් ආරම්භකර නොමැත.

	වර්ෂයේදී රේඛීය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණ ද, දුම්රිය පද්ධතිය සංවර්ධනය කිරීමේ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා එම වාර්තා භාවිතා කර නොතිබුණි.				
(ඇ)	ණය ගිවිසුම ප්‍රකාරව,ව්‍යාපෘතිය අවසන් කර 2022 දෙසැම්බර් 31 දින භාර දීමට යෝජිත වූ අතර, එම දිනයේදී ව්‍යාපෘතිය මගින් කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට (CSRP) අදාළ ආසියානු සංවර්ධන බැංකුවේ ණය උපයෝජනය කර අවසන් කර තිබුණි. එහෙත් ණය ගිවිසුම යටතේ පහසුකම් ලබා ගත් අනෙකුත් පාර්ශව එම මුදල් සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට නොගැනීම නිසා පොළී වියදම අඛණ්ඩව උද්ගත වීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට, ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් 102,087.41 ක පොළී පිරිවැයක් අය කර තිබුණි.	2023	ණය ගිවිසුමේ සංරචකවල සිදුවන ප්‍රමාදයන් මතඋද්ගතවන පොලිය ප්‍රමාදවන සංරචක මගින් දැරිය යුතුය.	ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුමේ නියමයන්ට අනුව, ව්‍යාපෘතිය වසා දමන දිනය දක්වා ණය පොළී වියදම ව්‍යාපෘතිය යටතේ ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ණය පොළිය ලෙස කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) සඳහා ඇමෙරිකානු ඩොලර් 102,087.41 ක් වෙන් කරන ලදී.	මෙම ව්‍යාපෘතියට වැය බරක් කර තිබු ණය ගිවිසුමේ අනෙකුත් සංරචකවල ප්‍රමාදය මත උද්ගත වූ පොලියමෙම ව්‍යාපෘතියෙන් ඉවත් කර ගෙන නොතිබුණි.
(ඇ)	කොළඹ තදාසන්න දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (CSREIP) යටතේ දුම්රිය සේවාව සඳහා සුහුරු ටිකට්පත් සහ ආසන වෙන්කිරීමේ	2023	හැකි ඉක්මනින් ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය.	අදාළ දෙස් විදෙස් උපදේශකයින් විසින් අදාළ කටයුතු නිසි පරිදි සම්පූර්ණ කරන ලද අතර ලංසු ලේඛන භාවිතා කර ලංසු කැඳවා	සුහුරු ටිකට්පත් සහ ආසන වෙන්කිරීමේ පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

	පද්ධතිය උප ව්‍යාපෘතියක් ලෙස දැනට ක්‍රියාත්මක වේ. එම උප ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා ගාස්තු වශයෙන් රු. මිලියන 19 ක වියදම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය (CSRP) මගින් දරා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2021 සැප්තැම්බර් 17 දින සිට වසර 03ක් ඇතුළත ක්‍රියාත්මක කළ යුතු වුවද, උප ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රගතිය ලබා නොතිබීම හේතුවෙන් මෙම උප ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් ඵල රහිත වී තිබුණි.			ජාත්‍යන්තර තරඟකාරී මිල ක්‍රමය (ICB) යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගන්නා ලද අතර කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වෙමින් පවතී.	
(ඉ)	කැළණිවැලි දුම්රිය මාර්ග සංවර්ධන කටයුතු සඳහා එම මාර්ගය දෙපස දුම්රිය ප්‍රවේශ අයිතිය (RoW)තුල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස සංකීර්ණ 07 කින් අවශ්‍ය නිවාස ඒකක 1244 ක් රු.මි.5,412 කට මිළදී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2017, 2018 වර්ෂවලදී අවබෝධතා ගිවිසුම්වලට එළඹ තිබුණි.ගිවිසුම්ගත දිනයේ සිට වසර 02 ක් තුළ නිවාස ඉදිකර ව්‍යාපෘතිය වෙත භාරදීමට එම අධිකාරිය එකඟ වී තිබුණද,	2022 2023	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය.	2024 පෙබරවාරි 29 දිනට නිවාස ඒකකවල ඉදිකිරීම් ප්‍රගතිය සියයට 89කි. රටේ පැවති විදුලි අර්බුදය, ඉන්ධන හිඟය සහ රටේ මහජන විරෝධතා හේතුවෙන් දින දීර්ඝ කිරීම මත එකඟ වූ කාල සීමාව තුළ නිවාස ඒකකවල ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වීම හේතුවෙන් අවබෝධතා ගිවිසුම තවත් මාස 6කින් දීර්ඝ කිරීමට කටයුතු කිරීම සඳහා නාගරික සංවර්ධන	ප්‍රමාද වී තිබුණු නිවාස ඒකක 550 මෙතෙක් ව්‍යාපෘතිය වෙත භාරදී නොතිබුණි.

ඉදිකිරීම් ප්‍රමාදවන අවස්ථාවලදී නැවත නැවතත් දින දීර්ඝ කර නව අවබෝධතා ගිවිසුම්වලට එළඹීම හේතුවෙන් වසර 06ක් ගතවී ඇතත් නිවාස ඒකක 550 ක් මෙතෙක් ව්‍යාපෘතිය වෙත භාර දී නොතිබුණි. මේ හේතුවෙන් නැවත පදිංචි කිරීම කටයුතු තවදුරටත් ප්‍රමාද වන බවත්, ඒ අනුව කොළඹ තදාසන්න ප්‍රදේශය තුළ තිබෙන දුම්රිය මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම තවදුරටත් ප්‍රමාදවෙමින් පවතින බවත් නිරීක්ෂණය විය. එමෙන්ම ඉදිකෙරෙමින් පවතින නිවාසවල මිලගණන් නැවත සලකා බැලීමට නාගරික සංවර්ධන අධිකාරිය ගෙන ඇති තීරණය අනුව නිවාස ඒකකයක ගිවිසුම්ගත මිල රු. මිලියන 5 සිට රු. මිලියන 10 ක් දක්වා වැඩි වීමේ අවදානමක් තිබුණි.

අධිකාරියට ලිපියක් ඉදිරිපත් කර තිබුණි. එම කාලසීමාව තුළ ඉතිරි සියයට 11 ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

05. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අංශය

5.1. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක I

2018 ජූලි 25 දින ආරම්භ කරන ලද සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක I සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 6228 LK යටතේ එ.ජ.ඩො මිලියන 100 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 434,140 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 01 දී දීර්ඝ කර 2026 ජුනි අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021සහ 2022 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක්ද 2022 වර්ෂය සඳහා තත්වාගණන නොකළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	1,715	2,006	2,515
මුළු වගකීම්	1,715	2,006	2,515
මුළු අරමුදල්			
විදේශ ණය මගින්			
දේශීය අරමුදල් මගින්			

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොමැති වීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති දේපල, පිරියත	2021	ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව.	වත්කම් ලේඛනය සකස් කරමින් පවතින බව.	2021 වසරෙන් පසු වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

	උපකරණ සහ පුස්තකාල පොත් ශේෂයන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.				
(ආ)	පාසල් අධ්‍යයන කාලය 2023 මාර්තු දක්වා දීර්ඝ කිරීම හේතුවෙන් පළාත් 9ක පාසල් 500ක ක්‍රියාත්මක මෙම වැඩසටහනේ 2022 වසර සඳහා අපේක්ෂිත ප්‍රගතිය සියයට 60ක් විය. කෙසේ වෙතත්, ප්‍රගතිය මැන බැලීම ප්‍රමාද වූ අතර, විගණන දිනය වන විටත් වැඩසටහනේ ප්‍රගතිය ඇගයීම සිදු කර නොතිබුණි.	2022	නිශ්චිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සෑම උත්සාහයක්ම ගත යුතුය.	මෙම පරීක්ෂණ 2023.06.30 දිනට පෙර පළාත් මට්ටමින් පැවැත්වීමට දැනුම් දී ඇති බව.	2023 වර්ෂයේදීත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	2021 මාර්තු 23 දිනැති අංක 05/2021 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද පාසල් පාදක ඉගනුම් ප්‍රවර්ධක ප්‍රදාන චක්‍රලේඛයේ 03 ඡේදය අනුව පාසල් ලබා ඇති කාර්යසාධනය මත ක්‍රමවේදයකට අනුව දෙවන අදියර යටතේ ප්‍රදාන ලබාදීමට කටයුතු කරන බව පෙන්වා දී තිබුණි. 2021 වසරේ ද ප්‍රතිපාදනවලට අදාළ ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකළ ජාතික පාසල් සඳහා 2022 සඳහා ප්‍රතිපාදන ලබා දී ඇති බව අමාත්‍යාංශය විසින් විගණනයට දැනුම් දී	2023	චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ පියවර ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

තිබුණි.

(ඇ)	2017 අප්‍රේල් 27 දිනැති අංක EST/7/EXAMS/05/10 07-6 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ උපදෙස්වලට පටහැනිව, දෛනික සාමාන්‍ය වැඩ කරන වේලාවන්හි පැවති වැඩමුළුවට සහභාගී වූ පළාත් 5ක සියලුම නිලධාරීන්ට සම්පත් දීමනා වශයෙන් රු. 823,000ක් ගෙවා තිබුණි.	2023	අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස්වලට අනුකූල විය යුතුය.	සම්පත් ගෙවීම සම්බන්ධයෙන් නව නීති රීති සහ මාර්ගෝපදේශ සකස් කරමින් පවතී. ඒ අනුව, සම්පත් ලබාදෙන පුද්ගලයින් ගණන සීමා කරන ලෙස දැඩිව උපදෙස් දී ඇත.	චක්‍රලේඛයක් සකස් කිරීමට විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණයක් ගෙන තිබුණද එය සකස් කර නොතිබුණි.
(ඉ)	2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ 9.3 ඡේදය අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස 02කට වරක් රැස්වන බවට රේඛීය අමාත්‍යාංශයේ ලේකම් / පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් සහතික විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී එක් මෙහෙයුම් කමිටුවක් පමණක් පවත්වා තිබුණි.	2023	චක්‍රලේඛය සහ ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි දක්වා ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය.	ඉදිරියේදී මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීමට කටයුතු යොදා ඇත.	2024 වර්ෂයේ සැප්තැම්බර් වන විට මෙහෙයුම් කමිටු රැස්වීම් සැලකිය යුතු ප්‍රමාණයක් පවත්වා නොතිබූ බැවින් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ)	ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ 96 වැනි ඡේදය අනුව අභ්‍යන්තර විගණනය අධ්‍යාපන අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදු කළ යුතු වුවද, කෙසේ වෙතත් අභ්‍යන්තර විගණන වාර්තා 2021, 2022 සහ 2023 වර්ෂ සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	2023	ව්‍යාපෘතියේ ඇගයුම් ලේඛනයේ සහ මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය.	මෙම සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විදේශීය ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරකම් අටකින් සිදු කිරීමට සැලසුම් කර ඇත.	2021, 2022 සහ 2023 වසර සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැති බැවින් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(උ)	පාසල් 86 ක වියදම්වලට අදාළ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි. මූල්‍ය ප්‍රගතිය ඉදිරිපත් කරන ලද පාසල් 92 කට අදාළව ලබාදුන් ප්‍රතිපාදනවලින් රු.මිලියන 65ක් වියදම් කර රු.මිලියන 26 ක් ඉතිරිව තිබුණි.	2023	ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගැයීම සඳහා ලබා දී ඇති මුදල් පරිහරණයට අදාළ චක්‍රලේඛය හා වාර්තාවලට අනුකූලව කටයුතු කිරීමට ක්‍රියා කළ යුතු අතර වාර්තා නිසි පරිදි පවත්වාගෙන යා යුතුය.	පාසල් රැසකට අරමුදල් මාරු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ජාතික පාසල් ශාඛාව වියදම් කිරීමට ලබා දී ඇති කාලය දීර්ඝ කර ඇත.	පාසල්වල ප්‍රගතිය තවමත් සිදුවෙමින් පවතින බැවින් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(ඌ)	පාසල් 253ක් වෙත ලබා දී තිබුණු රු. මිලියන 267.75ට අදාළව මූල්‍ය ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දක්වාම වාර්තා කිරීමට පියවර ගෙන නොතිබුණි. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රගතිය අනුව පාසල් 19කට ලබාදී තිබූ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 1.6ක් වැය කර රු. මිලියන 16.4 ක් ඉතිරි වී තිබුණි.	2023	චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සිදු කළ යුතුය.	ශාඛාව විසින් කාර්යසාධනය ලබා ගනිමින් පවතී.	පාසල්වල ප්‍රගතිය තවමත් සිදුවෙමින් පවතින බැවින් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

(ඔ)	2022 දී ජාතික පාසල් 105ක් වෙත ලබා දීම සඳහා රු. මිලියන 52.5ක ප්‍රදාන ලබා දීම වැය කර අවසන් කිරීමේ දිනය 2023 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණද, වියදම්වලට අදාළ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දින දක්වාම අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර නොතිබුණි.	2023	චක්‍රලේඛයට අනුව කටයුතු කිරීම සිදු කළ යුතුය.	ශාඛාව විසින් කාර්යසාධනය ලබා ගනිමින් පවතී.	පාසල්වල ප්‍රගතිය තවමත් සිදුවෙමින් පවතී.
(ඕ)	පාසල් සිසුන්ගේ චිත්තවේගීය කුසලතා වර්ධනය සඳහා කතන්දර පොත් මුද්‍රණයට අදාළ වැඩමුළු පැවැත්වීම සඳහා 2022 වසරේ පාසල් කටයුතු ශාඛාව විසින් රු. මිලියන 1.2ක් වැය කර තිබුණි. වසර 02ක් ගතවී තිබුණද 2024 මැයි 15 වන විට එම කුඩා කතා පොත් 06 නිර්මාණය කර මුද්‍රණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	ඉලක්කය සපුරා ගැනීමට කාර්යාක්ෂමව කටයුතු කළ යුතුය.	සකස් වෙමින් පවතී.	ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
(ක)	ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ හැරුණු විට වෙනත් අරමුණු සඳහා විසර්ජන සබැඳි දර්ශක ක්‍රියාත්මක නොවන ශාඛා 12ක වැඩමුළු හා වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 81ක් වැය කර තිබුණි.	2023	ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුදල් යෙදවිය යුතුය.	අදාල අරමුදල් සඳහා ලෝක බැංකුවේ විරෝධයක් නොමැති බව ලබා දී ඇත.	2024 වර්ෂයේදීද විරෝධතා නොමැති බවට ලිපි ලබා ගත් බැවින් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

(ග)	වැඩමුළු සඳහා රු. මිලියන 120 ක් වැය කර තිබූ අතර ඉන් සියයට 62 ක් හෙවත් රු. මිලියන 74 ක් පාසල් ප්‍රජාවගේ ධාරිතා සංවර්ධනය සඳහා වැය කර තිබුණි. ඒ අනුව පාසල් සිසුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැය කර තිබුණේ මුළු වියදමෙන් සියයට 6ක් වූ රු. මිලියන 7ක් පමණයි.	2023	පාසල් සිසුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වන වියදම් වැඩි කළ යුතුය.	වැළැක්වීමේ පියවර ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

5.2 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක II

2018 ජූලි 25 දින දී ආරම්භ කරන ලද සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය - සංරචක II සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 6228 LK යටතේ එ.ජ.ඩො මිලියන 100 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 434,140 ක් විය. ව්‍යාපෘතිය එක් අවස්ථාවකදී දීර්ඝ කර 2026 ජුනි අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 වර්ෂය සඳහා තත්වාගණන කළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්			
මුළු වත්කම්	275	453	443
මුළු වගකීම්	275	453	443
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්			
දේශිය අරමුදල් මඟින්			

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2022 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 04ක් සඳහා රු.මිලියන 175ක වියදම් ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර ඉන් අනතුරුව සිව්වන කාර්තුවේ කටයුතු 05ක් සඳහා එය රු.මිලියන 186 ක් ලෙස සංශෝධනය කර තිබුණි. තවද, 2022	2022	විධිමත් මූල්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි.	වැළැක්වීමේ පියවර ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක නොමැත.

	දෙසැම්බර් 20 වන දින ඇස්තමේන්තුව රු.මිලියන 168 දක්වා නැවත සංශෝධනය කර තිබුණි. ඒ අනුව, II සංරචකය යටතේ අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා නිසි මුල්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.				
(ආ)	ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතෙහි 96 ඡේදය අනුව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වුවද, 2023 වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්මේ ව්‍යාපෘති හඳුනාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතියේ 2019 සහ 2020 වර්ෂ ආවරණය වන පරිදි ගණිතය, ඉංග්‍රීසි සහ විදේශ භාෂා ශාඛාව සම්බන්ධයෙන් 2023 මැයි මාසයේදී අභ්‍යන්තර විගණන වාර්තාවක් නිකුත් කර තිබුණද, 2021, 2022 සහ 2023 යන වර්ෂ ආවරණය වන පරිදි වාර්තා නිකුත් කර නොතිබුණි.	2023	නීති රීති හා රෙගුලාසි අනුගමනය කළ යුතුය.	මෙම සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විදේශීය ව්‍යාපෘති යටතේ ක්‍රියාකාරකම් අටකින් සිදු කිරීමට සැලසුම් කර ඇත.	2021, 2022 සහ 2023 වසර සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.
(ඇ)	2022 වර්ෂය සඳහා 2022 දෙසැම්බර් 16 වැනි දින පාසල් 69ක් සඳහා ප්‍රදාන මගින් ලබාදුන් රු.මිලියන	2023	ව්‍යාපෘති අරමුදල් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කළ යුතුය.	2023 වර්ෂයේදී අංක 32/2023 දරන චක්‍රලේඛයක් නිකුත් කර ඇත.	පාසල්වල ප්‍රගතිය තවමත් සිදුවෙමින් පවතී.

	50.2ක මුදලක් වැයකර අවසන් කිරීම 2023 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණද, ඊට අදාළ මූල්‍ය ප්‍රගතියේදී පාසල් 69ක් සඳහා ලබාදුන් රු. මිලියන 50.2කට අදාළව 2023 දෙසැම්බර් 31 වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශයට ප්‍රගතිය ලබාදී නොතිබුණි.				
(ඇ)	මෙහෙයුම් අත්පොත ප්‍රකාරව ව්‍යාපෘතියේ සංරචක I යටතේ විසර්ජන සම්බන්ධිත දර්ශක ක්‍රියාත්මක කළ යුතු වුවද, සංරචක II යටතේ රු. මිලියන 144.2 ක මුදලක් පාසල් සඳහා ලබා දී තිබුණි.	2023	ව්‍යාපෘතියේ අරමුණු සඳහා මූල්‍ය කරණය කළ යුතුය.	වැළැක්වීමේ පියවර ගෙන නොමැත	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(ඉ)	ශාඛාවන්හි විෂය සම්බන්ධ කාර්යයන් හා එම ශාඛාවල විධායක නිලධාරීන්ගේ රාජකාරි ලැයිස්තුවල ඇතුළත් රාජකාරී කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා දරන ලද රු. මිලියන 2 ක වියදම ධාරිතා සංවර්ධන වියදම් ලෙස දක්වා තිබුණි.	2023	වියදම් නිසි ලෙස කළමනාකරණය කළ යුතුය.	වැළැක්වීමේ පියවර ගෙන නොමැත	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
(ඊ)	ව්‍යාපෘතියේ විසර්ජන සම්බන්ධිත දර්ශක (DLI) සාක්ෂාත් කර ගැනීම පිළිබඳ තෙවන පාර්ශවීය තහවුරු කිරීමේ වාර්තාව විගණිත වර්ෂයට අදාළව ඊළඟ වසරේ පෙබරවාරි 28 දිනට පෙර ලෝක	2023	නියමිත කාලය තුළ වාර්තා ඉදිරිපත් කළ යුතුය.	2023 අධ්‍යයන වර්ෂය 2024 පෙබරවාරි මස අවසන් වූ බැවින්, මේ මොහොතේ තුන්වන පාර්ශ්ව වලංගුකරණය ක්‍රියාවලිය	2023 වර්ෂයේදීත් එම නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

බැංකුව වෙත ලබා දිය යුතු වුවද, 2023 වර්ෂයට අදාළ වාර්තා සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එම වාර්තා ඉදිරිපත් කිරීමට අදාළ ඇගයීම් 2024 මැයි මාසය වන විටත් අවසන් කර නොතිබුණි.	සිදුවෙමින් පවතී.

5.3. උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් සංරචකය)

2018 දී ආරම්භ කරන ලද උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් සංරචකය) සඳහා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ණය ගිවිසුම් අංක 8743 LK යටතේ රු. මිලියන 18,136 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය අවස්ථා එකක දී දීර්ඝ කර 2023.12.31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2022 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
විදේශ අරමුදල්	6,031	4,449	4,664
මුළු වත්කම්	12,614	17,546	21,490
මුළු වගකීම්			
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	12,614	17,546	21,490

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මෙම ව්‍යාපෘතිය යටතේ ව්‍යාධි විද්‍යා අංශය සඳහා මහල් 04කින් ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ගොඩනැගිල්ල රු. මිලියන 153ක මුදලක් වැය කර මහල් 02ක් පමණක් නිමකර විශ්වවිද්‍යාලයට භාරදී තිබුණි.	2023	කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූල විය යුතුය.	මහල් හතර සඳහාම සියලුම බාහිර වැඩ සමඟ සම්පූර්ණ ව්‍යුහාත්මක කටයුතු නිම කර ඇත. කොරෝනා වසංගතයත් සමඟ අනපේක්ෂිත මිල විචලනයක් ඇති වූ අතර බලධාරීන් විසින් ගනු ලැබූ තීරණය මත ඉදිකිරීම් කටයුතු පවතින අයවැය ප්‍රතිපාදනවලට සීමා කර මහල් දෙක භාවිතයට සරිලන පරිදි නිම කර මුලිකවම භාවිතයට ගෙන ඇති අතර ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු නිම කිරීම් කටයුතු සිදු කරනු ලැබේ.	1 වන සහ 2 වන මහල සම්පූර්ණයෙන්ම නිම කර නොමැති බැවින් රසායනාගාර කටයුතු සිදු කිරීමට අනාරක්ෂිතව ප්‍රයෝජනයට ගෙන ඇත. බිම් මහලේ, 1 වන සහ 2 වන මහලේ ශේෂ කටයුතු තවමත් ඉතිරිව ඇත.
(ආ)	දැනට භාවිතා කරන ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන මහා පරිමාණ නිෂ්පාදන ආකෘතියක් ලෙස සහ ඉහළ වාණිජ නිෂ්පාදනයක් ලෙස වෙළඳපොළට හඳුන්වා දීම අරමුණු කරගත් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා උසස් අධ්‍යාපන ව්‍යාප්තිය, හා සංවර්ධනය කඩිනම් කිරීමේ	2023	අවසාන ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා උපරිම උත්සාහයක් ගත යුතුය.	කොවිඩ් වසංගතය හේතුවෙන් සමස්ත ව්‍යාපෘති කාලරාමුව විශාල වශයෙන් කඩාකප්පල් විය. කුඩා කොම්පෝස්ට් ගොඩවල් අප බලාපොරොත්තු වූ පරිදි ජනප්‍රිය නොවීය. එය වසංගතය සහ සංචලන සීමා කිරීම්, නිවෙස්වලට යාම	අවසාන ප්‍රතිඵලය ලබා ගැනීමට උපරිම උත්සාහයක් ගෙන නොතිබුණි.

	ව්‍යාපෘතිය(AHEAD) ලෝක බැංකු ණය ආධාර යටතේ රුපියල් මිලියන 50 ක් වැය කර තිබුණි. ගුණාත්මක සත්ව ආහාර සහ කාබනික පොහොර නිෂ්පාදනය කර ඇති මහා පරිමාණ කොම්පෝස්ට් බඳුන සඳහා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් දන්වා තිබූ නිර්ණායක සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබීම නිසා එම ඒකකය සමඟ එක්ව ක්‍රියාත්මක වන අස්වනු නෙලීමේ ඒකකය වාණිජකරණය කිරීමට නොහැකි වී තිබුණි.එම කීටයන් විසින් සකස් කරන ලද ආහාර සහ එම ආහාර සැකසීමේ තාක්ෂණික ක්‍රමය සඳහා පේටන්ට් බලපත්‍රයක් ඉල්ලුම් කර තිබුණද තාක්ෂණික ක්‍රමවේදයේ දුර්වලතා හේතුවෙන් එම ඉල්ලුම්පත්‍රයද ප්‍රතික්ෂේප වී තිබුණි. අදාළ නිර්ණායක සම්පූර්ණ කර නොතිබීම සහ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද වියදම් නිෂ්ක්‍රිය වී තිබුණි.			නිසා ඇති විය. එමනිසා, කුඩා බඳුන සාර්ථක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. කුඩා බඳුනක් සෑදීමට භාවිතා කරන මූලික පේටන්ට් බලපත්‍රවල ප්‍රධාන දෝෂ පැවතුණි. එය එළිමහන් පරිසරය තුළ මිත්‍රශීලී ලෙස නිර්මාණය කර නොතිබුණි. පේටන්ට් බලපත්‍ර අනුමත කිරීමේ නියෝජිතායතනය ලෙස ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල කාර්යාලය සලකා බලා නොතිබුණි. මෙම පරීක්ෂණ පැවැත්වූ පරිසරයේ අධික වර්ෂාව, ආර්ද්‍රතාවය සහ රාත්‍රී කාලයේ උෂ්ණත්ව තත්ත්වයන් මෙම ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වයේ සහ දුගඳෙහි වෙනස් වීමට හේතු විය හැකි බව අපි සිතමු.	
(ඇ)	යාපනය විශ්ව විද්‍යාලය සඳහා ඉංජිනේරු තාක්‍ෂණය සහ පද්ධති තාක්‍ෂණය සඳහා	2023	ප්‍රමාදයන් වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර කොන්ත්‍රාත්තුවේ	යාපනය විශ්ව විද්‍යාලය විසින් මෙම අදියර II 2023 ජුනි මාසය වන විට	එය තවම අවසන් කර නැත.

ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වටිනාකම රු. මිලියන 432 කට 2021 දෙසැම්බර් 15 වන දින මෙම ව්‍යාපෘතිය මගින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ගිවිසුමට අනුව, 2023 ජුනි මාසයේදී ඉදිකිරීම් අවසන් කළ යුතු වුවද 2023 දෙසැම්බර් 31 දක්වා දින දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතුවලින් සියයට 36 ක් පමණක් 2023 දෙසැම්බර් 31 දක්වා අවසන් කර ඇති බව නිරීක්ෂණය විය.	වැඩ නියමිත වේලාවට අවසන් කිරීමට පියවර ගත යුතුය.	අවසන් කිරීමට අපේක්ෂා කළ අතර, මෙම බලාපොරොත්තුව ඇතිව, තාක්ෂණ පීඨයට සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමේ රජයේ ප්‍රතිපත්තියට පහසුවෙන් අනුකූල වීමට හැකි විය. දැනට සෑම අධ්‍යයන වර්ෂයකදීම සිසුන් 400ක් පමණ ඇතුළත් කර ගනු ලැබේ. ශිෂ්‍ය ප්‍රමාණය වැඩිවීමට සරිලන පරිදි දැනට පවතින ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවන බව. මෙය අධ්‍යයන වැඩසටහනේ ගුණාත්මක භාවයට බලපාන අතර ශිෂ්‍ය නොසන්සුන්තාවයට හේතු විය හැක. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය, හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය (AHEAD) ව්‍යාපෘතියේ ඉතිරි මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන්කරවා ගෙන යාපනය විශ්වවිද්‍යාලය වෙත යොමු කරන ලෙස ඉල්ලා සිටි අතර එමගින් විශ්වවිද්‍යාලයට ඉදිරි වැඩ කරගෙන යාමට සහ සම්පූර්ණ

				කිරීමට හැකි වන බව. මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට උපකාර කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් දැනටමත් ඉල්ලීම් කර ඇති අතර අදාළ සියලු පාර්ශවයන් සමඟ මේ පිළිබඳව අවධානය යොමු කර ඇත.	
(ඇ)	සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩිදියුණු කිරීම, බිම් මට්ටමේ සිට ගොවීන් සහ කුඩා / මධ්‍යම පරිමාණ කෘෂි ව්‍යාපාරිකයන් සමඟ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ක්ෂේත්‍ර දැනුම වර්ධනය කිරීමේ අරමුණින්, මෙම ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත රුපියල් මිලියන 14 ක මුදලක් වැය කර 2021 පෙබරවාරි 24 වන දින සබරගමුව විශ්වවිද්‍යාලය විසින් මිලදී ගන්නා ලද ජංගම රසායනාගාර බස් රථය. 2021 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 06කදී පමණක් අධ්‍යයන කටයුතු සඳහා යොදාගෙන ඇති අතර ඒ අනුව බස් රථය ඌන උපයෝජිතව පැවතුණි.	2023	ව්‍යාපෘති සම්පත් ප්‍රමාදයකින් තොරව ප්‍රයෝජනයට ගත යුතුය.	නොවැළැක්විය හැකි සහ අනපේක්ෂිත තත්වයක් හේතුවෙන් අන්තර්ජාලය හරහා ඉගැන්වීම් කටයුතු සිදු කරන ලද කාල පරිච්ඡේද තුළ සැලසුම් කළ පරිදි මෙම සම්පත් භාවිතා කිරීමට අපට නොහැකි වූ බව මම ඉස්මතු කර දැක්වීමට කැමැත්තෙමි. කෙසේ වෙතත් දැනට පවතින අනධ්‍යයන වෘත්තීය ක්‍රියාමාර්ගය ඉවත් කළ වහාම මෙම සම්පත් භාවිතා කරමින් ක්ෂේත්‍ර චාරිකා, නිරූපන සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් කිහිපයක් අප සැලසුම් කර ඇති බව සතුටින් දන්වා සිටිමු.	ඌන ප්‍රයෝජනයට ගෙන ඇත.

5.4 උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය)

2018 දී ආරම්භ කරන ලද උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (ව්‍යාපෘති සංරචකය) සඳහා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ණය ගිවිසුම් අංක 8743 LK යටතේ රු. මිලියන 18,136 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය අවස්ථා එකක දී දීර්ඝ කර 2023.12.31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක් ද 2022 සහ 2023 වර්ෂ 2 තත්ත්වාගණනය නොකල මතයක්ද ලබාදී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
විදේශ අරමුදල්	210	203	196
මුළු වත්කම්	754	930	1,078
මුළු වගකීම්	8	59	59
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	746	871	1,019

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
මූල්‍ය ප්‍රකාශනවලට අනුව මෙහෙයුම් සහ මුදල් ආධාරක කණ්ඩායමේ (OMST) ගොඩනැගිලි පරිශ්‍රය සඳහා 2023 වර්ෂය තුල රු. මිලියන 29.3 ක මුදලක් වැය වී ඇති අතර එයට රු. මිලියන 21 ක් කාර්යාල කුලිය ලෙසද රු.මිලියන 1.6 ක්	2023	වියදම් දැරීමේදී ආර්ථිකමය වාසිදායි අයුරින් සිදුකළ යුතුය.	2023 වර්ෂය තුලදී තුන්වන මහල පමණක් කුලියට ගත් අතර මාසික කුලිය රු.700,000 ක් විය.	2024 වර්ෂය තුලදී ව්‍යාපෘතිය සම්පූර්ණ කර ඇත.

කාර්යාල පිරිසිදු කිරීමේ ගාස්තු ලෙස සහ රු. මිලියන 6.5 ක විදුලියද ඇතුලත් වී ඇත. එසේ නමුත් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 22 දෙදෙනෙකු පමණක් එම ගොඩනැගිල්ලේ සේවයේ යොදවා තිබුණි.

5.5. විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

2018 දී ආරම්භ කරන ලද විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD Project) ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3698එස්ආර්අයි හා 3699 එස්ආර් අයි (සීඕඑල්) යටතේ රු. මිලියන 23,200 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,200 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 1 දී දිර්ඝ කර 2024.12.31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 තත්වාගණන නොකල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	336	271	276
විදේශ අරමුදල්	3,971	6,694	7,258
මුළු වත්කම්	8,504	24,787	29,724
මුළු වගකීම්	2,226	796	771
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	5,706	15,931	27,834
දේශිය අරමුදල් මඟින්	571	843	1,118

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ල 2023 ජූලි 22 වන දින අවසන් කිරීමට නියමිතව තිබූ අතර එය 2024 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර ඇත.	2023	කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ව්‍යාපෘතිය ඉහල මට්ටමේ කමිටු සාකච්ඡාවෙන් පසු නැවත දෙවරකදී අත්තිකාරම් මුදල් ලබාදී ඇති අතර සේවක සංඛ්‍යාව 100 සිට 500 දක්වා වැඩිකර ඇත. සියලුම ද්‍රව්‍ය	2024 දෙසැම්බර් 31 දින දක්වා දින දීර්ඝ කර ඇත.

	කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවලට අනුව, ආරම්භ වූ දින සිට වසර 3ක් ගතවීමෙන් පසු එනම් 2024 ජනවාරි 31 වන විට භෞතික ප්‍රගතියෙන් සියයට 36ක් පමණක් ලඟාකර ගෙන තිබුණි. එබැවින් සැලකිය යුතු ඉතිරි වැඩ ප්‍රමාණයක් නියෝජනය වන සියයට 64 ක ප්‍රමාණය ඉතිරි කොන්ත්‍රාත්තු කාලය වන මාස නවයක් ඇතුළත නිම කළ යුතුය.			සපයාගෙන ඇති අතර සෘජුව අධීක්ෂණය කරනු ලබයි.	
(ආ)	ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ණය දීමේ නියෝජිතායතනය විසින් ප්‍රතිපාදනය කරන ලද ඇ.ඩොලර් මිලියන 145කින් නියෝජනය වන සියයට 87.9න් ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට 2023 දෙසැම්බර් 31ට වසර 05 මාස 8ක් ගත වී තිබුණද ඇ.ඩොලර් මිලියන 72.89කින් නියෝජනය වන සියයට 50.26ක් පමණක් භාවිත කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ණය ශේෂය සඳහා රු. මිලියන 176කට සමාන ඇමෙරිකානු ඩොලර් 795,741 ක කැපවීම් ගාස්තු ගෙවා තිබුණි.	2023	කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉදිකිරීම් කටයුතු, භාණ්ඩ සහ අනෙකුත් වියදම් සඳහා ඇ.ඩොලර් මිලියන 129.7 කින් සහ ණය පොලී සහ කැපවීමේ ගාස්තු සඳහා ඩොලර් මිලියන 15.3 කින් ණය අරමුදල සමන්විත වේ. වෙන් කරන ලද ණය අරමුදල් ප්‍රදානය කිරීමේ රු. මිලියන 129.7 කින් රු. මිලියන 97.22 ක් වටිනාකමැති කොන්ත්‍රාත්තු සම්පූර්ණ කර ඇති අතර ඉතිරි ප්‍රදානය ව්‍යාපෘති කාල සීමාව තුළ (2024 දෙසැම්බර් 31) සම්පූර්ණ කළ හැකි අතර 2025	ණය අවසන් දිනය වන 2025.06.30 වන විට ණය සම්පූර්ණයෙන් භාවිතා කිරීම සඳහා 2024 දෙසැම්බර් 31 වන විට සියලුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රදානය කිරීම අවසන් කිරීමට සැලසුම් කර ඇත.

	එබැවින්, ඇ.ඩො. මිලියන 72.11 ක ණය ශේෂය නියෝජනය වන සියයට 49.73 භාවිතා කිරීම සහ ඉතිරි මාස 18 ක ව්‍යාපෘති කාල සීමාව ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමේ හැකියාව පිළිබඳ විගණනයේදී සැක සහිත විය.			ජූනි 30 වැනි දින ණය අවසන් වන තෙක් විසර්ජන ලබා දීම සම්පූර්ණ කළ හැක. එබැවින්, සම්පූර්ණ ව්‍යාපෘති අරමුදල 2025 ජූනි 30 වන විට භාවිතා කළ හැකි බව.	
(ඇ)	2020 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට රු. මිලියන 17ක වියදමින් පුස්තකාල පොත් 1,098ක් මිලදී ගෙන තිබුණි. ඉන් පොත් 1,095ක් මිලදී ගත් දින සිට 2023 නොවැම්බර් 30 දක්වා පාඨකයන්ට නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	අක්‍රියව තබා නොගෙන ව්‍යාපෘති සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය	දැනට පුස්තකාල පොත් මිලදී ගැනීම නවතා ඇති අතර පොත් පරිහරණය කිරීම සඳහා සිසුන් දිරිමත් කර ඇත.	පිළිතුරු ලබා දී නොතිබුණි.
(ඈ)	2023 අධ්‍යයන වර්ෂයේ සිට ඉංජිනේරු පීඨයට සිසුන් බඳවා ගැනීම 120 සිට 400 දක්වා වැඩි කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු පීඨය අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මේ වන විට සිසුන් 180දෙනෙකු බඳවා ගැනීමට සිදු කර තිබුණි. ඊට අමතරව අමතරව ඉංජිනේරු පීඨය පවත්වාගෙන යාම සඳහා කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා	2023	කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ කටයුතු කාර්යක්ෂමව කර ඇත.	පිළිතුරු ලබා දී නොතිබුණි.

කුලී ගාස්තු ලෙස රු. මිලියන 19ක් 2023 ජූලි සහ 2024 පෙබරවාරි අතර ප්‍රමාද වූ කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවී තිබුණි.

5.6. ශ්‍රී ලංකාවේ තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අංශයේ (TVET) පෞද්ගලික අංශය සහ කාන්තා සවිබල ගැන්වීම සඳහා නව්‍ය ප්‍රවේශයන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය (නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ප්‍රදාන)

2018 මැයි 11 දින ආරම්භ කරන ලද නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ (ප්‍රදාන) සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක SRI(EF) 9193 යටතේ රු. මිලියන 534ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වයක් නොමැත. ව්‍යාපෘතිය අවස්ථා 02කදී දීර්ඝ කර 2023 ඔක්තෝබර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක්ද 2023 වර්ෂය සඳහා තත්වාගණන නොකල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්	137.45	321.71	880.8
මුළු වත්කම්	-	-	-
මුළු වගකීම්	-	-	-
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	50.50	219.14	559.09
දේශීය අරමුදල් මගින්			

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2021 විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මට අනුව 2.6.2 ක්‍රියාකාරකම යටතේ වූ කාන්තා ව්‍යවසායකයින්	2021	අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත	මෙම ක්‍රියාකරකම් ක්‍රියාවලිය 2021 වර්ෂයේදි ආරම්භ කරන ලදී. මෙවැනි ක්‍රියාකාරකම් සඳහා	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත

	වෙත ජාත්‍යන්තර වෙළඳපොල වෙත ළඟාවීම සඳහා කිසිදු වැඩපිළිවෙළක් හඳුන්වා දී නොතිබුණි.		යුතුය.	සාධාරණ කාලසීමාවක් අවශ්‍ය වන බැවින් සහ ව්‍යාපෘති සැලැස්ම ලෙස මෙය 2022 වර්ෂයේදි සාක්ෂාත් කර ගන්නා ලදී.	
(ආ)	ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යාංශය විසින් වාර්ෂිකව නිකුත් කරනු ලබන මිල ගණන් හා ප්‍රමාණයන්ට අනුව අදාළ ප්‍රදානලාභියා විසින් ඉදිරිපත් කරන ලද ඉදිකිරීම් ඇස්තමේන්තු යථාර්ථවාදී දැයි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීමට ලක් නොකළ අතර ගෙවීම් කිරීමේදී නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබීම ආදිය ඉහත ඉදිකිරීම්වල පොදු නිරීක්ෂණය විය.	2022-3.1 –4-(c)	ඉදිකිරීම් ක්‍රමවේද විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.	ව්‍යාපෘති මාර්ගෝපදේශ යටතේ එවැනි සත්‍යාපනයක් අවශ්‍ය නොවීය (ADB ලබා දී ඇති මාර්ගෝපදේශ සහ තාක්ෂණික මාර්ගෝපදේශ)	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත
(ඇ)	ගිවිසුමට ඇතුළත් කර ඇති යොමුගත ලියවිල්ලේ (TOR) (D) වගන්තිය අනුව උපදේශන සමාගම විසින් ලබාදිය යුතු ප්‍රධාන නිමවුම්වලින් ආරම්භක වාර්තාව, වාර්ෂික වාර්තාව සහ ISSC සඳහා වසර 5ක් සඳහා වූ උපායමාර්ගික සැලසුම්වල මෘදු පිටපත හැර, අනෙකුත් වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි	2022-3.1 –(6)-(b)	නියමිත වේලාවට යොමුගත ලියවිල්ල (TOR) අනුව ප්‍රධාන නිමවුම් ලබාදිය යුතුය.	අවශ්‍ය සියලුම ලියකියවිලි විද්‍යුත් තැපැල හරහා විගණනයට ඉදිරිපත් කර ඇත. (ගොනු බරින් යුක්ත වන අතර ඒවා මෘදු පිටපත් ලෙස පිළිගැනීමට විගණන නිලධාරීන් එකඟ වූ බැවින් මේවා විද්‍යුත් තැපැලෙන් විගණක වෙත ඉදිරිපත් කරන ලදී.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

(ඈ)	කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සහ වෙබ් අඩවියක් සංවර්ධනය කිරීම සඳහා රු. මිලියන 2.5ක් වෙන් කර තිබුණි. කෙසේවෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් යල් පැන ගිය සහ වංචාකාරී මිල ගණන් සහ පිරිවිතරවල ඇතුළත් නොවූ නිර්ණායක භාවිත කරමින් විනිවිදභාවයකින් තොරව සේවා සපයන්නෙකු තෝරාගෙන තිබුණි.	2023-3.1 –(අ)	විනිවිදභාවයෙන් යුතුව සේවා සපයන්නකු තෝරාගත යුතුය	කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානයෙන් ලැබී ඇති තොරතුරු අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදනය කර ඇති බව ඔවුහු තහවුරු කරන ලදි. ප්‍රසම්පාදනය කෘෂි තාක්ෂණ ව්‍යාප්ති මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදි.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත
(ඉ)	තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අංශයේ (TVET) පාඨමාලා සම්පූර්ණ කරන ශිෂ්‍යයන් සහ කර්මාන්තකරුවන් ලියාපදිංචි කර සේවාව ලබා ගැනීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත නිපුණතා සභාව විසින් රු. මිලියන 11.23ක පිරිවැයකට ජංගම යෙදුමක් (mobile App) සංවර්ධනය කරන ලදි. කෙසේවෙතත්, ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් නොමැතිකම හේතුවෙන් යෙදුම සමඟ ලියාපදිංචි වූ සභාවට, සිසුන්ට සහ කර්මාන්තකරුවන්ට	2023-3.1 –(b)	සංවර්ධිත ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගැනීමට කවුන්සිලය තීරණය තිබුණි. නිෂ්පාදන සමාලෝචන සැසි කිහිපයකින් පසුව, ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් ප්‍රෝ කනෙක්ට් (Pro Connect) යෙදවුම භාවිත කිරීමට එකඟ වූ අතර අවබෝධතා ගිවිසුමකට (MOU) අත්සන් කරන ලදි. කෙසේවෙතත්, ඔවුන්ගේ තාක්ෂණික සහ අලෙවි කණ්ඩායම් දැනට වෙනත් ව්‍යාපෘතියක නියැලී	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

	ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එය දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. එබැවින්, ඉහත යෙදුම සංවර්ධනය කිරීමට දරන ලද වියදම නිෂ්ඵල වේ.			සිටින නිසා Pro Connect වෙත ඔවුන්ගේ අවධානය යොමු කිරීම ප්‍රමාද වී ඇති බව ඔවුන් පසුව සභාවට දන්වන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, නිෂ්පාදිතය දැනට නිශ්කාර්ව පවතී.	
(ඊ)	ක්‍රියාකාරකම් 4.2.1.1 යටතේ ඩ්‍රෝන උපකරණ මිලදී ගැනීම සඳහා පර්යේෂණ සංවර්ධන පුහුණු ආයතනයට රු මිලියන 8.86ක් ප්‍රදානය කර තිබුණි. උපකරණ ක්‍රියාත්මක කිරීමට දැනුමක් ඇති උපදේශකයකු නොමැතිකම හා ආයතනය පුහුණු ආයතනයක් ලෙස නිසි ලෙස ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් මිලදී ගත් ඩ්‍රෝන උපකරණ ව්‍යාපෘති යෝජනාවේ සඳහන් පරිදි පුහුණු හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රයෝජනයට නොගෙන ආයතනයේ නිෂ්කාර්ය පැවතින බව 2024 මැයි 02 වැනි දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලාවල ප්‍රගතියක් නොලැබුණි.	2023-3.1 –(c)	ඩ්‍රෝන් උපකරණ ඵලදායි ලෙස භාවිත කිරීමට කටයුතු කළ යුතුයි.	පර්යේෂණ සංවර්ධන පුහුණු ආයතනය (IRDT) විසින් උතුරු පළාත පුරා ASSC සමඟ පුහුණුව ලැබූ සහතික ලත් ඩ්‍රෝන් නියමුවන් 7 දෙනෙකු සිටී. ඩ්‍රෝන වසර පුරා භාවිත නොකරන අතර ඒවා කෘෂිකාර්මික කටයුතු සඳහා සෘතුමය වශයෙන් භාවිත වේ. සෘතුමය නොවනවිට, ඩ්‍රෝන නිෂ්පාදකයන් විසින් ලබා දෙන උපදෙස් අනුව ඒවා ගබඩා කරනු ලැබේ.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

(ඪ)	ව්‍යවසායකයෙකු සමඟ ඇති කර ගත් ගිවිසුමකට අනුව, මීටර් 1ක් පළල, මීටර් 0.15 ඝණකම සහ දිග මීටර් 1207ක් සහිත පැල තවානක මාර්ග පද්ධතියක් ඉදිකිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද මිනුම් පත්‍රයට අනුව, පළල මීටර් 1.22, ඝණකම මීටර් 0.15 සහ දිග මීටර් 719 ක් වන මාර්ග පද්ධතියක් ඉදිකර තිබුණු අතර ව්‍යවසායකයා විසින් ඉදිකරන ලද මාර්ගයේ දිග තහවුරු කිරීමකින් තොරව ව්‍යවසායකයාට මුළු ප්‍රදානය රු. මිලියන 3.22 ක් ප්‍රතිපූරණය කර තිබුණු බව නිරීක්ෂණය විය.	2023-3.1 –(d)	මංසන්ධි ලගාකර කර ගැනීම තහවුරු කිරීමෙන් පසු ව්‍යවසායකයාට මුදල් ප්‍රතිපූර්ණය කිරීමට ක්‍රියා කළ යුතුය.	එකඟ විය. වරලත් ඉංජිනේරුවරයාගේ නිර්දේශය මත ගෙවීම් සිදුකර ඇත. කෙසේඅවෙතත්, පුද්ගලික අංශයේ නියුතු විශේෂඥයා භෞතික සත්‍යාපනය සිදුකර නොතිබුණි. විගණන වාර්තාවේ සඳහන් කරුණු සත්‍යාපනය කිරීම සඳහා අප දැනට භෞතික සත්‍යාපනයක් සිදු කරමින් සිටින අතර වාර්තාව කියවීමෙන් පසු එම කරුණු නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.
(ණ)	මංසන්ධි 02ක් ළගාකර ගැනීම සඳහා ව්‍යවසායකයෙකු වෙත එකතුව රු. මිලියන 3.51ක් ලබා දී තිබුණි. ගිවිසුමට අනුව, ඉන් මංසන්ධි 01 යටතේ NVQ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු අතර එය TVEC/NAITA සහතිකය හරහා සත්‍යාපනය කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, NVQ සහතික නිකුත් කිරීමේ බලය TVEC ආයතනය වෙත පමණක්	2023-3.1 –(e)	NVQ සහතිකය පිළිගත හැකි ආකාරයෙන් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය	ඒ වන විට අපේක්ෂිත වැඩසටහන සඳහා NVQ සහතික නිකුත් කිරීමට ලියාපදිංචි වී ප්‍රතීතනයලත් ආයතනයක් නොතිබුණි. කෙසේවෙතත්, සිනමන් පුහුණු අධ්‍යාපන ආයතනය (Cinnamon Training Academy) 2021.04.26 දින දක්වා මෙම සහතිකය නිකුත්	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

	වුවද අදාළ පුහුණු මධ්‍යස්ථානය විසින් NVQ 3 සහතික නිකුත් කර තිබුණු බව නිරීක්ෂණය විය.			කිරීමේ ප්‍රතීතනය ලබාගෙන තිබුණි. ඒ වන විට ඔවුන් ප්‍රතීතනය කර නොතිබුණද ඔවුන්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) හි වලංගු ලියාපදිංචියක් තිබුණි. එබැවින්, සිනමන් පුහුණු අධ්‍යාපන ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකය ඊළඟ හොඳම විකල්පය ලෙස පිළිගනු ලැබීය.	
(එ)	අමාත්‍යාංශයට උපකරණ ලබා ගැනීම ඇතුළුව සුහුරු පන්ති කාමර 32ක් ස්ථාපිත කිරීම සඳහා එකතුව එ.ජ.ඩො 911,540කට සමාන රු මිලියන 293.07ක් වැය කර තිබුණි. ලබා දී ඇති තොරතුරු වලට අනුව, දේශකයින් සඳහා පිරිවැය රු මිලියන 5.67ක් වන ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) 400ක් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේවෙතත්, පුහුණු මධ්‍යස්ථාන 32ක් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය 320ක් පමණක් වෙන්කර තිබුණි. එබැවින්, ප්‍රසම්පාදනය කරන ලද රු. මිලියන 1.13ක් වටිනා ඉතිරි ඉගෙනුම්	2023-3.1 –(f)	සුහුරු පන්ති කාමර අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීම පිළිබඳව පසු විපරම් කළ යුතුය.	දේශකයන් හා සිසුන් විසින් ඉගනුම් කළමනාකරණ පද්ධතිය (LMS) අඩු භාවිතයට සහ ඊට හේතුව පුහුණුව නොමැතිකමට යනාදිය සඳහා එකඟ වේ. අරමුදල් පවතින විට මෙම කාරණය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරමින් පුහුණුවක් ලබා දීමට අමාත්‍යාංශය සැලසුම් ඇත.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

කළමනාකරණ පද්ධති 80 වෙන් කිරීම පිළිබඳව විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, දේශකවරුන් සඳහා වෙන් කර ඇති ඉගෙනුම් කළමනාකරණ පද්ධති 320 න්, සියයට 57ක් නියෝජනය කරන ඉගෙනුම් කළමනාකරණ පද්ධති 183ක් අධ්‍යයන කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. ඉහත ඒවාට අමතරව ප්‍රසම්පාදනය කර සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා වෙන් කරන ලද රු මිලියන 45.37ක් වටිනා ඉගෙනුම් කළමනාකරණ පද්ධති 3,200න්, සියයට 24ක් නියෝජනය කරන ඉගෙනුම් කළමනාකරණ පද්ධති 753ක් පමණක් අධ්‍යයන කටයුතු සඳහා භාවිත කර ඇති අතර දේශකයින් සඳහා පුහුණු නොමැතිවීම, පාඨමාලා හදාරන සිසුන් සඳහා පුහුණු ද්‍රව්‍ය සහ පහසුකම් නොමැතිකම හේතුවෙන් කිසිදු ශිෂ්‍ය බලපත්‍ර (student license) භාවිත නොකළ පුහුණු මධ්‍යස්ථාන 16 ක් පැවතුණි. එබැවින්, නියමු ව්‍යාපෘතියේ සඵලතාවය අඩු මට්ටමක පැවතුනි.

(ඒ)	ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.	2023-3.2	අදහස් දක්වා නොමැත	අභ්‍යන්තර විගණනය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය මගින් සිදුකිරීමට කටයුතු කළ යුතුය.	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාවට නංවා නැත.

5.7. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ණය)

2014 මැයි 27 දින ආරම්භ කරන ලද නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (ණය) සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3119 (SRI) (SF) සහ 3120 (SRI) (SF) යටතේ රු. මිලියන 15,608ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ඒ සඳහා ශ්‍රී ලංකා රජයේ දායක වී නොතිබුණි. ව්‍යාපෘතිය අවස්ථා 02කදී දීර්ඝ කර 2023 ජුනි 30 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 වර්ෂය සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්			
විදේශ අරමුදල්	18,947.82	95,083	4,946.62
මුළු වත්කම්	31,773	63,877	60,357
මුළු වගකීම්	880	855	836
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	4,617.59	2,321.45	644.69
දේශිය අරමුදල් මඟින්			

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යන පාඨමාලාව සඳහා 32 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර පාඨමාලාව අවසන් කර තිබුණේ පුහුණුලාභීන් 12 දෙනෙකු පමණි.	2021- 3.2 (a)	වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා පුහුණු වීම් සැලසුම් කිරිමට හා ක්‍රියාත්මක කිරිමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය	අදහස් දක්වා නැත.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

(ආ)	වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ යුඕවිටි සහ යුසීඑස් හි කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන උපකාරක අධ්‍යයන පර්යේෂණ සහ නවෝත්පාදන ව්‍යාපෘති සඳහා රු. මිලියන 4 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත් මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණු අතර ව්‍යාපෘති යෝජනා 5 ක් පමණක් අනුමැතිය සඳහා ඉදිරිපත් වී තිබුණි.	2021-3.2 (c)	අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය.	අදහස් දක්වා නැත.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ඇ)	තත්තව කළමනාකරණ පද්ධතිය (QMS/QIS) පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 305ක තරු 3ක් සහිත ආයතන 175ක් සහ තරු 4ක් සහිත ආයතන 130ක් ලෙස 2016 වර්ෂයේ සිට 2022 වසර දක්වා DLI 02 යටතේ ස්ථාපිත කර ඇති අතර ඒසඳහා රු. මිලියන 168.74ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාවලට අනුව, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු මධ්‍යස්ථාන 223ක් තත්ත්ව සහතික ලබාගෙන තිබුණද, එම සියලුම සහතිකවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වී තිබුණි. තවද	2022-3.1(d)	ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය.	තත්ත්ව කළමනාකරණ පද්ධතියට අදාළ DLI 02, 2020 වසර වන විට සාක්ෂාත් කර ගත යුතු ඉලක්කය වන්නේ TVEC ලියාපදිංචි පුහුණු මධ්‍යස්ථාන 300 ක තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධති ස්ථාපිත කිරීමයි. 2020 අවසානය වන විට QIS පද්ධතිය එහි අරමුණු සාක්ෂාත් කර ගෙන ඇත.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	ආයතන 29ක් පමණක් . ලබා ගත් සහතිකය අලුත් කර තිබූ අතර අලුත් කරන ලද සහතිකවල වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. එබැවින් 2023 වසරේ ව්‍යාපෘතිය අවසන් වන තුරු පුහුණු මධ්‍යස්ථානවල ගුණාත්මක බව අඛණ්ඩව පවත්වා ගෙන ගොස් නොමැති බව ඉන් නිරීක්ෂණය විය.				
(ඉ)	විගණනයට ලබා දී ඇති ඉදිකිරීම් පිළිබඳ තොරතුරු අනුව, ව්‍යාපෘතිය මගින් රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතන 07ක් පිහිටුවීම සඳහා රු. මිලියන 954.1ක් වැය කර තිබුණි. විශ්වවිද්‍යාල විද්‍යායතන 05ක් පිහිටුවීම සඳහා ගැසට් නිවේදනයක් නිකුත් කළද කටුබැද්ද සහ බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතන පිහිටුවීමට අදාළ කිසිදු නීතිමය ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ විශ්වවිද්‍යාල විද්‍යායතන 03ක් පිහිටුවා තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටද මෙම විශ්ව විද්‍යාල විද්‍යායතන මෙහෙයුම්	2022-3.1(e)-(iv)-(b)	ඉතිරි විශ්වවිද්‍යාල විද්‍යායතනවල නීතිමය තත්ත්වය ලබාගැනීමට පියවර ගත යුතුය.	අංක 13/0042/539/001 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව, 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන 25ක් ඉදිකිරීමට 2013 පෙබරවාරි 01 වැනි දින කැබිනට් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අමාත්‍යාංශය සතු ඉඩම්වල වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල 5ක් ඉදිකිරීම ආරම්භ ඇත. ඉන් පසුව බටංගල සහ කටුබැද්ද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල	ව්‍යාපෘතිය අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	මට්ටමේ නොපැවතුණි.			ඉදිකිරීම ද ආරම්භ විය. එය අවසන් වූ පසු බටංගල පමණක් විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ලෙස භාවිත විය. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සිසුන් සඳහා ඔවුන්ගේ පාඨමාලා පැවැත්වීම සඳහා CGTTI හි කොටසක් ලෙස කටුබැද්දේ ඉදිකරන ලද අනෙකුත් ගොඩනැගිල්ල භාවිත කිරීමට ආරම්භ කර ඇත.	
(ඊ)	මෙම සභා තාක්ෂණික වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයට නිසියාකාරව ඇතුළත් නොවීම, සභා රජයේ මුදලින් ක්‍රියාත්මක වීම, ස්වයං ආදායම් උත්පාදනය සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම, ස්ථිර කාර්ය මණ්ඩලය සහ පරිපාලනය නොමැතිවීම, සභා සඳහා නීතිමය තත්ත්වය නොමැතිවීම, නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැතිවීම හේතුවෙන් එම අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොමැති බව නිරීක්ෂණය විය.	2022-3.1(f)-(iv)	එවැනි සභා පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මහ පෙන්වීමට කටයුතු කළ යුතුය.	සභාවල අතීත මෙහෙයුම් පිළිබඳව පුළුල් සමාලෝචනයක් සිදු කර ඇති අතර වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර සුදුසු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් සභා හොඳ කාර්ය සාධනයක් කරා මෙහෙයවනු ඇත. සභාවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සහ ඒවායේ තිරසාරභාවය සහතික කිරීම සඳහා ස්වයං ආදායම් උත්පාදනය කිරීමට, අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ අවශ්‍ය	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

				නෛතික තත්ත්වය ලබා දීමට උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඇත. අංශික උපාය මාර්ග සංවර්ධන උපදේශකයින් විසින් ලේඛනය සමාලෝචනය කර ඇති අතර ලේකම්වරයාගේ / නායකත්වයේ අවසාන එකඟතාවයෙන් පසුව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.	
(උ)	මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.	2022-3.3	මුදල් රෙගුලාසි 133 අනුව අභ්‍යන්තර විගණන අංශය මගින් වැඩසටහනේ ක්‍රියාකාරකම් විගණනය කිරීමට කටයුතු කළ යුතුය.	අපේක්ෂිත ඩීඑල්අයි ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩසටහන් කාලසීමාව දීර්ඝ කරන ලද අතර, මෙම කටයුතු සඳහා සහ අනෙකුත් අඛණ්ඩ වැඩ කටයුතු සඳහා පමණක් අයවැය වෙන් කරන ලදී. මෙහෙයුම් කමිටු රැස්වීමක් පැවැත්වීමේ අරමුණ සහ අවශ්‍යතාවය වන්නේ ක්‍රියාකාරකම් සඳහා මෙහෙයුම් කමිටු අනුමැතිය ලබා ගැනීමයි. මෙම සන්දර්භය තුළ FLM ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මෙහෙයුම් කමිටු අනුමැතිය දැනටමත්	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

				ගෙන ඇති බැවින් එවැනි අවශ්‍යතාවයක් නොතිබුණි.	
(ඌ)	2017 සැප්තැම්බර් 12 වැනි දින ගන්නා ලද කැබිනට් තීරණයට අනුව සිසුන් 400 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසීම සඳහා මහල් 3 කින් යුත් නව නේවාසිකාගාර ගොඩනැගිල්ලක් කිලිනොච්චියේ ඉදිකිරීමට රු මිලියන 253.8ක් වෙන් කරන ලද අතර 2020 මැයි 20 වන දින රු මිලියන 185.61 ක ඇස්තමේන්තුගත මුදලකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. පසුව, 2023 පෙබරවාරි 28 දින සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු මිලියන 120.14කට ගොඩනැගිල්ලේ පළමු මහල නිම කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.	2023-3.1-(b)			
(එ)	ජල සම්පාදන හා ජලාපවහන, විදුලිය සහ පවිත්‍රාගාරයට අදාළ කටයුතුවල දුර්වල ප්‍රගතිය හේතුවෙන් නේවාසිකාගාර ගොඩනැගිල්ලේ පළමු මහලේ නේවාසික පහසුකම් විගණන දිනය	2023-3.1-(b)-(i)	කොන්ත්‍රාත්කරුගේ කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය.	ඉතිරි වැඩ 2024 ජූලි 15 දිනට පෙර අවසන් කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. තවද, සිසුන් සඳහා නේවාසික පහසුකම් 2024 ජූලි 3 වන දින ලබා දෙනු ඇත.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	දක්වා ආධුනිකයන් වෙත ලබා දීමට නොහැකි විය.				
(ඒ)	2016 වර්ෂයේ පොතුවිල්හි ඉවුම් පිහුම් පාඨමාලාව සඳහා රු. මිලියන 4.47ක් වටිනා පුහුණු උපකරණ ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, උපදේශකවරුන් නොමැතිකම හේතුවෙන් අදාළ පාඨමාලාව විගණනිත දිනය දක්වා ආරම්භ කර නොතිබුණි. එබැවින්, මෙම උපකරණ නිශ්කාර්ය පැවති අතර වගකීම් කාලයද අවසන් වී තිබුණි.	2023-3.1-(c)-(i)	පුහුණු උපකරණ ඵලදායී ලෙස භාවිත කිරීමට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ඔ)	සිසුන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම සඳහා අහංගම හෝටල් පාසල හෝටලයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ සඳහා රු. මිලියන 162.18 ක් වැඩසටහන මගින් වැය කර තිබුණි. කෙසේවෙතත්, 2024 මැයි 10 වන දින වනවිටත් එවැනි පුහුණු වැඩසටහන් ආරම්භ කර නොතිබුණි.	2023-3.1-(c)-(ii)	වැඩසටහනේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ඕ)	අම්පාර සහ යාපනය දිස්ත්‍රික්කවල සංචාරකයින් වෙත ලබාදීමේ අරමුණින් වෘත්තීය පුහුණු අධිකාරියේ අරමුණුවලට පටහැනිව රු. මිලියන	2023-3.1-(c)-(iii)	තවදුරටත් ප්‍රමාදයකින් තොරව හෝටල් කාමර ප්‍රයෝජනවත් අයුරින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	91.03ක පිරිවැයකට හෝටල් කාමර 22ක් ඉදිකළ අතර මේ සඳහා රු. මිලියන 6.10ක් වටිනා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලද අතර 2017 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි.				
(ඝ)	ගොඩනැගිල්ලට ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් කුච්චිවේලි හෝටල් පාසලේ ආධුනිකයන් 52 දෙනෙකුට නවාතැන් ගැනීම සඳහා අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත රු. මිලියන 140.21ක පිරිවැයකට ඉදිකළ දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් 2017 වර්ෂයේ සිට වසර 06ක් පුරා නිශ්කාර්යව පැවතිණි.	2023-3.1-(c)-(iv)	තවදුරටත් ප්‍රමාදයකින් තොරව නේවාසිකාගාර ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් ආකාරයෙන් භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ග)	මොණරාගල, දඹුල්ල සහ ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු පිළිවෙළින් සියයට 70ක් සහ සියයට 65ක් අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන් විසින් අත්හැර දමා තිබූ අතර ඒ වන විට වැඩසටහන මගින් රු. මිලියන 142.70 ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, ජාතික තරුණ සභාව විසින් කොන්ත්‍රාත් නැවත ප්‍රදානය කර 2023 ජුනි	2023-3.1-(d)-(i)	ඉදිකිරීම්වල ඉතිරි වැඩ අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය.	ලව්ලේන් පුහුණු පන්තිකාමර ගොඩනැගිල්ලේ බිම් මහලේ පන්ති පැවැත්වේ. ඉහළ මහලේ පන්තිකාමර හතරක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන සැලසීමට නියමිතය.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	30 වන විට ඉතිරි වැඩ අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය.				
(ච)	වැඩසටහනේ අවසන් වාර්තාවට අනුව, ජාතික තරුණ සභාවේ ගොඩනැගිලි 5ක වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 535.78ක් ලබා දී ඇත. නමුත් එය රු. මිලියන 456.2ක් ලෙස අදාළ ආයතනයෙන් ලැබී ඇති තොරතුරුවල දැක්වේ.	2023-3.1-(d)-(ii)	ඉදිකිරීම්වල නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	ජාතික තරුණ සභාවේ රත්මලානෙහි වියදම දෙගුණයක් ගණන්ගෙන ඇති අතර එය රු. මිලියන 535.78 වී ඇත. අපගේ වාර්තාවට අනුව නිවැරදි මුදල රු. මිලියන 497.84 කි.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ඡ)	**කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලයවල ඉදිකිරීම් කටයුතු** වැඩසටහනේ අවසන් වාර්තාවට අනුව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි 36ක වැඩිදියුණු කිරීම් සඳහා රු මිලියන 1,093.48 ක් ලබා දී තිබුණි. කෙසේවෙතත්, අදාළ ආයතනයෙන් ලැබුණු තොරතුරු අනුව, එය රු මිලියන 711.8 විය.	2023-3.1-(e)-(i)	ඉදිකිරීම්වල නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පිළිතුරු අනුව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 711.8 කි. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන ඇස්තමේන්තුවේ වටිනාකම හඳුනාගෙන ඇත. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ බණ්ඩාරවෙල, හසලක, රත්මලාන, වවුනියාව, කළුතර, වාරියපොල, සමන්තුරේ,	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

				නුවරඑළිය, පොළොන්නරුව, දඹුල්ල සහ මඩකලපුව යන මධ්‍යස්ථානවල වටිනාකම දෙගුණ වී ඇති අතර එය රු. මිලියන 1,093.48 වේ.	
(ට)	බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරයේ නාන කාමරයක් ඉදිකිරීම සඳහා 2015 අගෝස්තු 24 වැනි දින වැඩසටහන මඟින් ලබා දුන් රු 464,400 ක් වටිනා නානකාමර උපාංග විගණිත දිනය වූ 2024 මාර්තු 06 වන විටත් නිශ්කාර්යව පැවතුණි.	2023-3.1-(f)-(i)	තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි.	වර්තමානයේ ඉදිකිරීම් සිදුකරමින් පවතී.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ඩ)	රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා අදාළ නොවන රු මිලියන 1.45ක් වටිනා පොත් 591 වර්ෂ 9ක් පුරා නිශ්කාර්යව පැවතුණි.	2023-3.1-(f)-(ii)	පොත්පත් ප්‍රයෝජනවත් අයුරින් පරිහරණය කිරීමට කටයුතු කළ යුතුයි.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.
(ණ)	රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ රූපවාහිනී පශ්චාත් නිෂ්පාදන තාක්ෂණ විද්‍යාගාරයේ (TV Post Production Technology) රු. 423,243ක් වටිනා මේස මයික්‍රෆෝනය 31	2023-3.1-(f)-(iii)	උපකරණ ප්‍රයෝජනවත් ආකාරයෙන් භාව කිරීමට කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

	පැවතියද, එහි පාඨමාලා හදාරන සිසුන්ට අදාළ නොවීම හේතුවෙන් 2024 පෙබරවාරි 06 වැනි දින විගණන දිනය වන විටත් වර්ෂ 9ක් පුරා නිශ්කාර්යව පැවතුණි.				
(ත)	වැඩසටහනේ අවසන් කිරීමේ වාර්තාවට අනුව, පාඨමාලා සඳහා අලුතින් සංවර්ධනය කරන ලද ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සහ විෂයමාලා 40ක් සහ සංශෝධිත ජාතික නිපුණතා ප්‍රමිති සහ විෂයමාලා 29ක් පැවතුණි. කෙසේවෙතත්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලැබුණු තොරතුරුවලට අනුව, සිසුන්ගේ ඉල්ලුමට සරිලන පාඨමාලා හඳුන්වා නොදීම, හඳුන්වා දෙන ලද පාඨමාලා සුදුසුකම්ලත් උපදේශකයින් නොමැතිකම සහ කර්මාන්ත අංශයේ නිපුණතා කවුන්සිලයේ දුර්වල මැදිහත්වීම් හේතුවෙන් කිසිදු ශිෂ්‍යයෙකු හැදෑරීමට සහභාගී නොවූණු පාඨමාලා 36ක් සහ සිසුන් 5ත් 78ත් අතර හදාරන පාඨමාලා 12ක් පැවතුණි.	2023-3.1-(f)-(iv)	අදාළ ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂයමාලා හඳුන්වා දීමට කටයුතු කළ යුතුය.	කර්මාන්තයට අවශ්‍ය පරිදි කර්මාන්තය ඉල්ලා සිටින විට ජාතික නිපුණතා ප්‍රමිති සංවර්ධනය කරනු ලැබේ. පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කිරීම අදාළ කර්මාන්තය විසින් සිදු කරනු ලැබේ. එබැවින්, සමහර ජාතික නිපුණතා ප්‍රමිති එම කර්මාන්තයේ අභිමතය පරිදි භාවිතා නොවේ. කර්මාන්ත අංශයේ නිපුණතා කවුන්සිල සෑම විටම ජාතික නිපුණතා ප්‍රමිති, විෂයමාලා සංවර්ධනයට සහ වලංගු කිරීමේ ක්‍රියාවලියේ සම්බන්ධ විය.	වැඩසටහන අවසානයේ නිර්දේශ ක්‍රියාත්මක නොවීය.

06. නිවාස හා නාගරික සංවර්ධන අංශය

6.1. අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය ණය ගිවිසුම් අංක CLK – 100901 යටතේ රු. මිලියන 8,354.32 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,670.86 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 03 කදී දීර්ඝ කර 2023 සැප්තැම්බර් 30 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	254.99	115.73	274.52
විදේශ අරමුදල්	316.73	1,005.28	281.93
මුළු වත්කම්	1,084	2,252	3,254
මුළු වගකීම්	35	78	101
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	625.57	1,773.41	1,783.14
දේශීය අරමුදල් මඟින්	275.03	390.78	665.29

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022(iii) ඡේදයේ “ අර්ධ වශයෙන් නිම කරන ලද යටිතල පහසුකම් සංවර්ධනය අත්හිටුවීමේදී එම යටිතල පහසුකම් භාවිතා කරන්නන්ට ඇති වන අපහසුතාවය අවම වන	2023	ඉතිරි වැඩ කඩිනම් කිරීමට කටයුතු කල යුතුයි.	විචලතාවයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැන් කටයුතු කරමින් පවතී . වර්තමානයේදී කොන්ත්‍රාත්කරුවන් ගේ හිමිකම් ඇගයීමට ලක්	පැවති ආර්ථික තත්වය අනුව හා ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව රජය ගත් තීරණයන් මත ව්‍යාපෘතිය තාවකාලිකව අත්හිටුවීමට සිදුවුවද ව්‍යාපෘතියේ කාර්යය

	පරිදි හා දිගුකාලීන පැවැත්ම තහවුරු වන පරිදි අවශ්‍ය කොටස් සම්පූර්ණ කළ යුතුය ” යනුවෙන් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශය විසින් නවතා දමා තිබුණි.			කරමින් පවතී.	ප්‍රමාණය අඩු කරමින් දැනටමත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී
(ආ)	ණය පහසුකම් ගිවිසුම අනුව 2021 අවසන් වන විට ව්‍යාපෘතියේ රු.මිලියන 6,562.68 ක් වටිනා පැකේජ 12 ක ප්‍රසම්පාදන සම්පූර්ණ කර තිබිය යුතු නමුත් රු.මිලියන 5,025 ක් වටිනා පැකේජ 07 ක ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.	2023	ව්‍යාපෘති කාලසීමාව තුල වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය.	ඉතිරි වැඩ රජය විසින් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසුව තීරණය කළ යුතුය.	ව්‍යාපෘතිය මූලික වශයෙන් 2023 සැප්තැම්බර් මස අවසන් කල යුතුව තිබුණද පැවති ආර්ථික අර්බුද තත්වය මත ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වූ අතර මින් පැකේජ 04 ක් අවසන් කර අදාල ආයතන වෙත භාර දී ඇති අතර ඒවා ක්‍රියාත්මක මට්ටමේ පවතී . තවද, දක්ෂිණ බහුවිද ප්‍රවාහන පර්යන්ත ව්‍යාපෘතිය (SMTC) දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතුරු පැකේජ 07 රජයේ උපදෙස් පරිදි තාවකාලිකව අත්හිටුවා ඇත.
(ඇ)	ව්‍යාපෘතිය යටතේ සිදු කිරීමට අපේක්ෂිත පැකේජ 12 න් රු.මිලියන 2,123 ක් වටිනා පැකේජ 05 ක් පමණක් ආරම්භ කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් තර තිබුණේ	2023-3.1(ආ)	වැඩ කඩිනම් කිරීම සඳහා නිවැරදි පියවර ගත යුතුය.	ආර්ථික අර්බුද ,ද්‍රව්‍ය නොමැතිකම සහ මූලික සැලසුමකරණය සහ සැලසුම් නිර්මාණ උපදේශනයේ ඇති දුර්වලතා ප්‍රමාදයට ප්‍රධාන හේතුවයි.	මෙම පැකේජ 04 ම මේ වන විට නිම කර අදාල ආයතන වෙත භාර දී ඇත.

	පැකේජ 2 ක් පමණි. 2023 වර්ෂයේදී මාස 04 සිට 07 දක්වා ප්‍රමාදයකින් පසුව අංක 3 සහ 4 පැකේජ නිම කරන ලද අතර ඒ සඳහා ප්‍රධාන වශයෙන් දුර්වල ඉදිකිරීම් අධීක්ෂණය සහ සැලසුම් හා නිර්මාණ කිරීමේ දුර්වලතාවය බලපා තිබුණි.				
(ඈ)	සුරපුර එළිමහන් රංගපීඨයේ සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ඒළිමහන් රංග පීඨයේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන තුරු ප්‍රධාන උපකරණ සහ භාණ්ඩ(ආලෝක ,ආසන) සපයා නොතිබීම හේතුවෙන් එම රංගපීඨ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි.එබැවින් ඉදිකිරීම් සඳහා වැය කර තිබූ රු.මිලියන 332 ක වියදම ඉදිරියේදී නිෂ්ඵල වියදමක් වී තිබුණි.	2023	ඉතිරි වැඩ තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිම කිරීමට උපදෙස් ලබා දිය යුතුය.	අප දැනටමත් සුරපුර එළිමහන් රංගපීඨය, SLBC එළිමහන් රංග පීඨය අදාළ ආයතනයන්ට පවරා දී ඇති අතර දැනට ඔවුන් එහි පාලනය භාරගෙන ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.	සුරපුර එළිමහන් රංගපීඨය වැඩ අවසන් කර උතුරු මැද පළාත් ආයතනය වෙත භාර දී ඇත. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ එළිමහන් රංග පීඨය වැඩ අවසන් මට්ටමින් අදාල ආයතන වෙත භාර දී ඇති අතර ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් එම ආයතනය මඟින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා ඇත.
(ඉ)	දිනකට ඝණ මීටර් 35 ක ධාරිතාවයකින් යුතු මලාපවාහන පිරිපහදු ඒකකයක් රු.මිලියන 30 කට ඉදිකිරීමට යෝජනා කර තිබුණු අතර අනුරාධපුර මහ නගර සභාවේ නගරාධිපතිවරයා විසින් 2022 පෙබරවාරි 10 දිනැති ලිපියෙන් කරන	2023	වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කළ යුතුය.	විචලනයන් සහ අනෙකුත් තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැන් කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන් ගේ හිමිකම මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී.	මෙම මළාපවාහන පිරිපහදු ඒකකය නිම කර එය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී.

	ලද ඉල්ලීමට අනුව එය සංශෝධනය කර දිනකට ඝන මීටර් 75 ක ධාරිතාවයකින් ඉදිකරන ලදී. තවද නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකිරීම හා ව්‍යාපෘතියේ වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර සිටම නගරාධිපතිවරයා විසින් කරන ලද ඉල්ලීම සැලකිල්ලට නොගැනීම හේතුවෙන් විචලනයන් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. එබැවින් කොන්ත්‍රාත්තුවේ මුළු කොන්ත්‍රාත් මුදල රු. මිලියන 98 ක් දක්වා වැඩිවී ඇති අතර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් විචලන නියෝගය අනුමත කර තිබුණි. තවද ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් රු. මිලියන 138 ක විචලන නියෝගයක් ඉඩම් සකස් කිරීමේ කටයුතු පවතින බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය, පාංශු ආරක්ෂණය හා පාරිසරික කටයුතු සඳහා අනුමත කර තිබුණි.				
(ඊ)	මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘති(RAMP) ප්‍රතිඋපායගත කිරීම සහ වේගවත් කිරීම සඳහා වූ කමිටුවේ තීරණයට අමතරව ව්‍යාපෘතිය ආරම්භයේදී හඳුනා නොගත් රු.මිලියන 236.85 ක් වටිනා විචලන නියෝගයක්	2023	නිසි අනුමැතිය ලබා ගත යුතුය.	අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ඇතිව ව්‍යාපෘතිය විසින් දැනට පවතින ව්‍යාපෘතිය නැවත ඇගයීමට ලක් කර ඇති අතර, විචලනයන් සහ අනෙකුත්	අදාල විචලනයන්ට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ගෙන අදාල තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගනිමින් මෙම උප ව්‍යාපෘතියේ ඉදිරි ඉදිකිරීම් කටයුතු සිදු වෙමින්

	ව්‍යාපෘතියට ඇතුලත් කර තිබුණි.			තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට දැනට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කරුවන් ගේ හිමිකම මේ වන විට ඇගයීමට ලක් කරමින් පවතී.	පවතී.
(උ)	උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යටතේ වාරිමාර්ග නිල නිවාස ගොඩනැගිල්ල වෙනත් ස්ථානයකට රැගෙන යාම සඳහා වන්දි වශයෙන් රු.මිලියන 45.9 ක මුදලක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මෙම පැකේජය අවලංගු කිරීමෙන් පසු එම මුදල වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අයකර ගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එය අයකර ගෙන නොතිබුණි.	2023	වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගෙවා ඇති මුදල අයකර ගැනීමට අපි කටයුතු කරන්නෙමු.	උතුරු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම යටතේ වාරිමාර්ග නිල නිවාස පිහිටි ඉඩම වන්දි ගෙවීමෙන් පසු මෙම ව්‍යාපෘතිය වෙත අත්පත් කරගෙන ඇති අතර දැනට මෙම ඉඩම ව්‍යාපෘතිය සතුව පවතී . ඉදිරියේදී මෙම උතුරු බහුවිද ප්‍රවාහන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ අනුමැතිය ලදහොත් මෙම ඉඩම ඒ සඳහා යොදාගනු ලැබේ.
(ඌ)	දක්ෂිණ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉතිරි කටයුතු අවසන් කිරීම සඳහා 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලෙස යුරෝ මිලියන 06 ට සමාන රුපියල් මිලියන 2,070 ක් වෙන් කිරීමට ජාතික මෙහෙයුම් මැදිරිය (NOR) තීරණය කර තිබුණද, මේ සම්බන්ධයෙන් ණය ප්‍රදානකරු සමඟ	2023	ණය ප්‍රදානකරුගෙන් කැමැත්ත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් පසු වෙන්කරන ලද රු. මිලියන 2,070 න් යුරෝ මිලියන 6ක් ණය ප්‍රදානකරුගෙන් ලබා ගැනීම සඳහා රජයට අවබෝධයක් ඇත. පැකේජය 06 පසුගිය කාලය තුළ මුහුණ දුන් මූල්‍ය	මේ සඳහා ප්‍රංශ නියෝජිත ආයතනයේ (AFD) කැමැත්ත ලැබී ඇති නමුදු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වී නොමැති බැවින් එම ප්‍රසම්පාදන ලබා ගැනීම සඳහා මෙතෙක් රජයේ අනුමැතියක් ලැබී නොමැත.

	ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. තවද මෙම වියදම ඉදිරියේදී ශ්‍රී ලංකා රජයට වැය බරක් වනු ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව, ව්‍යාපෘතිය රජයේ අරමුදලින් රු.මිලියන 129 ක් ඉදිකිරීම් සඳහා වැය කර ඇති අතර 2024 අප්‍රේල් 30 වන විට සියයට 38 ක අඩු භෞතික ප්‍රගතියක් ලබාගෙන තිබුණි.			බාධාවන් සහ අනෙකුත් බාධාවන් හේතුවෙන් සියයට 38 ප්‍රගතියක් දැනට ලබාගෙන ඇත.	
(එ)	2016 වර්ෂයේ ඇති කර ගත් ණය ගිවිසුමට අනුව රු. මිලියන 8,354 ක අරමුදල් ලබා දීමට ණය නියෝජිතායතනය එකඟ වී තිබූ අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මිලියන 1,671 ක් විය. ණය කාලසීමාව 2023 සැප්තැම්බර් 30 දින අවසන්වී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2,451 ක් හෙවත් සියයට 24.45 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ හේතුවෙන් අනුරාධපුර පූජා නගර සංවර්ධන ව්‍යාපෘතියේ පැකේජ 12 කින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි විය.	2023	ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	COVID 19 වසංගතය, ගෝලීය ආර්ථික අර්බුදය, දේශීය ආර්ථික ගැටලු සහ සියලු උද්ධමන හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් නිසි සැලසුම් ක්‍රමයට අනුව සිදු කිරීමට නොහැකි විය.	ඉතිරි උප ව්‍යාපෘති කරගෙන යාම සඳහා මෙතෙක් රජයේ අනුමැතිය නොලැබී ඇති අතර දැනට ක්‍රියාත්මක වෙමින් පවතින දක්ෂිණ බහුවිධ ප්‍රවාහන පර්යන්තය මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතී.
(ඒ)	පැකේජ 01 යටතේ දුම්රිය ප්ලාසා සංවර්ධන ව්‍යාපෘතිය රු. මිලියන 98 ක වටිනාකමකින් නිම කර 2022 වර්ෂයේ	2023	දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන ගිවිසුමක් ඇති කර ගැනීමට කටයුතු	නඩත්තුව වැඩි දියුණු කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට	ව්‍යාපෘතියේ අවසන් භාරකරු වන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත අදාල

	දී දුම්රිය දෙපාර්තමේන්තුවට භාර දී ඇත. කෙසේ වෙතත්, අලුතින් ඉදිකරන ලද ආපනශාලාව 2023 දෙසැම්බර් 31 වන දින දක්වා නිසි නඩත්තුවක් නොමැතිකම හේතුවෙන් හිස්ව පැවතුණි. එබැවින් දුම්රිය දෙපාර්තමේන්තුව සමඟ දීර්ඝ කාලීන මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුමක් ඇති කර නොගැනීම නිසා දුම්රිය ප්ලාසා ගොඩනැගිල්ල අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.		කළ යුතුයි.	කටයුතු සම්පාදනය කරන්නෙමු, නමුත් ව්‍යාපෘතිය නිසි ලෙස ශ්‍රී ලංකා දුම්රිය වෙත පවරා ඇත. නඩත්තු කිරීමේ වගකීම ශ්‍රී ලංකා දුම්රිය සේවයට පැවරේ.	ව්‍යාපෘතිය භාර දී ඇත. ඔවුන් විසින් එහි ව්‍යාපාරික ස්ථාන ක්‍රමවත් පරිදි ක්‍රියාත්මක කල නමුත් වර්තමානය වන විට වසා ඇත. මේ පිලිබඳ ව්‍යාපෘතිය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත කිහිප විටකම දැනුම් දී ඇත.
(ඔ)	2016 වසරේ ආරම්භ කරන ලද අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2023 සැප්තැම්බර් 30 වැනි දින නිම කිරීමට බලාපොරොත්තු වූ නමුත් එකඟ වූ ණය මුදල වන රු. මිලියන 10,025 න් රු.මිලියන 2,440 ක් පමණක් 2023 දෙසැම්බර් 31 දක්වා භාවිතා කර ඇත. සවිස්තරාත්මක සැලසුම ඉදිරිපත් කිරීමට උපදේශක සමාගම වසර 02 ½ ක් ප්‍රමාද කිරීම එම තත්ත්වයට අහිතකර ලෙස බලපා තිබුණි.	2023	නොපමාව සැලසුම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය	COVID 19 වසංගතය, ගෝලීය ආර්ථික අර්බුදය, දේශීය ආර්ථික ගැටලු සහ සියලු උද්ධමන හේතුවෙන් ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් නිසි සැලසුම් ක්‍රමයට සිදු කිරීමට නොහැකි විය.	ව්‍යාපෘතියේ උප ව්‍යාපෘති සැලසුම් අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කර අවසන් කල හෙයින් විටින් විට සිදු වූ ඒ වෙනස්කම් මත හා නව ඉල්ලීම් මත සැලසුම් ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර සියලු සැලසුම් මේ වන විට උපදේශන සමාගම මගින් ව්‍යාපෘතිය වෙත භාර දී අවසන් කර ඇත.

6.2. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයදීමේ ව්‍යාපෘතිය

2019 ජුලි 22 දින ආරම්භ කරන ලද කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයදීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ ණය ගිවිසුම් අංක L – 0081 A යටතේ රු. මිලියන 35,163.7ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 14,417.2 ක් විය. ව්‍යාපෘතිය 2025 ජුනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 සඳහා තත්වාගණන කල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	802	647	1,259
විදේශ අරමුදල්	3,395	5,361	6,053
මුළු වත්කම්	6,877	17,961	24,416
මුළු වගකීම්	378	1,387	1,914
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	4,325	10,054	42,110
දේශිය අරමුදල් මගින්	1,241	1,867	9,070

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	කොළඹගේ මාවත නිවාස ව්‍යාපෘතියේ 2020 ජුනි 01 වන දින රු. මිලියන 3,595.56ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත ආරම්භ කරන ලද නිවාස ඒකක 624ක් ඉදිකිරීමේ උක්ත ව්‍යාපෘතිය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 3,595.55ක් වැයකර එහි අපේක්ෂිත	2023	කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	ආර්ථික අර්බුදය කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහයට සෘජුවම බලපෑවේය.	2024.08.31 දින වන විට සියයට 94.34ක භෞතික ප්‍රගතියක් ලඟාකර ගෙන තිබුණි.

	ඉලක්කය වූ සියයට 87ට සාපේක්ෂව සියයට 80.27ක ප්‍රගතියක් පමණක් ලබා ගෙන තිබුණි.				
(ආ)	ඇපල්වත්ත නිවාස ව්‍යාපෘතියේ නිවාස ඒකක 700ක් ඉදිකිරීමට යෝජිත වූ, රු.මිලියන 4,473ක ඇස්තමේන්තුගත වටිනාකමක් මත ආරම්භ කරන ලද ව්‍යාපෘතිය 2023 ඔක්තෝබර් 17 වන දින අවසන් කිරීමට අපේක්ෂා කරන ලද නමුත් 2023 දෙසැම්බර් 31 දිනට සියයට 29.33ක ප්‍රගතියක් පමණක් අත්කර ගෙන තිබුණි.	2023	කාල රාමුව තුළ අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යයසාධනය ව්‍යාපෘති ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදී.	2024.08.31 දිනට සියයට 36.17ක භෞතික ප්‍රගතියක් ලබා කරගෙන තිබුණි.
(ඇ)	ෆර්ගියුසන් පාරේ නිවාස ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 4,511 ක්වූ නිවාස 750ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2024 ජනවාරි 04 දින අවසන් කිරීමට නියමිත විය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සියයට 12ක් පමණ ඉතාමත් අඩු කාර්යසාධනයක් පමණක් ලබාකරගෙන තිබුණි.	2023	සැලසුමට අනුව නියමිත වැඩ ආරම්භකළ යුතුය.	කොන්ත්‍රාත්කරුගේ කාර්යසාධනයට කොවිඩ් වසංගතයේ බලපෑම හේතුවිය.	2024.08.31 දිනට භෞතික ප්‍රගතියේ වෙනසක් සිදුවී නොතිබුණි.
(ඈ)	මහල් 14 කින් යුත් නිවාස ඒකක 300කින් යුත් ඔබේසේකරපුර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අත්තිවාරම්	2023	අතිරේක පිරිවැය අවම කිරීම සඳහා නිවැරදි පියවර ගත යුතුය.	නැවත ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සලකා බලනු ලැබේ.	නව කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ

	කොටස් සහ කණු එසවීමට අදාළ කොටස් පමණක් ඉදිකර ඇති බව භෞතික විගණනයේදී නිරීක්ෂණය වූ අතර ඉදිකිරීම් කටයුතු 2022 මාර්තු 29 දින අතරමග නවතා දමා තිබුණි. ඉදිකිරීම් සඳහා යොදාගත් කම්බි සහ කොන්ක්‍රීට් කොටස් දිරාපත් වෙමින් පැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2022 මාර්තු 29 දක්වා දැරූ රු. මිලියන 296 ක් ඵල රහිත වියදමක් බවට පත්වී තිබුණි.				කර ඇත.
(ඉ)	නිවාස ව්‍යාපෘතිවල මලාපවහන කොළඹ නාගරික මලාපවහන පද්ධතියට සම්බන්ධ කිරීම අත්‍යවශ්‍ය විය. නමුත් දැනට පවතින මලාපවහන පද්ධතියේ පවතින ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ අපද්‍රව්‍ය එම පද්ධතියට සම්බන්ධ කිරීම කොළඹ මහ නගර සභාව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ හේතුවෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් 2024 ජනවාරි 12 වන දිනැතිව ව්‍යාපෘතිවල මලාපවහනය සඳහා වෙනම ඉදිකිරීමක් ලෙස නව මලාපවහන පද්ධතියක් සඳහා රු.බිලියන 2 ක් ඇස්තමේන්තු කර ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියට වැඩ සඳහා	2023 3.4 (ආ)	ව්‍යාපෘති කාල සීමාවතුළ ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතුකළ යුතුය.	වැඩබිමෙහි බිම් මට්ටම් සැලකිල්ලට ගනිමින්, එම ස්ථානයේ අපද්‍රව්‍ය පොම්පාගාරයක් ඉදිකිරීමට කොළඹ නගර සභාව විසින් යෝජනා කරන ලදී. මලාපවහන සැකැස්ම අවසන් කිරීම සඳහා බාහිර උපදේශකයෙකු විසින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී. බාහිර උපදේශකවරයා විසින් මලාපවහන පොම්පාගාරය වෙනුවට භූමි මලාපවහන නල මාර්ගයක් යෝජනා කරන ලදී.	භූමි මලාපවහන නල මාර්ගය සඳහා කොන්ත්‍රාත්කරුවකු විසින් ලබාදී ඇති යෝජනාවලිය හා ඒ සඳහා ලබා දී ඇති ඉංජිනේරු ඇස්තමේන්තුවය වඩා වැඩි බැවින් ඒ සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු ව්‍යාපෘතිය මඟින් සිදුකිරීමට තීරණය කර ඇත.

	අධික පිරිවැයක් දැරීමට සිදු වූ අතර එය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර සැලසුම් කළ යුතුව පැවතුණි. තවද මේ හේතුවෙන් සියයට 96ක කාර්යසාධනයක් ලබා ඇති ස්ටේඩියම්ගම නිවාස ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් වෙත නිවාස ලබාදීම 2026 ජුනි 26 දක්වා ප්‍රමාද වී තිබුණි.				
(ඊ)	ව්‍යාපෘතියේ අකාර්යක්ෂම අරමුදල් භාවිතය හේතුවෙන් ණය මුදල එ.ජ.ඩො. මිලියන 70කින් අඩු කිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 3 වැනි අදියරේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අත්හිටුවා තිබූ අතර නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1272 කින් අඩු වී ඇත.	2023	නිශ්චිත කාල සීමාව තුළ ණය මුදල උපයෝජනය කළ යුතුය.	අරමුදල් නැවත වෙන්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ 3 වන අදියර ක්‍රියාත්මක නොවීය.	ව්‍යාපෘතියේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් මුල් ණය ගිවිසුමට අනුව ඉදිකිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව අඩුවූ අතර ඒ හේතුවෙන් නිවාස ප්‍රතිලාභීන් සංඛ්‍යාවද අඩුවිය.
(උ)	ව්‍යාපෘතියේ මුල් පිරිවැය ඇස්තමේන්තුවට අනුව රජයේ දායකත්වය එ.ජ.ඩොලර් මිලියන 42 කි. කෙසේ වෙතත් එය එ.ජ.ඩොලර් මිලියන 28 දක්වා ඩොලර් මිලියන 14 කින් අඩු කර තිබුණි. තවද, සංශෝධිත ගිවිසුමට අනුව ඉඩම් ප්‍රතිසංවර්ධනය සඳහාවූ පුද්ගලික හවුල්කාර දායකත්වය සම්පූර්ණයෙන්ම ඉවත් කර තිබුණි.	2023-3.2(ආ)	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත්කර ගැනීමට කටයුතු කළ යුතුය.	සෞඛ්‍ය අමාත්‍යාංශයට එ.ජ. ඩොලර් මිලියන 70ක් වෙන් කිරීම නිසා මෙම ව්‍යාපෘතිය නිම කිරීම සඳහා එ.ජ.ඩොලර් මිලියන 130ක් ලබාගත හැකිව තිබුණි.	සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබාදුන් එ.ජ. ඩොලර් මිලියන 70න් එ.ජ. ඩොලර් මිලියන 28ක් නැවත මෙම ව්‍යාපෘතියට ලබා දීමට නියමිතව ඇත.

(ඌ)	ඉඩම් සංවර්ධන ව්‍යාපෘති 11ක් යටතේ 2022 වසර අවසන් වන විට අක්කර 111.5ක භූමි ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, 2022 ජුනි 13 දිනැති ව්‍යාපෘති වෙනස් කිරීමේ ලේඛනයට අනුව මෙම සංරචකය නවතා දමා තිබුණි. කෙසේ වෙතත්, එම ඉඩම ආරක්ෂා කිරීමට සහ එම ඉඩමේ යටිතල පහසුකම් නැවත සංවර්ධනය කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට හෙළි කළ නොහැකි විය. එබැවින්, ව්‍යාපෘතියේ අරමුණු අනුව දැරිය හැකි මිලකට නිවාස ඉදිකිරීම සහ ඉඩම් නැවත සංවර්ධනය කිරීම සඳහා ආයෝජනය කිරීම තුළින් ඉඩම් පරිහරණයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය අසමත් වි තිබුණි.	2023-3.5(ඇ)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අත්පොත අනුව ඉඩම් සංවර්ධනය සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	වැඩවල විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඉඩම් ප්‍රමාණය අඩු කිරීම හේතුවෙන්, සංරචක 2 යටතේ ඉඩම් සංවර්ධන කටයුතු අඩු වී ඇත. වර්තමානයේ මෙම සංරචකය ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා උපදේශනය සඳහා පමණක් සීමා වී තිබුණි. කෙසේ වෙතත්, 2 සංරචකය යටතේ හඳුනාගත් ඉඩම්වල පදිංචිව සිටින පවුල් නැවත පදිංචි කිරීමෙන් පසු නිදහස් කිරීමට යෝජිත ඉඩම්වලට වැට බැඳ සුරක්ෂිත කිරීමේ හැකියාව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සොයමින් සිටී. තවදුරටත් සංරචක 1 හි විෂය පථය අඩුකිරීම හේතුවෙන් ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා යෝජිත ඉඩම අක්කර 50 තෙක් අඩුවිය.	හඳුනාගත් ඉඩම්වල පදිංචිවී සිටින පවුල්වල නැවත පදිංචිකිරීමෙන් පසු මුදවාගත් ඉඩම් ආරක්ෂාකිරීමට අවශ්‍ය කටයුතු ආරම්භකිරීමට නියමිතය. .

6.3 නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය

2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකු අරමුදල ණය ගිවිසුම් අංක 3706 SRI (COL) යටතේ රු. මිලියන 883.88 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 207.10 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 01 ක දී දීර්ඝ කර 2024 මාර්තු 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන කල මතයක්ද 2022 සහ 2023 වර්ෂ 2 සඳහා තත්වාගණන නොකල මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	23.92	1.29	1.40
විදේශ අරමුදල්	150.87	19.33	15.10
මුළු වත්කම්	499	523	529
මුළු වගකීම්	1.6	7.5	1.6
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	405.68	425.60	437.95
දේශීය අරමුදල් මඟින්	91.99	88.64	89.14

එම තත්වාගණ කල විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	රථවාහන ප්‍රවාහනය සහ සංචලනය සඳහා උපදේශන වාර්තා 13ක්, නාගරික වැඩිදියුණු කිරීම සහ උරුමයන් සංරක්ෂණය සහ ධාරිතා ගොඩනැගීම සඳහා උපදේශන වාර්තා 04ක් සහ පරිසර කළමනාකරණ සේවාව	2023	උපදේශන වාර්තා නියමිත කාලසීමාව තුළ ලබාගැනීමට කටයුතු කල යුතුය.	උපදේශන කොන්ත්‍රාත්තුවල පිරිවැය සහ කාලය මත පදනම් වූ කොන්ත්‍රාත් ස්වභාවය හේතුවෙන් ඉදිරිපත් නොකළ ලේඛන ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශයට	උපදේශන වාර්තා ලබාගැනීමට නොහැක.

	සඳහා උපදේශන වාර්තා 05ක් වශයෙන් පළමු හා අවසාන වාර්තා සැකසීම සඳහා පෞද්ගලික සමාගම් තුනකට භාර දී තිබුණි. කෙසේ වෙතත්, මෙම උපදේශන වාර්තා සම්බන්ධයෙන් ව්‍යාපෘතිය කිසිදු ප්‍රගතියක් අත්පත්කර ගෙන නොතිබුණි.			ඉල්ලා සිටිය නොහැක.	
(ආ)	ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කර ඇති අතර ව්‍යාපෘතියේ පෙර විෂය පථය වෙනස් කර 2024 මාර්තු 31 වන විට අවසන් කිරීමට යෝජිතව තිබූ ත්‍රිකුණාමලය සහ දඹුල්ල දිස්ත්‍රික්ක යටතේ වෙනත් විෂය පථයක් සමඟ ආරම්භ කර ඇත. නමුත් 2023 දෙසැම්බර් 31 දින වන විට ඉලක්ක සපුරා ගැනීම අඩු මට්ටමක පැවතිමෙන් ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම යටතේ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම ගැටළු සහගත තත්ත්වයක් විය.	2023	නියමිත කාලසීමාව තුල වැඩ නිමකිරීමට කටයුතු කල යුතුය.	ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2024.03.31 සිට 2024.12.31 දක්වා කාලය දීර්ඝ කරන ලෙස ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ඉල්ලා ඇත.	කාලය දීර්ඝ කිරීම් ලබාදී නොමැත.
(ඇ)	2024 මාර්තු 31 වන විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කළ යුතු වුවද, 2023 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාකාරකම් 10ක් ආරම්භ කර නොතිබුණි.	2023	වැඩ සැලැස්මට අනුව වැඩ නිම කිරීමට කටයුතු කල යුතුය.	සවිස්තරාත්මක නිර්මාණ සැලසුම් කරමින් පවතී.	2024 දෙසැම්බර් 31 දින දක්වා කාලය දීර්ඝ කිරීම් ලබාදී නොමැති හෙයින් එකී ක්‍රියාකාරකම් ආරම්භ කර නොමැත.
(ඈ)	මෙම ව්‍යාපෘතිය සඳහා දඹුල්ල, ත්‍රිකුණාමලය, කුරුණෑගල සහ	2023	ව්‍යාපෘතියට අදාල කටයුතු සඳහා පමණක් සැලසුම්	මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ව්‍යාපෘතිය නැවත	ත්‍රිකුණාමලය සහ දඹුල්ල ප්‍රදේශවල සංචාරක පහසුකම්

රත්නපුර යන නගර තෝරාගෙන ඇති අතර ඒ සඳහා 2019 සිට 2022 දෙසැම්බර් 31 දක්වා සංරචක 3ක් යටතේ රු. මිලියන 418.29 ක් වැය කර තිබුණි. 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය අත්හිටුවීමෙන් සහ 2024 මාර්තු 31 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමෙන් පසු විෂය පථය වෙනස් කර ත්‍රිකුණාමලය සහ දඹුල්ල දිස්ත්‍රික්කවලට පමණක් ප්‍රමුඛත්වය ලබා දී තිබුණි. එබැවින් එම දිස්ත්‍රික්ක වෙනුවෙන් මේ දක්වා ව්‍යාපෘතිය මගින් වැය කර ඇති මුළු මුදල නිෂ්ඵල වියදම් විය.		සහගතව වියදම් කිරීමට අවධානය යොමු කල යුතුය.	සක්‍රීය කිරීමේදී ත්‍රිකුණාමලය සහ දඹුල්ල ප්‍රදේශවල සංචාරක පහසුකම් සහ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත. අමාත්‍යාංශය ශ්‍රී ලංකා රජය ගන්නා ප්‍රතිපත්තිමය තීරණයට අනුගත විය යුතු බව දක්වා තිබුණි.	සහ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇත.

07. වාරි මාර්ග අංශය

7.1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1

2015 දී ආරම්භ කරන ලද මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 1සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3268-SRI යටතේ රු. මිලියන 10,407 ක් සහ ණය ගිවිසුම් අංක 3267-SRI යටතේ රු. මිලියන 10,688 ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය 2025 ජූලි 25 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2022 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	686	623	2,515
විදේශ අරමුදල්	3,550	2,611	21,930
මුළු වත්කම්	26,015	45,502	53,706
මුළු වගකිම්	1,916	846	5,113
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	18,645	19,237	39,168
දේශිය අරමුදල් මඟින්	4,479	5,102	6,588

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ආසියානු සංවර්ධන බැංකුව විසින් පත් කරන ලද ව්‍යාපෘතියේ තාක්ෂණික සහකාර පසුව එම වැඩසටහනේ උපදේශන සමාගමේ සේවයට එක් වි තිබූ අතර වසර 07ක කාලයක් කණ්ඩායම් නායකයා සහ ප්‍රධාන සැලසුම් ඉංජිනේරුවරයා	2023	වැඩසටහන් අධීක්ෂණය ස්වාධීන විය යුතු අතර බඳවා ගැනීම් ADB මාර්ගෝපදේශයන් ට අනුකූල විය යුතුය.	උපදේශක ප්‍රසම්පාදන ක්‍රියාවලිය අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් සිදු කර ඇත.එබැවින්, ප්‍රසම්පාදනය ආසියානු සංවර්ධන බැංකුව	වැඩසටහනේ උපදේශකයින් භාවිතා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අනුමත පිරිවිතරයන්ට අනුකූලව සිදු කර නොතිබූ අතර එය වැඩසටහන් අධීක්ෂණයේ ස්වාධීනත්වය

	ලෙස සේවය කර තිබුණි. ඒ සඳහා ඔහුට යුරෝ 26,000 කට සමාන රු. මිලියන 8.5 ක මාසික වැටුපක් ගෙවමින් සිටි අතර, 2023 ජුනි මාසය වන විට ඔහුට වැටුප් වශයෙන් රු.මිලියන 702.18 ක් ගෙවා තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් වැඩසටහන සකස් කිරීමේ කාර්යයට සහය වූ අයෙකු එම වැඩසටහනේ උපදේශන ආයතනයේ යොදවා තිබීම වැඩසටහන් අධීක්ෂණයේ ස්වාධීනත්වය අභියෝගයට ලක් කිරීමක් විය. මෙම උපදේශකයාගේ සේවය ලබා ගැනීම 2013 වසරේ ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද "ආසියානු සංවර්ධන බැංකුව සහ එහි ණය ගැතියන් විසින් උපදේශකයින් භාවිතා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ" සංග්‍රහයේ 1.11 ඡේදය ප්‍රකාරව පටහැනි කරුණක් විය.			මාර්ගෝපදේශයන් ට අනුකූල යුතුය.උපදේශක කණ්ඩායම සඳහා ගෙවීම් උපදේශන ගිවිසුමට අනුකූලව ගෙවනු ලැබේ.	අභියෝගයට ලක් වී විය තිබුණි.
(ආ)	යෝජිත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ විෂය පථය, ප්‍රතිපාදනය සහ සේවාවල කාල ප්‍රමාණය තීරණය කළ හැකි බැවින්, කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධනය මත	2023 2022	ගිවිසුම මත පදනම්ව උපදේශන ගාස්තු ගෙවීම සහ කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර වෙනත් ඉදිකිරීම්	මෙම උපදේශන ගිවිසුමේ අඩංගු වන්නේ, • කාර්යය මත යැපෙන එකවර ගෙවීම් • කාලය මත	කොන්ත්‍රාත්තුවේ ගිවිසුමේ කාර්ය සාධනය මත පදනම්ව උපදේශන ගාස්තු නොගෙවා වෙනත් ඉදිකිරීම්

	පදනම්ව උපදේශක ගාස්තු ගෙවිය යුතු වුවද, 2015 නොවැම්බර් 16 සිට මාස 60 ක කාලයක් සඳහා ඇ.ඩො. මිලියන 22.09 ක් වටිනා උපදේශන කොන්ත්‍රාත්තු ගිවිසුමක් කාල පදනම මත ගෙවීම සඳහා වැඩසටහනේ උපදේශකයා සමඟ අත්සන් කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීම නිසා උපදේශක කොන්ත්‍රාත් ගිවිසුම 2024 ජුනි 30 දක්වා අවස්ථා 06 කදී දීර්ඝ කර තිබූ අතර, මෙම දීර්ඝ කළ කාල සීමාව මත උපදේශන ගාස්තු ගෙවීමට සිදුවීමෙන් වියදම ඇ.ඩො.මිලියන 41.56ක් දක්වා ඉහළ ගොස් තිබුණි. ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශන ගාස්තු අදියර 1 සහ 2 සඳහා උපදේශන ගාස්තු ගෙවීමට ඇ.ඩො. මිලියන 26ක් පමණක් වෙන්කර තිබූ බැවින්, ඉක්මවූ උපදේශන ගාස්තු අනෙකුත් වියදම් සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් ගෙවීමට සිදු වී තිබුණි.		සඳහා වෙන් කළ මුදල් යොදවා උපදේශන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු ව්‍යාපෘතියේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග පියවර ගත යුතුය.	පදනම් වූ ගෙවීම් උපදේශකයාගෙන් අවශ්‍ය සේවාවන්හි ස්වභාවය අනුව. කාලය මත පදනම් වූ සේවාවන් පැහැදිලිවම ඉදිකිරීම් සම්බන්ධතා වල "සම්පූර්ණ කිරීමේ කාලය" වෙත සංවේදී වන බැවින් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු අවසන් වන තෙක් දීර්ඝ කිරීමට සිදු විය. උපදේශන සේවා සඳහා මුල්ම වෙන්කිරීම එජඩො මිලියන 22.09 ක් වූයේ අදියර 1 සහ මාස 60 ක කාලය සඳහා පමණි. අදියර 2 කාර්යයන් සඳහා සංශෝධන සහ වෙනස්කම් කිහිපයක් අනුමත කරන ලද අතර විෂය පථය වෙනස් කරන අයිතම සහ ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ සමහර වෙනස්කම් වේ.	සඳහා වෙන් කළ මුදල් යොදවා උපදේශන ගාස්තු ගෙවීම කර තිබුණි.
(ඇ)	ව්‍යාපෘතිය ආරම්භයේදී උපදේශන කටයුතු සඳහා විදේශිකයන් 34 දෙනෙකු බඳවාගෙන	2023	(i) යම් ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කරමින් මාසික වැටුප්	උපදේශන සේවා සඳහා ගෙවීම් උපදේශන ගිවිසුමට අනුකූලව ගෙවනු	ස්ථිර සේවා ස්ථානයක සේවය කරමින් මාසික වැටුප් ලබන

	ඇති අතර දැනට විදේශිකයන් 8 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. විදේශිකයෙකුට මසකට යුරෝ 16,000 සිට 26,000 කට සමාන රු.මිලියන 5.5 සිට රු.මිලියන 9 දක්වා වැටුපක් සහ යැපුම් දීමනා දිනකට යුරෝ 70 සිට 110 දක්වා ගෙවා තිබුණි. 2023 ජුනි 30 වන විට මෙම විදේශිකයන්ට යුරෝ 12,843,998 කට සමාන රු. මිලියන 4,341 ක වැටුප් සහ යැපුම් දීමනා යුරෝ 1,068,599 කට සමාන රු. මිලියන 361.18ක් ගෙවා තිබුණි.		ලබන පුද්ගලයින්ට යැපුම් දීමනා නොගෙවීමට පියවර ගත යුතුය. (ii) ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමටත් උපදේශන වියදම් අඩු කිරීමටත් කටයුතු කළ යුතුය.	ලැබේ.	පුද්ගලයින්ට යැපුම් දීමනා ගෙවීම කර තිබුණි.
(ඇ)	විදේශීය උපදේශන සමාගම විසින් අනුබද්ධ දේශීය සමාගම් 02ක් හරහා දේශීය සේවකයන් 161 දෙනෙකු බඳවාගෙන තිබූ අතර ඉන් 110 දෙනෙකු මේ වන විටත් සේවය කරමින් සිට තිබුණි. මෙම කාර්ය මණ්ඩලයට අමතරව කොළඹ ව්‍යාපෘති කාර්යාලයේ සේවය කරන 48 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සහ කොන්ත්‍රාත් ප්‍රදේශයන්හි පිහිටි වැඩබිම් කාර්යාලවල සේවය කරන 08 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් සඳහා කාලය මත	2023 2022	(i) උපදේශන පිරිවැය අවම වන ක්‍රමවේදයක් මුල සිටම සකස් නොකිරීමට අදාළ බලධාරීන් වගකිව යුතු බැවින් ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. (ii) ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමටත් උපදේශන වියදම් අඩු කිරීමටත් කටයුතු කළ යුතුය.	එකඟ වී නැත. 2023 ජුනි වන විට කොළඹ කාර්යාල කාර්ය මණ්ඩල සාමාජිකයින් 34 කට හා වැඩබිම් කාර්ය මණ්ඩල සාමාජිකයින් 117 දෙනෙකුට කාලය මත පදනම්ව ගෙවන ලදී.	කාර්ය මණ්ඩලය සඳහා කාලය මත පදනම්ව උපදේශන ගාස්තු ගෙවා තිබුණි

	පදනම්ව උපදේශන ගාස්තු ගෙවා තිබුණි.				
(ඉ)	ආසියානු සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ නිකුත් කළ බැංකුව සහ එහි ණයගන්නන් විසින් උපදේශකවරුන් යොදවා ගැනීමේ මඟ පෙන්වීම් අත්පොතෙහි අංක 1.11 (b) සහ (c) ඡේද වලට අනුව උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගන්නා සමාගම හෝ සමාගම් අදාළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙනත් කොන්ත්‍රාත් කලින් සිදුකර තිබේනම් උපදේශන කටයුතු සඳහා එම සමාගම් නැවත පත්කර නොගත යුතු අතර, ආසියානු සංවර්ධන බැංකුව සහ වාරිමාර්ග අමාත්‍යාංශය ආයතනවල සේවකයින් සමඟ පවුල් හා ව්‍යාපාරික සබඳතා ඇති පුද්ගලයන්ද උපදේශන කටයුතු සඳහා දායක කර නොගත යුතු වේ.කෙසේ වෙතත්, උතුරු මැද සහ වයඹ ඇළ සහ මිනිපේ ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘති 2015 වැඩසටහන සඳහා සැලසුම් නිර්මාණය, පාරිසරික තක්සේරු වාර්තා, ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ නවීකරණ වාර්තා සකස් කිරීම සඳහා Infotech IDEAS සමාගමට	2023	ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයන් ට පටහැනිව, උපදේශකයින් තෝරා ගැනීමේ මෙම අවිධිමත් ක්‍රම වහාම නතර කර ආසියානු සංවර්ධන බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.	මෙම පැවරුම් දෙක විවිධ කාල පරිච්ඡේද දෙකක සිදු කර ඇත, එබැවින් අන්‍යෝන්‍ය වශයෙන් බැහැර ඒවා ලෙස සැලකිය හැකිය. • උපදේශකයින් තෝරා ගැනීම අමාත්‍යාංශය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සිදු කර ඇත.	උපදේශක කොන්ත්‍රාත්තුව සඳහා නිර්මාණ සැලසුම් සකස් කර පාරිසරික ඇගයීම් සිදුකල උපදේශන සමාගම නැවත පත්කර පිළිගත් මාර්ගෝපදේශයන්ට පටහැනිව ගෙවීම් කර තිබුණි.

	මහවැලි උපදේශක කාර්යාංශය හරහා රු. මිලියන 102.98 ක මුදලක් ලැබී තිබුණි. තවද, මෙම වැඩසටහනේ ප්‍රධාන උපදේශකයා වූ ට්‍රැක්ටබල් සමාගමේ ශ්‍රී ලංකා නියෝජිත සමාගම ලෙස කටයුතු කර ඇති අතර, මෙම සමාගමේ ප්‍රධාන කාර්ය මණ්ඩලය ණය ගැනුම්කරුගේ වාරිමාර්ග අමාත්‍යාංශය සහ හා ඒ යටතේ ඇති ආයතන වල විශ්‍රාමලත් නිලධාරීන්ගෙන් සමන්විත විය.				
(ඍ)	අමානෝ තහඩු යොදා කොන්ත්‍රාත්කරුගේ උපදේශක සමාගමේ සහ උපදේශක සමාගමේ ආපන ශාලාව තාවකාලික කඳවුරු ලෙස ඉදිකිරීම වෙනුවෙන් පිළිවෙළින් රු.මිලියන 41.59ක් රු.මිලියන 18.32 ක් හා රු.මිලියන 7.4 ක් ගෙවා තිබුණු අතර, කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමෙන් පසු එම ගොඩනැගිලි ව්‍යාපෘතියට භාර දී තිබුණි. එහෙත්, කොන්ත්‍රාත්කරු භාවිතා කළ කඳවුරේ සවිකර තිබූ සියළුම වායු සමීකරණ යන්ත්‍ර ගලවා ඉවත් කර භාර දී තිබුණි.	2023	පවරාගෙන ඇති තාවකාලික ගොඩනැගිලි ස්වාධීන පාර්ශවයක් විසින් තක්සේරු කළ යුතු අතර වැඩිපුර ගෙවා ඇත්නම් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගත යුතුය.	කොන්ත්‍රාත්තුවේ වෙන්කිරීම් වලට අනුව ඉවත් කිරීමකදී කොන්ත්‍රාත්කරු විසින් ප්‍රතිසංස්කරණයේ කොටසක් ලෙස සවිකෘත සහ සවිකිරීම් සමඟ එවැනි සියලුම තාවකාලික පහසුකම් ඉවත් කළ යුතුය.	උපදේශක හා උපදේශක සමාගම් තාවකාලික ගොඩනැගිලි ස්වාධීන පාර්ශවයක් විසින් තක්සේරුකර භාර ගැනීමට හෝ ප්‍රදේශයේ අවශ්‍යතාවයකට යොදා ගැනීම කර නොතිබුණි.

7.2. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 2

2015 දී ආරම්භ කරන ලද මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - අදියර 2 ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3625-SRI යටතේ රු. මිලියන 28,239 ක ණය මුදලක් සහ ණය ගිවිසුම් අංක 3626-SRI යටතේ රු. මිලියන 4,891ක ණය මුදලක් ලබා දීමට දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 5,048 ක් විය. ව්‍යාපෘතිය 2025 ජූලි 25 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	552	548	2513
විදේශ අරමුදල්	10,064	30,938	21,930
මුළු වත්කම්	20,999	68,124	69,280
මුළු වගකීම්	3,129	2,379	2,582
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	16,143	63,581	39,168
දේශිය අරමුදල් මඟින්	1,617	2,165	6,588

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	උතුරු මැද පළාත් ඇල ඉදිකිරීම මඟින් මහකනදරාව ජලාශයට ජලය ලබාගෙන ඒ මඟින් රඹෑව, මැදවච්චිය ප්‍රදේශ වලට පානීය ජලය සැපයීම සඳහා රු.මිලියන 11,515ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ජපාන අන්තර් ජාතික සහයෝගිතා	2023	ප්‍රමුඛ කාර්යය හඳුනාගෙන ව්‍යාපෘතියේ නියමිත කාල සීමාව සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය.	එකඟ වේ.	උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නිම කර නොමැත.

	ආයතනයෙන් ලබාගත් ණය මුදලක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදවාගෙන අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර එහි වැඩ කටයුතු නිම වීමට ආසන්න මට්ටමක පැවතුණි. එසේ වුවද, උතුරු මැද පළාත් ඇල ව්‍යාපෘතිය නියමිත කාලය තුල ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතියේ ජලය මහකනදරාව ජලාශයට ලැබෙන තෙක් මෙම පානීය ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල නොහැකි මට්ටමක පැවතුණි.				
(ආ)	2025 වර්ෂයේ වැඩසටහන අවසන් වනවිට මොරගහකන්ද ජලාශයේ සිට කනදරා ඔය දක්වා කි.මී. 96 ක් දුරට ගමන් කරන උතුරු මැද පළාත් ඇළෙහි කි.මී. 27.7 ක් දිග උමං ඇල මාර්ගය පමණක් නිම කිරීමට මේවන විට සැලසුම් කර ඇත. මේ හේතුවෙන් කි.මී. 68.3ක් වූ ඉතිරි ඇල මාර්ගය ඉදිකර සමස්ථ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් විගණිත දිනය වන තුරු ඉදිරිපත් කර නොතිබුණි.	2023	ඉතිරි වැඩ සඳහා නිශ්චිත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු අතර නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතුය.	ඉතිරි කොන්ත්‍රාත් පැකේජ ප්‍රසම්පාදනය සඳහා සියලුම ලියකියවිලි සූදානම්ව පවතී. ඕනෑම අවස්ථාවක, අරමුදල් ප්‍රතිපාදන ලද පසු මේවා ප්‍රසම්පාදනය කර ප්‍රදානය කළ හැකිය. මූල්‍ය කටයුතු සංවිධානය කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විවිධ ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන සමඟ සාකච්ඡා පවත්වනු ලැබේ.	අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට නොහැකි වී ඇති අතර ඒ අනුව ඉතිරි වැඩ නිම කිරීමට නිශ්චිත සැලැස්මක් නොමැත.

(ඇ)	දේශීය කෘෂිකාර්මික බෝග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහවැලි කලාප 5ක හා හුරුළු වැව ප්‍රදේශවල ගොවීන්ට දෙමුහුම් මිරිස් බීජ දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා Poly Tunnel ඒකක 50ක් සපයා සවිකිරීමේ උප ව්‍යාපෘතියක් රු. මිලියන 91.57ක කොන්ත්‍රාත් වටිනාකමකට ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු Poly Tunnel සකස් කිරීම සම්බන්ධ පූර්ව පළපුරුද්ද රහිත වූ අතර 2018-2020 කාලය තුළ අලාභ ලබා 2021 වසරේ පමණක් ලාභයක් ලැබූ එනම් දුර්වල මූල්‍ය ශක්‍යතාවයක් සහිත සමාගමක් විය.ගිවිසුම අනුව 2023 මැයි 15 දිනට කාර්ය නිම කළයුතු වුවද 2024 මැයි 31 දක්වා අවස්ථා තුනකදී කාලය දීර්ඝ කර ගෙන 2024 අප්‍රේල් 30 දිනවන විටත් Poly Tunnel 42ක් පමණක් සවිකර තිබුණි.	2023	නිසි සැලැස්මක් ලබා ගැනීම සහ දීර්ඝ කරන ලද දිනය වන විට අදාළ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අධීක්ෂණය කිරීම කළ යුතු වේ.	අවසන් කිරීමේ නවතම කාලය (2024 මැයි 31) ඉක්මවා යන ඕනෑම ප්‍රමාදයක් කොන්ත්‍රාත්තුවට අනුව සලකනු ලැබේ.	සැලසුම් කළ පරිදි නිම කර නොමැත.
(ඈ)	වැඩසටහන යටතේ 2018 වර්ෂයේදී රු. මිලියන 7,146.91 ක වටිනාකමට පිරිනමා තිබූ කළුගහ - මොරගහකන්ද යා කරන උමං ඇළ මාර්ගය ඉදිකිරීමේ	2023 2022 2021	කොන්ත්‍රාත්තුව ප්‍රමාද වීමට හේතු සොයා බැලීමට ක්‍රියා කළ යුතු අතර සම්පූර්ණ කිරීමට සාධාරණ කාලයක් ලබා දිය යුතුය.	2024 අගෝස්තු 31 දක්වා තවත් දීර්ඝ කිරීමක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර ඇති අතර අමාත්‍ය	සැලසුම් කළ පරිදි නිම කර නොමැත.

	කොන්ත්‍රාත්තුවේ වැඩ කටයුතු 2021 සැප්තැම්බර් 10 දින නිමකල යුතු වුවත් නියමිත කාලය තුල නිම කිරීමට නොහැකි වීම නිසා 2023 දෙසැම්බර් 21 දක්වා දීර්ඝ කර තිබුණි.එසේ වුවද, එදිනට ඉදිකිරීම් ප්‍රගතිය සියයට 90 ක් වූ අතර, 2024 මැයි 31 දිනට කොන්ත්‍රාත්තුව නිම කිරීමට හැකි වෙතැයි ඇස්තමේන්තු කර තිබුණද 2023 දෙසැම්බර් 21 දිනෙන් පසු දින දීර්ඝයන් ලබා දී නොතිබුණි.			මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.	
(ඉ)	උතුරු මැද පළාත් ඇල ඉදිකිරීමේදී මින්නේරිය ගිරිතලේ ස්වාභාවික රක්ෂිතය, සීගිරිය අභය භූමිය, මින්නේරිය ජාතික උද්‍යානය හා හුරුළු වැව රක්ෂිතය තුළදී ඇළ ඉදිකිරීම පොළව ඇතුලතින් පමණක් Cut & Cover, double Conduit හෝ tunnel යන ක්‍රමවේද යොදාගෙන ඉදිකරන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය ඊට අනුකූලව කටයුතු නොකර තාක්ෂණික වශයෙන් යෝග්‍ය, ජාතික වශයෙන් ඵලදායී, පාරිසරික වශයෙන් අවම බලපෑම් වන ක්‍රමවේදය ලෙස	2023 2022	නිසි තාක්ෂණික හා ඵලදායී ක්‍රමවේද ක්‍රියාත්මක කළ යුතුය.	එකඟ නොවේ. NCPCP ඇල සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අවධීන් තුළදී, තාක්ෂණික වශයෙන් සුදුසු, ජාතික වශයෙන් ඵලදායී සහ පාරිසරික වශයෙන් අවම බලපෑමක් ඇති ක්‍රම සම්පූර්ණ කරමින් පාරිසරික බලපෑම් තක්සේරුවේ තත්ත්වයට ඉඩ සැලසීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇත. ඒ අනුව බොහෝ ප්‍රදේශ කැපුම් සහ ආවරණ ද්විත්ව නල මාර්ගයකින් සහ	තාක්ෂණික හා පිරිවැය වශයෙන් යෝග්‍ය ක්‍රමවේදය තෝරා ගෙන නොතිබුණි.

	දක්වමින් පිරිවැය අධික ක්‍රමයක් වූ උමං විදුම් යන්ත්‍ර 02 ක් යොදාගෙන කැණීම් කර උමඟ හරහා ජලය ගෙනයැමේ ක්‍රමවේදය තෝරා ගෙන තිබුණි.			උමං මාර්ගයකින් ආවරණය විය.	
(ඊ)	උපදේශන සමාගම විසින් උමං විදුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, වැඩබිම වෙත ප්‍රවාහණය කර සවි කිරීම සඳහා රු. මිලියන 7,255.40ක පිරිවැයක් ඇස්තමේන්තු කර තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා රු. මිලියන 6,690.97 ක මිලක් ඉදිරිපත් කර තිබුණු අතර යන්ත්‍ර 02 ආනයනය කිරීමේදී ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කර තිබූ ඉන්වොයිස් අනුව එම යන්ත්‍ර 02 හි CIF වටිනාකම් පිළිවෙළින් එජඩො. 10,581,673කට සමාන රු.මිලියන 2,147.97 ක් හා එජඩො. 9,476,342 කට සමාන රු.මිලියන 3,523.61 ක් වී තිබුණි. ඒ අනුව උපදේශක සමාගම විසින් ප්‍රමාණ පත්‍ර සකස් කිරීමේදී යන්ත්‍රයක වටිනාකම පිළිබඳ තහවුරුවක් ලබා නොගෙන මෙම අයිතමය සඳහා අධි ඇස්තමේන්තු සකස් කර තිබුණි.	2023	අදාළ සියලු මූලාශ්‍ර සහ සාධක සලකා බලා ඇස්තමේන්තු සකස් කර සමාලෝචනය කළ යුතුය.	ඇස්තමේන්තුගත අගය සහ CIF අගය සැසඳිය නොහැක. ඉංජිනේරු ඇස්තමේන්තුවේ වටිනාකම නිෂ්පාදනයේ අපේක්ෂිත CIF අගය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය හා සම්බන්ධ සියලුම බදු, හැසිරවීමේ ගාස්තු, වරායේ සිට වැඩ බිමට ප්‍රවාහනය, ස්ථාපනය එකලස් කිරීම, දියත් කිරීම සහ කොමිස් කිරීම + ලකුණු - දක්වා ආවරණය කරනු ලැබේ.	ඇස්තමේන්තු සකස් කිරීමේදී අදාල සියළු කරුණු සලකා බලා නොතිබුණි.

(උ)	01 වන උමං විදුම් යන්ත්‍රය චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු.මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමලය වරායෙන් නිකුත් කරන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන 2,155.97 ක් වී තිබුණි. ඒ අනුව ත්‍රිකුණාමලය සිට නාමල්පුර දක්වා යන්ත්‍රය ප්‍රවාහනය කර එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු. මිලියන 4,535ක විශාල මුදලක් එනම් මුළු පිරිවැයෙන් සියයට 68ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.	2023	පිරිවැය විමර්ශනය කර වැඩිපුර ගෙවීම් සිදුකර ඇත්නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	• මෙම කොන්ත්‍රාත්තුවේ තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇත. • කැබිනට් අනුමැතිය හරහා සාරානුකූලව ප්‍රතිචාර දක්වන අඩුම මිල දක්වන ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. • එක්වරක් අයිතම සඳහා උපුටා දක්වන ලද අනුපාතය (3.4.1.1) යනු ලංසුකරු විසින් සඳහන් කර ඇති තරඟකාරී මිලයි. • කොන්ත්‍රාත්තු වේ විධිවිධාන අනුව ගෙවීම් සිදු කර ඇත.	විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු ගැන සැලකිලිමත් වී නොතිබුණි.
(ඌ)	02 වන උමං විදුම් යන්ත්‍රයද චීනයේ සිට ආනයනය කර වැඩබිම වෙත ප්‍රවාහනය කර එය සවිකිරීම වෙනුවෙන් රු.මිලියන 6,690.97 ක සම්පූර්ණ මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවීමට එකඟව 2024 මාර්තු 15 වනවිට එයින්, රු. මිලියන 6,021.87 ගෙවා තිබුණි. උමං විදුම් යන්ත්‍රය ත්‍රිකුණාමල වරායෙන් නිකුත් කරන අවස්ථාව වන විට එහි පිරිවැය රු. මිලියන	2023	පිරිවැය විමර්ශනය කර වැඩිපුර ගෙවීම් සිදුකර ඇත්නම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉහත දී ඇති ප්‍රතිචාරය සලකා බැලිය යුතු වේ.	විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු ගැන සැලකිලිමත් වී නොතිබුණි.

	3,635.61 ක් වී තිබුණි. ඒ අනුව, ත්‍රිකුණාමලය සිට කෝඳුරුවාව දක්වා ප්‍රවාහනය කර යන්ත්‍රය එක්ලස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ ලාභය වෙනුවෙන් රු. මිලියන 3,055.36ක හෙවත් පිරිවැයෙන් සියයට 46ක් ගෙවා තිබීම විගණනයේදී මතභේදයට තුඩු දී තිබුණි.				
(එ)	කොන්ත්‍රාත්තුව පිරිනැමීමට වසර 2 ½ ක් ප්‍රමාද වීම නිසා කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය 2027 මාර්තු 10 දක්වා දීර්ඝ කර තිබුණු අතර ව්‍යාපෘතිය කඩිනම් කිරීම යටතේ 2025 ජූනි මාසයේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට Drill & Blasting ක්‍රමය යටතේ ඉදි කිරීමට නියමිතව තිබූ කි.මී. 10.4 ක් වූ දුර ඉදිකිරීම සඳහා 02 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට තීරණය කර තිබුණි. එහිදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර තිබූ තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් 02 වෙනි උමං විදුම් යන්ත්‍රයක් යෙදවීම නිර්දේශ කර නොතිබුණි. අනතුරුව අමාත්‍යාංශ ලේකම් විසින් විශේෂ තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත්කර තිබුණු අතර එම	2023 2022	මෙම මිලදී ගැනීම තාක්ෂණික ඇගයීම් කමිටු දෙකකින් නිර්දේශ නොකළ විට විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නිර්දේශ ලබාගෙන වැඩි මිලට මෙම උමං විදුම් යන්ත්‍රය ආනයනය කිරීමට කටයුතු කළ පාර්ශ්වයන් මීට වගකිව යුතු වේ. එබැවින් එම පාර්ශවයට විරුද්ධව ක්‍රියාමාර්ග ගත යුතු අතර මිලදී ගැනීම සම්බන්ධ සියලු කරුණු කැබිනට් මණ්ඩලයට දැනුම් දිය යුතුය.	• TBM යන්ත්‍ර 2ක් සමඟ සංශෝධිත කොන්ත්‍රාත් කාලය. (2025 ජුනි 8) • ස්වභාවයෙන්ම මෙම ව්‍යාපෘතියට සමාන වන උමා ඔය ව්‍යාපෘතියේ ජල ප්‍රවේශය පිළිබඳ අත්දැකීම් තවදුරටත් සමාලෝචනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය වසර 2½ ක් සඳහා තාවකාලිකව නතර කරන ලදී. ව්‍යාපෘතිය සඳහා ඉංජිනේරුවරයාගේ නිර්දේශය ඇතිව සහ ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ඇතිව දෙවන TBM යෙදවීමේ වාසි සලකා බැලීමෙන් අමාත්‍ය මණ්ඩලය විසින් අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ	විගණනය විසින් දක්වා ඇති පරිදි කටයුතු කර නොතිබුණි.

	කමිටුව විසින්ද යෝජනාවේ ශක්‍යතාවය සැක සහිත වන බවට හා කොන්ත්‍රාත්තුව සඳහා අමතර අරමුදල් ආයෝජනය කිරිම සාධාරණීකරණය කළ නොහැකි බවට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි. එම කමිටුවේ තීරණයද පිළිගැනීමට කටයුතු කර නොතිබූ අතර නැවත පත්කළ විශේෂ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් 2 වන උමං විදුම් යන්ත්‍රයක් යෙදවීමට නිර්දේශය ලබා ගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් 2021 ඔක්තෝම්බර් 14 වැනි දින ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවේ දී අමාත්‍ය මණ්ඩලය දැනුවත් කර නොතිබුණි.			මූල්‍යකරණය (MFF) ලබා ගත හැකි කාල සීමාව තුළ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ඉහළ අවධානයක් යොමු කෙරේ.	
(ඒ)	කාර්ය ඇස්තමේන්තුව අනුව කොන්ත්‍රාත්තුව අවසානයේදි විදුම් යන්ත්‍ර 2 ගලවා වරාය දක්වා ප්‍රවාහනය කිරිම වෙනුවෙන් රු. මිලියන 179.99 ක් ප්‍රමාණ පත්‍රයට ඇතුල් කර තිබුණි. එහිදී රු. මිලියන 13,381.94 ක් වටිනා යන්ත්‍ර 2 වෙනුවෙන් ගෙවූ පිරිවැයෙන් ප්‍රමාණවත් මුදලක් තක්සේරු කර නැවත ලබා ගැනීමට ගිවිසුම් මගින් එකග වී නොතිබූ අතර යන්ත්‍ර 2 කිසිදු අයකිරීමක් රහිතව මෙරටින් රැගෙන යාමට	2023	කොන්ත්‍රාත්තුව අවසානයේ යන්ත්‍ර 02 ප්‍රතිඅපනයනය කිරීමේදී එහි වටිනාකම තක්සේරු කර කොන්ත්‍රාත්කරුගෙන් සාධාරණ මුදලක් අය කළ යුතු අතර ඒ සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ අදාළ වගන්ති සංශෝධනය කළ යුතුය.	මෙම සියලු ක්‍රියා ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලංසු ලේඛනයේ සේවා යෝජකයාගේ අවශ්‍යතාවයට අනුකූල වේ.යන්ත්‍ර සඳහා ගෙවන ලද මුදල කොන්ත්‍රාත්තුවේ එකඟ වූ එක්වරක් සඳහා වන ගාස්තු වේ.	විගණනය විසින් දක්වා ඇති පරිදි කටයුතු කර නොතිබුණි.

එකඟ වී තිබුණි.

(ඔ)	ඇළ මාර්ගයේ 03 වන උමඟෙහි උමං විදුම් යන්ත්‍රයක් යොදාගෙන කැණීම් කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය මේ දක්වා අවසර ලබා දී නොතිබුණි. එසේ වුවද, දැනට වලංගුව පවතින කැණීම් බලපත්‍රය භාවිතයෙන් 1 වන උමං විදුම් යන්ත්‍රය යොදාගෙන එම උමඟෙහි කි.මී. 5.77 ක් දුරක් කැණීම් කර තිබුණි.	2023 2022	පතල් කැණීමේ බලපත්‍රය GSMB වෙතින් ලබාගත යුතුය.	පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවේ පවා GSMB වෙතින් බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාව සඳහන් කර නොමැත. ව්‍යාපෘතියේ රැස්වීම අතරතුර පවා GSMB හි නිලධාරීන් පැමිණ සිටියද ඔවුන් කිසිවෙක් එවැනි බලපත්‍රයක් අවශ්‍ය බව මතු කළේ නැත. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් GSMB වෙතින් අවශ්‍යතාවය පිළිබඳව ලිඛිතව විමසා තිබුණද මෙතෙක් පිළිතුරක් ලැබී නොමැත.	අදාල කැණීම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.
(ඕ)	උමං මාර්ගයේ දුර්වල පාෂාණ ඇති ස්ථාන වලට කොන්ක්‍රීට් වළලු (Ring) යෙදීම සඳහා එම වළලු සකස් කිරීමට රු. මිලියන 2,892.3 ක්, වළලු සකස් කිරීමේ කම්හලක් හා ගබඩාවක් ඉදිකිරීමට පිළිවෙළින් රු.මිලියන 928.72 ක් හා රු. මිලියන 149.82 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව මෙම කම්හලේ නිෂ්පාදනය කර 2024 ජනවාරි 31 දිනට උමං මාර්ගයේ සවිකරන ලද කොන්ක්‍රීට් වළලු 2,967 න් වළලු	2023	මෙම ගැටළුව නිවැරදි කිරීමට පියවර ගත යුතුය.	මෙහි දක්වා ඇති අගයන් අදාළ BOQ අයිතම සමඟ හෝ හඳුනාගත් ඉරිතැලීම් පිළිබඳ අඩවි වාර්තා සමඟ නොසැසඳෙන නමුත්, එම සිද්ධිය සිදු වූ ලෙස පිළිගනු ලැබේ. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ඉංජිනේරු සහ කොන්ත්‍රාත්කරුගේ විශේෂඥයින් හේතු සහ නිවැරදි කිරීමේ ක්‍රම හඳුනාගැනීමේ නිරත වී ඇත. සේවායෝජකයා ද සිදුවෙමින් පවතින	කොන්ක්‍රීට් වළලු පුපුරා ඉරිතැලීම් පිළිබඳ පිළියම් යොදා නොමැත.

	1,298 ක් එනම් සියයට 44 ක් විවිධ ස්ථාන වලින් පුපුරා තිබුණු බවට හඳුනාගෙන තිබුණි.			පිළියම් යෙදීම් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කර ඇත.	
(ක)	කි.මී. 27.7 දිග උමං ඇල මාර්ගය කැණීම් කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 21 ක් විය. කොන්ත්‍රාත්තුවේ සිදුවන මිල විචලන සඳහා ගෙවීමට රු. මිලියන 3,001.79 ක් වෙන් කර තිබුණත් 2023 ජූනි 30 වන විටත් එයින් රු. මිලියන 5,131.24 ක් වැය කර තිබුණි. ඒ අනුව කැබිනට් අමාත්‍යවරුන්ගේ අනුමැතියකින් තොරව රු.මිලියන 2,129.45ක් වැඩියෙන් ගෙවා තිබුණි.	2023	අතිරේක ගෙවීම් සඳහා කැබිනට් අනුමැතිය ලබාගත යුතුය.	සාමාන්‍ය පිළිවෙත වන්නේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් කලින් අනුමත කරන ලද පිළිගත් කොන්ත්‍රාත් මිල ඉක්මවන විට මුළු වියදම සටහන් වූ පසු කොන්ත්‍රාත් මිල සංශෝධනය කිරීමයි. තවමත් මෙම කොන්ත්‍රාත්තුවේ එම තත්ත්වය ඇතිවී නොමැත.	මිල විචලන සඳහා ගෙවීමට අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ග)	වැඩසටහන යටතේ 2022 වර්ෂයේ මිලදී ගත් පොහොර තොගයක් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින පොහොර සමාගම් 02 කට භාරදීමේදී රු.මිලියන 55.23 ක් වටිනා පොහොර මෙට්‍රික් ටොන් 161.5 (බෑග් 3,230) ක ඌණතාවයක් ඇති වී තිබුණි.	2023 2022	අලාභය අදාළ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර අලාභය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය.	මෙම ගැටළුව පිළිබඳව සොයා බැලීමේ කටයුතු ආරම්භ කර ඇත.මෙම තොරතුරු 2024 වන විට මූල්‍ය ප්‍රකාශනවල "සටහන" ලෙස හෙළිදරව් කෙරේ.	පොහොර ඌණතාවය සම්බන්ධ ගැටළුව නිරාකරණය කර නොමැත.
(ච)	2018 සිට 2023 දක්වා කාලසීමාව සඳහා වෙන් කරන ලද අරමුදල් ඌන උපයෝජනය කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට	2023 2022	නොසැලකිලිමත්කම සඳහා හේතු සොයා බැලීම සහ සැලැස්ම අනුව ක්‍රියාකාරකම් සිදු කළ යුතුය.	විවිධ හේතු නිසා ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.	සැලසුම් නොකළ ව්‍යාපෘතියේ බැඳීම් ගාස්තු පිළිබඳ සොයා බලා නොතිබුණි.

	ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 229.23 ක බැඳීම් ගාස්තුව ගෙවා ඇත.				
(ජ)	වයඹ පළාත් මහ ඇළ ව්‍යාපෘතිය යටතේ මහකිතුල ආදාන උමග, මහකිතුල සහ මහකිරුළ ජලාශ සහ පෝෂක ඇල මහකිරුළ ජලාශ ඉදිකිරීම සඳහා රු. මිලියන 9,978 ක පිරිවැයකින් 2024 වන විට නිම කිරීම සඳහා විදේශීය සමාගමකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, වසර 2 ක කාලය තුළ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 2.97 ක වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි මීට ප්‍රධාන වශයෙන් නිසි කාර්ය මණ්ඩලයක් නොමැතිකම, ප්‍රමාණවත් ඉදිකිරීම් උපකරණ නොමැතිකම සහ දුර්වල වැඩබිම් කළමනාකරණය හේතු වී තිබුණි. මෙම අසතුටුදායක තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කරමින් තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුට දැනටමත් රු. මිලියන 1,197 ක් සහ නිම කරන ලද වැඩ සඳහා රු. මිලියන 355 ක් ගෙවීම් කර තිබුණි.	2022 2021	i) ආසියානු සංවර්ධන බැංකුවේ මාර්ගෝපදේශයට අනුව නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම (ii) කොන්ත්‍රාත්කරු අසාදු ලේඛණ ගත කළ යුතුය (iii) කාර්ය සාධන සහතික සඳහා රුපියල් මිලියන 459.18 ක් සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 3.021 ක් අය කළ යුතුය.	කොන්ත්‍රාත්තුව 2023 මැයි 11 දින අවසන් කරන ලදී. අත්තිකාරම් ගෙවීම සම්පූර්ණයෙන්ම අයකරගෙන ඇත.	නව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.

(ට)	කොටස 03 සම්බන්ධයෙන්, සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් පැකේජ 09 න් කොන්ත්‍රාත් පැකේජ 6 ක් සඳහා කොන්ත්‍රාත්කරුවෙකු රු. මිලියන 1.7 ක මුදලකට 2 කොටස යටතේ ලැබී තිබූ ප්‍රතිපාදනවලින් තෝරාගෙන තිබුණි. කෙසේ වෙතත්, 3 වන කොටස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ණය ප්‍රතිපාදන ලබා දී නොතිබූ බැවින් කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර ප්‍රසම්පාදන කටයුතු සඳහා 2 වන කොටස යටතේ දරන ලද වියදම් යොදා ගැනීමට හේතු වී තිබුණි.	2022 2021	මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව 3 වැනි කොටසේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය ආරම්භ කළ නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	2021-2022 කාලසීමාව තුළ රට තුළ පැවති වසංගත තත්ත්වයන්, 3 වන කොටස යටතේ අවශ්‍ය මුදල් සහ අතිරේක අරමුදල් අපේක්ෂා කළ පරිදි නොලැබීම හේතුවෙන් එම තත්ත්වය අපට පාලනය කළ නොහැකි විය. එබැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දරන ලද පිරිවැය නිෂ්ක්‍රීය වීම වැළැක්විය නොහැකි විය.	අවශ්‍ය ණය ප්‍රතිපාදන ලැබී නොමැත.
(ඩ)	2019-2020 තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ සමෝධානික ජල සම්පත් කළමණාකරණ ව්‍යාපෘතියේ උපදේශන සේවා 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබූ අතර, එම ව්‍යාපෘතිය 2021 ක්‍රියාකාරි සැලැස්මටද ඇතුලත් කර නොතිබුණි.	2021	ප්‍රමාදයකින් තොරව අදාල කාල සීමාව අනුව උපදේශන සේවා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කල යුතුය.	සම්බන්ධිත පාර්ශව හා ණය ලබා දෙන ආයතනය සමඟ පැවති සාකච්ඡා වට කිහිපයකින් පසුව කෙටුම්පත් නිර්ණායක පරිශීලනය මේ වන විට අවසන් කර ඇති අතර, 2022 වර්ෂය අවසානයේදී ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. අධ්‍යනය 2024 වර්ෂය අවසානයේදී සම්පූර්ණ කරනු ඇත.	ව්‍යාපෘතියේ උපදේශන සේවා ක්‍රියාත්මක කර නොතිබුණි.

7.3 ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය

2021 දී ආරම්භ කරන ලද ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම් අංක 6621-LK සහ ණය ගිවිසුම් අංක 6619-LK යටතේ රු. මිලියන 13,159 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 145 ක් විය. ව්‍යාපෘතිය 2025 ඔක්තෝබර් 31දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2022 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	4	2	1
විදේශ අරමුදල්	305	489	2,453
මුළු වත්කම්	**688**	**3,480**	**5,395**
මුළු වගකීම්	**1**	**28**	**142**
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	305	872	3,332
දේශීය අරමුදල් මඟින්	4	6	7

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අම්පාර සේනානායක සමුද්‍රය බැම්මට රිප්-රැප් (Rip-Rap) ආරක්ෂාව සහ බැම්ම පාර වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 532.85 (බදු හැර) වටිනාකමින් යුත් කොන්ත්‍රාත්තුවක් 2022 දෙසැම්බර් 28 දින	2023	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය මත හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක්	2023 ජුලි 7 වන දින අම්පාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් මෙම ස්ථානය පරීක්ෂා කළ විට, තත්ත්ව පරීක්ෂණ වාර්තා නිකුත් කරන තුරු වේල්ල මත ගොඩගසා තිබූ අංක 5 දරන පෙරහන් ස්ථරයේ ද්‍රව්‍ය	ප්‍රමිතියෙන් තොර කළුගල් භාවිතය අනාවරණය කර ඒවා ඉවත්කර නියමිත ප්‍රමිතියට අනුකූල බව තහවුරු වන ප්‍රායෝගික වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.

	ප්‍රදානය කරන තිබුණි.රිප්-රැප් (Rip-Rap) සකස් කිරීමේදී ප්‍රමිතියෙන් බාල කළුගල් භාවිතා කර ඇති බවත් එහි මතුපිට උසස් තත්ත්වයේ කළුගල් යොදන බවත් මාධ්‍යවල ප්‍රචාරය වී තිබුණි.මේ සම්බන්ධයෙන් ව්‍යාපෘතිය මගින් විමර්ශනයක් සිදු කර ඇති අතර එහිදී රිප්-රැප්(Rip-Rap) සකස් කිරීම සඳහා වැඩබිමට ප්‍රවාහනය කර තිබූ කළුගල් වර්ග දෙකක කියුබ් 282ක් ප්‍රමිතියෙන් තොර බව අනාවරණය වී ඒවා වැඩබිමෙන් ඉවත් කරන ලෙස කොන්ත්‍රාත්කරුට දන්වා තිබූ අතර රිප්-රැප් සඳහා භාවිතා කරන ලද ප්‍රමිතියෙන් තොර ගල් ඉවත් කර නැවත අලුත්වැඩියා කිරීමට පියවර ගෙන තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් සඳහා ඇතැම් ස්ථානවල ප්‍රමිතියෙන් තොර කළුගල් භාවිත කර ඇති බව වාරිමාර්ග නිලධාරීන් හඳුනාගෙන තිබුණි.		ක්‍රියාත්මක කළ යුතුය.	නොතබන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී.	
(ආ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අරාවත්ත වැව් බැම්ම වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 40.02 ක බදු රහිත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබූ අතර	2023 2022	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය සඳහා හොඳ සහ	මිල අනපේක්ෂිත තත්ත්වයන් සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවූ බැවින් වාරිමාර්ග අමාත්‍යාශයේ ලේකම් විසින්	කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සහ මිල වෙනස්වීම් ඇගයීමටත් ඒ සඳහා කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක්

	කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මෙම කොන්ත්‍රාත්තුව 2024 අප්‍රේල් 30 දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කරන ලද අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 84 ක් විය. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම හේතුවෙන් මිල වෙනස්වීම් සඳහා රු.මිලියන 19.71 ක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.		කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.	අතිරේක රු.මිලියන 21.58 ක් අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දැනට සංශෝධිත ඇස්තමේන්තුව රු. මිලියන 61.60 ක් වන අතර, ඒ අනුව ගෙවීම් සිදු කර තිබුණි.	ක්‍රියාත්මක කර නොතිබුණි.
(ඇ)	මහවැලි අධිකාරියට අයත් පොල්ගොල්ල සහ උඩවලව ජලාශ සඳහා ස්ථිර බර ඉසිලීමේ යන්ත්‍ර දෙකක් සවි කිරීම සඳහා රු.මිලියන 805ක් වෙන් කර තිබුණි.මේ සඳහා ටෙන්ඩරය කැඳවා මාස හතකට පසු, 2022 අප්‍රේල් 8 වන දින, රු.මිලියන 797.61 ක කොන්ත්‍රාත්තු දෙකක් ඉදිරිපත් කර තිබුණි.කෙසේ වෙතත්, රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ආනයනික අමුද්‍රව්‍ය සඳහා වැඩි පිරිවැයක් දැරීමට හේතු වූ නිසා කොන්ත්‍රාත්කරු කලින් ලබා දුන් මිලට කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීමට අකමැති වී තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු රු.මිලියන 1,248.37	2023 2022	ව්‍යාපෘතියක් යෝජනා කිරීමට පෙර යෝජනාවේ ප්‍රමුඛතාවය ඉතා හොඳින් සලකා බැලිය යුතුය.	රටේ පවතින විදේශ විනිමය හිඟය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු ඇමෙරිකානු ඩොලර්වලින් ගෙවන ලෙස ඉල්ලා සිටින ලදි.IWWRMP ව්‍යාපෘතිය හරහා ලෝක බැංකු අනුමැතියට යටත්ව මේ සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කරන ලදි. උග්‍ර රුපියල අවප්‍රමාණය වීම නිසා, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) දර්ශක මත පදනම්ව මිල	ව්‍යාපෘති දෙකෙහි භෞතික ප්‍රගතිය සියයට 95 ඉක්මවා ඇතිබව සඳහන් කර ඇතත් ව්‍යාපෘති ප්‍රමුඛතාවය ,සක්‍යතාව, අරමුදල් වල ප්‍රමාණාත්මතාව යනාදී කරුණු ඔස්සේ විශ්ලේෂණය සිදු කර නොතිබුණි.

	කට ව්‍යාපෘතිය නිම කිරීමට එකඟ වී තිබුණි . එහි ප්‍රතිඵලයක් ලෙස පෙර මිලට වඩා රු.මිලියන 450.76ක් වැඩිපුර ගෙවීමට එකඟ වී තිබුණි. 2023 වසර අවසන් වන විට උඩවලව ජලාශයේ බර ඉසිලීමේ යන්ත්‍රයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 33ක් වූ අතර පොල්ගොල්ල ජලාශයේ ඉදිකිරීම් ප්‍රගතිය සියයට 37ක් වි තිබුණි.			අවිනිශ්චිතතාවයන් ගණනය කරන ලදී. ඩොලර් සංරචකය සඳහා සියයට 10 ක අවිනිශ්චිතතාවයක් වෙන් කර ඇති අතර, මෙම මිල අවිනිශ්චිතතාවයන් සඳහා ගිවිසුම් සකස් කරන ලදී.	
(ඇ)	2022 වර්ෂයේදී කොත්මලේ සහ රන්දෙණිගල ජලාශ වේලිවල චලනයන් නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය භූමිතික (geodetic) මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා එජඩො 1,749,791.18 (රු.මිලියන 629.92) ක මුදලකට විදේශීය සමාගමකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. කොන්ත්‍රාත්තුව මාස 11 කට පසු මිල කැඳවා ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරු මුල් මිලට කොන්ත්‍රාත්තුව පිළිනොගත් නිසා 2023 පෙබරවාරි 24 දින මහවැලි අධිකාරිය විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණ අතර එම වසරේ ද කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර නොතිබුණි.	2023 2022	හැකි ඉක්මනින් ලෝක බැංකු මාර්ගෝපදේශයන් ට අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම කල යුතුවේ.	කොත්මලේ සහ රන්දෙණිගල ජලාශ වේල්ල නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය භූමිතික (geodetic) මිනුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ලංසු කැඳවන ලදි.කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු 8 වන දින එජඩො 1,749,791.18 ක වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග හේතුවෙන් කොන්ත්‍රාත්කරු එකඟ වූ මිල ගණන් යටතේ ඉදිරියට යාමට කැමැත්තක් දැක්වා නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස 2023 පෙබරවාරි 24 දින කොන්ත්‍රාත්තුව	ලෝක බැංකු මාර්ගෝපදේශයන් ට අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීම කර නොතිබුණි.

				අවලංගු කර තිබුණි.	
(ඉ)	අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව, ව්‍යාපෘතිය සඳහා මුලින් වෙන් කරන ලද එජඩො මිලියන 10 (රු.මිලියන 3,000) මහවැලි, උතුරු සහ නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා වැය කර තිබුණි.මෙම වැඩසටහන යටතේ රු.මිලියන 2,235 ක් වටිනා වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘති 659 ක් ලෝක බැංකුව විසින් අනුමත කරන ලද නමුත් ව්‍යාපෘති 493 ක කටයුතු පමණක් ආරම්භ කර තිබුණි.	2023	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් සිදු කරනු ලබන ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය මත හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.	ඇ.ඩො. මිලියන 10ක් යොදා ගනිමින් ප්‍රජා මූලික සංවිධාන විසින් සිදු කිරීමට නියමිත ව්‍යාපෘති 861ක් සඳහා රු.මිලියන 29.50ක් ලෝක බැංකුව විසින් අනුමත කර තිබුණි.ඊට අමතරව, බල ගිණුම් ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති 12 ක්, සාප්පු ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති 10 ක් සහ ජාතික තරඟකාරී ලංසු තැබීමේ ක්‍රමවේදය යටතේ ව්‍යාපෘති 9 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ප්‍රදානය කරන ලද ව්‍යාපෘති අතරින් 685ක් ආරම්භ කර තිබූ අතර, රු.මිලියන 1,200ක ගෙවීම් දැනටමත් සිදු කර ඇති අතර, මේ දක්වා ව්‍යාපෘති 300ක් අවසන් කර තිබුණි.	ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය සහ පරීක්ෂණය සඳහා හොඳ සහ කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.
(ඊ)	කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල සහ රන්ටැඹේ ජලාශ ඇතුළුව වර්ග කිලෝමීටර් 3,100ක් ආවරණය වන ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශ සඳහා ජල සම්පත්	2023	පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඇතුළුව, බාහිරින් ලබා ගැනීමේ තීරණ සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කළ යුතු වේ. එය සැලකිය යුතු වටිනාකමක් ගෙන	අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අතිරේක ලේකම් (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව) වෙත යවන ලද සටහනේ දැක්වෙන පරිදි ඉහළ මහවැලි	පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයක් ඇතුළුව, බාහිරින් ලබා ගැනීමේ තීරණ සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කර අභ්‍යන්තරව සංවර්ධනය කළ නොහැකි විශේෂිත

කළමනාකරණ සැලැස්මක් සැකසීම සඳහා ජාත්‍යන්තර ජල කළමනාකරණ ආයතනයට සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 221.99ක කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.මෙම ව්‍යාපෘතිය සඳහා වාර්තා සකස් කිරීමට මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධ වී තිබුණි. කෙසේ වෙතත්, එම ආයතනවල කාර්ය මණ්ඩලය විසින් නිම කිරීමට නියමිතව තිබූ මෙම කාර්යයන් සැලකිය යුතු පිරිවැයක් යටතේ බාහිර පාර්ශ්වයකට පවරා තිබුණි.	එන විට හෝ සාධාරණ කාල රාමුවක් තුළ අභ්‍යන්තරව සංවර්ධනය කළ නොහැකි විශේෂිත විශේෂඥතාවක් අවශ්‍ය වූ විට පමණක් බාහිරින් ලබා ගැනීම කළ යුතුය .	ජල පෝෂක ප්‍රදේශ සඳහා මෙවැනිම ජල සම්පත් කළමනාකරණ සැලැස්මක් මෙම ආයතන විසින් මෙම අවස්ථාවට පෙර සකස් කර තිබුණේද යන්න විමසා බලා තිබුණි. ඉහත සඳහන් ආයතන මීට පෙර මෙවැනි ජල සම්පත් කළමනාකරණ සැලසුම් සකස් කර නොමැති බවත් ඒ සම්බන්ධයෙන් ඔවුන්ට පූර්ව අත්දැකීම් නොමැති බවත් වාර්තා වී තිබුණි.	විශේෂඥතාවක් අවශ්‍ය වූ විට පමණක් බාහිරින් ලබා ගැනීම කළ යුතුය.

7.4 දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය

2021 සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කරන ලද දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන් ප්‍රවේශ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර බැංකුව ණය ගිවිසුම් අංක 8996 යටතේ රු. 27,600 මිලියන ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 300 ක් විය. ව්‍යාපෘතිය 2026 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2022 සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්		
විදේශ අරමුදල්		
මුළු වත්කම්	381	1,560
මුළු වගකීම්	214	753
මුළු අරමුදල්		
විදේශ ණය මඟින්		
දේශීය අරමුදල් මඟින්		

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් අය කරන ලද කැපකිරීම් ගාස්තු (Commitment Charges) රුපියල් මිලියන 72 ක් සහ ණය පොලිය (Loan Interest) රු.මිලියන 33 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එහි	2023	කැපකිරීම් ගාස්තු(Commitment Charges) සහ ණය පොලී (Loan Interest) ව්‍යාපෘති වියදම් ලෙස ගණන් ගත යුතුය.	ඉදිරියේ දී නිවැරදි කිරීම සඳහා අදාල නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී තිබුණි.	කැපකිරීම් ගාස්තු(Commitment Charges) සහ ණය පොලී (Loan Interest) ව්‍යාපෘති වියදම් ලෙස ගෙන නොතිබුණි.

	ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ව්‍යාපෘති වියදම රු. මිලියන 105 ක් අඩුවෙන් දක්වා තිබුණි.				
(ආ)	8996 LK දරණ ණය ගිවිසුමේ උපලේඛණ 2 හි 1වන වගන්තිය අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දින සිට මාස තුනකට නොඅඩු කාලයක් තුළ ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් (National Project Oversight Committee) ව්‍යාපෘතිය විසින් ස්ථාපිත කළ යුතු වුවද ව්‍යාපෘතිය 2021 ඔක්තෝබර් 12 දින ආරම්භ කර තිබුණද,ඉහත අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි.	2022 2023	ණය ගිවිසුමේ කොන්දේසි අනුව ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව (National Project Oversight Committee) ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය.	ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව (National Project Oversight Committee) ව්‍යාපෘතිය විසින් මේ වන විට ස්ථාපිත කරීමට කටයුතු කර තිබුණි.	ජාතික ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව (National Project Oversight Committee) ස්ථාපිත කර තිබුණද කිසිදු රැස්වීමක් පවත්වා නොතිබුණි.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ මූල්‍ය කාර්ය සාධනය රු. මිලියන 601.2ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක් වන වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ව්‍යාපෘතියේ 5 වැනි සංරචකය යටතේ ලබාදී ඇති රු.මිලියන 97.19 ක් වන අත්තිකාරම් මුදලක් ඊට ඇතුළත් කර තිබුණි.	2023	අදාළ කාලසීමාව තුළ අදාළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමටත්, අත්තිකාරම් කඩිනමින් පියවීමටත් අවශ්‍ය පියවර ගත යුතුය.	දිස්ත්‍රික් වාරිමාර්ග කාර්යාල වෙත අවශ්‍ය උපදෙස් හා අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් වැලැක්වීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි.	ව්‍යාපෘතියේ මූල්‍ය කාර්ය සාධනය ගණනයේදී අත්තිකාරම් මුදල් ඇතුළත් නොකල යුතුය.

(ඈ)	ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයට වාර්ෂික ඇස්තමේන්තුව යටතේ රුපියල් මිලියන 2,025ක් වෙන් කර තිබුණද, මිලියන 601.2 (29.69%) ක් පමණක් භාවිතා කර තිබුණි. සැලසුම් කළ කාලසීමාව තුළ සැලසුම් කර ඇති කටයුතු ඉටු කිරීම සඳහා නිසි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් සියයට 70.31 ක ප්‍රතිශතයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.	2022 2023	සැලසුම් කර ඇති පරිදි එක් එක් සංරචක යටතේ සියලුම ක්‍රියාකාරකම් අවසන් කිරීමටත්, නියමිත කාලසීමාව තුළ අරමුදල් නිසි ලෙස භාවිතා කිරීමටත් ක්‍රියා කළ යුතුය.	ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාල නිලධාරීන්ට ලබා දී තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රගතිය සතිපතා ලෝක බැංකු නියෝජිතයින් සමඟ සමාලෝචනය කර තිබුණි.	සැලසුම් කළ කාලසීමාව තුළ සැලසුම් කර ඇති කටයුතු ඉටු කිරීම කල යුතුය.
(ඉ)	වසර 5ක කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇ. ඩොලර් මිලියන 92 ක් වෙන් කර තිබුණද, ව්‍යාපෘතිය සඳහා පසුගිය වසර දෙක තුළ භාවිත කර ඇත්තේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.23ක් නොහොත් එම ප්‍රතිපාදනයේ සියයට 2.5 පමණි.	2023	ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාල නිලධාරීන්ට ලබා දී තිබුණි.ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රගතිය සතිපතා සමාලෝචනය කර තිබුණි.	අදාල ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වෙන් කල ප්‍රතිපාදන උපරිම ලෙස භාවිතා කල යුතුය.
(ඊ)	2023 දෙසැම්බර් 31 දිනට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුවෙන් (IBRD) ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1,364ක මුදලක් ලැබී තිබුණද,රු. මිලියන 676 ක් පමණක් වර්ෂය තුළ වියදම් කර තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස රු.මිලියන 784 ක	2022 2023	ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ලබා දෙන අරමුදල් ආර්ථික වශයෙන් ව්‍යාපෘතියේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා යෙදවීමට යොමු කළ යුතුය	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අරමුදල් ආර්ථික වශයෙන් ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා යෙදවීය යුතුය.

මුදලක් මාස 7ක් තිස්සේ භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව ගිණුමේ තැන්පත් කර තිබුණි.

7.5 දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP)

2017 ජූලි 1 දී ආරම්භ කරන ලද ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) 2016 අගෝස්තු 05 දින එළඹි ප්‍රදාන ගිවිසුම යටතේ රු. මිලියන 5,499.71 ක මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2021.74 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා 1 ක් දින දීර්ඝ කර 2024 දෙසැම්බර් 28 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2022 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් මතය ව්‍යාවනය කර තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	702	387	365
විදේශ අරමුදල්	901	872	2,030
මුළු වත්කම්	2,251	2,997	5,268
මුළු වගකීම්	33	42	51
මුළු අරමුදල්			
විදේශ ප්‍රදාන මඟින්	358	2,864	1,455
දේශීය අරමුදල් මඟින්	800	400	625

මතය ව්‍යාවනය කර ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	හරිත දේශගුණික අරමුදල පසුගිය වසර 07 තුළ රු. මිලියන 8,106 කට සමාන එ.ජ.ඩො. මිලියන 34.44 ක් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත ලබා දී	2021 2022 2023	අරමුදල් සපයන නියෝජිතායතනය අරමුදල් මහබැංකුව හරහා යොමු කර ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා යොදවා ගිණුම්ගත කළ යුතුය	මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතීතන ආයතනය ලෙස ක්‍රියාකරන UNDP ආයතනය වෙත මුදල් අමාත්‍යාංශය විසින් කරන ලද දැනුම් දීමකට අනුව	නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

තිබුණද, 2023 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 3,198.12 කට සමාන එ.ජ.ඩො. මිලියන 12.99 ක් පමණක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබූ අතර රු.මිලියන 3,198.12 කට සමාන එ.ජ.ඩො. මිලියන 14.91 ක මුදල ව්‍යාපෘතියේ කටයුතු කිහිපයක් සිදුකිරීම සඳහා UNDP විසින් වැය කර තිබුණි. ඉතිරි රු. මිලියන 1,618 කට සමාන එ.ජ.ඩො. මිලියන 6.55 ක් UNDP විසින් රඳවා ගෙන තිබුණි.

ඒ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි සම්පූර්ණ විසර්ජනයෙන් සියයට 30 ක් නියෝජනය වන ක්‍රියාත්මක කරවීමේ ආයතනය වූ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MMDE) වෙත ලබා දී තිබූ මුදල සඳහා පමණක් වන බැවින්, සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය එමගින් පිළිබිඹු වී නොතිබුණි.ඒ අනුව විගණන කටයුතු (MMDE) විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් වෙත පමණක් සීමා විය.

ව්‍යාපෘතිය සඳහා GCF (හරිත දේශගුණික අරමුදල) වෙතින් ලැබෙන සියලු මුදල් මහභාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල යුතු බව දන්වා තිබුණි. ඒඅනුව 2023 වර්ෂයේ සිට එසේ GCF වෙතින් ලැබෙන මුදල් සියයට 90 ක් පමණක් මහභාණ්ඩාගාරය වෙත ලබාදීමට කටයුතු කර තිබුණි.

(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා ශේෂ පිරික්සුමේ සමුච්චිත අරමුදල් ලෙස රු.මිලියන 66 ක හඳුනා නොගත් ණය ශේෂයක් පෙන්වා තිබුණද,එවැනි ශේෂයක් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.	2022 2023	මූල්‍ය ප්‍රකාශන වල සියළුම කරුණු හෙළිදරව් කිරීමට කටයුතු කල යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.
(ඇ)	රු.මිලියන 63.60 කට සමාන එ.ජ.ඩො. 203,602.80 ක් වන ලැබුණු බැඳීම් ගාස්තු හා හිඟ අත්තිකාරම් සම්බන්ධ වගකීම් UNDP විසින් ඉදිරිපත් කළ ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තා තුළ ඇතුළත්ව තිබුණි. කෙසේ වෙතත්,එම ගාස්තු සහ හිඟ අත්තිකාරම් ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022 2023	සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.
(ඇ)	ව්‍යාපෘති ලේඛනයේ 7 කොටසේ 69 වන වගන්තිය අනුව ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව (CDR) වාරිමාර්ග අමාත්‍යාංශයේ (ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ) ලේකම් විසින් අනුමත කළ යුතුය.කෙසේ වුවද, 2017 සිට 2023 දක්වා කාලය තුළ ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කිරීමේදී ලේකම්වරයා විසින් සහතික කර තිබුණේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළ	2021 2022 2023	වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කළ යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	UNDP ආයතනය දරණු ලබන වියදම් ගිණුම් වාර්තා වල ඇතුලත් නොවීම හා ඒ අනුව එම මුදල් වාර්ෂික භාණ්ඩාගාර ඇස්තමේන්තු වලද ඇතුලත් නොවීම යන කරුණු හේතුවෙන් ඒසඳහා අත්සන් කිරීමට ලේකම්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

	එ.ජ.ඩො. 17,657,672.68 ක වියදම පමණි.				
(ඉ)	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත හරිත දේශගුණික අරමුදලෙන් රු.මිලියන 3,074 (ඇමරිකානු ඩොලර් මිලියන 12.98) ක් ද ශ්‍රී ලංකා රජයෙන් රු.මිලියන 2,141.95(ඇමරිකානු ඩොලර් මිලියන 8.84) ක් ද 2023 න් අවසන් වර්ෂය තෙක් ලැබී තිබුණි. අරමුදල් ක්‍රියාකාරකම් ගිවිසුමෙහි (FAA) අරමුදල් යෝජනාවේ B කොටසට අනුව, ශ්‍රී ලංකා රජයේ දායකත්වය සියයට 27 ක් වන අතර හරිත දේශගුණික අරමුදලේ දායතත්වය ව්‍යාපෘතියේ මුළු අයවැයෙන් සියයට 73 කි. ව්‍යාපෘතිය සඳහා GCF වෙතින් රුපියල් මිලියන 3,074ක් ලැබී තිබුණද එය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 59ක් පමණි. ඒ අනුව 2017-2023 කාලය තුළ ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 36.6 ට සමාන රුපියල් මිලියන 1,789 ක් ශ්‍රී ලංකා රජයට දැරීමට සිදු වී තිබුණි.	2022 2023	කොන්දේසි අනුව ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය වෙත ලැබෙන මුදල පදනම් කරගෙන රජයේ දායකත්වය නිදහස් කළ යුතුය.	කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.
(ඊ)	අරමුදල් ක්‍රියාකාරකම් ගිවිසුමෙහි (FAA) 2.01 වගන්තිය අනුව ප්‍රතීතනය ලත් ආයතනය	2022 2023	ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය	2022 ජුනි 17 දින 2017 වර්ෂයේ සිට මේ දක්වා UNDP විසින් දරා ඇති	නිර්දේශයේ සඳහන් කරුණු මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත.

(UNDP) "විධායක ආයතනය විසින් අරමුදල් සපයන ක්‍රියාකරකම් ක්‍රියාත්මක කිරීම,මෙහෙයවීම සහ අධීක්ෂණය කළ යුතුය".නමුත් ප්‍රතිතනය ලත් ආයතනය (UNDP) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නිරත වී තිබූ අතර මුළු වියදමින් සියයට 51.84 ක් නොහොත් ඇමරිකානු ඩොලර් මිලියන 14.91 කට සමාන රු. මිලියන 3,198 ක් 2017-2023 කාලය තුළ වියදම් කර තිබුණි.	විසින් ක්‍රියාත්මක කළ යුතු අතර FAA ප්‍රකාරව ප්‍රතිතනය ලත් ආයතනය විසින් මෙහෙයවීම සහ අධීක්ෂණය කළ යුතුය.	වියදම් වලට අදාල තොරතුරු ඉදිරිපත් කරන ලෙසත් එම වියදම් රජයේ ගිණුම් වල ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසත් දන්වා තිබුණි.

8. පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ අංශය

8.1 නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (RIDEP)

2017.07.07 දී ආරම්භ කරන ලද නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය ණය ගිවිසුම් අංක 116 - SLP යටතේ රු.මිලියන 17,185 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,437 ක් විය. ව්‍යාපෘතිය 2024.07.07 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 යන වර්ෂ 02 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකල මතයක් ලබා දී තිබුණු අතර 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2024 දෙසැම්බර් 09 දින ය.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	229.31	220.00	367
විදේශ අරමුදල්	2,523.05	1,067.00	-
මුළු වත්කම්	4,739	9,256	6,652
මුළු වගකීම්	4,739	9,256	6,652
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	2,523.05	1,067.00	-
දේශිය අරමුදල් මඟින්	229.31	220.00	367

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	පානීය ජල උප ව්‍යාපෘති සඳහා උපදේශක සමාගම එකඟ වූ උප ව්‍යාපෘති 73 න් 39 ක් අතහැර දමා තිබුණි.	2022	අත්හරින ලද උප ව්‍යාපෘති සංඛ්‍යාවට අනුලෝමව	අත්හරින ලද උප ව්‍යාපෘති සංඛ්‍යාවට අනුලෝමව උපදේශක	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	ඒ අනුව, එම සමාගමට ගෙවිය යුතු මුදල සහ විස්තරාත්මක සැලසුම්, ශක්‍යතා අධ්‍යයනය සහ ප්‍රසම්පාදන ලේඛන ඇතුළු සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමට ලබා දී තිබූ කාලය අඩු කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, උපදේශක සමාගම පිරිවැය සහ කාලය අඩු කිරීම සඳහා එකඟතාවයකට පැමිණ නොතිබුණි.		උපදේශක සමාගමට ගෙවිය යුතු මුදල අඩු විය යුතුය.	සමාගමට ගෙවිය යුතු මුදල අඩු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගී බව.	
(ආ)	JICA ආයතනය අරමුදල් ලබාදීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 වන විට අපේක්ෂිත භෞතික ප්‍රගතිය ලබා ගැනීමට අපොහොසත් වූ උප කොන්ත්‍රාත් 62 ක් අතරින් උප කොන්ත්‍රාත්තු 24 ක ප්‍රගතිය සියයට 1ත් 68ත් අතර වූ අතර උප කොන්ත්‍රාත්තු 38ක ප්‍රගතිය සියයට 0ත් 95ත් අතර මන්දගාමී තත්වයක පැවතුණි.	2021/ 2022	වැඩ සැලැස්මට අනුව අවසන් කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත්කර ඇති අතර ප්‍රගතිය ලඟාකර ගැනිමට කටයුතු කරනු ලැබේ.	නිර්දේශ පරිදි නිම කිරීමට කටයුතු කර නැත.
(ඇ)	2022 අප්‍රේල් මාසයේදී JICA ණය ලබා දීම නතර කර තිබූ බව දැනුවත් වීමෙන් පසුවත් ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති පැකේජ 04ක් සඳහා 2022 මැයි මාසයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. අරමුදල් ලබාදීම නවතා ඇති තත්ත්වයකදී සිදුකරමින් පවතින සිවිල් වැඩ සඳහා මුදල් ගෙවා වැඩ නිම කිරීමට හැකියාව තිබියදී	2022	දැනට කෙරෙමින් පවතින සිවිල් වැඩ අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	JICA අරමුදල් අත්හිටුවන බව ව්‍යාපෘති දැනුවත් වූයේ 2022 ජූනි මස වන බව.	නිර්දේශ පරිදි වැඩ අවසන් කිරීමට කටයුතු කර නැත.

	ඊට ප්‍රමුඛත්වය ලබා නොදී අලුතින් පිරිනැමූ ග්‍රාමීය මාර්ග සහ වාරිමාර්ග කොන්ත්‍රාත් පැකේජ 03ක් සඳහා වැඩ ආරම්භ කිරිමේ අත්තිකාරම් ලෙස රු. මිලියන 37ක් ගෙවා තිබුණි.				
(ඇ)	කොන්ත්‍රාත් පැකේජ 37ක් සඳහා සැලසුම් සැකසීම,හරස්කඩ මිනුම් ගැනීම සහ නිර්මාණ ඇදීම යන කටයුතු සඳහා රු. මිලියන 31.4ක් ගෙවීමට එකඟ වී තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම කටයුතු සඳහා රු. මිලියන 19.6ක් කොන්ත්‍රාත්කරු වෙතද ගෙවා තිබුණි. ඒ අනුව එකම සේවාව සැපයීම සඳහා දෙපාර්ශවයකට ගෙවීම් සිදු කර තිබුණි.	2021/ 2022	එකඟ වූ කාර්යය උපදේශකයා විසින් සිදු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුට ඒ සඳහා මුදල් නොගෙවිය යුතුය.	මෙම කටයුතු දෙක කාර්යයන් දෙකක් වන අතර අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර ඇති බව.	නිර්දේශ පරිදි වැඩිපුර ගෙවීම අයකරගෙන නැත.

8.2 ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - සංරචකය 02 (PRDP)

2019.05.02 දී ආරම්භ කරන ලද ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - සංරචකය 02 සඳහා ජාත්‍යාන්තර සංවර්ධන සමායතනය ණය ගිවිසුම් අංක 5788 – LK යටතේ රු. මිලියන 17,595ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 200 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා දෙකක දී දීර්ඝ කර 2024.03.31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021, 2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	42.90	41.80	53.21
විදේශ අරමුදල්	4,200	4,365.3	5,215.50
මුළු වත්කම්	5,916	15,676	20,127
මුළු වගකීම්	5,916	15,676	20,127
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	4,210.46	3,558.61	5,267.58
දේශීය අරමුදල් මඟින්	42.97	41.82	53.21

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	ප්‍රමාණ පත්‍රයෙහි එක් එක් අයිතමය සඳහා ඉදිරිපත් කරන ලද ඒකකයක මිලට ප්‍රවාහන පිරිවැය ද ඇතුළත් විය යුතු වුවද, එන්.ඩබ්.පී 03 පැකේජයේ ප්‍රවාහන පිරිවැය ලෙස කොන්ත්‍රාත්කරුට රුපියල් මිලියන 11 ක් ගෙවා එය	2023	ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග වාර්තා කර නැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කර නැත.

	මිල විචලනය සඳහා ද යොදා ගෙන තිබුණි.				
(ආ)	කාර්යමණ්ඩලය සඳහා ගෙවීම්, ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයට වාහන සැපයීම වැනි අමතර වියදම් දැරීමට 2022 සැප්තැම්බර් 30 දක්වා මුළු හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදනයෙන් සියයට 25 එනම් රු.මිලියන 203 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 8.13.1 ඡේදයට පටහැනිව කොන්ත්‍රාත් විචලනයන් ලෙස ගෙවා තිබුණි.	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතුය.	ලෝක බැංකුවේ අනුමැතිය ඇතිව කටයුතු කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කරමින් නීතිරීතිවලට පටහැනි ගෙවීම් අයකරගෙන නැත.
(ඇ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/D/7777/TCAMP හා 2019 මාර්තු 30 දිනැති ලිපිය මගින් පළාත් ව්‍යාපෘති උපදේශක සේවා ඒකකවල කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතියට පටහැනිව කොන්ත්‍රාත් බිල්වල BOQ අයිතමයක් ලෙස තනතුරු 05ක් සඳහා රු.මිලියන 80ක් ගෙවා තිබුණි.	2022	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වැඩබිම්වල පවතින නේවාසික ඉංජිනේරු (RE) සහකාර නේවාසික ඉංජිනේරු (ARE) කාර්යාලවල සහාය කාර්ය මණ්ඩලය සඳහා එමගින් අනුමැතිය ලබාදීමක් සිදු නොවන බව.	අනුමත නොවූ කාර්ය මණ්ඩල ගෙවීම් කොන්ත්‍රාත් බිල්වලින් අඩු කරගෙන නැත.
(ඈ)	මායිම පුළුල් කිරීමේ කාර්යයේ දී උප පාදක වර්ගය 01 සඳහා ABC ආදේශ කර ඇත. එබැවින් කොන්ත්‍රාත්කරුට මායිම පුළුල් කිරීමේ කාර්යයේ දී රුපියල් 696,018 ක අමතර මුදලක් ගෙවා තිබුණි.	2022	BOQ අනුව වැඩ අවසන් කළ යුතුය.	මෙහිදී දෙපස මාර්ගය පුළුල් කිරීමේදී කුඩා තීරයන් වල (0.15-0.3m)පස් වෙනුවට ගල් ඇතිරීමට ඉංජිනේරු විසින් තීරණය කර ඒ අනුව ක්‍රියා කර ඇති බව.	BOQ අනුව වැඩ අවසන් කර නැත.

(ඉ)	ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් රු.මිලියන 22.2ක මුදලක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සහ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ රජයේ සේවයේ නියතු ඉංජිනේරුවන් සඳහා ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් සපුරාලීම සඳහා යොදවා තිබුණි.	2022	ණය ගිවිසුමෙන් අනුමත ව්‍යාපෘති අරමුණු සඳහා පමණක් ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කළ යුතුය.	පළාත් මාර්ග අධිකාරිය හා දෙපාර්තමේන්තුවල ඉංජිනේරුවරුන් එම ස්ථානවල දීර්ඝ කාලයක් රැඳී නොසිට වෙනත් රැකියා සොයා යෑමට මූලික හේතුවක් ලෙස එම ස්ථානවල වරලත් තත්ත්වය ලබා ගැනීම සඳහා පහසුකම් නොමැති වීම හඳුනා ගෙන එම තත්ත්වය ඉලක්ක කර ගෙන Center of Excellence ආයතනය බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ රත්මලාන කාර්යාලයේ ස්ථාපිත කර ඒ සඳහා අවශ්‍ය කාර්යයන් වෙනුවෙන් මෙම වියදම් දරා ඇති බව.	ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව ගෙවීම් කර ඇති මුදල් අයකරගෙන නැත.
(ඊ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක හා පළාත් ව්‍යාපෘති උපදේශක සේවා ඒකකවල කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබා දී තිබුණද ඊට පටහැනිව පළාත් ව්‍යාපෘති උපදේශන සේවා ඒකකවල තනතුරු 07ක් සඳහා කොන්ත්‍රාත් විචලනයන් යටතේ	2022	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විගණනයේ පෙන්වා ඇති පරිදි රුපියල් මිලියන 30ක මුදලක් ඒ සඳහා වැය වුවද එම මුදලට සමාන මුදලක් කාර්මික නිලධාරීන් සඳහා ගෙවන මුදලින් අඩුවීම නිසා රජයට අලාභයක් සිදු නොවූ බැව් පෙන්වා	විධිවිධානවලට පටහැනිව කටයුතු සිදු කර ඇති කාර්ය මණ්ඩල ගෙවීම් කොන්ත්‍රාත්කරු ගෙන් අයකරගෙන නැත.

	රු.මිලියන 30 ක් ගෙවා තිබුණි.			දිය හැකි බව.	
(ඊ)	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව රත්මලාන පුහුණු ආයතනයේ කළමනාකරණ සහායකයෙකු සඳහා රු.405,150ක මුදලක් WP 03 කොන්ත්‍රාත් පැකේජයේ විචලතා යටතේ ගෙවා තිබුණි.	2022	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කාර්යාලයට උපදේශකවරුන් කිහිප දෙනෙකුගේ සහය සඳහා වන අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කර ගැනීමට මෙම නිලධාරිනිය තාවකාලිකව සේවයේ යොදවන ලද බව.	- එම -
(ඌ)	කොන්ත්‍රාත් පැකේජ 03කට අදාළව ඇස්තමේන්තු කළ වැඩ අයිතම 121 ක් ඉටුනොකර පැවති වටිනාකම රු. මිලියන 43.2 ක් ද, ඇස්තමේන්තු කළ වැඩ අයිතම 108කට අදාළව ඇස්තමේන්තු කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් ඉටුකළ වැඩවල වටිනාකම රු.මිලියන 129.96ක් ද, පැකේජ 04ක වැඩ අයිතම 117කට අදාළව ඇස්තමේන්තු කරන ලද ප්‍රමාණයන් ඉක්මවා ඉටුකළ වැඩ වටිනාකම රු.මිලියන 218.4ක් ද, පැකේජ 03 ක කලින් ඇස්තමේන්තු නොකළ ඉවුරු බැමි ඉදිකිරීමේ වැඩ අයිතම සඳහා රු.මිලියන 53.4ක් ද ගෙවීමට සිදුවීම හේතුවෙන් ව්‍යාපෘතියේ උපදේශකවරුන්/ ඉංජිනේරුවරුන් නිසි සැළකිල්ලෙන් කටයුතු කර නොතිබුණි.	2023	විචලතාවයන් හේතුවෙන් රජයට එල්ල වන අධික බර අඩු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	මෙම වෙනස්වීමේ ප්‍රමාණය ඉතා අඩු තත්ත්වයක පවත්වා ගැනීමට නම් ව්‍යාපෘතිය පටන් ගැනීමට පෙර අදාල කටයුතු නිමකර තිබිය යුතු වන නමුත් එවැනි ක්‍රියාවලියක් පළාත් මාර්ග සංවර්ධනයන්හි දක්නට නොමැති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කර නැත.

8.3 ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය (LDSP)

2019.06.30 දී ආරම්භ කරන ලද ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘතිය සඳහා ජාත්‍යාන්තර සංවර්ධන සමායතනය ණය ගිවිසුම් අංක 6371 – LK යටතේ රු. මිලියන 12,222 ක ණය මුදලක් හා රු.මි. 4,221 ක ප්‍රදාන ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 1,222 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දීර්ඝ කර 2024.09.30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021, 2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	21.4	31.14	31.21
විදේශ අරමුදල්	696.58	2,391.28	3,429.55
මුළු වත්කම්	3,735	6,977	8,225
මුළු වගකීම්	3,735	6,977	8,225
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	1,594.5	2,747.9	1,548.3
විදේශ ප්‍රදාන මගින්	1,102.0	175	1,583.6
දේශිය අරමුදල් මගින්	21.4	31.1	31.2

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	තිරප්නේ ප්‍රාදේශීය සභාව මගින් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා පොදු වෙළඳපොලක් ඉදිකිරීම සඳහා 2022 පෙබරවාරි 15 වන දින රු. මිලියන 18 කට කොන්ත්‍රාත්තුවක් **ලබා දී තිබුණි.** ඒ සඳහා රු. මිලියන 2.7ක් ගෙවා තිබියදී කොන්ත්‍රාත්තුව ඉටු කිරීම පැහැර හැර තිබුණද රු. මිලියන 3.6 ක කොන්දේසි සහිත අත්තිකාරම් ඇපකරය ලංසු ලේඛනවල සඳහන් නියමිත ආකෘතියට පටහැනිව පිලිගැනීම හේතුවෙන්, කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව පැහැර හරින ලද අවස්ථාවේදී කොන්ත්‍රාත් ගිවිසුම ඒකපාර්ශ්විකව අවලංගු කර අදාළ කාර්ය සාධන ඇපකරය සහ අත්තිකාරම් ඇපකරය මුදල් කර ගැනීමට ප්‍රාදේශීය සභාවට නොහැකි වී තිබුණි.	2023	නිලධාරීන්ගේ නොසැලකිලිමත්කමට එරෙහිව විනය පියවර ගත යුතුය**.**	මේ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇති අතර පිළිතුරු ලද වහාම අවසාන පිළිතුර ලබා දීමට කටයුතු කරන බව.	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.

(ආ)	එරාවූර්-05, විවේකානන්ත මහජන පුස්තකාලයේ ව්‍යාපාර සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම 2022 ජුලි 06 වන දින නිම කිරීමට සැලසුම් කර තිබුණ අතර 2022 ඔක්තෝබර් 06 දක්වා මාස 3 ක දිගුවක් ලබා දී තිබුණි. කෙසේ නමුත්, කොන්ත්‍රාත්කරු 2023 මාර්තු 31 දින කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර තිබුණද, එරාවූර් නගර සභාව විසින් කොන්ත්‍රාත්කරුගෙන් දින 175 ක ප්‍රමාද ගාස්තුවක් වූ රු. මිලියන 1.4 ක මුදලක් අය කර ගෙන නොතිබුණි.	2023	කොන්ත්‍රාත් ගිවිසුමට අනුව කොන්ත්‍රාත්කරු ගෙන් ප්‍රමාද හානි අය කළ යුතුය.	මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇති අතර පිළිතුරු ලද වහාම අවසාන පිළිතුර ලබා දීමට කටයුතු කරන බව.	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.
(ඇ)	රාජාංගනය හන්දියේ ග්‍රාමීය වෙළෙඳ පොළ ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රමවේදයට අනුව ලංසු කැඳවා අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ සාමාගම් තුනක් කොන්ත්‍රාත්තුව පිළිගෙන නොතිබූ බැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 150ක් වැඩි වූ රු. මිලියන 34 ක ලංසුවක් ඉදිරිපත් කළ සමාගමට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.එබැවින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතාවයක් පැවති බව නිරික්ෂණය විය.	2023	CIDA ගිවිසුම් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.	මේ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇති අතර පිළිතුරු ලද වහාම අවසාන පිළිතුර ලබා දීමට කටයුතු කරන බව.	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.
(ඈ)	රාජාංගනය ප්‍රාදේශීය සභාව, පුත්තලම හන්දියේ රජයේ ඉඩමක රු. මිලියන 47.5 ක් වැයකර කඩ 08ක්	2023	ඉඩමේ අයිතිය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි.	මේ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත්	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.

	සහිත සාප්පු සංකීර්ණයක් ඉදිකර තිබුණද ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර එම ඉඩමේ අයිතිය පවරා දී නොතිබුණි. ඉඩමේ අයිතිය නිරවුල් නොකර ඉදිකිරීම් සිදු කිරීම හේතුවෙන් ඉදිකරන ලද සාප්පු සංකීර්ණය අපේක්ෂිත අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට නොහැකි වී තිබුණි.			කර ඇති අතර පිළිතුරු ලද වහාම අවසාන පිළිතුර ලබා දීමට කටයුතු කරන බව.	
(ඉ)	නොච්චියාගම ප්‍රාදේශීය සභාව විසින් රු. මිලියන 37 ක වියදමින් කටුපත්වැව ප්‍රදේශවාසීන්ට පානීය ජලය ලබාදීමේ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණද එම ඉඩම ප්‍රාදේශීය ලේකම්වරයාගේ බලපත්‍රයක් ඇතිව පෞද්ගලික පාර්ශවයන් විසින් පරිහරණය කරන ලද ඉඩමක් විය. එබැවින් එම ඉඩම විධිමත් ලෙස ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොතිබුණි.	2023	ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීම වැනි මූලික කටයුතු සිදු කළ යුතුයි.	මේ සම්බන්ධයෙන් උතුරු මැද පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇති අතර පිළිතුරු ලද වහාම අවසාන පිළිතුර ලබා දීමට කටයුතු කරමි.	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.
(ඊ)	2019 මාර්තු 05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, උතුරු මැද පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස පත්කර රු.683,000ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.	2021/ 2022/ 2023	චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම අයකර ගැනීම සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම සඳහා 2022.02.14, 2022.09.08, හා 2024.09.24 දිනැති ලිපි මගින් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් දැනුවත් කර ඇති බව.	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.

(උ)	පළාත් පාලන සැලසුම් පද්ධතිය ශක්තිමත් කිරීම, පළාත් පාලන සේවා සහ ආර්ථික යටිතල පහසුකම් සහය සහ ආයතනික සංවර්ධනය වැඩිදියුණු කිරීම යන සංරචකවල අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 80ක්, සියයට 70ක් සහ සියයට 85ක් වුවද සත්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 45ක්, සියයට 66ක් සහ සියයට 30 ක් විය.	2022 / 2023	සියලු පාර්ශවයන්ගේ අපේක්ෂිත ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කටයුතු කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතුය.	ප්‍රතිලාභ සැලසෙන ආකාරයට සියළු ව්‍යාපෘති නිම කර ඇති බව.	ප්‍රගතිය පහළ මට්ටමක පැවතිනි.
(ඌ)	උතුරු සහ නැගෙනහිර පළාත්වල ධාරිතා වර්ධනය, අධීක්ෂණය හා ඇගයීම, ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සහ ඌව සහ උතුරු මැද පළාත්වල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2020 ජනවාරි 10 දින හෝ ඊට පෙර නිම කිරීමට උපදේශකවරු 04 දෙනෙකු පත්කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 3.7ක ගෙවීමෙන් කොටසක් සිදුකර තිබුණි. කෙසේවෙතත්, නියමිත කාලය තුළ නිම නොකරන ලද ඉහත සඳහන් උපදේශන කටයුතු තුළින් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.	2021 / 2022	ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021.10.07 දින අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙම බඳවා ගත් උපදේශකවරුන් ගේ කාර්යභාරය (TOR) තව දුරටත් කරගෙන යායුතුද, එවා සංසෝධනය කළ යුතුද සහ ඔවුන්ට ගෙවියු යුතු ඉතිරි මුදල ගෙවීම සඳහා එස්.ජී.චන්ද්‍රදාස මහතාගේ සහභාගීත්වයෙන් කමිටුවක් පත් කරන ලද බව. එම කමිටු වාර්තා අනුව උපදේශකවරුන් විසින් සිදුකල යුතු කටයුතු සඳහා ඔවුන් සමඟ සාකච්ඡා කර අන්නෝන්‍ය එකඟතාවයකට පැමිණීමටත් හැකි විය. ඒ අනුව	නිර්දේශ පරිදි අයකර ගැනීමට කටයුතු කර නැත.

				ඔවුන්ට ගෙවීම් සිදු කර උපදේශනාත්මක සේවාවන් අවසන් කර ඇති බව.	
(එ)	ව්‍යාපෘතියේ කටයුතු ආරම්භවීමට පෙර ව්‍යාපෘති සූදානම් කිරීමේ කටයුතු නිමකිරීමට පත්කරන ලද තාක්ෂණික ප්‍රසම්පාදන, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, පළාත් පාලන සහභාගිත්ව සංවර්ධන සැලැස්ම සඳහා පහසුකම් සපයන්නා සහ පාරිසරික සහ සමාජ ආරක්ෂණ සඳහා පත් කරන ලද තනි පුද්ගල උපදේශකවරු හතර දෙනා සඳහා රු. මිලියන 6.47ක කොටස් ගෙවීමක් කර තිබුණි. කෙසේවෙතත්, නියමිත කාලය තුළදී ඉහත සඳහන් උපදේශන කටයුතු නිමනොකිරීම හේතුවෙන් ඉහත වියදම නිශ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. එසේ තිබියදීත් කාර්යභාරය නිම කිරීමකින් තොරව ඉතිරි මුදල ගෙවීමට 2022 පෙබරවාරි 23 දින තීරණයක් ගෙන තිබුණි.	2021 / 2022	ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	-එම-	නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය වාර්තා කර නැත.

8.4 පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (LGESP)

2012.07.01 දින ආරම්භ කරන ලද පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව ණය ගිවිසුම් අංක 2790- SRI (SF) යටතේ රු. මිලියන 7,670ක් සහ ණය ගිවිසුම් අංක 3431 – SRI (SF) යටතේ රු. මිලියන 8,700ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු.මිලියන 2,410.80 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා හතරකදී දීර්ඝ කර 2024.01.31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණ අතර 2023 වර්ෂය සඳහා මතය තත්ත්වාගණනය කර තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	400	195	285.06
විදේශ අරමුදල්	2259.3	1,664.55	2,175.35
මුළු වත්කම්	18,364	40,407	39,184
මුළු වගකීම්	18,364	40,407	39,184
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	2,140.1	1,697.81	2,530.47
දේශීය අරමුදල් මගින්	400	195	258.42

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	වත්කම් කළමනාකරණ මෘදුකාංගය ස්ථාපිත කරන ලද පළාත් පාලන ආයතන 07න් 05ක සිදුකරන ලද විගණන පරීක්ෂාවේදී එකී ආයතනවල මෘදුකාංගය	2022 / 2023	ව්‍යාපෘති කාලය තුළ වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා සහ ඉන් පසු ඇතිවන තාක්ෂණික	අවශ්‍ය සියළු පුහුණු වීම් ලබා දී ඇති අතර, එය යාවත් කාලීනව පවත්වා ගැනීමේ වගකීම අදාළ ප්‍රාදේශිය	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	ස්ථාපිත කරන අවස්ථාවේ ඇතුලත් කරන ලද වත්කම්වල දත්ත පමණක් මෘදුකාංගයේ දත්ත පද්ධතිය තුල පවතින අතර එම දත්ත යාවත්කාලීන කර නොතිබුණි. තව ද එම දත්ත භාවිතා කර වත්කම් කළමනාකරණය සඳහා තීරණ ගත හැකි ආකාරයට තොරතුරු මෘදුකාංගය හරහා පරීශිලකයාට ලබා ගත නොහැකි බව හා පළාත් පාලන ආයතන විසින් මෘදුකාංගය භාවිතයට නොගෙන තම අවශ්‍යතා ඉටු කර ගැනීමට පැතුරුම්පත් භාවිතා කරන බව නිරීක්ෂණය වූ බැවින් ඇ.එ.ජ. ඩොලර් 133,747.70 ක් වැයකොට ස්ථාපිත කර තිබු නිෂ්ඵල මාදුකාංගයක් බවට පත් වී තිබුණි.		ගැටළු විසඳීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම වැනි අඛණ්ඩ ක්‍රියාවලියක් පවත්වා ගත යුතුය.	සභාව වෙත පවරා ඇති බව.	
(ආ)	තාක්ෂණික විගණනය සඳහා වර්ෂයක කාලයකට තනි පුද්ගල උපදේශක වරයෙකු ලෙස ඉංජිනේරුවරයෙකු තෝරාගෙන තිබුණි. අමාත්‍යංශ ලේකම් සහ තාක්ෂණික විගණන උපදේශක විසින් අත්සන් කරන ලද ගිවිසුම අනුව, තාක්ෂණික විගණන උපදේශක විසින් ප්‍රධාන ගැටළු සහ නිර්දේශයන් අවසන් වාර්තාවේ වාර්තා කළ යුතුය. කෙසේවෙතත්, ඉහත වාර්තාවේ කිසිදු ප්‍රධාන ගැටළුවක් සහ නිර්දේශ අඩංගු වී නොතිබියදී ඒ පිළිබඳ	2021	ගෙවීම අයකර ගැනීමට පියවර ගත යුතුය.	උපදේශකවරයා විසින් ඉදිරිපත් කරන ලද මාසික වාර්තා වල එම නිර්දේශ ඇතුළත්කර ඇත. ඔහුගෙන් බලාපොරොත්තු වූයේ Technical Audit උපදේශක වන අතර ඔහු TOR ප්‍රකාරව එදිනෙදා නිර්දේශ මඟින් ව්‍යාපෘතිය නිවැරදි කර ගැනීම සඳහා කරගෙන යනු ලබන ව්‍යාපෘති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

නොසලකා තාක්ෂණික විගණන උපදේශක වෙත රු.මිලියන 12.47ක් ගෙවා තිබුණි.

8.5 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (සංරචකය 1 - පළාත් කොටස) (GEM)

2018.08.30 දින ආරම්භ කරන ලද සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (සංරචකය 1 - පළාත් කොටස) සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය ණය ගිවිසුම් අංක 6228- LK යටතේ රු. මිලියන 15,505 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දීර්ඝ කර 2025 ජූනි 30 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණනය නොකළ මතයක් ලබා දී තිබුණ අතර 2022 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ලබාදී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	-	-	-
විදේශ අරමුදල්	1,600	2,673	3,614
මුළු වත්කම්	2,413	5,083	8,697
මුළු වගකීම්	2,413	5,083	8,697
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	2,010.1	2,670.23	3,613.7
දේශිය අරමුදල් මගින්	-	-	-

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	**වයඹ පළාත**				
	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ වයඹ පළාතේ ගණිත ඉගෙනීම සහ ගණිත ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 3.7	2022	මිලදී ගැනීම් සිදු කිරිමේදි අවශ්‍යතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.	මිලදී ගැනීම් සිදු කිරීමේදී අවශ්‍යතාවය පිළිබඳ සැළකිලිමත් වියයුතු බවට	අරමුදල් නිශ්කාර්යව යොදවා ඇත.

	ක වටිනාකමකට Trapezoid මේස 156ක් සමාලෝචිත වර්ෂයෙහි මිල දී ගෙන බෙදාහැර තිබුණි. මෙම මේස එම ගණිත ක්‍රියාකාරකම් සඳහා සුදුසු නොවන සාමාන්‍ය මේස වූයෙන් නවීන තාක්ෂණයට ගැළපෙන පරිදි ගණිතය දැනුම වර්ධනය කිරීම සඳහා ලබා දෙන ලෝක බැංකු ණය අදාල අරමුණ ඉටුවන පරිදි උපයෝජනය කර නොතිබුණි.			අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.	
(ආ)	සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සහ භාරකාරත්වය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු හා ඉලක්ක හඳුන්වාදී තිබියදී වයඹ පළාත් කෘෂිකර්ම උපකරණ, ක්‍රීඩා උපකරණ, ගෘහ විද්‍යා උපකරණ හා සෞන්දර්ය උපකරණ මිලදී ගැනීම සඳහා 2020 සිට 2023 වර්ෂය දක්වා රු.මිලියන 31ක මුදලක් වැය කර තිබුණි.	2022/ 2023	දරනු ලබන වියදම් ව්‍යාපෘති DLI වලට අනුකූල විය යුතුය.	පාසල්වල පුස්තකාල, කෘෂිකාර්මික ඒකක, ක්‍රිඩා ඒකක, ගෘහ විද්‍යා ඒකක සඳහා පහසුකම් සැලසීම මඟින් "සම්පූර්ණ පාසල් තත්ත්ව සහතික කිරීම" යටතේ වන DLI අරමුණු කරගෙන මෙම කාර්යය සිදු කර ඇති බව.	අපේක්ෂිත වියපැහැදම් සබැඳි දර්ශක (DLI) වලට පටහැනිව ගෙවීම් සිදුකර තිබුණි.
(ඇ)	පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන 2023 ඔක්තෝබර් 25 දින මන්නාරම කලාප අධ්‍යාපන කාර්යාලය වෙත භාර දී තිබූ ක්‍රියාකාරී මේස කට්ටල 10ක් සහ 2024 මාර්තු 22 දින ලබාදුන් ගුරු පුටු 121ක් තාක්ෂණික පිරිවිතරයන්ට සකස් නොකිරීම හා විවිධ අඩුපාඩු හේතුවෙන් අපේක්ෂිත කාර්යය සඳහා භාවිත නොකර කලාප	2023	තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල නොවූ ගෘහ භාණ්ඩ භාරගැනීම නොකළ යුතු අතර එම ගෘහ භාණ්ඩ තාක්ෂණික පිරිවිතරයන්ට අනුව නැවත සකස් කරවා ප්‍රයෝජනයට ගත යුතුය.	ලංසු ලේඛනවල සඳහන් තාක්ෂණික පිරිවිතරයන් පිළිබඳ සෑහීමකට පත් නොවීම හේතුවෙන් මෙහි සඳහන් භාණ්ඩ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් භාර ගෙන නොමැති අතර සැපයුම්කරු වෙත ගෙවීම ද සිදුකර	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	අධ්‍යාපන කාර්යාලයේ ගබඩා කර තිබුණි.			නොමැත. තවද ගුරු පුටු සැපයුම්කරු වන ලිංගම් වෙල්ඩින්ග්ස් ආයතනයේ (Lingam Weldings Ltd) කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර, ආදායමට ඇතුළත් කර ඇත.	
(ඈ)	ක්ෂේත්‍ර පරික්ෂාවට ලක්වූ වයඹ පළාතෙහි පාසල් 04 ක 10 හා 11ශ්‍රේණිවල සිසුන්ගේ ඉංග්‍රිසි හා ගණිත යන විෂයයන් දෙකට 2022 හා 2023වර්ෂවලදී සිසුන් ලබාගත් ලකුණුවල සමාන්‍ය සියයට 41කටත් අඩු මට්ටමක පවතින බැවින් ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරන පරිදි පළමු වියපැහැදම් සබැඳි දර්ශක දෙක කරා ළගා වීමට නොහැකි වී ඇති බව නිරික්ෂණය විය.	2023	ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය.	වැළැක්වීම සඳහා ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න වාර්තා කර නැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
(ඉ)	ඉංග්‍රීසි භාෂා අධ්‍යාපනය වැඩිදියුණු කිරිම යටතේ 2018 සිට 2021 වර්ෂය දක්වා දකුණු පළාත තුළ පාසල් 58ක් තෝරාගෙන තිබූ අතර, එම සංරචකය යටතේ 2022 වර්ෂය අවසාන වන විට සිසුන්ගේ කාර්යසාධන මට්ටම අවම වශයෙන් සියයට 60ක් අපේක්ෂා කළ ද, කලාප කාර්යාල 07ක අවසාන වාර විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ලකුණු සැසඳීමේදී 8 සහ 9	2022	-එම-	-එම-	-එම-

	ශ්‍රේණිවල සිසුන් 6243ක් සහ 6540ක ගේ ලකුණුවල සාමාන්‍යය පිළිවෙලින් සියයට 37.37 ක් සහ 37.83ක් වී තිබුණි.				
(ඊ)	ගණිතය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම යටතේ 2018 සිට 2021 වර්ෂය දක්වා දකුණු පළාත තුළ පාසල් 38 ක් තෝරාගෙන තිබූ අතර, 2022 වර්ෂය අවසාන වන විට සිසුන්ගේ කාර්යසාධන මට්ටම අවම වශයෙන් සියයට 60 ක් අපේක්ෂා කළද, කලාප කාර්යාල 08 ක අවසාන වාර විභාගයේදී ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණු සැසඳීමේදී 8 සහ 9 ශ්‍රේණියේ සිසුන් 4826 ක් සහ 5090 කින් ගණිතය විෂය සඳහා ලබාගත් ලකුණුවල සාමාන්‍යය පිළිවෙලින් සියයට 47.97 ක් සහ 44.38 ක් වී තිබුණි.	2022	-එම-	-එම-	-එම-

09. භාණ්ඩාගාර හා රාජ්‍ය ණය අංශය

9.1 ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.

2022 මැයි 09 දිනදී ආරම්භ කරන ලද ආර්ථික අර්බුදයේ බලපෑම් අවම කිරීම සහ සමාජ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 9290 - එල්කේ යටතේ රු.මිලියන 108,062 ක ණය මුදලක් ලබා දීමට එකඟ විය. ව්‍යාපෘතිය එක් අවස්ථාවකදී දීර්ඝ කර 2024 මැයි 09 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර, එම වර්ෂ දෙක සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	-	-
විදේශ අරමුදල්	99,903	12,642
මුළු වත්කම්	101,800	112,653
මුළු වගකීම්	-	-
මුළු අරමුදල්	101,800	112,653
විදේශ ණය මගින්	101,800	112,653
දේශීය අරමුදල් මගින්	-	-

ඊට අමතර ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේනතුවට ලබා දී තිබූ අත්තිකාරම් මුදලින් ප්‍රතිලාභී දීමනා ගෙවීමෙන් පසුව, අධි තක්සේරුව හේතුවෙන් ඉතිරි වූ	2022	ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිවැරදි දත්ත භාවිතා කරමින් අරමුදල්	ඔබගේ නිරීක්ෂණය සමග එකඟ වෙමි.	මේ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව පෙන්වා දී ඇති අතර පවත්නා

	රු.මිලියන 1,096 ක සහ රු. මිලියන 93 ක මුදල අනුපිළිවෙලින් මාස 4 ක සහ මාස 8 ක ප්‍රමාදයක් සහිතව 2022 දෙසැම්බර් 29 සහ 2023 අප්‍රේල් 18 යන දිනවල දී නිරවුල් කර තිබුණි.	කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය.		දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දී තිබුනද එය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදුකර නොමැත.
(ආ)	ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො. මිලියන 325 ට සමාන වූ රු. මිලියන 108,225 ක් වූ අතර එම මුදල 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා විය. සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ මුළු අරමුදල් උපයෝජනය රු. මිලියන 100 කට සමාන එ.ජ.ඩො. මිලියන 274.37 ක් වූ අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 84 ක් වී තිබුණි.	සියලු ඉලක්ක අපේක්ෂිත පරිදි සාක්ෂාත් කර ගැනීමට සහ ප්‍රතිපාදන අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ විය.	2022.12.31 දිනට එසේ වුවද, 2023.12.31 දිනට ව්‍යාපෘතියේ මුළු වියදම එ.ජ.ඩො මිලියන 309.89 ට සමාන වූ රු. මිලියන 112,545.41 ක් වූ අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් 95%ක් වේ. තවද, ව්‍යාපෘතියට අදාල සියලුම අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව කටයුතු කිරීම තුලින් ප්‍රතිපාදන අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීමේ හැකියාව පෙන්වා දී ඇත.
(ඇ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රජයේ ණය කළමනාකරණ තොරතුරු පද්ධතියට අනුව, ප්‍රතිලබ්ධි නොවූ	වෙන් කරන ලද මුළු අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	අන්තර්කරණ සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) යටතේ	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක Inclusive

ණය මුදල සඳහා බැඳීම් ගාස්තු ලෙස රු. මිලියන 2.26 කට සමාන එ.ජ.ඩො. 6,934.5 ක් ණය දෙන නියෝජිතායතනය වෙත අනාර්ථික ලෙස ගෙවා තිබුණි.		ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට එ.ජ.ඩො. මිලියන 500 ක මුදලක් වෙන් කර ඇත. කෙසේ වුවද, රටේ හදිසි තත්ත්වය හේතුවෙන්, ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීමේ සහ මෙම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සමාජ ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ අරමුණ ඇතිව අන්තර්කරණ සම්බන්ධතා සංවර්ධන ව්‍යාපෘතිය (ICDP) - CERCs සක්‍රීය කිරීම මගින් එ.ජ.ඩො. මිලියන 325 ක මුදලක් නැවත වෙන් කරන ලදී. ඒ අනුව, සමස්ත ICDP ව්‍යාපෘතිය සඳහා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය ද ඇතුළුව) විගණන නිරීක්ෂණවල සඳහන් කර ඇති	Connectivity Development Project (ICDP) ව්‍යාපෘතිය ව්‍යාපෘතිය සඳහා බැඳීම් ගාස්තුව ඇ.ඩො.679,985.04 ක් වේ. එහෙත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන්ට අදාල බැඳීම් ගාස්තුව ඇ.ඩො. 6,934.5, ක් (රු.මි.2.26)බව ඇස්තමේන්තු කළ හැක. එය ව්‍යාපෘතිය සඳහා වූ මුළු බැඳීම ගාස්තුවෙන් 1% පමණක් වේ.

				එ.ජ.ඩො. 679,985.04 ක් වූ බැඳීම් ගාස්තු ගෙවා ඇති බව නිරීක්ෂණය වේ.	
(ඇ)	2023 වර්ෂය සඳහා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කර නොතිබූ අතර මුළු ප්‍රතිපාදන රු.මිලියන 12,642 ක් පරිපූරක ප්‍රතිපාදන සහ මු.රෙ. 66 හරහා වෙන් කර තිබුණි.	2023	ව්‍යාපෘතිවල අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතුය	සැපයුම්කරු විසින් පොහොර මෙ.ටොන් 27,987.02ක් සපයා ඇතත්; ලිවන් නියුට්‍රිෂන් පෞද්ගලික සමාගම 2022 දෙසැම්බර් 22 දින වරායට ළඟා වූ අතර, ලෝක බැංකුව එම සැපයුම සඳහා 2023 ජනවාරි 03 දින ගෙවා තිබුණි. එබැවින් 2023 වර්ෂයේදී එම වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය විය. තවද 2022 දී සැලසුම් කළ පරිදි පොහොර ආනයනය සිදු නොවූ බැවින් 2023 දී ඉතිරි පොහොර ප්‍රමාණය මිලදී ගැනීමට තීරණය කරන ලදී. එබැවින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පරිපූරක ප්‍රතිපාදන සහ මු.රෙ. 66 මඟින් වෙන් කරන ලදී.	අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගෙන 2023.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව ගිණුම් ගතකර ඇත.

(ඉ)	මෙම ව්‍යාපෘතිය යටතේ යූරියා පොහොර මිලදී ගැනීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 110ක් වෙන් කර තිබුණද, එයින් 2023 දෙසැම්බර් 31 වන විට භාවිත කර තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 100 ක් පමණි.	වෙන් කර ඇති අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ විය.	ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො 110.00ක් වන අතර 2023.12.31 දිනට උපයෝජනය කල වියදම එ.ජ.ඩො 100.13ක් වේ. ඒ අනුව එදිනට එහි 91% ප්‍රගතියක් වේ. ඉතිරි මුදල වන එ.ජ.ඩො මිලියන 10 නැවත ICDP වෙත පවරා දී ඇත.
(ඊ)	මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘතියේ ගිණුම්වලට අනුව ඇමෙරිකානු ඩොලර් 5,226,053 ට සමාන රු.මිලියන 1,698ක් ව්‍යාපෘතියේ අරමුණු සඳහා භාවිතා නොකර ණය දෙන නියෝජිතායතනයට ආපසු ලබා දී තිබුණි.	වෙන් කර ඇති අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ විය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා ඉතිරිව ඇති අරමුදල් මුල් අන්තර්ගත සම්බන්ධතා සහ සංවර්ධන ව්‍යාපෘතිය වෙත ආපසු ලබා දීමට ලෝක බැංකුවට යවන ලදී.	මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වූ සමාජ ආරක්ෂණ සංරචකය යටතේ ප්‍රතිලාභීන් සඳහා පමණක් ගෙවීම් මෙම ගිණුම තුළින් සිදු කල බැවින් එම සංරචකය ක්‍රියාත්මක කර අවසන් බැවින් ලෝක බැංකුවේ ඉල්ලීම මත එම ගිණුම 2023.04.18 දින අවසන් කරන ලදී. පොහොර හා ගෑස් මිලදී ගැනීම සෘජු ගෙවීම් ක්‍රමවේදය භාවිතා ලදී.
(ඔ)	ව්‍යාපෘතිය යටතේ මුදල් සහනාධාර (සමෘද්ධි, වැඩිහිටි, වකුගඩු රෝග, ආබාධිත දීමනා) ලබාදීමට ඇමරිකන් ඩොලර් මිලියන	වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීමට සහ නිවැරදි	මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන්ට මුදල් ගෙවීම සමෘද්ධි බැංකුව හරහා	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

	145ක් වෙන් කර තිබුණද, එයින් 2023 දෙසැම්බර් 31 වන විට ඇමරිකන් ඩොලර් මිලියන 140ක් පමණක් භාවිත කර තිබුණි. එසේම ඊට අදාළ ප්‍රතිලාභීන්ගේ ලැයිස්තුව. ඉහත මුදල් සහනාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය විසින් තහවුරු කර නොතිබුණි.	පුද්ගලයින්ට මූල්‍ය සහනාධාර ලබා දී ඇත්ද යන්න තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.	සිදුකෙරිණි. ඒ අනුව, ප්‍රතිලාභීන්ගේ ලැයිස්තු ඇතුළුව සියලුම ගෙවීම් තොරතුරු ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි බැංකුව විසින් නඩත්තු කළ යුතුය.	හා සමෘද්ධි බැංකු මගින් පවත්වා ගත යුතු බව අවස්ථා කිහිපයකදී මෙම දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදී.
(ඕ)	ඉන්වොයිසිවලට අනුව, 2022/23 මහ කන්නයේ සහ 2023 යල කන්නයේ ගොවීන්ට බෙදා හැරීම සඳහා යූරියා පොහොර මෙට්‍රික් ටොන් 137,400ක් කොළඹ කොමර්ෂල් පොහොර සමාගම සහ ලංකා පොහොර සමාගම වෙත නිකුත් කර තිබුණි. ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනයට ලබා දී තිබූ තොරතුරුවලට අනුව ආනයනය කරන ලද යූරියා පොහොර ප්‍රමාණය මෙ.ටොන් 137,848 ක් විය. ඒ අනුව යූරියා පොහොර මෙට්‍රික් ටොන් 448 ක තහවුරු නොකළ වෙනසක් විය.	නිවැරදි තොරතුරු පැහැදිළි කර ගැනීමටත්, බෙදාහැරීම අපේක්ෂා කළ පරිදි සිදු වී ඇත්ද යන්න තහවුරු කිරීමටත් කටයුතු කළ යුතුය.	2023 නොවැම්බර් 22 වැනි දින පැවති රැස්වීම් සාකච්ඡාවේදී ගනු ලැබූ තීරණ අනුව සහ අංක SMFI/3/D/06/08 දරණ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ලිපිය හා ලෝක අංක SMFI /3/D/06/08 ලෝක බැංකු වෙළුම V හි සඳහන් පරිදි කෘෂිකර්ම හා වැවිලි අමාත්‍යාංශය විසින් එම පොහොර බෙදා හැරීමට අදාළ කරුණු 2023 නොවැම්බර් 29 දිනැති අංක TO/SL&TG/01/	අදාල තොරතුරු ලද විගස විගණන අංශ වෙත ලබා දීම සඳහා කඩිනමින් නිවැරදි තොරතුරු ලබා දෙනමෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.
(එ)	යූරියා පොහොර මෙ.ටොන් 137,848ක් නිකුත් කර තිබුණද ව්‍යාපෘති සම්බන්ධීකරණ	අපේක්ෂිත පරිදි නිවැරදි පුද්ගලයන් සඳහා බෙදාහැරීම සිදු		

ඒකකය මගින් මෙ.ටොන් 123,540ක් පමණක් ලද බවට තහවුරු කර තිබුණි. එබැවින්, යූරියා පොහොර මෙට්‍රික් ටොන් 14,308 ක නොසැසඳු/ තහවුරු නොකළ බෙදාහැරීමක් නිරීක්ෂණය විය. එමෙන්ම පොහොර බෙදා හැරීමට අදාළ ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය ලබා දී නොතිබුණි.

කර තිබේද යන්න තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.

37/02 දරණ ලිපිය මගින් අප දෙපාර්තමේන්තු වට පිටපතක් සහිතව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු ව වෙත ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් යූරියා මෙ.ටොන් 137,848.33 න් යූරියා මෙ.ටොන් 118,872.18ක් ගොවීන් වෙත බෙදා දී ඇත. තවද මෙට්‍රික් ටොන් 18,976.15ක ඉතිරි ප්‍රමාණය ගොවීන් වෙත බෙදා හැරීම පිළිබඳ තොරතුරු සපයන ලෙස මෙම දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබුණි. එමෙන්ම යූරියා මෙට්‍රික් ටොන් 137,848.26 න් මෙ.ටොන් 123,540.785ක් බෙදා හැරීමට අදාළ සියලුම තොරතුරු මේ වන විටත් මෙම දෙපාර්තමේන්තුව ට පිටපතක් සමඟ ලෝක බැංකුවට

ඉදිරිපත් කර ඇති අතර ඉතිරි මෙට්‍රික් ටොන් 14,307.255 සඳහා 2024 ජුනි 18 දිනැති අංක එන්.පී. /CERS/2/2022/ Agri දරණ ලිපිය මඟින් තොරතුරු ඉල්ලා ඇත.

9.2 ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය

2022 සැප්තැම්බර් 16 දිනදී ආරම්භ කරන ලද ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 4205 එස්ආර්අයි හා ප්‍රදාන අංක 9229 එස්ආර්අයි යටතේ රු. මිලියන 74,091 ක මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එක් අවස්ථාවකදී දීර්ඝ කර 2024 අගෝස්තු 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර, 2022 සහ 2023 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්ත්වාගණනය නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම		
රජයේ අරමුදල්	-	-
විදේශ අරමුදල්	52,899	14,424
මුළු වත්කම්	68,403	67,567
මුළු වගකීම්	5,872	28
මුළු අරමුදල්		
විදේශ ණය/ ප්‍රදාන මඟින්	62,508	67,539
දේශීය අරමුදල් මඟින්	-	-

එම විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතරව ව්‍යාපෘතියට අදාළව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	සමෘද්ධි පොරොත්තු ලේඛනයේ ප්‍රතිලාභීන් සඳහා එක් පුද්ගලයෙකුට රු. 5,000 බැගින් ගෙවිය යුතු වුවද, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛනයට අනුව,	2022	අනුමත මුදල ගෙවීමට කටයුතු කළ යුතුය.	සමෘද්ධි පොරොත්තු ලේඛනය යටතේ එක් ප්‍රතිලාභියෙකුට 2022 සැප්තැම්බර්	ගෙවීම් කිරීම සඳහා ලබා දෙන උපදෙස් හා අදාල චක්‍රලේඛ අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.

	සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාසවලදී එක් පුද්ගලයෙකුට රුපියල් 5,000 කට වඩා අඩු මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. ප්‍රතිලාභීන් සඳහා එවැනි අඩුවෙන් ගෙවීම්වල එකතුව රු. මිලියන 187 ක් වී තිබුණි.		මාසයේදී රු. 4,700ක් ගෙවා ඇති අතර 2022 ඔක්තෝබර් මාසයේදී එක් ප්‍රතිලාභියෙකුට රු.3,000ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.	
(ආ)	2022 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම එ.ජ.ඩො. මිලියන 203.36 ක් වූ අතර, 2022 වර්ෂයේදී සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සඳහා එ.ජ.ඩො. මිලියන 172.12 ක ප්‍රතිපාදන එයට ඇතුළත්ව තිබුණි. කෙසේ වුවද, 2022 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 55,930 කට සමාන එ.ජ.ඩො. මිලියන 153.7 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය 2022 වසර සඳහා ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 84 ක් පමණක් වී තිබුණි.	අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා ද, වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීම සඳහා ද අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	එකඟ විය.	2024 වර්ෂය අවසානයේදී ව්‍යාපෘතියට අදාල ඇස්තමේන්තු ගත මුළු පිරිවැය එ.ජ.ඩො 203.36ක් වන අතර ඊට අදාලව මුළු වියදම එ.ජ.ඩො 191.78ක් වාර්තා කර ඇත. එය ව්‍යාපෘතියේ පිරිවැයෙන් 94% වේ. තවද ව්‍යාපෘතියට අදාල සියලුම අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි 2024.04.30 අංක 24/0861/604/097 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාල 2024.05.22 දිනැති තීරණය මගින් ව්‍යාපෘති කාල සීමාව 2026 අගෝස්තු දක්වා දීර්ඝ කර ඇති අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව

					කටයුතු කිරීම තුලින් ප්‍රතිපාදන අරමුදල් උපරිම ලෙස උපයෝජනය කිරීමේ හැකියාව පෙන්වා දී ඇත.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, ගර්භනී මව්වරුන් සඳහා පෝෂ්‍යදායි ආහාර ලබාදීම සහ කිරි දෙන කාන්තාවන් සහ වයස අවුරුදු දෙකට අඩු ළමුන් සඳහා පෝෂණ දීමනාව ලබා දීම 2022 වර්ෂයේ විදේශ ණය මූල්‍යකරණය යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ලෙස සඳහන් කර ඇත. රු.මිලියන 2,650 ක අයවැය ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, මෙම මුදල් ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය යටතේ අදාළ කටයුතු සඳහා යොදා නොගෙන මු.රෙ. 66. මගින් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි.		අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	2022 දෙසැම්බර් 31 දිනට පෙර සමෘද්ධි බැංකුවේ ගැබිණි මව්වරුන්ගේ නව බැංකු ගිණුම විවෘත කිරීම අවසන් කර නොමැති බැවින්, ඉතිරි ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂයකට මාරු කර ඇත. තවද, බැංකු ගිණුම ආරම්භ කිරීම සඳහා උපදෙස් ලබා දී ඇති අතර චක්‍රලේඛයට අනුව, හඳුනාගත් ප්‍රතිලාභීන් සඳහා බැංකු ගිණුම් විවෘත කරන ලද අතර ගෙවීම් කිරීම අවසන් කර ඇත.	මෙම සංරචකය සඳහා ගිණුම් ආරම්භ කරන කරන ලද මව්වරුන් 153,320 ක් සඳහා 2023.12.31 දිනට දරන ලද මුළු වියදම රු.1,533,200,000 ක් වේ.
(ඈ)	2023 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුවට අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් ඉටු කිරීම සඳහා වියදම් විෂයයන් 03 ක් යටතේ රු. මිලියන 8,578 ක් වෙන් කර ඇති අතර, පසුව මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ඇති මුළු මුදල රු.	2023	ව්‍යාපෘතියේ අරමුණු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන නිසි ආකාරයෙන් වෙන් කළ යුතුය.	ගොවීන්ගේ සහ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා සහ CRM සහ Geogoviya තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම	ක්‍රියාත්මක ආයතනවල ඉල්ලීම සහ ඒ ඒ වර්ෂයන්ට ක්‍රියාත්මක සැලැස්ම අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සිදු කලද, එම කාර්යයන්

	මිලියන7,119 ක් විය. මෙම මුදල් මාරුකිරීම්වලදී, ව්‍යාපෘතියේ වියදම් අයිතම යටතේ එකතුව රු. මිලියන4,208 ක් ද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ව්‍යාපෘති සඳහා එකතුව රු. මිලියන2,911 ක් ද ගිණුම්ගත කිරීම සිදු කරන ලදී. මේ අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යථාර්ථවාදී අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි.		සඳහා ආධාර සැපයීම සඳහා 2023 අයවැය ඇස්තමේන්තුවලින් රු. මිලියන 8,577.50ක් වෙන් කර ඇත.	ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ඉතිරිවීම් ඇති වේ.
(ඉ)	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, 2022 දෙසැම්බර් සිට 2023 ජූනි දක්වා කාලය තුළ ගොවීන් 1,039,961ක් අතර රු. මිලියන 7,424ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ වාර්තාවලට අනුව, සහනාධාර ලබා දී තිබුණේ ගොවීන් 1,035,218ක් සඳහා පමණි. ඒ අනුව ගොවීන් 4,743 ක වෙනසක් විය.	නිවැරදි සංඛ්‍යා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.	මෙම විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි, ගොවීන් සංඛ්‍යාවේ විෂමතාවයක් ඇති බැවින්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ (DAD) කොමසාරිස් ජනරාල්වරයා මගින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ (DAD) ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත දැනුම් දෙන ලදී. අපට අවශ්‍ය තොරතුරු ලැබුණු පසු, අපි ඉදිරියේදී ඔබව	මෙහි සඳහන් පරිදි ගොවීන් සංඛ්‍යාවේ නොගැලපීමක් පවතින බැවින් ඒ පිළිබඳ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් මගින් එහි ප්‍රධාන මූල්‍ය නිලධාරී දැනුවත් කල අතර ඒ අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක 7/5/8-330-01 හා 2023.08.19 දිනැති ලිපිය මගින් මුළු ප්‍රතිලාභී ගොවීන් සංඛ්‍යාව 1,039,961ක් ලෙස තහවුරු කර

				දැනුවත් කරන්නෙමු.	ඇත.
(ඊ)	මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් එ.ජ.ඩො. මිලියන 200 ක ණය මුදලට අමතරව, JFPR විසින් ආසියානු සංවර්ධන බැංකුව හරහා අදාළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මූල්‍යකරණය සඳහා එ.ජ.ඩො. මිලියන 3 ක ප්‍රදානයක් ලබා දීමට එකඟ වී ඇත. 2023 වර්ෂය සඳහා එම ප්‍රදානයෙන් එ.ජ.ඩො. මිලියන 0.1902ක් හෙවත් රු. මිලියන 68.36ක් වෙන් කර ඇත. කෙසේ වුවද, 2023 වර්ෂයේදී ව්‍යාපෘතිය සඳහා යොදවා තිබුණේ එ.ජ.ඩො. මිලියන 0.09ක් හෙවත් රු. මිලියන 33.57ක් හෙවත් සියයට 47ක් පමණි.		අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වෙන් කර ඇති ප්‍රදානය ඵලදායී ලෙස සම්පූර්ණයෙන්ම භාවිතා කිරීම අවශ්‍ය වේ.	පිළිතුරු ලබා දී නොමැත.	JFPR විසින් ආසියානු සංවර්ධන බැංකුව හරහා අදාළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් මූල්‍යකරණය සඳහා 2024 වර්ෂය සඳහා එම ප්‍රදානයෙන් රු. මිලියන 443.56ක් වෙන් කර ඇත. 2024 වර්ෂයේදී ඒ සඳහා දරන ලද වියදම රු. මිලියන 277.35ක් වේ. එය 63%ක් වේ. එමෙන්ම ව්‍යාපෘතියට අදාල සියලුම අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කාලසීමාව දීර්ඝ කර ඇත.
(උ)	විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ රජයේ ණය ගිණුම්කරණ පද්ධතියට අනුව, අරමුදල් භාවිතයට නොගැනීම හේතුවෙන් රු. මිලියන 15කට සමාන එ.ජ.ඩො. 45,801.27ක් 2024 මාර්තු 15 දින ණය දෙන නියෝජිතායතනයට බැඳීමේ ගාස්තු ලෙස ගෙවා තිබුණි.		වෙන් කර ඇති මුළු මුදල් කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	එකඟ වෙමි.	2024.12.31 දින වන විට ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත ණය පොළී හා බැඳීම් ගාස්තු එ.ජ.ඩො මිලියන 12.19ක් දී සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කර ඇත.

(ඌ)	ADB ණය සමාලෝචිත වර්ෂය තුළ සමාජ ආරක්ෂණ පද්ධතිවල (DSD හි CRM සහ DAD හි Geogovia ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා එ.ජ.ඩො. මිලියන 2.65ක් හෝ රු. මිලියන 965.47ක් ඇස්තමේන්තු කර තිබුණද, එම පද්ධති සම්බන්ධයෙන් කිසිදු උපයෝජනයක් සිදු කර නොතිබුණි.	අපේක්ෂිත පරිදි සියලු ඉලක්ක සපුරා ගැනීමට සහ වෙන් කරන ලද අරමුදල් උපරිම ලෙස භාවිතා කිරීම සහතික කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.	මෙම ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව (DSD) සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM පද්ධතිය වැඩිදියුණු කිරීමට යෝජනා කරන ලදී. එම පද්ධති වැඩිදියුණු කිරීමට පෙර, පවතින පද්ධති තක්සේරු කිරීමට සහ පද්ධතිවල අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, අධ්‍යයන කටයුතු අවසන් කර ඇති අතර වැඩිදියුණු කිරීම් සිදු කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස ක්‍රියාත්මක කරන ආයතනවලට දැනුම් දී ඇත. ඒ අනුව, අදාළ පද්ධති වැඩිදියුණු කිරීම් ව්‍යාපෘති කාලසීමාව තුළ සිදු කිරීමට අපේක්ෂා කෙරේ.	සමෘද්ධි සහනාධාර වැඩසටහන අස්වැසුම ලෙස වෙනස් කිරීම සහ එම සහනාධාර ලබා දීම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය (WBB) මගින් සිදුකිරීම සහ එම සහනාධාර ගෙවීම වාණිජ බැංකු හරහා සිදු කරන ලද බැවින්, CRM පද්ධතිය වැඩිදියුණු කිරීම එම අවස්ථාවේදී අවශ්‍ය නොවීය. එසේම දැනට පවතින Geogoviya පද්ධතියට අදාලව ඇගයීම් සිදුකර අවසන් නොවූ බැවින් එම පද්ධතිය වැඩිදියුණු කිරීම ද ප්‍රමාද විය. එබැවින් ඉතා කඩිනමින් පවතින වර්තමාන තත්වයන්ට අදාලව පද්ධති දෙකෙහිම සිදුකල යුතු වැඩිදියුණු කිරීම් හදුනාගෙන ඒ සඳහා අවශ්‍යය ප්‍රතිපාදන ප්‍රමාණය දන්වා එවන ලෙස ක්‍රියාත්මක කිරීමේ ආයතන දැනුවත් කර ඇත. ඒ අනුව එම

			ආයතන මෙම යෝජිත පද්ධති වැඩි දියුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍යය ප්‍රතිපාදන අප වෙත මෙතෙක් දන්වා නොමැති බැවින් 2024 වර්ෂයේ ඒ සඳහා වියදමක් සිදුවී නොමැත.
(ඕ) ADB ප්‍රදාන කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශය යටතේ අවදානමට ලක්විය හැකි (කාන්තා, ළමුන් සහ ආබාධිත පුද්ගලයින්) සඳහා ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 695 ක් වූ හදිසි ආධාර සඳහා වන ප්‍රදාන යටතේ ඇති කාර්යයන් සම්බන්ධයෙන් 2024 මාර්තු 15 දිනට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදී.			
(i) මූල්‍ය ප්‍රගතිය වූයේ රු.මිලියන 182 ක් හෝ සමාලෝචිත වර්ෂය අවසාන ඇස්තමේන්තුවෙන් සියයට 27 ක් පමණි.	-එම-	එකඟ වෙමි.	2024වර්ෂය අවසානයේ එහි මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 310.39 ක් වන අතර එය ඇස්තමේන්තුවෙන් සියයට 45 ක් වේ.
(ii) ප්‍රධාන ක්‍රියාකාරකම් 05ට අදාළ උප ක්‍රියාකාරකම් 12 ක් අත්හැර දමා තිබුණි.	-එම -	එකඟ වෙමි. මුල් ක්‍රියාකාරී සැලැස්මේ ඇතැම්	සංශෝධිත ක්‍රියාකාරකම් සැලැස්ම සඳහා අනුමැතිය මෙම

		ක්‍රියාකාරකම් කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය විසින් අත්හිටුවා (අවලංගු කර ඇත) ඇත. නව ක්‍රියාකාරකම් හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ඇත. සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2024.03.22 දිනැති අංක NP/ADB/01/2022/MOW/CS දරන ලිපිය මගින් මෙම දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇත.	දෙපාර්තමේන්තුව අංක NP/ADB/01/2022/MOWCS හා 2024.03.22 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබාදී ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක ආයතන මගින් එම කාර්යයන් ක්‍රියාත්මක කරමින් පවතී.
(iii) ප්‍රධාන ක්‍රියාකාරකම් 08කට අදාළ උප ක්‍රියාකාරකම් 24කට අදාළව කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබුණි.	-එම -	සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව, මෙම කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කෙරේ.	
(ආ)කෘෂිකාර්මික උපදේශන සේවාවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයේ දී ලබා දුන් එ.ජ.ඩො. මිලියන 0.06 ක් හෝ රු. මිලියන 21.86 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් කිසිදු	-එම -	මෙම කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.	

	ප්‍රගතියක් අත් කර ගෙන නොතිබුණි.			
(ඕ)	2023/2024 වර්ෂ සඳහා කෘෂිකාර්මික දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් (GAP) සඳහා එ.ජ.ඩො. මිලියන 0.25 ක් හෝ රු. මිලියන 91.08 ක ප්‍රදාන වෙන් කර ඇත. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී, රු. 57,353 ක් පමණක් භාවිතා කර තිබුණි.	-එම -	එකඟ වෙමි. මෙම ක්‍රියාකාරකම් සිදුවෙමින් පවතින අතර ව්‍යාපෘති කාල සීමාව තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත.	2024 වර්ෂය අවසානයේ දී රු. මිලියන 4.448ක් භාවිතා කර ඇත. එය ඇස්තමේන්තුව මත 5%ක ප්‍රගතියකි.

9.3 මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය

2018 ඔක්තෝබර් 18 දී ආරම්භ කරන ලද මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 6006-LK යටතේ රු. මිලියන 22,500 (ඩොලර් මිලියන 75) ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා.1 දී දීර්ඝ කර 2023 දෙසැම්බර් 29 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021 සහ 2022 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර, 2021 හා 2023 මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ද 2022 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක්ද ලබාදී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	2,013,863	2,084,725	703,654
විදේශ අරමුදල්	1,085,318	903,231	31,750
මුළු වත්කම්	2,077,867,337	2,798,775,254	1,938,874,927
මුළු වගකීම්			
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	739,191,183	104,947,864	(627,454,860)
දේශීය අරමුදල් මඟින්	2,013,863	2,084,725	703,654

එම විගණන මතය ඉදිරිපත් කිරීමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ කටයුතු සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 339 න්,	2023	වෙන් කර ඇති මුළු අරමුදල් අපේක්ෂිත පරිදි භාවිතා කිරීමට කටයුතු කළ යුතුය	නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි.	ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ නොකර ඉතිරි මුදල ආපසු පියවා ව්‍යාපෘතියේ කටයුතු නිම කර

	සියයට 22 ක් නියෝජනය වන රු. මිලියන 73 ක මුදලක් ව්‍යාපෘතිය මගින් උපයෝජනය කර නොතිබුණි.				ඇත.
(ආ)	ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත මුදල එ.ජ.ඩො. මිලියන 75 කි. ව්‍යාපෘතිය ආරම්භයේ සිට වසර හයක් ඉකුත්ව යෑමෙන් පසුව අවසන් කර තිබුණද, සමස්ත ණය ප්‍රයෝජනය එ.ජ.ඩො. මිලියන 8.95 ක් වූ අතර එය ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 11.94 ක් විය.	2023	එම	එම	ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ නොකර ඉතිරි මුදල ආපසු පියවා ව්‍යාපෘතියේ කටයුතු නිම කර ඇත.
(ඇ)	උපයෝජනය නොකළ ණය සඳහා 0.25%ක බැඳීමේ ගාස්තු ගෙවීමට ව්‍යාපෘතිය බැඳී සිටියි. ඒ අනුව, 2018 සිට 2023 දක්වා රු. මිලියන 221 ක් (එ.ජ.ඩො. 992,133) අනාර්ථික බැඳීම් ගාස්තු මූල්‍යකරණ නියෝජිතායතනයට ගෙවා තිබුණි.	2023	එම	බැඳීම් ගාස්තු විදේශ සම්පත් දෙපාර්තමේන්තු ව මගින් හසුරුවන බැවින් කිසිදු අදහස් දැක්වීමක් සිදු කළ නොහැකිය.	ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ නොකර ඉතිරි මුදල ආපසු පියවා ව්‍යාපෘතියේ කටයුතු නිම කර ඇත.
(ඈ)	2023 වර්ෂයේදී ව්‍යාපෘතිය මගින් කිසිදු ක්‍රියාකාරකමක් සිදු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ත භෞතික ප්‍රගතිය පහත දැක්වේ.	2023	අපේක්ෂිත පරිදි ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	නිරීක්ෂණය සම්බන්ධයෙන් එකඟ වෙමි.	ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ නොකර ඉතිරි මුදල ආපසු පියවා ව්‍යාපෘතියේ කටයුතු නිම කර ඇත.

	ක්‍රියාකාරකම් සංඛ්‍යාව	භෞතික ප්‍රගතිය %
සංරචකය 01		
DLI 1 - මූල්‍ය පද්ධතියේ (CBSL, SEC සහ IRCSL) ඒකාබද්ධ, අවදානම් පාදක අධීක්ෂණය අනුගමනය කිරීම.	ක්‍රියාකාරකම් 3 යි	6.5
DLI 2 - මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව (FCP) සඳහා ආයතනික සහ නියාමන රාමුවක් ස්ථාපනය කිරීම, ප්‍රතිඵලය සක්‍රිය කිරීම: FCP සඳහා නෛතික සහ නියාමන රාමුව ක්‍රියාත්මක කිරීම සහ සියලුම මූල්‍ය සේවා හරහා FCP සඳහා ආයතනික ධාරිතාව වර්ධනය කිරීම	ක්‍රියාකාරකම් 1 යි	6.5
DLI 3 - සේවක අර්ථසාධක අරමුදලේ (EPF's) වත්කම් (ආයෝජන) සහ වගකීම් (රක්ෂිරීම්) සාකල්‍ය කළමනාකරණය සඳහා තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම සහ විවිධාංගීකරණය වූ ආයෝජන උපාය මාර්ගයක් අනුගමනය කිරීම.	ක්‍රියාකාරකම් 1 යි	0.00
DLI 4 - මූල්‍ය ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා ආයතනික සුරැකුම්පත් සඳහා භාර දීමට එදිරිව ගෙවීම් (DvP) පියවීමේ ක්‍රමය ස්ථාපනය කිරීම.	ක්‍රියාකාරකම් 3 යි	6.5

DLI 5 - ප්‍රාරක්‍ෂණ සහ ප්‍රතිරක්‍ෂණ ව්‍යාපාර වෙන්කරමින් ජාතික රක්‍ෂණ භාර අරමුදල (NITF) ප්‍රතිව්‍යුහගත කිරීම.	ක්‍රියාකාර කම් 1 යි	6.5%
සංරචකය 02 (i) අධීක්ෂණය සහ නියාමනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම	ක්‍රියාකාර කම් 2 යි	0.7
(ii) අධීක්ෂණය සහ නියාමනය සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම	ක්‍රියාකාර කම් 9 යි.	1.65
	ක්‍රියාකාර කම් 12 යි.	0.00
(iii) අධීක්ෂණය සහ නියාමනය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ IRCSL හි ධාරිතාව ශක්තිමත් කිරීම සහ අදාළ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කිරීම	ක්‍රියාකාර කම් 2 යි.	1.69

9.4 ලෝක බැංකුව අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය

2020 සැප්තැම්බර් 08 දී ආරම්භ කරන ලද ලෝක බැංකුව අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය සඳහා ලෝක බැංකුවේ ණය ගිවිසුම් අංක 6,346-LK, 6,371-LK, 6,228-LK, 8,878-LK යටතේ රු.මිලියන 10,491 (ඩොලර් මිලියන 56) ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා1 කදී දීර්ඝ කර 2023 මාර්තු 31 දින අවසන් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර, 2021, 2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලයන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	952,849	1,161,069	----
විදේශ අරමුදල්	6,088,457,774	4,009,812,548	4,769,397,086
මුළු වත්කම්	8,896,953,711	15,817,606,299	22,305,635,932
මුළු වගකීම්			
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	8,899,443,437	13,909,071,267	20,395,505,743
දේශිය අරමුදල් මගින්	952,848	2,113,918	2,113,918

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ආහාර සුරක්ෂිතතාවය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය ප්‍රමුඛතාවය ලෙස හඳුනාගෙන තිබුණි. එහෙත් සමස්ථ ප්‍රතිපාදන වලින් සියයට 85 ක් එනම් රු.මිලියන 3,640 ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා ලබා දී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා ප්‍රතිපාදනය කර තිබූ මුදල රු.මිලියන 264 කි. එය සමස්ථ ප්‍රතිපාදන වලින් සියයට 6 ක් බව විය.	2022	අපේක්ෂිත පරිදි සියළු ඉලක්ක සපුරා ගැනීම සඳහා පියවර ගැනීම අවශ්‍ය වේ.	රට තුළපවතින අර්ථික අර්බුදය හේතුවෙන්, මන්දපෝෂණයට එරෙහිව සටන් කිරීමට සහ පාසල් පැමිණීම සහ අධ්‍යාපන කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා රට පුරා සීමිත අවධානමට ලක් විය හැකි දරුවන්ට පෝෂණීය සමබල ආහාර වේලක් ලබා දීම සහතික කිරීම ඉතා වැදගත් විය. ඇමෙරිකානු ඩොලර් මිලියන 19.08 ක මුදලක් යොදා ගනිමින් දිවයින පුරා අවශ්‍යතා ඇති පාසල් 7,926 ක ළමුන් 1,081,927 ක් සඳහා දිවා ආහාර ලාබදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහාය ලබා දීමට CERC ව්‍යාපෘතියේ සංචිතය තීරණය කරන ලදි.	2023 මාර්තු 31 දිනට ව්‍යාපෘති කාලය අවසන් වන විටත් ව්‍යාපෘතියේ භෞතික කාර්යය සම්පූර්ණ වී නොතිබුණි.

9.5 සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය

2017 ජනවාරි 01 දින ආරම්භ කරන ලද සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම් අංක 5915 එල්කේ යටතේ රු. මිලියන 10,949 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 19 ක් විය. ව්‍යාපෘතිය එක් අවස්ථා දී දීර්ඝ කර 2023 ජුනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර,2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්වාගණන නොකළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	3	3	3
විදේශ අරමුදල්	1,576	31	3,498
මුළු වත්කම්	11,661	23,008	26,282
මුළු වගකීම්			
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	1,639	283	3,521
දේශීය අරමුදල් මඟින්	3	3	3

මීට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ව්‍යාපෘතිය සඳහා වූ ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇමුණුම 03 (ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන) හි 26 වැනි වගන්තියට අනුව, ව්‍යාපෘති කළමනාකරන ඒකකය විසින් සමුච්චිත ඒකාබද්ධ වියදම ගණනය කළ හැකි ආකාරයට වියදම් වාර්තා MoSEW වෙතින් ලබා	2023	ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ ගිවිසුමේ විධිවිධානවලට අනුකූල විය යුතුය.	සමෘද්ධි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද මාසික වියදම් වාර්තා මත පදනම්ව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ඒකාබද්ධ වියදම් වාර්තාව	ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

	ගෙන ඒකාබද්ධ කළ යුතුය.එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ දී ලෝක බැංකුවෙන් ආපසු ගෙන තිබූ රු. මිලියන 2,689ට අදාල අයදුම් පත් සමඟ ඉදිරිපත් කරන ලද එකී වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.			සකස් කර ලෝක බැංකුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම ඉදිරිපත් කිරීම ව්‍යාපෘති ඇගයුම් ලේඛනයේ ඇමුණුම 03 හි 26 සහ 27 වගන්ති වලට අනුව සිදු වූ අතර ලෝක බැංකුව එය පිළිගෙන ඇත.	
(ආ)	ව්‍යාපෘතිය මගින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 16 ක ස්ථාවර වත්කම් අගය සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.	2023	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.	සටහන් කර ගන්නා ලදී.	ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	ව්‍යාපෘතියේ වාර්තාවලට අනුව අයදුම්පත්‍ර පරිගණකගත කිරීම වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල 15 ක් සඳහා එකතුව රු.මිලියන 1.3 ක් අදාළ නිළධාරීන් වෙනුවෙන් ගෙවා තිබූ අතර, ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් වෙනුවෙන් ලබා දුන් රු.මිලියන 1.2 ක් අදාල නිලධාරින් වෙතට සිදුකළ බවට සහතික කර ගැනීමට ප්‍රමාණවත් හා උචිත සාක්ෂි විගනනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023	අදාළ පාර්ශ්ව වෙත ගෙවීම් කර ඇති බවට ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය සහතික විය යුතුය	සටහන් කර ගන්නා ලද අතර අයදුම්පත්‍රය පරිගණක ගත කිරීම අස්වැසුම පද්ධතියෙන් තහවුරු කිරීමෙන් පසු අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කරන ලද ඉල්ලීම මත පදනම්ව, සියලුම අදාළ නිලධාරීන්ට ගෙවීම සඳහා අවශ්‍ය අරමුදල් SILP හරහා	අදාළ පාර්ශ්ව වෙත ගෙවීම් කර ඇති බවට ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය විසින් තහවුරු කර නොතිබුණි.

				දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවන ලදී.	
(ඇ)	නියැදි විගණන පරීක්ෂණයට අනුව බිල්පත් නිරවුල් කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් සඳහා රු.මිලියන 1.2 ක් ගෙවීම් සිදුකර තිබූ අතර ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10කට අදාළව ගෙවා තිබූ එකතු වටිනාකම රු.716,634ක් සඳහා වවුචර් හා ප්‍රභව ලේඛන වල මුල් පිටපත් ඉදිරිපත් කර නොතිබුණි.	2023	අදාළ පාර්ශ්ව වෙත ගෙවීම් කර ඇති බවට ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය සහතික විය යුතුය	සටහන් කර ගන්නා ලදී.	අදාළ පාර්ශ්ව වෙත ගෙවීම් කර ඇති බවට ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය සහතික වී නොතිබුණි.
(ඉ)	2022 අගෝස්තු 10 වන දින e-Wis සමඟ අත්සන් කරන ලද ගිවිසුමට අනුව, ඒකාබද්ධ සමාජ සුබසාධන කළමනාකරණ පද්ධතිය පිහිටුවීම 2023 අප්‍රේල් 10 වන විට අවසන් කළ යුතුව තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය අවසන් දිනට මොඩියුල 12 න් 8 ක් පමණක් නිම කර තිබූ අතර එහි මූල්‍ය කාර්ය සාධනය රු. මිලියන 25 ක් වූ මුළු කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් රු.මිලියන 15ක් හෝ සියයට 60 වී තිබූ අතර ඒ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය.	සෑම ගෙවීමක්ම TOR අනුව පත් කරන ලද සමාලෝචන කමිටුවේ නිර්දේශයෙන් අනුව සිදු කර ඇත.	ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ ගිවිසුමට අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ)	ව්‍යාපෘතියේ ගනුදෙනු 2021 මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් කර නොතිබුණි.	චක්‍රලේඛ උපදෙස් හා මුදල් රෙගුලාසි සමඟ අනුකූල වීම අවශ්‍ය වේ.	ලිපි දෙකක් මඟින් අභ්‍යන්තර විගණන අංශය දැනටමත් දැනුවත් කර ඇත.	චක්‍රලේඛ උපදෙස් හා මුදල් රෙගුලාසි සමඟ අනුකූලව කටයුතු කර නොතිබුණි.

10. ආපදා කළමනාකරණ අංශය

10.1 ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය

2019 ජුලි 01 දින ආරම්භ කරන ලද ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය සඳහා අසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ ණය ගිවිසුම් අංක එල් 0124 යටතේ රු. මිලියන 14,528 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 3,868.08ක් විය. ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දීර්ඝ කර 2025 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් තත්ත්වාගණන නොකල මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	49	262	652
විදේශ අරමුදල්	145	754	2,281
මුළු වත්කම්	1,599	2,658	5,983
මුළු වගකීම්	456	263	141
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	757	1,511	3,798
දේශීය අරමුදල් මගින්	436	698	1,349

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් මාස 02කට වරක් පැවැත්විය යුතු නමුත්	2021, 2022	චක්‍රලේඛයේ ඇති උපදෙස් සමඟ අනුකූලවීම අවශ්‍ය වේ.	විවිධ හේතුන් නිසා චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීමට අපොහොසත් වී	2024 වර්ෂයේ සිට ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇත.

සමාලෝචිත වර්ෂයේදී ඇත.
කමිටු රැස්වීම් 01ක්
පමණක් පවත්වා තිබුණි.

11. වනාන්තර, වනජීවී සහ පරිසරය අංශය

11.1 පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය

2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ජාත්‍යාන්තර සංවර්ධන සංගමයේ ණය ගිවිසුම් අංක 5792 යටතේ රු. මිලියන 7630 ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 40 ක් විය. ව්‍යාපෘතිය අවස්ථා එකක දී දීර්ඝ කර 2023 මැයි 31 දින අවසන් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට විගණකාධිපති විසින් 2021,2022 සඳහා තත්වාගණනය කළ මතයක්ද 2023 වර්ෂය සඳහා තත්වාගණනය නොකළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල්	38.70	42.50	43
විදේශ අරමුදල්	4482.82	5763.08	7500
මුළු වත්කම්	5,313.58	10,223.53	11,601.53
මුළු වගකීම්	144.48	133.01	-
මුළු අරමුදල්	5038.06	9,796.49	11,407.67
විදේශ ණය මගින්	4999.36	9753.95	11,341.27
දේශීය අරමුදල් මගින්	38.70	42.54	66.40

එම විගණන මතයන් ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2022 වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ	2022	නියමිත ව්‍යාපෘති කාලය තුළ කාර්යයන් සම්පූර්ණ කර ගත යුතුය.	මේ සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වෙනත් කාර්යයන්ට ඵලදායීව යොදවාගෙන ඇත.	රතුගල ආශ්‍රිතව සැලසුම් කරන ලද වැඩ කටයුතු අතරමඟ නතර කර ඇත.

	මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නඟා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ තවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි.				
(ආ)	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්,	2022	නියමිත මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු අතර වියදම් අවම වන අයුරින් කටයුතු සැලසුම් කළ යුතුය.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ම මින් ඉදිරියට පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ඇත	ඉදිරියේදී මෙවැනි පාඨමාලා සංවිධානය කිරීමේදී වියදම් අවම වන පරිදි විධිමත්ව සිදු කරන ලෙස දෙපාර්තමේන්තු නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

	කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායි ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය.				
(ඇ)	මුල් ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1345 ක් වූ වන විද්‍යායතනයේ ඉදිකිරීම් කටයුතු මුල් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණ පත්‍ර (BOQ) අනුව සියයට 50 කට වඩා නිම කර තිබියදී ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහා රු.793,534,305 ක ඇස්තමේන්තුගත වටිනාකමකට නව සමාගම් 02 ක් වෙත පිරිනමා තිබුණි. ඒ අනුව මුල් කොන්ත්‍රාත්කරු විසින් කණිෂ්ඨ සේවක මණ්ඩල නිල නිවසේ ඉදිකිරීම් කටයුතු නතර කරන අවස්ථාව වන විට විදුලි සවි කිරීම්, නාන කාමර හා වැසිකිලි බිත්ති ජල කාන්දු වීම් වළක්වා ගැනීම සඳහා තීන්ත ආලේප කිරීම (Water	2023	විදේශාධාර ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද මෙම ඉදිකිරීමට අදාළව වැඩිපුර ගෙවා තිබුණු වියදම් සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	වන විද්‍යායතනයේ ඉදිකිරීම් සඳහා ද්වීගණනයක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර ඇති අතර එහි නිර්දේශ ලද පසු එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් කමිටු නිර්දේශ ලැබී නොතිබුණි.

	Proof) සහ පිටත බිත්තිවල තීන්ත ආලේප කිරීම යන කටයුතු සියයට 60 කට වඩා අවසන් කර තිබියදී සම්පූර්ණ කරන ලද වැඩ කොටස් ද ඇතුළත් කර ප්‍රමාණ පත්‍ර සකස් කර නව සමාගම වෙත පවරා තිබීම හේතුවෙන් රු.8,586,182 ක වැඩිපුර වියදමක් දැරීමට සිදු වී තිබුණි.				
(ඇ)	අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන්හි ගම්මාන සහ කුඹුරු වටා විදුලි වැට ඉදි කිරීම සඳහා මිලදී ගන්නා ලද උපකරණවලින් අදාළ සමිතිවලට හා අනුරාධපුර හා කුරුණෑගල ගොවිජන සංවර්ධන සහකාර අධ්‍යක්ෂ කාර්යාලවලට භාණ්ඩ නිකුත් කිරීමෙන් අනතුරුව රු.80,740,804 ක උපකරණ සහ එනජයිසර් බල ගැන්වීම සඳහා මිලදී ගන්නා ලද රු.534,400 ක 12V (90Am) බැටරි 16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන රිටිගල, මොරගොඩ හා මහ දිවුල්වැව වනජීවී බීට්ටු කාර්යාල පරිශ්‍රයන්හි අනාරක්ෂිතව ගබඩා කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ කාල සීමාව අවසන් වූ 2023 මැයි 31 දින වන විට එම දිස්ත්‍රික්ක 02හි ඉදිකළ යුතු 47 ක් වූ ගම්මාන වටා වැට සංඛ්‍යාවෙන් වැට 07 ක් අඩක් පමණක් නිමකර	2023	වැට ඉදිකිරීම, නඩත්තුව හෝ පසු විපරම් කිරීම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකරන බවට එම දෙපාර්තමේන්තුව විසින් විගණනයට දැනුම් දී ඇති හෙයින් මෙම උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කර අපේක්ෂිත ආකාරයට වැට ඉදිකර නඩත්තු කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවට යොමු කර වීමට කටයුතු කළ යුතුය.	කුඹුරු වටා විදුලි වැට ඉදිකිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ එකඟතාවය මත ඉදිරි කටයුතු සම්බන්ධීකරණයට පියවර ගෙන ඇති අතර ගම්මාන වටා විදුලිවැට ඉදිකිරීම සඳහා මිලට ගත් උපකරණවල ඉතිරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනයට ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.	ගම්මාන වටා විදුලිවැටට ඉදිකිරීම සඳහා මිලට ගත් උපකරණවල ඉතිරිය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගනිමින් තිබෙන අතර 2024 සැප්තැම්බර් 30 දින වන විටත් අඩක් නිම කළ හා ඉදිකර නොතිබුණු ගම්මාන වටා වැටවල් සම්පූර්ණ කර නොතිබුණි.

	තිබුණු අතර වැට 09 ක ඉදිකිරීම් ආරම්භ කර හෝ නොතිබුණි.				
(ඉ)	රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන වටිනාකම රු.2,818,200 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම තක්සේරු නොකළ nut & bolt 122 ක් සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ අතර එම අලාභය සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර, වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමටත් පියවර ගත යුතුය.	විශාල භාණ්ඩ තොග සඳහා මින් ඉදිරියට ආරක්ෂක සේවා මගින් ආරක්ෂාව සැලැස්මට කටයුතු කරනු ඇත.	දෙපාර්තමේන්තු පරීක්ෂණ අවසන් වී ඇති අතර අධිකරණ කටයුතු සිදු කරමින් පවතී.
(ඊ)	විදුලි වැට ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබූ Tension Spring ඒකක 3183 න් ඒකක 56 ක් පමණක් විදුලි වැටවල් සඳහා නිකුත් කර තිබීමෙන් රු.7,817,500 ක් වටිනා ඒකක 3127 ක් ද රු.1,408,500 ක් වටිනා විදුලි වැටට හානියක් සිදුවන අවස්ථාවකදී නාද වන Fence voltage alarm with siren and flashlight ඒකක 09 ක් ද මොරගොඩ වනජීවී බීටවු කාර්යාලයේ ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි.	2023	විදේශාධාර ව්‍යාපෘති යටතේ මිලදී ගත් මෙම උපකරණ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපර්තමේන්තු වේ කටයුතු මෙහෙය වීමට හා පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය.	ඉතිරි උපකරණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වේ ප්‍රයෝජනය සඳහා ලබා දීමට තීරණය කර ඇත.	ඉතිරි උපකරණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු වේ කටයුතු සඳහා යොදා ගනිමින් පවතියි.

12. බලශක්ති අංශය

12.1 විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය

2017 ජුනි 29 දින ආරම්භ කරන ලද විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහය වීමේ ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3409 යටතේ රු. මිලියන 17,392ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 6,836ක් විය. ව්‍යාපෘතිය දීර්ඝ කර 2025 මාර්තු 31 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්ත්වාගණන කළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල් (ලං.වි.ම)	1,191.03	744.63	166,08
විදේශ අරමුදල්	2,256.49	3,968.88	4,433.22
මුළු වත්කම්	9,949.00	15,359.43	19,902.06
මුළු වගකීම්	298.00	957.66	902.93
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	7,334.57	11,303.45	15,736.67
දේශීය අරමුදල් මඟින් (ලං.වි.ම)	2,316.41	3,098.31	3,262.44

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාවලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි 80 වන වගන්තියට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය නිතිපතා යාවත්කාලීන කෙරෙන ව්‍යාපෘති වෙබ් පිටුවක් පවත්වාගෙන යා	2023	ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතු වේ.	සටහන් කරගෙන ඇති අතර ඒ අනුව නිවැරදි කරනු ලැබේ.	ලංකා විදුලිබල මණ්ඩලයට සාමාන්‍ය වෙබ් පිටුවක් ඇති අතර දැනට පවතින වෙබ් පිටුවට ව්‍යාපෘති විස්තර

	යුතු අතර එහි (i) ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය, ලංසුකරු, කොන්ත්‍රාත් ප්‍රදානය (ii) ව්‍යාපෘතිය යටතේ බෙදා හරින ලද අරමුදල් භාවිතය සහ (iii) භෞතික ප්‍රගතිය ඇතුළත් වේ. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් සපුරා නොතිබුණි.				ඇතුලත් කිරීමට තොරතුරු තාක්ෂණ ශාඛාව සමග සාකච්ඡා කෙරෙමින් පවතී.
(ආ)	**පැකේජය 4** කිලෝ මීටර් 285, කිලෝ වොට් 33 කුළුණු මාර්ග, 2 එස්එස්බීබී ගැන්ට්‍රි 13ක් ඉදිකිරීම. ව්‍යාපෘතිය 2019 මැයි 30 වන දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කරන ලද අතර සම්පූර්ණ කොන්ත්‍රාත්තුවේ වටිනාකම එජඩො මිලියන 40.48 කි. මෙම කොන්ත්‍රාත්තුව බලාත්මක දිනය 2019 ඔක්තෝබර් 28 වන අතර කොන්ත්‍රාත් කාලය දින 730ක් විය.සම්පූර්ණ කිරීමේ දිනය 2021 ඔක්තෝබර් 27 වේ.මුල්ම වැඩ නිම කිරීමේ දින සිට වසර දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, 2024 මාර්තු 31 වන විට ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.වාර තුනක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර තුන්වන EOT අනුව අවසන් දිනය 2024 සැප්තැම්බර් 8 විය.2024 පළමු කාර්තුවේ ප්‍රගති	2023 2022 2021	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) හරහා තෙවන පාර්ශ්ව විරෝධතා සහ ඉඩම් නිරවුල් කිරීමේ ගැටළු විසඳීම කඩිනම් කරන ලදී.ණය කල් ඉකුත්වන දිනට පෙර ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා අවශ්‍ය සැලැස්මක් සකස් කර ඒ අනුව වැඩ කටයුතු සිදු කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දෙන ලදී.ඒ අනුව සැලැස්මට අනුකූලව සිදුකරන බව සහතික කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුගේ වැඩ බිම් ක්‍රියාකාරකම් සමීපව	ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 2024 ජූනි 30 වන විට සියයට 66.54 ක් වී තිබුණි.

	වාර්තාවට අනුව, කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 65 ක් වූ අතර කොවිඩ් වසංගතය සහ ගමනාගමන සීමා කිරීම්, ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ක්‍රියාකාරිත්වය යනාදිය ප්‍රමාදයට ප්‍රධාන හේතු වී තිබුණි.			නිරීක්ෂණය කිරීම සිදු කෙරේ.	
(ඇ)	**පැකේජය** 7 ලොට් ඒ 1: පන්නිපිටිය කොටුමා උපපොළේ 100 MVAr BSC ස්ථාපනය කිරීම ව්‍යාපෘතියේ කටයුතු 2019 අගෝස්තු 1 වන දින ආරම්භ කරන ලද අතර එය 2021 ජනවාරි 21 වන දින අවසන් කිරීමට ආරම්භයේදී අපේක්ෂා කර තිබුණි.වාර 4ක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර හතරවන EOT අනුව අවසන් දිනය 2022 අප්‍රේල් 30 වී තිබුණි.කොන්ත්‍රාත්කරු විසින් අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් පස්වන කාලය දීර්ඝ කිරීම(EOT) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර 2023 දෙසැම්බර් 31 වන විට ණය ලබා දී ඇත්තේ රු.මිලියන 97.1, එජඩො මිලියන 1.34 සහ යුරෝ මිලියන 3.4 කි. මූලික නිම කිරීමේ දින සිට වසර තුනකට වැඩි කාලයක් ගත	2023 2021	වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරු වන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	කාලය දීර්ඝ කිරීම, පරීක්ෂා කිරීම සහ ආරම්භ කිරීම සඳහා වන වගකීම බෙදීම සහ සැපයූ ධාරිත්‍රකවල (Capacitors) කාන්දුවීම් හඳුනා ගැනීම පිළිබඳ ගිවිසුම්ගත ගැටළු හේතුවෙන් ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි. 2024 ජනවාරි කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා නැවත ආරම්භ කිරීමත් සමඟ 2024 මාර්තු 1 වන දින වැඩබිම් කටයුතු නැවත ආරම්භ කරන ලදී. හඳුනාගත් කාන්දුගත ධාරිත්‍රක සඳහා ප්‍රතිස්ථාපන ධාරිත්‍රක(Capacitors) සැපයීමට නිෂ්පාදකයා එකඟ වූ අතර 2024 ජූනි 27 දින	2024 ජූනි 30 දිනට භෞතික ප්‍රගතිය සියයට 86.5 වී තිබුණි. සතියක ප්‍රගති නිරීක්ෂණය ක්‍රියාත්මක වන අතර ව්‍යාපෘතිය සැලසුම් කල පරිදි එහි අවසන් පරීක්ෂා කිරීම ආරම්භ කිරීම පවතින අතර 2024 දෙසැම්බර් 21 වන විට අවසන් කිරීමට නියමිතය.

	වී ඇතත්, ව්‍යාපෘතිය 2024 මාර්තු 05 වන විට අවසන් කර නොමැති අතර 2023 ඔක්තෝබර් 19 වන දින සිට වැඩබිම් කටයුතු අත්හිටුවා ඇති අතර එය මාස තුනකට වැඩි කාලයක් වී තිබුණි.2024 පළමු කාර්තුව සඳහා වන ප්‍රගති වාර්තාවට අනුව, පරීක්ෂණ සහ ක්‍රියාත්මක කිරීමේ ගැටළුව තවමත් විසඳී නොමැති අතර ස්ථාපිත ධාරිත්‍රකවල (Capacitors) කාන්දුවීම් හඳුනාගෙන ඇති බව සඳහන් කර තිබුණි.			වැඩබිමට නව ධාරිත්‍රක (Capacitors) ලැබුණි. කාලය දීර්ඝ කිරීම සහ වගකීම් බෙදීම පිළිබඳ ගැටළු නිරාකරණය කර 2024 දෙසැම්බර් 21 දක්වා කාලය දීර්ඝ කිරීම ලබා දී ඇති අතර පරීක්ෂා කර ආරම්භ කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.	
(ඇ)	ණය ගිවිසුමට අනුව, ණය ක්‍රියාත්මක වන දිනය (අංක3409 SRI) 2017 ජුනි 29 වන අතර මූලික ණය අවසන් දිනය 2022 මාර්තු 31 වන අතර පසුව, වාර දෙකක් තුල වසර තුනකින් ණය දීර්ඝ කරන ලද අතර ණය අවසන් කිරීමේ දිනය 2025 මාර්තු 31 දින විය. අවසාන දීර්ඝ කිරීමේ ලිපියට අනුව, මෙම ණය මුදල සමුච්චිතව මාස 36කින් දීර්ඝ කර ඇති බවත්, ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබා දුන් අවසන් දීර්ඝ කිරීම මෙය බවත් සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 මාර්තු 31 දිනට පැකේජ 4 සහ 7 ලොට් ඒ 1 භෞතික ප්‍රගතිය පිළිවෙලින් 65 සහ 78 වූ අතර, මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 69 සහ 74 වී තිබුණි. පැකේජය 4 භෞතික ප්‍රගතියෙන්	2023	වැඩ කඩිනම් කිරීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	ණය කල් ඉකුත්වීමේ දිනයට පෙර අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.	2024 ජුනි 30 දිනට පැකේජ 4 සහ 7 ලොට් ඒ 1 භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 66.54 සහ 86.5 වී තිබුණි.

	සියයට 35 ක් සහ පැකේජය 7 ලොට් ඒ 1 භෞතික ප්‍රගතියෙන් සියයට 22 ක් ඉතිරි කොන්ත්‍රාත්තු දීර්ඝ කිරීමේ කාල සීමාව (මාස 12) තුළ සම්පූර්ණ කළ යුතු බව නිරීක්ෂණය වී තිබුණි.				
(ඉ)	ව්‍යාපෘතියේ මූලික අදියරේ දී ඉඩම් අත්පත් කර ගැනීම අවසන් කිරීමට නියමිතව තිබුණද, 2023 දෙසැම්බර් 31 වන දින වන විටත් ඉඩම් 8 ක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.	2023 2022 2021	ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි.	කළමනාකාරිත්ව අදහස් ඉදිරිපත් කර නොතිබුණි.	සියලුම නීත්‍යානුකූල හිමිකම් ලංවිම වෙත පවරා ඇති අතර වන්දි ලබාදීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.
(ඊ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 සැප්තැම්බර් 18 දිනැති අංක PED 01/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ස්පෝර්ට් යුටිලිටි වාහන (Sport Utility Vehicle) දෙකක් සහ රෝද හතරෙන් බලගැන්වෙන කැබ් රථ(four wheel driven double cabs) දහසයක් පිළිවෙලින් රු.මිලියන 46.8ක් සහ රු.මිලියන 153.5ක පිරිවැයකට 2019 සහ 2020 කාලය තුල මිලදීගෙන තිබුණි.චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි සභාපති සහ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් වාහන ප්‍රසම්පාදනය සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.	2021	චක්‍රලේඛ උපදෙස් වලට අනුකූල වීම අවශ්‍ය වේ	ව්‍යාපෘති කටයුතු සඳහා ලංවිමට වෙන්කිරීමට වාහන නොතිබූ බැවින්, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ස්ථාපිත කමිටුවක අනුමැතිය ලබාගෙන ව්‍යාපෘති විෂය පථය යටතේ වාහන කිහිපයක් සපයා ඇත.	රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන තිබුණද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

12.2 මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය

2019 මාර්තු 04 දින ආරම්භ කරන ලද මන්නාරම සුළං බලශක්ති ජනන ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3585 යටතේ රු. මිලියන 31,104.84ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබු අතර ලංකා විදුලිබල මණ්ඩලය රු. මිලියන 8,818.22ක් විය. ව්‍යාපෘතිය දීර්ඝ කර 2024 ජුනි 30 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මුල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්ත්වාගණන නොකළ මතයක්ද 2022 සහ 2023 වර්ෂ සඳහා තත්ත්වාගණන කළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල් (ලං.වි.ම)	274.73	33.78	1,066.22
විදේශ අරමුදල්	2,727.09	2,046.77	3,459.24
මුළු වත්කම්	28,339.89	29,249.52	32,691.76
මුළු වගකිම්	2,658.61	2,359.16	1,277.87
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	23,245.95	25,292.71	28,751.95
දේශිය අරමුදල් මඟින් (ලං.වි.ම)	2,435.32	1,597.64	2,661.94

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තාවලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2021 නොවැම්බර් මාසයේදී සුළං බලාගාරය ලංකා විදුලිබල මණ්ඩලයට (CEB) පවරා එය ක්‍රියාත්මක කිරීමෙන් පසු බලාගාරයේ හානියට පත් තල හතරක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා රු.මිලියන 1,024.1 ක	2023	ලංකා විදුලිබල මණ්ඩලයට වත්කම් පැවරීමෙන් පසු දරන ලද ප්‍රාග්ධන වියදම් ලංකා විදුලිබල මණ්ඩලයේ පොත්වල	අකුණු සැර වැදීම හේතුවෙන් හානියට පත් සුළං ටර්බයින තල හතරක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය වන USD 3,025,406 ට	මෙම කාරණය තවමත් මතභේදාත්මක ය. ස්ථිර තීරණයක් ගැනීමෙන් පසුව මේ පිළිබඳව සුදුසු ලෙස කටයුතු කරනු ලැබේ.

මුදලක් ලංකා විදුලිබල මණ්ඩලයට දැරීමට සිදුවී තිබුණි. කෙසේ වෙතත්, ලංකා විදුලිබල මණ්ඩල මූල්‍ය ප්‍රකාශනයේ ඉහත ප්‍රතිස්ථාපන පිරිවැය ගැලපීමෙන් තොරව, එය ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.	ගිණුම්ගත කළ යුතුය.	සමාන මුදලක් EPC කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඉන් අවසන් රඳවා ගැනීමේ ගාස්තුව රඳවා තබාගෙන ඇත.

12.3 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර I)

2014 ජුලි 13 දින ආරම්භ කරන ලද හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර I) සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3146 සහ 3147 යටතේ රු. මිලියන 23,330.48ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ලංකා විදුලිබල මණ්ඩලය රු. මිලියන 5,184.55ක් විය. ව්‍යාපෘතිය දීර්ඝ කර 2024 ජුලි 13 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021,2022 සහ 2023 වර්ෂ 3 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්ත්වාගණන කළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල් (ලං.වි.ම)	414.33	527.17	(380.84)
විදේශ අරමුදල්	1,369.54	4,476.14	8,120.91
මුළු වත්කම්	15,549.52	20,960.07	29,050.98
මුළු වගකීම්	899.17	743.17	1,091.56
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	11,423.61	16,358.48	24,481.85
දේශිය අරමුදල් මඟින් (ලං.වි.ම)	3,271.73	3,858.41	3,477.56

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාවලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ) 01 වන කොටස- ජලවිදුලි උත්පාදනය සංවර්ධනය සහ පද්ධතියට සම්බන්ධ කිරිම. මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම				

(i)	ලොට් ඒ – සුදානම් කිරීමේ කටයුතු කොන්ත්‍රාත්තුව 2018 අප්‍රේල් 24 වන දින ප්‍රදානය කරන ලද අතර එය 2020 මැයි 06 වන දින අවසන් කිරීමට ආරම්භයේදී අපේක්ෂා කර තිබුණි. සිව් වරක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර කාලය දීර්ඝ කිරීම අනුව අවසන් දිනය 2024 ජූලි 13 වී තිබුණි. මූලික නිම කිරීමේ දිනයේ සිට වසර තුනකට වැඩි කාලයක් ගත වී තිබුණද, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබූ අතර කොන්ත්‍රාත්කරුගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් සැලකිය යුතු ප්‍රමාදයක් වී තිබුණි. තවද, ADB මෙහෙවර වාර්තාවට අනුව, 2023 ඔක්තෝබර් 30 දිනට කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය 77.7%ක් වූ අතර එය 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතියට සමාන වන අතර පවතින තොරතුරු අනුව මාස දෙකක කාලයක් සඳහා කිසිදු ප්‍රගතියක් පෙන්නුම් කර නොතිබුණි.	2023 2022 2021	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	නේවාසික කඳවුර, හැරවුම් මාර්ග ඉදිකිරීම් කටයුතු තවමත් අවසන් නැති අතර දැනට, කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ප්‍රශ්නය හේතුවෙන් වැඩ බිමේ කිසිදු කෙරීගෙන යන වැඩක් සිදු නොවේ.	කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට පියවර ගෙන ඇත.
(ii)	ලොට් ඒ2- ප්‍රධාන සිවිල් වැඩ කොන්ත්‍රාත්තුව 2019 ඔක්තෝබර් 04 දින ප්‍රදානය කරන ලද අතර එය 2023 සැප්තැම්බර් 14 වන දින අවසන් කිරීමට ආරම්භයේදි අපේක්ෂා	2023 2022 2021	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ	දැනට පවර්හවුස් සුපිරි ව්‍යුහය කොන්ක්‍රීට් කිරීම, වේල්ල කොන්ක්‍රීට් කිරීම, උමං මාර්ග සැකසීම, ස්විච් අංගන	Covid 19 වසංගත තත්ත්වය කොන්ත්‍රාත්කරුගේ බලමුලු ගැන්වීම 2020 අප්‍රේල් දක්වා ප්‍රමාද කළේය. ඉන් අනතුරුව රට

	කරන ලදී. වාර දෙකක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර කාලය දීර්ඝ කිරීම අනුව අවසන් දිනය 2024 ජූලි 13 විය.		සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	කටයුතු සිදු වෙමින් පවතී.	තුළ පැනවූ අගුලු දැමීම සහ ඇඳිරි නීතිය ව්‍යාපෘතියේ කටයුතුවලට බරපතල ලෙස බලපෑවේය.
(iii)	ලොට් බී- යාන්ත්‍රික හා විදුලි පහසුකම් කොන්ත්‍රාත්තුව 2020 මැයි 30 වන දින ප්‍රදානය කරන ලද අතර එය 2023 නොවැම්බර් 30 වන දින අවසන් කිරීමට ආරම්භයේදී අපේක්ෂා කර තිබුණි. එක් වරක් සඳහා කාලය දීර්ඝ කිරීමක් (EOT) ලබා දී ඇති අතර කාලය දීර්ඝ කිරීම අනුව අවසන් කිරීමට සැලසුම් කළ දිනය 2024 ජූලි 13 වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය 54.1%ක් වූ අතර එහිදී අපේක්ෂිත කාර්ය සාධනය 82.4%ක් සමඟ සැලකිය යුතු අපගමනයක් වන අතර 2024 මාර්තු 31 වන විට ප්‍රගතිය 61% ක්ව පැවතුණි.	2023 2022 2021	ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සඳහා ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා ක්‍රියාකාරකම් සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	පවර් හවුස් ටර්බයින, ජනක යන්ත්‍ර සහ උපාංග, වාන් දොරටු නිෂ්පාදන කටයුතු චීනයේ අවසන් කර ඇති අතර, එම ස්ථානයට ප්‍රවාහනය කිරීමේ කටයුතු කඩිනමින් ආරම්භ කෙරේ.	2024/09/30 වන විට කාර්යයේ ප්‍රගතිය 85% කි. පවර් හවුස් හි ජෙනරේටය, ටර්බයිනය වැනි ප්‍රධාන උපකරණ සියල්ල ක්‍රියාත්මක වෙමින් පවතී.
(ආ)	ණය ගිවිසුම සහ පහසුකම් පරිපාලන අත්පොත ක්‍රියාත්මක කිරීමේ කාලසටහනට අනුව, ව්‍යාපෘතිය 2019 වන විට අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, මුලික නිම කිරීමේ දින සිට වසර හතරකට වැඩි කාලයක් ගත වුවද, 2023 දෙසැම්බර් 31 දිනට	2023	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	2024 ජූනි වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 75.2% ක් වූ අතර 2024 ජූලි 13 වැනි දින ණය අවසන් වන දිනට ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය 97.5% ක් වේ.	2024/07/13 දිනට පිළිවෙළින් භෞතික ප්‍රගතිය 77%ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය 70.22%ක් විය.

	මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් 64% සහ 47% විය. තවද, 2024 ජූනි වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 73% ක් වූ අතර ADB මෙහෙවර වාර්තාවට අනුව, ලබා දී ඇති ණය කාලසීමාව තවදුරටත් දීර්ඝ කිරීමක් සිදු නොකරන අතර, ණය අවසන් කිරීමෙන් ඉක්මවා සිදු කරන ලද කාර්යයන් සඳහා වෙනත් මූල්‍ය ආධාර විකල්ප සම්පත් වලින් ලබා ගැනීම අවශ්‍ය වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ හදිසි අවශ්‍යතාවක් පිළිබඳ 2014 මැයි 07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව පිවිතුරු බලශක්ති උත්පාදනය ඉහළ නංවා පිවිතුරු සහ විශ්වාසනීය විදුලිබල සැපයුමක් ලබා ගැනීමේ සමස්ත වැඩසටහනේ අරමුණ අපේක්ෂා කළ පරිදි ඉටු නොවනු ඇත.				
(ඇ)	සමාලෝචිත වර්ෂය සඳහා හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර I) සඳහා රු.මිලියන 14,966 ක් වෙන් කර ඇති අතර, ඉන් රු.මිලියන 7,740 ක් පමණක් වර්ෂය තුළ භාවිතා කර තිබුණි. තවද, පහසුකම් පරිපාලන අත්පොතට අනුව, එජඩෝ	2023	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	ඉහත පැකේජවල දක්වා ඇති හේතු අනුව, ණය කල් ඉකුත්වන දිනට පෙර අරමුදල් සම්පූර්ණයෙන්ම භාවිත කිරීම කළ නොහැකි විය.	2024/07/13 වන විට ADB ණය මුදලින් USD මිලියන 66.46 මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය සඳහා භාවිතා කර ඇත. එය 70.22% කි.

	මිලියන 180ක වෙන්කිරීමෙන් (ADB සහ AFD අරමුදල්) එජඩො මිලියන 102.45 (වෙන් කළ අරමුදල්වලින් 57%) පමණක් 2023 දෙසැම්බර් 31 වන විට භාවිත කර තිබුණි. ADB ණය ගිවිසුම 2014 නොවැම්බර් 20 දින අත්සන් කරන ලද අතර එය 2015 පෙබරවාරි 02 දින සිට බලාත්මක වී තිබුණි. ණය ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට වසර අටකට වැඩි කාලයක් ගත වී තිබුණද, 2024 ජූලි 13 වැනි දින ණය කල් ඉකුත්වන දිනය වන විටත් ගිවිසුම මගින් වෙන් කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් භාවිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පිවිතුරු බලශක්ති උත්පාදනය ඉහළ නංවා පිවිතුරු හා විශ්වාසනීය විදුලිබල සැපයුමකට ප්‍රවේශ වීමේ ව්‍යාපෘති අරමුණු අපේක්ෂා කළ පරිදි ඉටු නොවනු ඇත.				
(ඇ)	පහසුකම් පරිපාලන අත්පොතට අනුව, රටේ දිගුකාලීන අභියෝගය වන්නේ මිල අධික ෆොසිල ඉන්ධන බලශක්තිය මත අධික ලෙස යැපීම අවම කර ගැනීම සහ ඉල්ලුම වර්ධනය වැඩි වශයෙන් සපුරා ඇත්තේ මිල අධික තෙල්වලින් ක්‍රියාත්මක වන තාප බලාගාර යනාදිය මගින් වීමත්ය. කෙසේ	2023	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වන්ගේ වැඩ සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය සඳහා පහසුකම් පරිපාලන අත්පොතට අනුව වෙන් කර ඇති මුදල එජඩො මිලියන 113.86ක් වන අතර ඉන් එජඩො මිලියන 44.41ක් පමණක්	2024/07/13 වන විට ADB ණය මුදලින් USD මිලියන 66.46 මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය සඳහා භාවිතා කර ඇත.එය 70.22% කි.

	වෙතත්, ඉහත කරුණු මගින් සඳහන් කරන ලද මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකය අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වනු ඇත. පහසුකම් පරිපාලන අත්පොතට අනුව, 1 කොටස- සංවර්ධනය කර විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලද ජලවිදුලි උත්පාදනයේ සම්පූර්ණ ප්‍රතිපාදන එජඩො මිලියන 128.53 ක් වූ අතර ඉන් එජඩො මිලියන 46.42 ක් පමණක් 2023 දෙසැම්බර් 31 වන විට භාවිතා කර තිබුණි.			2023 දෙසැම්බර් 31 දිනට භාවිත කර තිබුණි.	
(ඉ)	ආනයනය කරන ලද වාහන 3 ක මුළු තථ්‍ය CIF වටිනාකම රු. මිලියන 8.9 කට සමාන එජඩො 58,446 ක් වුවද, ව්‍යාපෘතියේ 2 කොටසේ ලොට් බී2 හි ප්‍රමාණ පත්‍රයට අනුව එම වාහන 3 ආනයනය කිරීම සඳහා රු. මිලියන 24 කට සමාන එජඩො 158,065 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රමාණ පත්‍රයේ මුළු මුදලම කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. ඒ අනුව, ව්‍යාපෘතිය විසින් වාහන මිලදී ගැනීමේදී රු. මිලියන 15.1 ක ආර්ථිකමය නොවන වියදමක් දරා ඇති බව නිරීක්ෂණය විය.	2021	අනාගතයේදී අවශ්‍ය වත්කම් තථ්‍ය පිරිවැය මත සපයා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	CIF අනුව වාහනයේ මිල සහ කොන්ත්‍රාත්කරු විසින් පිරිනමන ලද මිල වෙනස් වුව ද, කොන්ත්‍රාත් ගිවිසුමේ ලංසු මිලට අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීමට ලංවීමට බැඳීමක් ඇත.	කොන්ත්‍රාත් ගිවිසුමේ මිල ලංසුව අනුව කොන්ත්‍රාත්කරුට ගෙවීමට ලංවිම බැඳී සිටී.

12.4 හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II)

2017 ජුලි 10 දින ආරම්භ කරන ලද හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර II) සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 3483 සහ 3484 හා ප්‍රංශ නියෝජිතායතනයේ 102201 දරන ණය පහසුකම් ගිවිසුම් යටතේ රු. මිලියන 27,985.45ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබු අතර ලංකා විදුලිබල මණ්ඩලය රු. මිලියන 11,822.80ක් විය. ව්‍යාපෘතිය දීර්ඝ කර 2024 ජුනි 30 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ දෙක සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට විගණකාධිපති විසින් තත්ත්වාගණන කළ මතයක්ද 2023 වර්ෂය සඳහා තත්ත්වාගණන නොකළ මතයක්ද ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම			
රජයේ අරමුදල් (ලං.වි.ම)	2,454.33	2,760.81	1,419.35
විදේශ අරමුදල්	7,403.11	4,995.44	8,375.38
මුළු වත්කම්	28,017.51	36,758.82	44,992.30
මුළු වගකීම්	2,487.19	3,314.31	1,714.63
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	20,920.02	25,937.63	34,351.43
දේශිය අරමුදල් මඟින් (ලං.වි.ම)	4,610.28	7,506.87	8,926.23

මීට අමතරව ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තාවලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ) පැකේජය 8 ලොට් බී අම්බලන්ගොඩ 132/33 kVකොටුමා උපපොළ වැඩිදියුණු කිරීම, පන්නල 132/33kV කොටුමාඋපපොළ				

	වැඩිදියුණු කිරීම සහ 132/33kV 31.5 MVA අමතර ට්‍රාන්ස්ෆෝමර් 2ක් සැපයීම ව්‍යාපෘතිය නිම කිරීමට ඇත්තේ මාස තුනක කාලයක් පමණි. ණය දීර්ඝ කිරීමේ ලිපියට අනුව, 2023 ජුනි 30 දින ණය අවසන් දිනය 2024 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.මෙම දීර්ඝ කිරීම සමඟ, ණය වර්ග දෙකම සමුච්චිතව මාස 24 කින් දීර්ඝ කරනු ලබන අතර මෙය ADB විසින් ලබා දෙන අවසාන දීර්ඝ කිරීම වේ. ණය අවසන් වන දිනයෙන් ඉදිරියට වැඩ කිරීම නිසා අනාගතයේ දී බැඳීම් ගාස්තු ඇතිවිය හැක. ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම මගින් ව්‍යාපෘතිය නියමිත කාලයේදී නිම කිරීම සහතික කිරීමට ඇති කැපවීම අවධාරණය කරනු ඇත.	2023	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	2024 ජුනි දක්වා ව්‍යාපෘති දීර්ඝ කිරීම ලබා දෙන ලදී. ණය වලංගු කාලසීමාව සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත්තු සමීපව නිරීක්ෂණය කරන ලද අතර 2024 ජුනි මස අවසානයේදී සියලුම ප්‍රධාන වැඩ නිම කිරීමට හැකි විය.	ව්‍යාපෘතිය 2024.06.30 දින නිම කරන ලදී. ව්‍යාපෘතිය 2024 ජුනි 30 දින අවසන් කළද ව්‍යාපෘතිය භාර දී නොතිබූ අතර ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර නොතිබුණි.
(ආ)	**පැකේජය 9: කෙරවලපිටියේ 220kV ස්විචින් ස්ටේෂන්** ව්‍යාපෘති කටයුතු 2020 අගෝස්තු 14 වන දින ආරම්භ කරන ලද අතර 2022 අගෝස්තු 14 වන දින සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන ලදී. 2024 පෙබරවාරි 27 දක්වා කාලය දීර්ඝ කර තිබුණි. මූලික සම්පූර්ණ කිරීමේ දිනයේ සිට වර්ෂයකට වඩා වැඩි කාලයකට පසුවද භෞතික ප්‍රගතිය 96	2023 2022	වැඩ කඩිනම් කිරීමට ක්‍රියා කළ යුතු අතර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු වන්ගේ කටයුතු සමීපව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ.	ව්‍යාපෘතියේ ප්‍රගතියට කොවිඩ් 19 වසංගතය සහ විශේෂයෙන් සෘණාත්මක ආර්ථික තත්ත්වය මෙම කාලසීමාව තුළ බලපෑවේය.	2024 මැයි 31 වන දින ව්‍යාපෘතිය අවසන් කළද ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලයට භාර දී නොතිබුණි.

	විය. 2024 පළමු කාර්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, භෞතික ප්‍රගතිය ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වූයේ COVID 19 වසංගතය, ජාත්‍යන්තර ගුවන් තොටුපළ වසා දැමීම සහ ගමන් සීමා කිරීම වේ. චීනයේ මුල් GIS නිෂ්පාදනයට ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් විස්තරාත්මක සැලසුම් අවසන් කිරීමේ ප්‍රමාදය, වෙළඳපොලේ ද්‍රව්‍ය හිඟය සහ වැඩබිම් සඳහා ශ්‍රම බලකාය සකස් කිරීමේ ගැටළු මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු වී තිබුණි.				
(ඇ)	2024 මාර්තු 31 වන විට පැකේජ 7 න් 5 ක භෞතික ප්‍රගතිය සියයට 100 ක් අවසන් වුවද, එම සම්පූර්ණ කරන ලද පැකේජවලට අදාළ වාහන 2024 මැයි 31 වන දින වනවිටත් ලංකා විදුලිබල මණ්ඩලයට මාරුකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී ලංකා විදුලිබල මණ්ඩලයේ රු.මිලියන 430.7 ක් වටිනා වාහන 45 ක් ව්‍යාපෘතිය සතුව තිබූ අතර ඉන් කොටසක්වත් CEB වෙත භාර දී නොතිබුණි.	2023	නිම කරන ලද පැකේජවලට වෙන්කර ඇති වාහන ලංකා විදුලිබල මණ්ඩලයට භාර දිය යුතුය.	සියලුම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයන්වල ඉතිරි පැකේජ සඳහා පවතින වාහන භාවිතා කිරීමට සිදු විය.	ලංකා විදුලිබල මණ්ඩලයේ කළමනාකාරීත්වයේ නිසි අනුමැතිය ඇතිව අනෙකුත් වාහන අදාළ ශාඛා වෙත පැවරීමට පියවර ගැනේ.

13 සෞඛ්‍ය අංශය

13.1 කොවිඞ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේක මූල්‍යනය ව්‍යාපෘතිය

2020 ජුලි 23 දින ආරම්භ කරන ලදකොවිඞ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීම සඳහා අතිරේකමූල්‍යනය ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ ණය ගිවිසුම් අංක 67270LKයටතේ රු. මිලියන 7,803.87 කට සමාන එ.ජ.ඩො 41.09 ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි.වපෘතියේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණි.

2021 සහ 2022 වර්ෂ වල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වසර 2 සඳහාව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලටඅදාලව විගණකාධිපති විසින් පිළිවෙලින් තත්ත්වාගණනය නොකළ මතයක් සහ තත්ත්වාගණනය කළමතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	831	277
මුළු වත්කම්	831	277
මුළු වගකිම්	831	277
මුළු අරමුදල්		
විදේශ ණය මගින්	831	277

එම තත්වාගණකල විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිද විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	රට අගුලු දැමීම සහ ඇදිරි නීතිය හේතුවෙන් ජීවනෝපාය අහිමි වූවන් සඳහා රු.5,000 දීමනා සහ රු. 10,000 ක අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දීමට රජය ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි.ඒ	2021	රජයේ සහ ලෝක බැංකු අරමුදල් භාවිතය වෙනම හඳුනාගැනීම සඳහා වාර්තාව පවත්වාගෙන යා යුතුය.	අදාළ ණය ගිවිසුම 2021.01.20 දින සංශෝධනය කර ඇත.මහා භාණ්ඩාගාරයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලබා දෙන ලද	මෙම ප්‍රතිපාදන ලබාදීම සිදුකර ඇත්තේ රජයේ අරමුදල් වලින් වන අතර එම ප්‍රතිපාදන ලෝක බැංකුව විසින් පසුව ප්‍රතිපූර්ණය කර ඇත.

	අනුව ,ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ඉහත දීමනා සඳහා රු. මිලියන 9,887 ක මුදලක් ලබා දී ඇති අතර රජය රු. මිලියන 12,249 ක් වැය කර තිබුණි.කෙසේවෙතත්, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ මුදල් ලබා දීම් සම්බන්ධ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි.		ප්‍රතිපාදන රජයේ මුදල් බැවින් එය ලෝක බැංකු ආධාර යටතේ ලබා දුන් මුදල් ලෙස සඳහන් කර නොමැත.	
(ආ)	පොරොත්තු ලේඛනයේ 2022 සිටින වකුගඩු රෝගීන් 13849ක් වෙනුවෙන් මාස 4කදී රුපියල් මිලියන 276.98ක් ගෙවා තිබුණද, නිවැරදි වකුගඩුරෝගීන්ට මෙම මුදල ගෙවා ඇත්ද යන්න තහවුරු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වූ බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.	ගෙවීම්වල නිවැරදි බව තහවුරු කිරීමට අවශ්‍ය සියලුම සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය.	සමාජ සේවා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් යාවත්කාලීන කෙරේ. එබැවින් රෝගීන්ගේ අයදුම්පත්‍ර, වෛද්‍ය වාර්තා ආදී සියලුම වාර්තා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිලාභීන් සංඛ්‍යාව අනුව ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන ලබාදීමට	ප්‍රතිලාභීන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම පෙර පරිදිම සිදුවන අතර ප්‍රතිපාදන ලබාදීම මුදල් අමාත්‍යාංශය විසින් සෘජුවම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත බැර කිරීම සිදු කරයි. පසුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කිරීම සිදු කරයි.

ලැයිස්තු සකස් කරන අතර එම ලේකම් කාර්යාලයේ නිර්දේශය මත මෙම අමාත්‍යාංශයේ ගිණුම් අංශය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිකුත් කරයි.

13.2 සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

2018 ඔක්තෝබර් 18 දින ආරම්භ කරන ලද සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,559 කට සමාන ජපන් යෙන් මිලියන 11,352 කි. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතන ණය ගිවිසුම් අංක SL . P118 යටතේ රු. මිලියන 15,519 කට සමාන ජපන් යෙන් මිලියන 10,639 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබුණි.ඉතිරි මුදල වන රු. මිලියන 1,040 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. ව්‍යාපෘතියේ කටයුතු 2025 ඔක්තෝබර් 20 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණද, 2023 අප්‍රේල් සිට ව්‍යාපෘතියේ කටයුතු අතරමග නවතා තිබුණි.

2021 සහ 2022 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 යන වර්ෂ සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව විගණකාධිපති විසින් පිළිවෙලින් තත්ත්වාගණනය නොකළ මතයක් සහ තත්ත්වාගණනය කළ මතයක් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022
	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	236	50
මුළු වත්කම්	489	538
මුළු වගකීම්	489	538
මුළු අරමුදල්		
විදේශ ණය මගින්	331	437
දේශීය අරමුදල් මගින්	65	89

එම තත්ත්වාගණනය කළ විගණන මතය ඉදිරිපත් කිරිමට හේතු වූ කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බදුල්ල පළාත් මහ රෝහලේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බදුල්ල පළාත් මහ රෝහලේ මහල් 10 කින් යුත් ගොඩනැඟිල්ලේ ඉදිකිරීම 2018 වසරේ මධ්‍යම	2021	අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනිමට ක්‍රියා කළ යුතුය.	ඉදිකිරීමේ ප්‍රගතිය වැඩිදියුණු කිරීම සඳහා ඉදිකිරීමේ ප්‍රගතිය වැඩිදියුණු කිරිම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සෞඛ්‍ය අමාත්‍යාංශය,	2022 RAMP තීරණ පරිදි මෙම ව්‍යාපෘතිය නතර කර ඇත. NOR අනුමැතිය පරිදි 2024 සැප්තැම්බර් මස වන විට නැවත වැඩ ආරම්භ කර ඇත.

	ඉංජිනේරු උපදේශන කාර්යාංශයට පිරිනමන ලද අතර එය 2021 අප්‍රේල් මාසයේදි අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් 2023 මාර්තු වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. රු.මිලියන 1,271 ක උපකරණ සපයා සවිකිරිමට සැලසුම් කර තිබුණද ඉහත ඉදිකිරීම් නිම කර නොතිබීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.			මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය කර ඇත.	
(ආ)	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහල, මහනුවර, කුරුණෑගල සහ අනුරාධපුර ශික්ෂණ රෝහල්වල ඉදිකිරීම් සහ කොළඹ, කළුතර, පේරාදෙණිය MLT පුහුණු පාසල්වල මෙන්ම කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය සඳහා උපකරණ සපයා සවිකිරිම 2019 ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කිරීමට නියමිත තිබූ නමුත්, 2023 මාර්තු වන විට අවම වශයෙන් ටෙන්ඩර් කැඳවීම හෝ සිදු කර නොතිබුණි.	2021	අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනිමට ක්‍රියා කළ යුතුය.	ණය අනුමත කිරිමට පෙර ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්ම සකස් කර තිබුණි. JICA විසින් 2018 ඔක්තෝබර් 19 දින ණය අනුමත කරන ලදි. ව්‍යාපෘති කළමණාකරණ ඒකකය 2019 ජනවාරි 01 දින පිහිටුවන ලදී. නීතිපති දෙපාර්තමේන්තු වේ මාස පහක ප්‍රමාදයක් සහ ලොව පුරා පැතිර යන COVID – 19 වසංගතය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසටහන	ත්‍රිකුණාමලය, අනුරාධපුර JICA අනුමැතිය පරිදි ලද මුදල් යටතේ වැඩ ආරම්භ කර ඇත. කුරුණෑගල සහ මහනුවර ශික්ෂණ රෝහල් සංශෝධිත විෂය පථයට අනුව වැඩ ආරම්භ කර ඇත. කොළඹ, කළුතර, පේරාදෙණිය MLT පුහුණු පාසල්වල මෙන්ම කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය සඳහා සංශෝධිත විෂය පථයට අනුව වැඩ ආරම්භ කර ඇත.

				වෙනස් කරන ලදී.	
(ඇ)	2021 වර්ෂය අවසන් වන විට, ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන කොන්ත්‍රාත් සම්බන්ධ ක්‍රියාවලියේ අදාළ මූලික කටයුතු සිදුකර ඇතත් ලංසු කැඳවීමට කටයුතු කර නොතිබුණි. කෙසේ නමුත් ව්‍යාපෘති උපදේශනය සඳහා යෙන් මිලියන 872 ක් වෙන් කර තිබුණි.	2021	අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට ක්‍රියා කළ යුතුය.	ඉදිකිරීම් පැකේජවල සියලුම සවිස්තරාත්මක සැලසුම් සහ ටෙන්ඩර් ලියකියවිලි සකස් කර 2022 ජූනි 17 වැනි දින JICA වෙත එකඟතාව සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ඉදිරිපත් කර ඇත. අවාසනාවකට ටෙන්ඩරය ප්‍රකාශයට පත් කිරීමට තවමත් අනුමැතිය ලැබී නොමැත. විගණන විමසුමේ සඳහන් කර ඇති පරිදි උපදේශන සේවාවේ මූල්‍ය ප්‍රගතිය නිවැරදිය. ණය ලබා දීම අත්හිටුවීම හේතුවෙන් භෞතික ප්‍රගතිය 30% මට්ටමේ පවතී.	සංශෝධිත විෂය පථයට අනුව වැඩ ආරම්භ කර ඇත.

13. 3 සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය.

2021 නොවැම්බර් 17 දින ආරම්භ කරන ලද සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යකරණය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 24,538.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 123 කි. මෙයින් රු.මිලියන 22,543.5 කට සමාන එ.ජ.ඩො. මිලියන 113 ක් (අංක L 4121 ගිවිසුම යටතේ එ.ජ.ඩො. මිලියන 110 ක් ණය වශයෙන් ද අංක G 9222 – SRI ගිවිසුම යටතේ එ.ජ.ඩො. මිලියන 03 ක ප්‍රදානයක්) ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වන රු.මිලියන 1,995 ක් මූල්‍යකරණය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි. 2026 මැයි 31 දින ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබේ.

2021,2022 යන වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන් ද 2023 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලටඅදාළව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	2,022	657	8,070
මුළු වත්කම්	2,452	3,619	13,972
මුළු වගකීම්	2,452	3,619	13,972
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	1,996	4,684	9,504
විදේශ ප්‍රදාන මඟින්	-	-	-
දේශීය අරමුදල් මඟින්	-	-	70

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	රු. මිලියන 2328 ක වෛද්‍ය උපකරණ වර්ග 19 ක අයිතම 4400 ක් මිලදී ගැනීම සඳහා සැපුම්කරුවන් වෙත	2021	ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුතුව සිදු කල යුතුය.	ලංසු ලේඛනයේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූල විය හැකි ලංසුකරුවන්	මෙම අයිතම සඳහා පිරිවිතර සකස් කිරීම ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මගින් සිදුකර

	කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී. වෛද්‍ය උපකරණ වර්ග 11 කට අයත් අයිතම 1,725 ක් මිලදි ගැනීමේදි ජීව වෛද්‍ය ඉන්ජිනේරු සේවා අංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර තිබුණු සම්මත පිරිවිතර සංශෝධනය කර තිබුණු අතර එසේ සිදු කිරිමට පිළිගතහැකි සාධාරණ හේතු සහ ලබා ගන්නා ලද අනුමැතීන් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.ඩිෆබ්‍රිලේටර් 50 ක් මිලදි ගැනීමේදී එක් පිළිවිතරයක් එක් ලංසුකරුවකුට පමණක් සපුරාලිය හැකි පරිදි පක්ෂග්‍රාහි ලෙස සංශෝධනය කිරීම හේතුවෙන් අනෙකුත් සියලුම පිරිවිතර හා අවශ්‍යතා සපුරා තිබූ අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැම්මට නොහැකිවිම හේතුවෙන් සිදු වි තිබුණු පාඩුව රු. මිලියන 37 ක් විය.			සිටින නමුත් ඔවුන් මෙම ප්‍රසම්පාදනය සඳහා සහභාගි වී නොමැති බව.	ඇති අතර ඊට අනුකූලව ලංසු කැඳවීම සඳහා ජෛව වෛද්‍ය සේවා ඉංජිනේරු අංශයේ නිගමනයට අනුව අනුමත පිරිවිතර සඳහා අයදුම් කල හැකි ලංසුකරුවන් සිටියද ඔවුන් මෙම ප්‍රසම්පාදනය සඳහා අයදුම් කර නොමැත. මෙම අදාල උපකරණ ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය මගින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති අතර ඒ සඳහා ගෙවීම් පමණක් Retroactive Financing යටතේ ව්‍යාපෘතිය මගින් සිදුකර ඇත.
(ආ)	මුදල් රෙගුලාසි අංක 753(1) සහ 753(2) ප්‍රකාරව නිකුත් කරන නිලධාරියා පොදු ආකෘති පත්‍ර අංක 141 හි නිකුත් කිරීමේ නියෝගය සකස් කළ යුතු අතර ලබන නිලධාරියා පොදු ආකෘති පත්‍ර අංක219 හි ලැබීම් නියෝගයක් සකස් කළ යුතුය. කෙසේ වෙතත් අදාළ නිලධාරීන් රු.	2022	මූල්‍ය රෙගුලාසිවලට අනුකූල විය යුතුය.	ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට ලැබෙන කොවිඩ් සත්කාරයට අදාළ උපකරණ අවශ්‍යතාවය අනුව ඔවුන් විසින් බෙදා හැරීම සිදු කරනු ලබන අතර අයිතම	අදාල උපකරණ ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශය විසින් ලංසු කැඳවා මිලදීගෙන තිබූ අතර සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ අතිරේක මූල්‍යායනය ව්‍යාපෘතියේ Retroactive Financing (පසුගාමී මූල්‍යකරණය)

	මිලියන 2,597 ක් වටිනා වෛද්‍ය උපකරණ වෙනුවෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.			බෙදාහැරීම පිළිබඳව අපට පාලනයක් නොතිබුණි.	යටතේ ගෙවීම් සිදුකර ඇත. අදාල ලැබීම් නියෝග තොග සටහන් පොත් ආදී සියළුම අදාල ලියකියවිලි නිසි පරිදි ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.
(ඇ)	අදාළ යන්ත්‍ර සපයා සවි කිරීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත 2021 වසරේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගත් දැඩි සත්කාර ඒකක වාතාශ්‍ර යන්ත්‍ර 25න් ජාතික රෝහලට ලබාදී ඇති යන්ත්‍ර 05ක් සහ ජෛව වෛද්‍ය ඒකකයට ලබාදුන් එක් යන්ත්‍රයක් 2023 මැයි 08 දින වන විටත් සවිකර නොතිබුණි. කෙසේ වෙතත්, 2022 මාර්තු 15 දින රු.මිලියන 4.3 ක් වටිනා බැංකු ඇපකරයක් ලබාගෙන ඇති අතර, මෙම ගනුදෙනුවට අදාළ අවසාන ගෙවීම වන රු. මිලියන 18 ක් 2022 මාර්තු 24 දින ගෙවා තිබුණි. මෙම බැංකු ඇපකරයේ කාලසීමාව 2023 අප්‍රේල් 23 දිනෙන් අවසන් වී ඇති බවත්, එහි වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු නොකළ නිසා රජයට පාඩුවක් සිදුවිය හැකි බවත් නිරීක්ෂණය විය.	2022	නිසි සැලසුම් සකස්කර පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂවරයාගේ ලිඛිත නිර්දේශය මත ගෙවීම් සිදු කර ඇති අතර, යන්ත්‍ර සවි කිරීම සඳහා සූදානම් වූ පසු ස්ථාපනය සිදු කරනු ලැබේ.	මෙම යන්ත්‍ර එවකට අදාල ස්ථානවල ස්ථාපනය කිරීම සඳහා එම ස්ථාන සූදානම් නොමැති නිසා ජෛව වෛද්‍ය අංශයේ නිර්දේශ මත ගෙවීම් සිදුකර ඇති අතර ඒවා අදාල ස්ථාන වල ස්ථාපනය කර ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂක සනාථ කර ඇත.
(ඈ)	2023 වර්ෂය සඳහා සකස් කරන ලද කාර්ය සාධන වාර්තාවට අනුව	2023	නියමිත කාල සීමාව තුළ කාර්යයන්	විවිධ හේතූන් මත සැලසුම් කළ කටයුතු ප්‍රමාද	ඇමෙරිකානු ඩොලර් මිලියන 3 ක ප්‍රදානය ජපානයේ JFPR

ක්‍රියාකාරකම් 07ක් සඳහා රුපියල් මිලියන 1324.23ක් වෙන් කර තිබුණද 2023 වර්ෂය තුළ එකී කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබුණි.	සම්පූර්ණ කළ විය. යුතුය.	යටතේ ලබාදී ඇත. එමගින් , (a) සුවසැරිය පදනම සඳහා ගිලන් රථ 25ක් ලබා ගැනීම සඳහා දෙවරක් ලංසු කැඳවීම සිදු කලද ලංසු ප්‍රදානය කිරීම මේ දක්වා සිදු කිරීමට නොහැකි විය. (b) මෙම ගිලන් රථ ලංසුව නොපැවරීම නිසා ජීවිත ආධාරක උපකරණ ලබාගැනීම සිදු නොකරන ලදි. (c) සුව සැරිය පදනම සඳහා ගිලන් රථගාල් 20ක් ඉදිකිරීම් සඳහා සැලසුම්කර තිබූ නමුත් ඒ සඳහා පොලිස් ස්ථාන වල ඉඩකඩ වෙන්කර ගැනීම, ප්‍රමාණාත්මක බිල්පත් සකස් කිරීම් (BOQ) හා උපදේශන සේවා අදාල පලාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තු වෙන් ලබා ගැනීම සඳහා

					කාලය ගතවීම මත 2023 දී අදාල කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. සුවසැරිය නිලධාරීන් පුහුණු කිරීම සඳහා උපකරණ හා Audio Visual Equipment ලබා ගැනීමේ කොන්ත්‍රාත්තුව 2023 පිරිනැමීමට නොහැකි විය.
(ඉ)	ඌව පළාතේ ව්‍යාපෘති 05 ක ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 243.5 කි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 378 ක් වූයෙන් මුළු ඇස්තමේන්තු වටිනාකමට වඩා සියයට 55 කින් වැඩිය.	2023	ඇස්තමේන්තු සංශෝධනයකදී, නැවත ලංසු කැඳවිය යුතුය.	ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාවේ දී ලංසු කැඳවන ලද අතර පෙර නොවූ විරූ ලෙස ද්‍රව්‍ය මිල ඉහළ යාම සලකා බලා ලංසුකරුවන් විසින් සියලුම ලංසු ඉදිරිපත් කරන ලදී. එකී ලංසු ඉංජිනේරු ඇස්තමේන්තුව වඩා බෙහෙවින් වැඩි විය. කෙසේ වෙතත්, එම කාලය තුළ ද්‍රව්‍යමය මිල උච්චාවචනයන් සැලකිල්ලට ගනිමින් ඉංජිනේරු ඇස්තමේන්තු සංශෝධනය කර ඇති අතර අඩුම ප්‍රතිචාර දක්වන ලංසුකරුවන්ට	මෙම කොන්ත්‍රාත්තු සඳහා BOQ බිල්පත් උපදේශන සමාගම පිලියෙල කොට ඇත්තේ වර්ෂ 2022 ආර්ථික අර්බුදයට පෙරය. ආර්ථික අර්බුදය පැවති සමයේ ලංසු කැඳවීම් කෙරුණු අතර අමුද්‍රව්‍ය මිල ඉහලයාම මත ලංසු වල මිල ගණන් BOQ වල මිල ගණන් වලට වඩා බොහෝසේ වැඩිවී තිබුනි. මෙම BOQ පත් නව මිල ගණන් මත නැවත සකස් කෙරුණු අතර ඒවා වඩා අඩුම ලංසු ලාභීන්ගේ ප්‍රමාණපත් සමඟ සැසඳීම් කර ඇත. එම සැසඳීම් මත එම මිල ගණන් නව ප්‍රමාණපත් සමඟ

				කොන්ත්‍රාත් ලබා දීමට පෙර ලංසු මිල සමඟ සංසන්දනය කර ඇත.	සැසඳීම් කිරීමෙන් පසු පමණක් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් නිර්දේශ ලබා දී ඇත.
(ඊ)	2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අනුව, පළාත් හතරට අදාළව ප්‍රාථමික සෞඛ්‍ය සේවා සංවර්ධනය යටතේ රෝහල් 42ක සිවිල් කටයුතු සඳහා රුපියල් මිලියන 837.68ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපාදනවලින් උපයෝජනය සියයට 11කි.	2023	ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	සිවිල් වැඩ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම ප්‍රමාද වීම සහ කොන්ත්‍රාත්කරුවන් මුහුණ දෙන විවිධ ගැටලු හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල මන්දගාමී ප්‍රගතිය වසර සඳහා ප්‍රතිපාදන අඩුවෙන් උපයෝජනයට හේතු වී ඇත..	ප්‍රාථමික සෞඛ්‍ය සේවා සංවර්ධනය යටතේ රෝහල් 42ක සංවර්ධන කටයුතු ව්‍යාපෘතිය යටතේ සිදුවන අතර රෝහල් 20ක සංවර්ධන කටයුතු නිම කර ඇති අතර රෝහල් 03 ක සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතී. තවත් 12ක ලංසු කැඳවීම් සිදුකර ඇති අතර රෝහල් 07ක සංවර්ධන කටයුතු අරමුදල් හිඟකම මත නොකිරීමට තීරණය කර ඇත. ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේදී ප්‍රමුඛතාවය ලබා දී ඇත්තේ අත්‍යවශ්‍ය ඖෂධ ප්‍රසම්පාදනය සඳහා පමණි
(උ)	2023 වර්ෂය තුළ ක්ෂේත්‍ර සෞඛ්‍ය මධ්‍යස්ථාන (FHC) 127ක් සඳහා රුපියල් මිලියන 1010.14ක් වෙන් කර තිබූ නමුත් රු. මිලියන 56.01ක් පමණක් උපයෝජනය කර තිබුණි.	2023	ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.	අලුත්වැඩියා කිරීම් සහ වැඩිදියුණු කිරීම් වන අතර, ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් සහ මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් 2023 වර්ෂයේදී අරමුදල් ඌන උපයෝජනයට	කෙෂ්ත්‍ර රෝහල් මධ්‍යස්ථාන 127ක් සංවර්ධනය කිරීමට ව්‍යාපෘතිය යටතේ සැලසුම් කොට ඇති අතර කෙෂ්ත්‍ර රෝහල් මධ්‍යස්ථාන 35 ක කටයුතු අවසන් කර ඇත. කෙෂ්ත්‍ර රෝහල් මධ්‍යස්ථාන

				ලක්ව ඇත.	10ක කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කෙෂ්ත්‍ර රෝහල් මධ්‍යස්ථාන 53ක ලංසුකැඳවීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.ඉතිරි කෙෂ්ත්‍ර රෝහල් මධ්‍යස්ථාන 29 දැනටමත් සංවර්ධන කටයුතු වෙනත් අරමුදල් යටතේ සිදුකර ඇති අතර හෝ නව ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ සිදු නොවන බැවින් අත්හැර දැමීමට කටයුතු කර ඇත.
(ඌ)	2012 දෙසැම්බර් 05 දිනැති අංක AMP/12/1602/509/005-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රජයේ රෝහල් සඳහා වාර්ෂිකව අවශ්‍ය වන ශල්‍ය ගෝස් දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලදී ගැනීමට තීරණය කර තිබුණි. 2022 වසරේදී වෛද්‍ය සැපයුම් අංශය රුපියල් මිලියන 268 ක් වටිනා ශල්‍ය ගෝස් මීටර් මිලියන 03 ක් සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා ආනයනය කිරීමට කටයුතු කර තිබුණි.	2023	නීති රීති වලට අනුකූල විය යුතුය	සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හරහා ගෝස් මීටර් මිලියන දොළහක් මිලදී ගැනීමට වෛද්‍ය සැපයුම් අංශය තීරණය කර තිබූ අතර අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) විසින් 2022 අගෝස්තු 05 වැනි දින අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, දේශීයසැපයුම්ක රුවන්ගේඉල්ලීම ගරු අමාත්‍යවරයා විසින් තාවකාලිකව	වෛද්‍ය සැපයුම් අංශය විසින් ශල්‍ය ගෝස් මිලියන 12ක් කෙෂ්ත්‍ර පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලබා ගැනීමට තීරනය කර තිබූ අතර ඒ සඳහා අනුමැතිය අතිරේක ලේකම් (ප්‍රසම්පාදනය) විසින්ලබා දී ඇත. එහෙත් අදාල ඇනවුම් ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් දේශීය සැපයුම්කරුවන්ගේ රැස්වීමකදී තාවකාලිකව අත්හිටුවීමට දේශීය සැපයුම්කරුවන්ගේ ඉල්ලීම මත

අත්හිටුවන ලදී. 2022 අගෝස්තු 19 වන දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී අනාගත අභියෝගවලට මුහුණ දීමට සූදානම් වීම සඳහා ගෝස් මීටර් මිලියන තුනක් මාස තුනක ආරක්ෂිතතොගය ක් ලෙස ලබා ගැනීමට තීරණය කරන ලදී.	එකඟතාවයකට පැමිණ තිබුනි. එහෙත් 2022 අගෝස්තු 19වන දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකදී ශල්‍ය ගෝස් මීටර මිලියන 3ක් Buffer Stock ලෙස ඇණවුම් කිරීමට එකඟ විය. මේ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදී ඇත.

13.4 සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය.

2018 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද සෞඛ්‍ය පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් අංක 3727- SRI(COL) යටතේ සහනදායී ණය වශයෙන් රු.මිලියන 5,813 ට සමාන එ.ජ.ඩො. මිලියන 37.5 ක් ද, ගිවිසුම් අංක0618- SRI(SF) යටතේ රු.මිලියන 1,938 ට සමාන එ.ජ.ඩො. මිලියන 12.5 ක ප්‍රදානයකින් සමන්විත වන අතර එකතුව රු.මිලියන 7,751 කට සමාන එ.ජ.ඩො. මිලියන 50 ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය 2023 නොවැම්බර් 30 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණ ද අවස්ථා දෙකකදී කාලය දීර්ඝ කිරීමක් සිදුකර තිබූ අතර 2025 මැයි 31 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබේ.

2021,2022සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021, 2022 සහ 2023 යන වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලටඅදාළව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	2021 රු. මිලියන	2022 රු. මිලියන	2023 රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	2,669	1,230	1,011
මුළු වත්කම්	5,746	7,663	7,721
මුළු වගකීම්	5,746	7,663	7,721
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	3,478	4,328	7,688
විදේශ ප්‍රදාන මඟින්	826	1,076	1,305
දේශිය අරමුදල් මඟින්	292	353	453

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා නිකුත් කරන ලද 32 අතිරේකයෙහි විධි විධාන උල්ලංගනය කරමින්, 2020 සහ 2021 වර්ෂවලදී ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු	2021	මෙම මුදල වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය.	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ අනුමැතිය මත මෙම ගෙවීම් සිදුකර ඇති බව	මෙම ගෙවීම් නැවත අයකර ගැනීම සඳහා අදාල නිලධාරීන්ට ලිපි මගින් දන්වා ඇති අතර එයින් කොටසක් නැවත ව්‍යාපෘතිය වෙත අයකර ගැනීමට හැකිවී ඇත. ඉතිරි

	සාමාජිකයින් සඳහා දීමනා වශයෙන් මෙම ව්‍යාපෘතිය මගින් රු. මිලියන 1.5 ක් ගෙවා තිබුණි.				නිලධාරීන්ට නැවතත් සිහි කැඳවීම් යැවීමට කටයුතු කර ඇත.
(ආ)	2020 වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශයට අනුව කිසිදු හේතුවක් හෝ අධිකාරියක් නොමැතිව ගෙවන ලද රු. මිලියන 1.66 ක් 2022 අප්‍රේල් 30 වන දින දක්වා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	2021	මෙම මුදල වගකිව යුතු පාර්ශවවලින් අයකර ගත යුතුය.	එම මුදල ප්‍රතිපූර්ණ කරන ලෙස ප්‍රතිලාභියාගෙන් ඉල්ලා සිටීමටද,එසේ සිදු කිරීමට ප්‍රතිලාභියා අසමත් වුවහොත්, අමාතයාංශ මට්ටමේ පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරිමටද තීරණය කරන ලද බව	ලංසුකරු විසින් මිල ගණන් වලංගු කාලය තුලදී ලංසුව ඉවත්කර ගැනීම හේතුවෙන් ලංසු බැඳුම්කරය වන රුපියල් මිලියන 1.66 ක් අයකරගෙන ඇත. පසුව ලංසුකරු විසින් නැවත එම සැපයීම් කලහැකි බව දන්වමින් එවන ලද ලිපිය සැලකිල්ලට ගෙන එම මුදල ලංසුකරු වෙත නැවත ගෙවා ඇත.
(ඇ)	රුපියල් මිලියන 109 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 09 ක ඉදිකිරීම් වැඩ අතර මග නවතා තිබූ අතර ඉන් කොන්ත්‍රාත්තු 06 ක් එක් කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දී තිබුණි. කාර්ය සාධන බැඳුම්කර මුදල් කර රුපියල් 690,834ක් අය කර තිබුණද, ඊට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එසේම, රුපියල් මිලියන 38 ක කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් නඩුවක් පවතින බැවින් මෙම කොන්ත්‍රාත් ගිවිසුම් අවසන් කිරිමට සහ කාර්ය සාධන බැඳුම්කරය මුදල්	2022	නියමිත වේලාවට ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.	එක් කොන්ත්‍රාත්කරු වෙකුගේ රුපියල් 2,682,182 ක් වටිනා බැඳුම්කරය මුදල් කරන ලෙස අප බැංකුවෙන් ඉල්ලා සිටියද, කොන්ත්‍රාත්කරු අධිකරණයේ නඩුවක් පවරා ඇත. අප්‍රේල් 22 වැනිදා රුපියල් 1,578,000ක කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර ඇත. මෙම කොන්ත්‍රාත්තුවේ ඉතිරි වටිනාකම	කොන්ත්‍රාත්තු 06ට අදාල කාර්යය සාධන බැඳුම්කර මුදල් 2022 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත බැර කර ඇත. කෝන්වැව ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව සහ හපුතලේ ප්‍රාදේශීය රෝහල් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර 2022

	කර ගැනීමට නොහැකි වී තිබුණි.			ලෙස රුපියල් 1,974,233.00 ක් ගෙවන ලෙස අපි දැනටමත් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. තවත් එක් කොන්ත්‍රාත්තුවක් අවසන් කිරීමට ආසියා සංවර්ධන බැංකුවේ අනුමැතිය ඉල්ලා ඇත.	වර්ෂයේදී කාර්යසාධන බැඳුම්කරය මුදල් කර ඇත. රත්නපුර රෝහලේ අයඩීන් චිකිත්සක ඒකකය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය අවසන් කිරීමක් සිදුකර ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂක සඳහන් කරයි.
(ඇ)	ප්‍රසම්පාදන කොන්දේසි අනුව, සැබෑ උපදේශන සේවා කාලය 2023 මාර්තු සිට 2024 ජුනි දක්වා (මාස 15) විය යුතුය. කෙසේ වෙතත් විගණන දිනය වන 2024 ජුනි 25 වන විටත් ජාතික බෝවන රෝග පිළිබඳ ආයතන සංකීර්ණය ඉදිකිරීම සඳහා උපදේශන සමාගමක් තෝරාගෙන නොතිබුණි.	2023	නියමිත කාලය තුළ කාර්යයන් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය	මිල ගණන් ඇස්තමේන්තුගත පිරිවැයට වඩා වැඩි බැවින් සහ අරමුදල් නොමැතිකම හේතුවෙන් උපදේශන කාර්යයේ ක්‍රියාවලිය නැවැත්වීමට සහ උපදේශන කටයුතු සඳහා පවතින අනෙකුත් විකල්ප සලකා බැලීමට තීරණය කරන ලදි.	ආසියානු සංවර්ධන බැංකුවේ එකඟත්වය මත එවකට පැවති RDC උපදේශන සමාගම සමග ජාතික බෝවන රෝග පිළිබඳ ආයතනයේ රසායනාගාර ඉදිකිරීමට අදාල සේවා සැපයීම පිළිබඳව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද උපදේශන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත RDC සමාගමට පිරිනැමීමට තීරණය කරන ලදී.
(ඉ)	මහජන සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් 2021 වර්ෂයේදී රුපියල් මිලියන 87ක් වැය කර වෑන් රථ 09 ක් මිලදී	2023	වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගී කර ගත යුතුය	අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වාහන භාවිතා කිරීම සහතික	මහජන සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් මිලදී ගත් වෑන් රථ 09 සඳහා සවිකල

ගෙන ඇතත් වෑන් රථවල සවි කළ යුතු ඇමතීම් පද්ධති මිලදී නොගත් නිසා එම වෑන් රථ මිලදී ගත් කාර්යයට නොයොදා වෙනත් කටයුතු සඳහා භාවිතා කරන බව නිරීක්ෂණය විය.	කළ හැක්කේ සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ පළාත් සෞඛ්‍ය බලධාරීන්ට පමණි.	යුතු ඇමතීම් පද්ධති මිලදී ගැනීම් සිදුකර ඒවා රථවල සවිකර නැවත අදාල පලාත් බලධාරීන්ට ලබාදී ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂ සඳහන් කරයි.

13.5 සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය (HSRP)

2022 ජූලි 18 දින ආරම්භ කරන ලද සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය සඳහා ණය ගිවිසුම් අංක L 0081 A සහ L 0124A යටතේ රු.මිලියන 35,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් මූල්‍යායනය කිරීමට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් එකඟ වී ඇත. 2025 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය අවසන් කිරීමට එකඟ වී විය.

2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2022සහ2023 යන වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන් ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලටඅදාළව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	2022	2023
	රු. මිලියන	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම	5,216	348
මුළු වත්කම්	7,266	7,077
මුළු වගකීම්	7,266	7,077
මුළු අරමුදල්		
විදේශ ණය මඟින්	7,268	6,478

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	**වර්ෂය**	**විගණකගේ නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර**	**වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය**
(අ)	මුදල් රෙගුලාසි අංක 835(2)(අ) ප්‍රකාරව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී, ප්‍රතිපාදනයේ විෂය සීමාව ඇතුලත යම් කාර්යයක් සඳහා ගොඩනැගිල්ල අවශ්‍ය බවත් ඒ සඳහා සුදුසු රජයේ ගොඩනැගිලි නොමැති බවත් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ඒත්තු ගොස් තිබිය යුතුය. කෙසේ වෙතත්, මෙම ගොඩනැගිල්ල කුලියට	2023	නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල විය යුතුය	ඉඩකඩ ලබා ගැනීම සඳහා අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) සමඟ සාකච්ඡා පවත්වන ලදි. කෙසේ වෙතත් අපගේ ඉල්ලීමට යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි.	සෞඛ්‍ය පද්ධති ප්‍රතිචාර ව්‍යාපෘතිය (HSRP) සඳහා ගිවිසුම් 2022 ජූනි මස අත්සන් කරනු ලැබූ අතර 2022 HSRP සඳහා බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලයට ව්‍යාපෘති කළමණාකරණ ඒකකය තුල ප්‍රමාණවත් ඉඩකඩ නොමැති බැවින් Covid19 Vaccine

ගැනීමේදී අමාත්‍යාංශය සතු හෝ දැනට කුලී පදනම මත ලබාගෙන තිබෙන කාර්යාල පරිශ්‍රයන්හි ඉඩකඩ තිබේද යන්න සලකා බලා නොතිබුණි

for Recovery Project පවත්වා ගෙන යනු ලබන කාර්යාල පරිශ්‍රය සහ අනෙකුත් උපකරණ HSRP ව්‍යාපෘතියට ලබාදෙන ලෙස ඉල්ලා සිටියද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුනි.මේ හේතුවෙන් ව්‍යාපෘතිය මගින් ලංසු කැඳවා රු.350,000/- මාසික කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීමට කටයුතු කල නමුත් රජයේ තක්සේරු වාර්තාවට අනුව මාසික වෙළඳපොල කුලිය රු.210,000/- ක් වූ හෙයින් නවතා දමන ලදි.

මීට අමතරව Medi House ගොඩනැගිල්ලේ අවශ්‍ය ඉඩකඩ ලබා ගැනීමට නොයෙක් වර සාකච්ඡා කලද, ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුනි. 2023 මාර්තු 02 වන දින අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ රැස්වීමේදී, මේ

					සම්බන්ධයෙන් සාකච්ඡා කෙරුණු අතර, වෙළඳපොල මිල ගණන් යටතේ HSRP ව්‍යාපෘතිය සඳහා වෙනම ගොඩනැගිල්ලක් ලබා ගැනීමට තීරණය විය. .
(ආ)	2023 පෙබරවාරි 28 දිනැති අදාළ වෙබ් අඩවියේ පළ කර තිබූ ප්‍රසම්පාදන දැන්වීම ප්‍රකාරව අවසන් කල්බදු වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුව මත පදනම් වෙ෦ යන්න සඳහන් කර තිබුණද බදු වටිනාකම සලකා බැලීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කිසිදු තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. මෙය ප්‍රසම්පාදන නිවේදනයේ සඳහන් කොන්දේසි සහ මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂනය කෙරේ	2023	මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය	අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී වෙළඳපළ මිල ගණන් තක්සේරු අනුපාත සමඟ සැසඳෙන්නේ නැති බැවින් වෙළඳපළ මිලට ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත.	මෙම ප්‍රසම්පාදනය කිරීමට පෙර කරන ලද පලමු ප්‍රසම්පාදනයේ දී තක්සේරු වාර්තාවක් ලබා ගත්තද එය වෙළඳපොල මිල ගණන් වලට වඩා අඩු අගයක් ගැනීම හේතුවෙන් ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය. එබැවින් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානතවයෙන් පැවති රැස්වීමේදී වෙළඳපොල මිල ගණන් මත ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදි. වෙළඳපොල මිල ගණන් සමඟ තක්සේරු වටිනාකම ගැලපීමට නොහැකි බව මිල ගණන් සැසඳීමේදී පෙනී යන ලදි.

13.6 ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක I

2019 ජනවාරි 19 දින ආරම්භ කරන ලද ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිසංස්කරණ සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් ව්‍යාපෘතියේ මුලු ඇස්තමේන්තු පිරිවැය වූ රුපියල් මිලියන 31,588 ට සමාන එක්සත් ජනපද ඩොලර් 200 ක් ලබා දීමට අංක 8878 දරණ ණය ගිවිසුම අනුව එකග වී තිබූ අතර මෙය සංරචක 1 සහ සංරචක 11 ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව සංරචක 1 සඳහා රුපියල් මිලියන 29,220 කට සමාන එක්සත් ජනපද ඩොලර් 185 ක් මධ්‍යම මට්ටමින් සහ පළාත් මට්ටමින් ලබා දීමට එකඟ වී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරිමට සැලසුම් කර තිබුණද 2024 ජුනි 30 දක්වා දින දීර්ඝ කර තිබුණි..

2021 සහ 2022 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂ 2 සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව විගණකාධිපති විසින් තත්ත්වාගණනය කළ මතයන් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	3,564	5,250	12,442
මුළු වත්කම්	7,843	13,092	26,338
මුළු වගකීම්	7,843	13,092	26,338
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	7,785	13,006	26,318

එම තත්ත්වාගණනය කළ විගණන මතයන් ඉදිරිපත් කිරිමට හේතු වු කරුණු වලට අමතර ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 2 සඳහා ඉදිරිපත් කර තිබු විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට සංරචකය I සඳහා අරමුදල් නියෝජිතායතනය විසින් ගෙවා ඇති මුළු මුදල රු.මිලියන 17,359 කි. මහා භාණ්ඩාගාරය විසින්	2021	ව්‍යාපෘතිය සඳහා ලැබුණු සියලුම අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර වෙනසට හේතු හඳුනාගෙන හෙළිදරව් කළ	මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති පරිදි, සංරචකය I සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මිලියන 7,785 ක් ලැබී ඇති	2024.12.31 දක්වා විගණන නිර්දේශ ක්‍රියාත්මක වී නොමැත.

	එයින් රු.මිලියන 7,962 ක මුදලක් පමණක් ව්‍යාපෘතියේ සංරචකය I සඳහා නිකුත් කරන ලදී. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සංරචකය I සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති මුදල රු.මිලියන 7,785 ක් පමණක් වූ බැවින් ඒ අතර රු.මිලියන 177 ක වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන වලට අනුව, පසුගිය වසර තුන තුළ ව්‍යාපෘතියේ සංරචකය I සඳහා වැය කර ඇති මුළු මුදල රු. මිලියන 7,733 කි. මහා භාණ්ඩාගාරයේ ඉතිරිව ඇති රු. මිලියන 9,397 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.		යුතුය.	අතර එය නිවැරදි බවත්, ලැබුණු මුදල සහ නිකුත් කළ මුදල අතර වෙනසක් ඇති බවත්, සවිස්තරාත්මක තොරතුරු සොයාගත් වහාම තොරතුරු ඉදිරිපත් කරන බවත් දැනුම් දෙමි.	
(ආ)	2020 මැයි 20 දින සිට බලපැවැත්වෙන 2021 අංක 09 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 8 (1) වගන්තිය අනුව කොවිඩ් 19 වසංගතය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය අයිතම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. කෙසේ වුවද, එම විධිවිධානවලට පටහැනිව, 2020 මැයි 20 දිනට පසුව සිදු කරන ලද එවැනි මිලදී ගැනීම් සඳහා සැපයුම්කරුවන් 18 දෙනා වෙත එකතු කළ අගය මත බදු වශයෙන් රු. මිලියන 11 ක මුළු මුදලක් ගෙවා	2021	ඒ පිළිබඳව විමර්ශනය කර වගකිවයුතු පාර්ශවවලින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සංශෝධිත පනත යටතේ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් නොදැනුවත්ව, එකතු කළ අගය මත බදු ගෙවා ඇති අතර, සැපයුම්කරුවන් ට ගෙවූ මුළු එකතු කළ අගය මත බදු මුදල හෙළිදරව් කර තිබුණු බව සත්‍යායනය කිරීම සඳහා දේශීය ආදායම්	රු. මිලියන. 1.22 දක්වා ගෙවීම් මේ දක්වා තහවුරු කරගෙන නොමැත.

	තිබුණි.			දෙපාර්තමේන්තු වට වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. ඉදිරියේදී සැපයුම්කරුවන් ගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට නියමිත අතර අමාත්‍යාංශය විසින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ බලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.	
(ඇ)	ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ බෝ නොවන රෝග හඳුනාගෙන කළමනාකරණය කිරීම වුවද, වයඹ පළාතට වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 50 ක් වූ රු.මිලියන 168 ක මුදලක් පළාත් සෞඛ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවලට ඇතුළත් කර නොතිබුණු ගොඩනැගිලි 17 ක් ඉදිකිරීම සඳහා මෙම මුදලින් රු. මිලියන 68.3 ක් වැය කර තිබුණි.	2021	ව්‍යාපෘති මගින් සැපසුම් කළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.	ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය මගින් අරමුදල් ලැබෙන විට, පළාත් සභා මගින් ප්‍රාථමික සත්කාර සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ භාවිතය වැඩිකිරීම සඳහා ක්‍රියාකාරකම් හඳුනා ගනියි. එබැවින්, සත්‍යාපනය කළ නොහැකි රෝහල්වලින් ඇතැම් ක්‍රියාකාරකම් හඳුනා ගනු ලැබේ.	දිගින් දිගටම මෙවැනි වියදම් දරා ඇති අතර ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි.
(ඇ)	ණය ගිවිසුමේ සංශෝධිත උපලේඛන 02 අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ	2021	මෙම පිරිවැය සංරචක II යටතේ දැරිය	එකඟ වෙමි. ධාරිතා ගොඩනැගීම	- එම -

පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ මගින් සංරචක II යටතේ පුහුණු / ධාරිතා සංවර්ධන සැලසුම්වල සංවර්ධන සහ අධීක්ෂණ කොටස ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, පළාත් 09 සඳහාම, සංරචක I යටතේ පුහුණු / ධාරිතා සංවර්ධනය සඳහා රු.මිලියන 112.98 ක් වැයකර තිබුණි.	යුතුය.	සංරචක II හි ක්‍රියාකාරකමක් වශයෙන් හඳුනාගෙන ඇති බවද, සංරචක II ධාරිතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ධාරිතා ගොඩනැගීමේ සැලැස්මක් පිළියෙළ කළ ද, එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

13.7 ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II

2019 පෙබරවාරි 02 දින ආරම්භ කරන ලද ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචක II සඳහා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව ණය ගිවිසුම් අංක 8878 LK යටතේ රු. මිලියන 2,368.27 කට සමාන එ.ජ.ඩො. මිලියන 15 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර 2022 වර්ෂයේ දී එය එ.ජ.ඩො. මිලියන 6 දක්වා අඩු කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

2021,2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2022 වර්ෂයන් සඳහා තත්වාගණනය කළ මතයන් ද 2023 වර්ෂය සඳහා තත්වාගණනය නොකළ මතයක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අදාලව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	249	100	118
මුළු වත්කම්	566	649	1,073
මුළු වගකීම්	566	649	1073
මුළු අරමුදල්			
විදේශ ණය මගින්	444	444	880

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ පහත පරිදි විය.

විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
ප්‍රාථමික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන සඳහා ඩිජිටල් සංඥා පද්ධති 600 ක් සැපයීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව 2021 මැයි 07 දින බදු රහිතව රු. මිලියන 77 ක කොන්ත්‍රාත්තු වටිනාකමක් යටතේ ප්‍රදානය කරන ලදී.	2022	සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය.	මෙය රාජ්‍ය සේවා අංශයේ නව්‍ය ක්‍රියාකාරකමක් වන බැවින්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව පුළුල් කරන ලද ක්‍රියාකාරකමක් වශයෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) මගින් මුල් සැලසුම් සකස් කරන ලද	දැනට මෙම ව්‍යාපෘති ක්‍රියාත්මකව පවතින අතර මේ වන විට දිස්ත්‍රික් සම්බන්ධිකාරකවරු පත්කර ඇත. එනමුත් 2021.12.31 වන විට රෝහල් කොපමණ ප්‍රමාණයක මෙය ක්‍රියාත්මකව පවතින්නේද යන්න පිළිබඳ නිශ්චිත

කෙසේ වුවද, රු. මිලියන 77 ක් වැය වන පද්ධති 599 ක් ඇණවුම් කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 75 ක් වැය වන පද්ධති 584 ක් පමණක් ලැබී තිබුණි. කෙසේ වුවද, ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානවල අවශ්‍ය යටිතල පහසුකම් සුදුසු ලෙස පවතිද යන්න පිළිබඳව නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු නොකර මෙම පද්ධති මිලදී ගෙන තිබීම හේතුවෙන්, ඒවා ස්ථාපනය කිරීමේදී විවිධ ගැටළු සහ බාධකවලට මුහුණ දීමට සිදුවී තිබුණි . 2023 මැයි 22 විගණිත දිනය වන විට මෙම ඩිජිටල් සංඥා පද්ධති 600 න් 285 ක් නිසි ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති බව අනාවරණය විය.

අතර ලෝක බැංකුව විසින් මේ සඳහා අනුමැතිය ලබා දෙන ලදී.ඉතිරි ඩිජිටල් සංඥා පද්ධති 285 මධ්‍යම සම්ප්‍රේෂණ පද්ධතියට සම්බන්ධ කිරීමට සෞඛ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නුදුරු අනාගතයේදී කටයුතු කරනු ඇත. මේ සඳහා ඩිජිටල් සංඥා පද්ධතියේ ක්‍රියාකාරීත්වය සමීපව අධීක්ෂණය කිරීම සඳහා දිස්ත්‍රික් නිලධාරීන් සමඟ මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත.

තොරතුරු නැත. ඒ සඳහා පසුවිපරම් ක්‍රමවේදයක් සකස් කර නොමැත

13.8 කොවිඩ් - 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය

2021 අගෝස්තු 19 දින ආරම්භ කරන ලද කොවිඩ් - 19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුම් අංක 4083 SRI හා 4084 -SR (SF) යටතේ රු. මිලියන 30,000 කට සමාන එජඩො. මිලියන 150 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී තිබූ අතර ශ්‍රී ලංකා රජයේ දායකත්වය රු. මිලියන 2,370 ට සමාන එජඩො 11.85 ක් වූ අතර ව්‍යාපෘතියේ කටයුතු 2024 ජුනි 30 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු 2023 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිලිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 හා 2023 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන්ද, 2022 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අදාලව විගණකාධිපති විසින් ලබා දී තිබුණි

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	3,600	19,145	260
මුළු වත්කම්	3,600	22.791	34,477
මුළු වගකිම්	3,600	22.791	34,477
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	3,600	19,144	236
දේශිය අරමුදල් මඟින්		0.5	24

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	සිනෝෆාම් එන්නත් ඒකක 1,781,684 ක් කල් ඉකුත් වීමට ආසන්න බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කල අතර, ඊට ප්‍රතිචාර වශයෙන් ව්‍යාපෘති	2023	එන්නත් නිසි සැලැස්මක් අනුව මිලදී ගත යුතුය.	ණය ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ දී, එන්නත් මාත්‍රා 03 ක් ලබා දීමෙන් මිලියන 04 ක ජනගහනයක් ආවරණය කිරීමට	මධ්‍යම එන්නත් ගබඩාවෙහි ඉතිරිව ඇති Sinopharm එන්නත් පරීක්ෂා කර ලබා කල් ඉකුත් වී ඇති එන්නත් අපහරණය කිරීම සම්බන්ධයෙන්

අධ්‍යක්ෂවරයා සඳහන් කර තිබුණේ ඉදිරි කටයුතු සඳහා කල් ඉකුත්වන එන්නත් තොග පිළිබඳව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥවරයා දැනුවත් කර ඇති බවයි. කෙසේ වෙතත් 2024 මාර්තු දක්වා එන්නත් තොග සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කල් ඉකුත් වීමට ආසන්නව තිබූ මෙම එන්නත් තොගයේ වටිනාකම එන්නත් මිලදී ගැනීම සඳහා වැය කළ මුළු වටිනාකමෙන් සියයට 11 කි.

සැලසුම් කර තිබුණි. කොවිඩ් වසංගත තත්ත්වය ආරම්භයේදීම එන්නත් කිරීමට මිනිසුන් පෙළඹී සිටියද, එම තත්ත්වය පහව ගිය විට, අපේක්ෂා කළ පරිදි එන්නත් සඳහා ජනතාව ඉදිරිපත් නොවීය. එබැවින්, සම්පූර්ණ එන්නත් ප්‍රමාණයම භාවිතා කළ නොහැකි වූ අතර, 2023.02.14 දින වන විට, Sinorpharm එන්නතෙහි මාත්‍රා 1,781,684 මධ්‍යම එන්නත් ගබඩාවේ ඉතිරිව තිබුණි. ඉන් මාත්‍රා 35ක් (කුප්පි 07ක්) කොළඹ ජාතික රෝහලට සහ කොළඹ මහ නගර සභාවට යවා ඇත. එසේම, කල් ඉකුත් වූ සිනෝෆාම් එන්නත් මාත්‍රා 1,781,649 ක් මධ්‍යම එන්නත් ගබඩාවල ආරක්ෂිතව ගබඩා කර ඇත.

ප්‍රධාන ගණකාධිකාරී (ගබඩා සමීක්ෂණ) සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ දැනුවත් කරන ලෙස සෞඛ්‍ය ලේකම්තුමා විසින් උපදෙස් ලබාදෙන ලදී.

13.9 කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් -19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ දෙවන අතිරේක මුල්‍යකරණය ව්‍යාපෘතිය.

2020 අප්‍රේල් 04 දින ආරම්භ කරන ලද කොවිඩ් - 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සහ කොවිඩ් -19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ දෙවන අතිරේක මුල්‍යකරණය ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 41,717.45 සමාන එ.ජ.ඩො. මිලියන 209.11 ක් වූ අතර එයින් රු.මිලියන 12,271.25 කට සමාන එ.ජ.ඩො. මිලියන 61.51 ක් මූල්‍යනය කිරීමට ණය ගිවිසුම් අංක IDA 6875–LK යටතේ ජාත්‍යන්තර බැංකුව විසින් ද රු.මිලියන 29,446.20 කට සමාන එ.ජ.ඩො.මිලියන 146.60 ක මුදලක් ණය ගිවිසුම් අංක IBRD 9237-LK යටතේ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් ද මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 යන වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන් ද 2022 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට අදාලව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	**2021**	**2022**	**2023**
	රු. මිලියන	**රු. මිලියන**	**රු. මිලියන**
වර්ෂයේ මුළු වියදම	23,403	2,347	915
මුළු වත්කම්	35,842	73,179	67,294
මුළු වගකීම්	35,842	73,179	67,294
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	35,797	70,693	65,150
දේශීය අරමුදල් මඟින්	7	9	15

ව්‍යාපෘතියට අදාලව පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණය	වර්ෂය	විගණකගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගන්නා ලද වැළැක්වීමේ පියවර	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය
(අ)	2021 අංක 09 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව 2020 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොවිඩ් 19 වසංගත තත්වය සඳහා යොදා ගනු ලබන වෛද්‍ය උපකරණ එකතු කළ අගය මත බද්දෙන් (VAT) නිදහස් කර තිබුණි. කෙසේ වෙතත්, එම විධිවිධානවලට පටහැනිව, 2020 සහ 2021 වසරවල සිදු කරන ලද මිලදී ගැනීම් සඳහා සැපයුම්කරුවන් 51 දෙනෙකු වෙත එකතු කළ අගය මත බදු ලෙස රු. මිලියන 96.3 ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.	2021	මෙම බදු මුදල් අය කර ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වන බව.	විගණන ඡේදයෙන් ඉදිරිපත් කරන ලද ඇමුණුම් 1 සහ 3 මෙම ව්‍යාපෘතියට අදාල වේ. ඒ අනුව සැපයුම්කරුවන් 37 සඳහා ගෙවන ලද එකතු කල අගය මත බදු (VAT) ප්‍රමාණය රු.40,883,710.63 දක්වා ඇත. මෙම සියලුම ආයතන වලට වැට් මුදල ගෙවා ඇති බවට සනාථ කිරීමට හෝ එය ගෙවා නොමැති නම් එම වැට් මුදල ව්‍යාපෘතියට ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා ලියාපදිංචි තැපෑලෙහි ලිපි යවන ලදී. මේ අනුව ආයතන 26ක් එම වැට් මුදල දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවූ බව සනාථ කර ඇත. (සනාථ කරන ලද මුළු මුදල රු.38,873,184) අදාල ලිපිවලට අදාල ගොනු පහත දැක්වේ. 1.ERHSP/COVID-19/FIN/2023/45 - Recovery of VAT Paid 2.

					ERHSP/COVID-19/FIN/2024/04 – VAT Refund
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ, වෛද්‍ය සැපයුම් මිලදී ගැනිම සඳහා ව්‍යාපෘති අරමුදල්වලින් එ.ජ.ඩො. මිලියන 4.11 කට සමාන රු. මිලියන 824.26 ක මුදලක් අදාළ සැපයුම්කරුවන් වෙත සෘජුවම ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් අවස්ථා 02 කදී, පුද්ගලික සමාගම් 02 කින් රු. මිලියන 192.05 ක පිරිවැය වූ වෛද්‍ය සැපයුම් සඳහා නිකුත් කරන ලද භාණ්ඩ ලැබිමේ පත්‍ර (GRNs) 05 ක සැපයුම්කරුගේ නම ලෙස එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) දක්වා තිබුණි. එයට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2021	මේ පිළිබඳව සොයා බලා ඒ අනුව අවශ්‍ය පියවර ගත යුතුය.	නිරීක්ෂණය සමඟ එකඟ වන බව.	හිටපු ගරු රාජ්‍ය ඇමතිතුමා, රාජ්‍ය ලේකම්, ව්‍යාපෘති අධ්‍යක්ෂ, මූල්‍ය නිලධාරී සහ ව්‍යාපෘති නිලධාරී සහ වෛද්‍ය සැපයුම් අංශය සමඟ පැවති සාකච්ඡා වලදී මේ පිළිබඳව ඉදිරියට ව්‍යාපෘතිය නමට නිකුත් කරන ලද GRN නිවැරදිව දක්වා ඇත. මේ පිළිබඳව භෞතික පරීක්ෂාවන් සිදු කර නොතිබුනි .
(ඇ)	ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් 2022 වර්ෂයේදී රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මිලදී ගන්නා ලද ඖෂධ සඳහා නාම මාත්‍රා ඉන්වොයිසි මත පදනම්ව රු. මිලියන 7,660 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ඖෂධ බෙදා හැරීමේ නියෝග වලට අනුව ඇතැම් ඖෂධ 2023 වර්ෂයේදී	2022	මුල් ලියකියවිලි මත පදනම්ව ගෙවීම් සිදු කළ යුතු ය.	එම ප්‍රසම්පාදන යාන්ත්‍රණය රටේ හදිසි තත්ත්වය යටතේ ප්‍රසම්පාදනයේදී ලබා දී ඇති ප්‍රතිපාදන මත පදනම් වන බව ද කරුණාවෙන් සලකන්න. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් කරන ලද පැහැදිලි	රටේ පැවති හදිසි තත්ත්වය යටතේ ප්‍රසම්පාදනයේදී ලබා දී ඇති ප්‍රතිපාදන මත පදනම්ව කටයුතු කරන ලදී. ඉදිරියේ දී මුල් ලියකියවිලි මත පදනම්ව ගෙවීම් සිදු කරන බව දන්වා ඇත.

	ලැබී ඇති බවත් ඒ අනුව වාණිජ ඉන්වොයිසි සහ තොග ලැබීම් පත් ලබාදී ඇත්තේ ගෙවීම් කිරීමෙන් පසුව බවත් නිරීක්ෂණය කෙරේ			කිරීම මේ සමඟ අමුණා ඇත.	
(ඈ)	ජාතික ඩෙංගු මර්දන ඒකකය සඳහා පෙස්ගාඩ් ඒකක 1500ක් රුපියල් මිලියන 29ක් ගෙවා මිලදී ගෙන තිබුණි. එම තොග නිකුත් කිරීමකින් තොරව තිබුණු අතර ඒවායේ කාලය 2025 දෙසැම්බර් 16 දිනෙන් අවසන් වේ.	2023	පාඩුව අවම කර ගැනීමට කටයුතු කළ යුතුයි	මෙම කෘමිනාශක නිකුත් කිරීමේදී ආයතනවල අවශ්‍යතාවයට අනුව පාලනයක් සහිතව නිකුත් කරනු ලබන අතර කල් ඉකුත්වන දිනය මත පමණක් නිකුත් නොකෙරේ. වසංගත සහ අධි වසංගත තත්ත්වයන් තුළ ඩෙංගු රෝගය පැතිරීම මත මෙම අවශ්‍යතාවය වෙනස් වන බව කරුණාවෙන් සලකන්න.	මේ පිළිබඳව අධ්‍යක්ෂ ඩෙංගු මර්දන ඒකකය මගින් විමසිය යුතු බව දන්වා ඇතත් එසේ කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

13.10 කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මුල්‍යයනය

2021 සැප්තැම්බර් 27 දින ආරම්භ කරන ලද කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මුල්‍යයනය සඳහා ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව සමග එළඹි අංක 9296- LK දරණ ණය ගිවිසුම අනුව රු. මිලියන 21,000 කට සමානව එ.ජ.ඩො. මිලියන 100 ක් මුල්‍යයනය කිරීමට එකග වී තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ කටයුතු 2023 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි.

2021, 2022 සහ 2023 වර්ෂවල ව්‍යාපෘතියේ මූල්‍ය තත්වය පිළිබඳ වැදගත් තොරතුරු සමහරක් පහත දැක්වෙන අතර 2021 සහ 2023 වර්ෂ සඳහා තත්ත්වාගණනය නොකළ මතයන්ද , 2022 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක්ද ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට අදාලව විගණකාධිපති විසින් ලබා දී තිබුණි.

වර්ෂය	2021	2022	2023
	රු. මිලියන	රු. මිලියන	රු. මිලියන
වර්ෂයේ මුළු වියදම	16,102	1,858	නැත
මුළු වත්කම්	16,103	17,962	28,072
මුළු වගකීම්	16,103	17,962	28,072
මුළු අරමුදල්			
විදේශ ණය මඟින්	16,102	1,858	-

ඉහත මතයන් ප්‍රකාශයට අදාළ ව්‍යාපෘතියේ පසුගිය වර්ෂ 3 සඳහා ඉදිරිපත් කර තිබූ විගණන වාර්තා වලින් පැන නැගුණු වැදගත් විගණන නිරික්ෂණ කිහිපයක් පහත පරිදි විය.

	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
(අ)	මුළු පිරිවැය රු. මිලියන 6,956 ක් වන එන්නත් මාත්‍රා මිලියන 06 ක් එන්නත් කිරීම සඳහා 2022 ජූලි 31 දින වන විට සෞඛ්‍ය ආයතන වෙත	2021	භාවිත කළ ප්‍රමාණය හෝ භාවිතයට නොගෙන ඉතිරිව ඇති ප්‍රමාණය පිළිබඳ	අදහස් දක්වා නොමැත.	මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ වසංගත රෝග අංශයෙන් පැහැදිලි කිරීම්

	නිකුත් කර තිබුණි.මෙම එන්නත් දින 30 ක් ඇතුළත භාවිත කළ යුතුය. කෙසේ වුවද, ඉතිරි තොග ශේෂයට අදාළ තොරතුරු විගණනය සඳහා ලබා දී නොතිබුණි. සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව රු. මිලියන 31 ක් වටිනා එන්නත් මාත්‍රා 23,159 ක් දින 30 ඉක්මවීම හේතුවෙන් සෞඛ්‍ය ආයතන 147 ක් විසින් භාවිතයෙන් ඉවත් කර ඇති බව අණාවරණය විය.	තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය.		ලබාගත යුතු බව දන්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුනි.
(ආ)	එන්නත් කිරීම සඳහා 2021 සෞඛ්‍ය ආයතන වෙත නිකුත් නොකළ , රු. මිලියන 10,737 ක් (මිලදී ගත් මුළු තොගයෙන් සියයට 57 ක්) වටිනා එන්නත් මාත්‍රා මිලියන 8 ක් 2022 ජූලි 31 දින කල් ඉකුත්වීම හේතුවෙන්, ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ සහ වසංගත රෝග විද්‍යා ඒකකයේ ගබඩා කර තිබුණි. ඉන් අනතුරුව, 2022 මැයි 13 දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හදිසි භාවිත ක්‍රියාවලිය සඳහා සෙල්සියස් අංශක සෘණ 60 ත් සෘණ 90 ත් අතර උෂ්ණත්වවල ගබඩා කර තිබුණු, විවෘත නොකළ එන්නත්වල ජීව කාලය මාස 09 සිට මාස 12 දක්වා වැඩි කිරීමට නිර්දේශ කර තිබුණි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්	උපදෙස් වලට අනුව එන්නත් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	• සෙල්සියස් අංශක 90 සිට 60 දක්වා උෂ්ණත්වවලදී ගබඩා කර තිබූ එන්නත්වල විවෘත නොකළ කුප්පිවල රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ මත පදනම්ව සහ නිෂ්පාදකයාගෙන් ලැබුණු තොරතුරු සමාලෝචනය කිරිමෙන් පසුව, එන්නත් කාණ්ඩ 04 ක ජීව කාලය 2022 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) මඟින් නිර්දේශ කර ඇත. • එන්නතෙහි එක් කාණ්ඩයක් සඳහා අනුමැතිය මේ	- එම -

	ජාතික ඖෂධ නියාමන අධිකාරියේ උපදෙස්වලට අනුව, එන්නත් මාත්‍රා මිලියන 7 ක ජීව කාලය මාස 12 ක් දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, ජීව කාලය දීර්ඝ කළ එන්නත් මාත්‍රා මිලියන 7 ක ජීව කාලය මාස 12 ක් දක්වා දීර්ඝ කළ එන්නත් මාත්‍රා 316,926 ක් 2022 සැප්තැම්බර් 05 දින වන විට එන්නත් කිරීම සඳහා නිකුත් කර තිබුණි.			වන තෙක් ලබා දී නොමැත. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කරන ලද විමසීමකදී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් දන්වා ඇත්තේ මෙම විශේෂිත කාණ්ඩයේ ජීව කාලය දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු මේ වන තෙක් සැපයුම්කරුවන් විසින් ලබා දී නොමැති බවයි.	
(ඇ)	2020 දෙසැම්බර් 01 සිට 2021 සැප්තැම්බර් 27 දක්වා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් මිලදී ගත් වෛද්‍ය උපකරණ සඳහා ව්‍යාපෘතිය මගින් රුපියල් මිලියන 372ක් ගෙවා තිබුණි. වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2022	එම ලේඛණ ව්‍යාපෘති කලමනාකරණ ඒකකය සතුව තිබිය යුතුය.	අදාළ ප්‍රසම්පාදන ලේඛන, මිලදී ගැනීමේ ඇණවුම්, තොග, රිසිට්පත්, ඉන්වොයිසි, ගෙවීම් වවුචර, බෙදාහැරීමේ ලැයිස්තුව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවෙන් විගණනය සඳහා ලබා ගත හැක.	3වන අතිරේක මූල්‍යකරණයට අදාල ව්‍යාපෘති ඇගයීම් වාර්තාවට අනුව Rectoactive Finance යටතේ ගෙවා ඇති මුදල් ප්‍රතිපූරණය කිරීමට ප්‍රතිපාදන ලබා දී ඇත. ඒ අනුව මෙම මුදල රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට, ඔවුන් විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ඇත.